# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2166/11 - 2020 මාර්තු මස 11 වැනි බදාදා - 2020.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත**

42 (ඇ) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා 2020 ජනවාරි 01 දිනයෙන් පසු බලාත්මක කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (SLFRSs සහ LKAS) වෙනස්වීම් ආයතනය විසින් සම්මත කර මේ සමග පළකර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් විස්සේ ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

ප්‍රසන්න ලියනගේ,
ලේකම්.

2020 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.


1A - PG 4987 — 00 (2020/03)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 2020 ජනවාරි 1 සිට බලාත්මක වෙනස්වීම්

**පටුන**

[1] මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුව

[2] SLFRS 1 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs) මුල්වරට භාවිත කිරීම

[3] SLFRS 2 - කොටස් පදනම් ගෙවීම්

[4] SLFRS 3 - ව්‍යාපාර සංයෝජනය

[5] SLFRS 4 - රක්ෂණ ගිවිසුම්

[6] SLFRS 5 - විකිණීම් සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්

[7] SLFRS 6 - ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම

[8] SLFRS 7 - මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම

[9] SLFRS 8 - මෙහෙයුම් ඛණ්ඩ

[10] SLFRS 9 - මූල්‍ය සාධනපත්‍ර

[11] SLFRS 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

[12] SLFRS 11 - බද්ධ සැකසුම්

[13] SLFRS 12 - වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම

[14] SLFRS 13 - සාධාරණ වටිනාකම් මිණුම් කිරීම

[15} SLFRS 14 - නියාමන විලම්බන ගිණුම්

[16] SLFRS 15 - ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින් වන අයභාරය

[17] SLFRS 16 - කල්බදු

[18] LKAS 1 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

[19] LKAS 2- තොග

[20] LKAS 7- මුදල් ප්‍රවාහ ප්‍රකාශය

[21] LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

[22] LKAS 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

[23] LKAS 11- ඉදිකිරීම් කොන්ත්‍රාත්තු

[24] LKAS 12 - ආදායම් බදු

[25] LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ

[26] LKAS 17- කල්බදු

[27] LKAS 18- අයභාර

[28] LKAS 19 - සේවක ප්‍රතිලාභ

[29] LKAS 20 - රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණ සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම

[30] LKAS 21 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම් වල බලපෑම්

[31] LKAS 23 - ණයගැනුම් පිරිවැය

[32] LKAS 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිකිරීම

[33] LKAS 26 - විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තා කරණය

[34] LKAS 27 - වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන

[35] LKAS 28 - ආශ්‍රිතයන්හි ආයෝජන සහ බද්ධ ව්‍යාපාර

[36] LKAS 29 - අති උද්ධමනකාරී ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරනය

[37] LKAS 32 - මූල්‍ය සාධනපත්‍ර : ඉදිරිපත් කිරීම

[38] LKAS 33 - කොටසක ඉපැයුම්

[39] LKAS 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය

[40] LKAS 36 - වත්කම් හානිකරණය

[41] LKAS 37 - ප්‍රතිපාදන,අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්

[42] LKAS 38 - අස්පෘශ්‍ය වත්කම්

[43] LKAS 39 - මූල්‍ය සාධනපත්‍ර හඳුනාගැනීම සහ මැණීම

[44] LKAS 40 - ආයෝජන දේපළ

[45] LKAS 41 - කෘෂිකර්මය

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුව**

මෙම ලේඛනය අවසානයේ වෙනමම දක්වා ඇත.

**SLFRS 1 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs) මුල්වරට භාවිත කිරීම**

ඇ1 අස්තිත්වය පහත සඳහන් නිදහස් කිරීම්වලින් එකක් හෝ වැඩි ගණනක් උපයෝගී කර ගැනීම සඳහා තෝරා ගත හැකිය.

……..

(ච) ~~ගනුදෙනුකරුවන්ගෙන් වත්කම් මාරුකිරීම~~ [ඉවත් කරන ලදී]

………..

**SLFRS 2 - කොටස් පදනම් ගෙවීම්**

63(ඉ) ~~[නවමත් බලාත්මක නැති සංශෝධනවලට මෙම ඡේදය යොමු කරන අතර එම නිසා මෙම සංස්කරණයේදී ඇතුලත් කර නැත]~~

2018 දී නිකුත්කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමුකිරීම්වල සංශෝධන, අ පරිශිෂ්ඨයේ සඳහන් හිමිකම් සාධනපත්‍රවල නිර්වචනය සඳහා වූ පාද සටහන සංශෝධනය කර ඇති අතර එකී සංශෝධනය 2020 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා භාවිතාකල යුතුය. මෙකී සංශෝධන ද සමඟ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි සඳහන් යොමුකිරීම්වලට සිදුකරන ලද අනෙකුත් සංශෝධන සියල්ලක්ම ව්‍යවහාරකරනු ලබන්නේ නම් මෙකී සංශෝධනයද කලින් ව්‍යවහාරකරණයට ඉඩ දේ. SLFRS 2 සඳහා වූ සංශෝධන LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි හා මෙම ප්‍රමිතයේ 53-59 දක්වා වූ ඡේදවලට යටත්ව අතීතයානුයෝගීව ව්‍යවහාර කල යුතුය. නමුත් අතීතයානුයෝගී ව්‍යවහාරය ප්‍රායෝගික නොවන විට හෝ එහි අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් පවතීනම් SLFRS 2 සඳහා වූ එකී සංශෝධනය LKAS 8 හි ඡේද 23 – 28, 50-53 හා 54ඊ අනුව සිදුකල යුතු වේ.

අ පරිශිෂ්ඨය

ස්කන්ධ සාධන පත්‍රය අස්තිත්වයක සියලුම වගකීම්* අඩුකිරීමෙන් පසු ඉතිරි වත්කම්වලට හිමිකම් සඳහා සාක්ෂි සපයන ගිවිසුමකි.*

* වගකීමක් යනු ~~එය නිරවුල් කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ වලින් යුත් සම්පත් අස්තිත්වයෙන් පිටතට ගලායනු ඇතැයි අපේක්ෂිත~~ ආර්ථික සම්පත් මාරු කිරීම**ක්** සිදුවන අතීත සිදුවීම් වලින් පැනනගින්නා වූ අස්තිත්වයේ ප්‍රවර්තන බැඳීමක් ලෙස 2018 නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකලපනාත්මක රාමුව

~~ආකෘතිමය රාමුව~~ නිර්වචනය කරයි (එනම් අස්තිත්වයේ මුදල් හෝ වෙනත් වත්කම් පිටතට ගලා යාම)

**SLFRS 3 - ව්‍යාපාර සංයෝජනය**

**3 අස්තිත්වය ගණුදෙනුවක් හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාර සංයෝජනයක් දැයි නිශ්චය කල යුත්තේ, මෙම SLFRSහි නිර්වචනය ව්‍යවහාරනය අත්පත් කරගන්නා වත්කම් සහ පවරා ගන්නා වගකීම් ව්‍යාපාරයකින් සමන්විත වීමේ අවශ්‍යතාවය අනුවයි. අත්පත් කරගන්නා වත්කම් ව්‍යාපාරයක නොවේ නම් වාර්තාකරණ අස්තිත්ත්වය ගනුදෙනුව හෝ වෙනත් සිද්ධිය වත්කමක් අත්පත් කර ගැනීමක් ලෙස ගිණුම්ගත කල යුතු වේ. ආ5- ආ12ඇ ඡේද ව්‍යාපාර සංයෝජනයක් සහ ව්‍යාපාරය පිළිබඳව නිර්වචනය හඳුනාගැනීම මත මඟපෙන්වීම සලසයි.**

64ට 2018 නොවැම්බර් නිකුත් කල ව්‍යාපාරයක් යන නිර්වචනය ආ7අ - ආ7ඇ, ආ8අ - ආ12ඇ ඡේද එකතු කර ඇති අතර පරිශිෂ්ඨ අ හි ව්‍යාපාරය යන පදයේ නිර්වචනය සංශෝධය කර 3 ඡේදය, ආ7 - අ9, ආ11, ආ12 ඡේද සංශෝධනය කර ඇත. ආ10 ඡේදය ඉවත් කර ඇත. 2020 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන ප්‍රථම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භ වන දින හෝ ඊට පසු අත්පත් කරගත

දිනය වන ව්‍යාපාර සංයෝජනවලට සහ එම කාලපරිච්ඡේදයේ ආරම්භ වන දින හෝ ඊට පසු පසු සිදුවන වත්කම් අත්පත් කරගැනීම්වලට මෙම සංශෝධන අත්තිත්වයක් විසින් ව්‍යවහාර කල යුතු වේ. මෙම සංශෝධන කලින් ව්‍යවහාර කිරීමට ඉඩ දෙයි. අස්තිත්ත්වක් මෙම සංශෝධන එසේ කලින් ව්‍යවහාර කරන විට එම කරුණ හෙළිදරව් කළ යුතු වේ.

## අ පරිශිෂ්ඨය

## නිර්වචිත පද

...

ව්‍යාපාර ~~ආයෝජකයින්ට හෝ අනෙකුත් අයිතිකරුවන්ට සාමාජිකයින්ට හෝ සහභාගිවන්නන්ට සෘජුවම ලාභාංශ, පිරිවැය අවම කිරීම හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභයක් ලබාදීමේ ස්වරූපයෙන්~~ සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් භාණ්ඩ හෝ සේවා පරිභෝගිකයින්ට සැපයීම, ආයෝජන ආදායම් උත්පාදනය කිරීම (එනම් ලාභාංශ සහ පොළිය) හෝ වෙනත් ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් මෙහෙයවීමේ සහ පාලනය කිරීමේ හැකියාව ඇති එකිනෙකට සම්බන්ධවූ ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයකි.

ආ7 නිමවුම් ඇති කිරීම සඳහා දායකවීමට හැකි එම යෙදවුම් සහ එම යෙදවුම්වල භාවිතා කරන ක්‍රියාවලිවලින් ව්‍යාපාරයක් සමනවිත වේ. ~~ව්‍යාපාරවලට සාමාන්‍යයෙන් නිමවුම් ඇතත් ව්‍යාපාරයක් ලෙස සුදුසුකම් ලැබීමට සංකලිත වූ සමූහයක් සඳහා නිමවුම් අවශ්‍ය නොවේ.~~ ව්‍යාපාරයක මූලිකාංග තුන පහත සඳහන් පරිදි නිර්වචනය කෙරේ. (ව්‍යාපාරයක මූලිකාංග මත මගපෙන්වීම සඳහා ආ8- ආ12 ඡේද බලන්න)

(අ) **යෙදවුම:** ක්‍රියාවලි එකක් හෝ වැඩි ගණනක් එයට භාවිතා කරන විට නිමැවුම් ඇතිකරන හෝ නිමැවුම් ඇතිකිරීමට දායකවීමට හැකියාව ඇති ඕනෑම ආර්ථික සම්පතකි. උදාහරණවලට ජංගම නොවන වත්කම් (අස්පෘශ්‍ය වත්කම් හෝ ජංගම නොවන වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම ඇතුළත්ව) බුද්ධිමය දේපළ, අවශ්‍ය ද්‍රව්‍ය හෝ අයිතින් සහ සේවකයන් ලබා ගැනීමට ප්‍රවේශයේ හැකියාව ඇතුළත් වෙයි.

(ආ) **ක්‍රියාවලිය:** යෙදවුමකට හෝ යෙදවුම්වලට ව්‍යවහාර කලවිට හෝ නිමැවුම් ඇති කිරීමට දායකවීමට හැකියාව ඇති ඕනෑම පද්ධතියක් ප්‍රමිතියක්, නියමයන්, සම්ප්‍රදාය හෝ නීති වේ. උදාහරණවලට උපකමික්‍ර කළමනාකරණ ක්‍රියාවලි, මෙහෙයුම් ක්‍රියාවලි සහ සම්පත් කළමනාකරණ ක්‍රියාවලි ඇතුළත්ය. මෙම ක්‍රියාවලි සංකේතාත්මකව ලේඛන ගතවන නමුත් යෙදවුම් භාවිතා කිරීමෙන් නිමැවුම් ඇති කිරීමට හැකියාව ඇති නීති සහ සම්ප්‍රදායන් අනුගමනය කිරීමෙන් අවශ්‍ය ප්‍රවීණතාව සහ පළපුරුද්ද ඇති සංවිධානමය අවශ්‍ය ප්‍රවීනතාවය සහ පළපුරුද්ද ඇති සංවිධානය වූ බුද්ධිමය හැකියාව ශ්‍රමකාය නීති සම්ප්‍රදායන් අනුගමනය කිරීමෙන් යෙදවුම් වලින් නිමැවුම් ඇති කිරීමට හැකියාව ඇති ක්‍රියාවලි සැලකිය හැකිය. (ගිණුම්කරණය, බිල්පත් සැකසීම, පඩිපත සහ වෙනත් පරිපාලන පද්ධතීන්, අවශ්‍යයන්ම නිමැවුම් ඇති කිරීමට භාවිතා කරන ක්‍රියාවලි නොවේ).

(ඇ) **නිමැවුම:** යෙදවුම් සහ එහි යෙදවුම්වලට භාවිතා වන ක්‍රියාවලිවල ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ක්‍රියාකම්වලින් භාණ්ඩ හෝ සේවා පරිභෝගිකයින්ට සැපයීම, ආයෝජන ආදායම් උත්පාදනය කිරීම (එනම් ලාභාංශ සහ පොළිය) හෝ වෙනත් ආදායම් උත්පාදනය කිරීමයි ~~ආයෝජනයන්ට හෝ වෙනත් අයිතිකරුවන්ට සාමාජිකයන්ට හෝ සහභාගිවන්නන්ට සෘජුවම ලාභාංශ පිරිවැය අඩුවීම හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභ ස්වරූපයන් එළදාවක් සැලසීම හෝ~~ සැලසීමයි ~~ඇති හැකියාව~~.

### සාධාරණ වටිනාකමේ සංකේන්ද්‍රකරණය හඳුනා ගැනීමට විකල්ප පරීක්ෂාව

ආ7අ අත්පත් කර ගත් ක්‍රියාකාරකම් සමූහයක් හෝ වත්කම් ව්‍යාපාරයක් නොවේදැයි සරල තක්සේරු කිරීමක් කිරීමට ඉඩදීමට ආ7 ආ ඡේදයේ විකල්ප පරීක්ෂාව (සංකේන්ද්‍රකරණ පරීක්ෂාව) නියමකර ඇත. අස්තිත්ත්වයකට පරීක්ෂාව ව්‍යවහාර කිරීමට තෝරා ගැනීමට හෝ ව්‍යවහාර නොකිරීමට තෝරා ගැනීමට හැකිය. එක් එක් ගණුදෙනුව හෝ අනෙකුත් සිද්ධිය සඳහා වෙන වෙනම එකී තෝරා ගැනීම සිදුකිරීමට අස්තිත්වයකට හැකියාව ඇත. මෙම සංකේන්ද්‍රකරණ පරීක්ෂාවේ පහත ප්‍රතිඵල තිබේ.

(අ) සංකේන්ද්‍රකරණ පරීක්ෂාව සම්පූර්ණ නම් ක්‍රියාකාරකම් සමූහය සහ වත්කම් ව්‍යාපාරයක් නොවන බව නිශ්චය කරන අතර තවදුරටත් තක්සේරුව අවශ්‍ය නොවේ.

(ආ) සංකේන්ද්‍රකරණ පරීක්‍ෂාව සම්පූර්ණ නොවන්නේ නම් හෝ අස්තිත්ත්වය පරීක්‍ෂාව ව්‍යවහාර කිරීමට තෝරා නොගන්නේ නම් ආ8 - ආ12ඇ ඡේදවල නියම කර ඇති තක්සේරුව අස්තිත්ත්වය මඟින් ඉටු කල යුතු වේ.

ආ7ආ අත්පත්කරගත් දළ වත්කම්වල සාධාරණ වටිනාකම් සම්පූර්ණයෙන්ම තනි හඳුනාගත් වත්කමක හෝ සමාන හඳුනාගත් වත්කම් කාණ්ඩයක් තුල වේ නම් සංකේන්ද්‍රකරණ පරීක්‍ෂාව සම්පූර්ණ වේ. මෙම සංකේන්ද්‍රකරණ පරීක්‍ෂාව සඳහා :

(අ) අත්පත්කරගත් දළ වත්කම්වල මුදල් සහ මුදල්වලට සමාන දෑ, විලම්භිත බදු වත්කම් සහ විලම්භිත බදු වගකීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කීර්තිනාමය ඉවත් කල යුතු වේ.

(ආ) දළ වත්කම්වල සාධාරණ වටිනාකම තුල අත්පත් කරගත් ශුද්ධ හඳුනාගත් වත්කම්වල සාධාරණ වටිනාකම ඉක්මවා සිදුකරන ඕනෑම ප්‍රතිෂ්ඨාවක් (පාලනය නොවන හිමිකම් සාධාරණ ම සහ කලින් තබාගත් හිමිකමේ සාධාරණ වටිනාකමද ඇතුලු අන්තර්ගත කල යුතුය. අත්පත් කරගන්නා ලද දළ වත්කම් අත්පත් කරගත් දල වත්කම් වල සාධාරණ අගය සාමාන්‍යයෙන් නිශ්චය කරන්නේ, පවරාගත් වගකීම්වල සාධාරණ අගයට (විලම්භිත බදු වගකීම් හැර) හුවමාරු කල ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට (එකතු කලා පාලනය නොවන හිමිකමේ සාධාරණ වටිනාකම සහ කලින් තබා ගත් හිමිකමේ සාධාරණ වටිනාකම ඇතුළත්ව) එකතු කිරීමෙන් එයින් අ උප ඡේදයේ හඳුනාගත් අයිතම ඉවත් කිරීමෙනි. කෙසේවෙතත් අත්පත් කරගත් දළ වත්කම්වල සාධාරණ අගය එම එකතුවට වඩා වැඩි නම් වඩා නිශ්චිත ගණනය කිරීමක් සමහර විට අවශ්‍ය විය හැකිය.

(ඇ) ව්‍යාපාර සංයෝජනයක් තුල තනි හඳුනාගත හැකි වත්කමක් ලෙස හඳුනාගෙන මනින ලද ඕනෑම වත්කමක් හෝ වත්කම් කාණ්ඩයක්, තනි හඳුනාගත හැකි වත්කමක් තුල ඇතුලත් කල යුතු වේ.

(ඈ) සැලකිය යුතු පිරිවැයක් දැරීමකින් තොරව හෝ එම වත්කමට (උදාහරණ ලෙස ඉඩම් සහ ගොඩනැගිලි) උපයෝජනයේ හෝ වත්කමක සාධාරණ අගයේ සැලකිය යුතු හීනවීමකින් තොරව කිසියම් ස්පෘශ්‍ය වත්කමක් හා සම්බන්ධ හෝ භෞතිකව තවත් වත්කමකින් (හෝ SLFRS 16 කල්බදු හි නිශ්චිත කල්බද්දකට පාදක කරගත් වත්කමකින්) ඉවත් කර භාවිතයට ගත නොහැකි ස්පෘශ්‍ය වත්කමක් වන විටදී එම වත්කම් තනි හඳුනාගත හැකි වත්කමක් ලෙස සැලකිය යුතු වේ.

(ඉ) එක සමාන වත්කමක් දැයි තක්සේරු කිරීමේදී, අස්තිත්ත්වයක් එක් එක් තනි හඳුනාගත හැකි වත්කමේ ස්වභාවය සහ එම වත්කම් වලින් නිමවුම කළමනාකරණය කිරීම සහ ඇති කිරීම ආශ්‍රිත අවදානම් සැලකිය යුතු වේ. (එනම් අවදානම් ලක්‍ෂණ වේ)

(ඊ) පහත සඳහන් දෑ එක සමාන වත්කම් ලෙස සලකනු නොලැබේ:

(i) ස්පෘශ්‍ය වත්කම් සහ අස්පෘෂ්‍ය වත්කමක්;

(ii) ඈ උපඡේදයේ නිර්ණායක අනුව තනි හඳුනා ගත හැකි වත්කමක් ලෙස සලකනු ලබන්නේ නම් හැර විවිධ පන්තිවල ස්පෘශ්‍ය වත්කම් (උදාහරණ තොග, නිෂ්පාදනය කරන උපකරණ සහ මෝටර් රථ);

(iii) විවිධ පන්තිවල හඳුනාගත හැකි අස්පෘශ්‍ය වත්කම් (උදාහරණ ලෙස සන්නම්, නාම බලපත්‍ර සහ සංවර්ධනය කිරිම යටතේ ඇති අස්පෘශ්‍ය වත්කම්);

(iv) මූල්‍ය වත්කම් හා මූල්‍ය නොවන වත්කම්

(v) විවිධ පන්තිවල මූල්‍ය වත්කම් (උදාහරණ ලෙස ලැබිය යුතු මුදල් සහ ස්කන්ධ උපකරණවල ආයෝජන) ; සහ

(vi) එකම වත්කම් පන්තිය තුල නමුත් සැලකිය යුතු විවිධ අවදානම් ලක්‍ෂණ තිබෙන හඳුනාගත හැකි වත්කම්

ආ7ඇ ආ7ආ ඡේදයේ අවශ්‍යතාවයන්වලින්, LKAS 38 *අස්පෘෂ්‍ය වත්කම්* හි සමාන වත්කම් සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ විකරණය කිරීමට හෝ LKAS 16 *දේපළ, පිරියත සහ උපකරණ*, LKAS 38 සහ LKAS 7 *මූල්‍ය සාධනපත්‍ර හෙළිදරව් කිරීම්* හි පන්තිය යන පදයේ අර්ථ නිරූපණය වෙනස් කිරීමට භාජනය නොකරයි.

## ව්‍යාපාරයක මූලිකාංග

ආ8 ව්‍යපාරවල නිමවුම් සාමාන්‍යයෙන් තිබුණා වුවත්, ව්‍යාපාරයක් ලෙස සුදුසුකම් ලැබීමට සංකලිත ක්‍රියාකාරකම් සමුහයක් සහ වත්කම් සඳහා නිමවුම් අවශ්‍ය නොවේ. ව්‍යාපාරය යන නිර්වචනයේ හදුනාගත් අරමුණු සදහා මෙහෙයවනු ලැබීමේ සහ කළමනාකරණය කිරිමේ හැකියාවට සංකලිත වු ක්‍රියාකාරකම් සමුහයකට සහ වත්කම්වලට එකට එක්වී නිමවුම් බිහිකිරිමට යෙදවුම් සහ එම යෙදවුම්වලට භාවිතා කල ක්‍රියාවලින් යන අත්‍යවශ්‍ය මූලිකාංග දෙක අවශ්‍ය වේ. ~~කෙසේවෙතත් වෙළඳපොළ සහභාගිවන්නන්ට ව්‍යාපාරය අත්පත්කර ගැනිමේ දක්‍ෂතාවය සහ නිමවුම් නිෂ්පාදනය අඛණ්ඩව ගෙනයා හැකි නම්~~ විකුණුම්කරු එම ව්‍යාපාරය මෙහෙයවීමට භාවිතා කරන සියළුම යෙදවුම් හෝ ක්‍රියාවලින් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ. ~~උදාහරණ ලෙස ව්‍යාපාරය ව්‍යාපාරය තමන්ගේම~~ යෙදවුම් ~~හෝ ක්‍රියාවලින් සමග සංකලිත කර දැක්විය හැකිය.~~ කෙසේ වෙතත් ව්‍යාපාරයක් ලෙස සැලකීමට නිමවුම් බිහි කිරිමේ හැකියාවට එකට එක්වූ සැලකියයුතු දායකත්වය දෙන අඩුම තරමේ යෙදවුමක් සහ ප්‍රමාණවත් ක්‍රියාවලියක් සංකලිත වු ක්‍රියාකාරකම් සමුහයකට සහ වත්කම්වලට ඇතුලත් කල යුතුයි. ක්‍රියාකාරකමක් ප්‍රමාණවත්දැයි තක්සේරු කරන්නේ කෙසේදැයි ආ12ආ ඡේද විශේෂයෙන් සදහන් කරයි.

ආ8අ අත්පත්කරගත් සංකලිත ක්‍රියාකාරකම් සමුහයක් සහ වත්කම් සදහා නිමවුම් තිබූ පමණින්ම අත්පත්කරගත් සංකලිත ක්‍රියාකාරකම් සමුහයක් සහ වත්කම් සඳහා නමැවුම් තිබූ පමණින්ම හෝ අයභාරය අඛන්ඩව පැවති පමනින්ම පෙර සැලකිය යුතු ක්‍රියාවලිය හා යෙදවුම යන දෙකම අත්පත් කර ගෙන තිබෙන බව සැලකිල්ලට නොගත යුතුය.

ආ9 අස්තිත්වයේ සංවර්ධනයේ අවස්ථාවද ඇතුලත්ව ව්‍යාපාරයේ මුලිකාංගවල ස්වභාවය සහ අස්තිත්වයේ මෙහෙයුම්වල (ක්‍රියාකාරකම්වල) ව්‍යුහය කර්මාන්තය අනුව වෙනස් වෙයි. ස්ථාපිත ව්‍යාපාර සදහා බොහෝ විට විවිධ වර්ගයේ යෙදවුම්, ක්‍රියාවලින් සහ නිමැවුම් ඇති අතර අළුත් ව්‍යාපාර සදහා බොහෝවිට ඇත්තේ යෙදවුම් සහ ක්‍රියාවලි ස්වල්පයක් සහ සමහර විට එක නිමවුමකි. (තනි නිෂ්පාදනයකි) සෑම ව්‍යාපාරයකටම වාගේ වගකීම්ද ඇති නමුත් ව්‍යාපාරයකට වගකීම් තිබීම අවශ්‍ය නොවේ. තවදුරටත් අත්පත් කරගත් ක්‍රියාකාරකම් සමුහය සහ වත්කම් ව්‍යාපාරයක් නොවන නමුත් වගකීම්ද එහි තිබිය හැකිය.

~~ආ10 සංකලිත වු ක්‍රියාකාරකම් සමුහයකට සහ වත්කම් සංවර්ධනය වන අවධියේදී නිමවුම් නොතිබිය හැකිය. එසේ නොවේ නම් අත්පත් කරගන්නා විසින් ව්‍යාපාරයක් සමුහයක්දැයි නිශ්චය කිරීමට වෙනත් සාධක සලකා බැලිය යුතුය. එම සාධක අතුලත් නමුත් ඒවාට සීමා නොවී සමුහය:~~

~~(අ) සැලසුම් කල ප්‍රධාන ක්‍රියාකාරකම් ආරම්භ කර තිබීම;~~

~~(ආ) එම යෙදවුම් නිපදවිය හැකි සේවකයින්, බුද්ධිමය දේපළ සහ වෙනත් යෙදවුම් සහ ක්‍රියාවලි තිබීම ;~~

~~(ඇ) භාණ්ඩ නිෂ්පාදනයට සැලසුම අනුව ඉදිරියට යෑම; සහ~~

~~(ඇ) නිෂ්පාදනයක් මිලදී ගන්නා වූ ගණුදෙනුකරුවන්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව.~~

~~සංවර්ධන අවධියේදී ව්‍යාපාරයක් ලෙස සුදුසුකම් ලැබීමට නියමිත සංකලිත ක්‍රියාකාරකම් සමුහයක් සහ වත්කම් සඳහා ඉහත දැක්වු සියළුම සාධක පැවතීමට අවශ්‍ය නොවේ.~~

ආ11 විශේෂ ක්‍රියාකාරකම් සහ වත්කම් සමුහය ව්‍යාපාරයක් දැයි නිශ්චය කිරීමේදී, සංකලිත වු සමුහය වෙළඳපොළ සහභාගිවනන්නන් විසින් මෙහෙයවීම සහ කළමනාකරණය කිරීමේ දක්‍ෂතාවය මත පදනම් විය යුතුය. ඒ අනුව නියමිත සමුහය ව්‍යාපාරයක්ද යන්න ඇගයීමේදී විකුණුම්කරු සමුහය ව්‍යාපාරයක් ලෙස මෙහෙයවීම හෝ අත්පත් කර ගන්නා විසින් සමුහය ව්‍යාපාරයක් ලෙස මෙහෙයවීමට අපේක්‍ෂා කරන්නේද යන්න අදාල නොවේ.

## අත්පත් කරගත් ක්‍රියාවලිය ප්‍රමාණවත්දැයි තක්සේරු කිරිම

ආ12 ~~මෙයට පටහැනිව සාක්ෂි නොමැති නම් නියමිත වත්කම් යන ක්‍රියාකාරකම් සමුහයක කීර්තිනාමයක් පැවතීමට ව්‍යාපාරයක් බවට අනුමාන කල යුතුය. කෙසේ වෙතත් ව්‍යාපාරයකට කීර්තිනාමයක් නොමැති විය හැකිය.~~ අත්පත් කරගත් ක්‍රියාකාරකම් සමුහයක් සහ වත්කම්වල නිමවුම් නොමැති නම් (ආ 12ආ ඡේද) සහ එයට නිමවුම් තිබේ නම් (ආ 12ඇ ඡේද) අත්පත්කරගත් ක්‍රියාවලියක් ප්‍රමාණවත් දැයි තක්සේරු කරන්නේ කෙසේදැයි ආ 12අ - ආ 12ඇ ඡේද විස්තර කරයි.

ආ12අ අයභාරය උත්පාදනය ආරම්භ කර නොමැති ආරම්භක අවදියේ පවතින අස්තිත්වයක් අත්පත් කරගත් දිනට අත්පත් කරගත් ක්‍රියාකාරකම් සමූහය සහ වත්කම් තුල නිමවුම් තිබිය නොහැකි අවස්ථාවක් සඳහා උදාහරණයකි. තවදුරටත් අත්පත්කරගත් ක්‍රියාකාරකම් සමූහයක් සහ වත්කම් එම අත්පත් කර දිනට අයභාරයන් උත්පාදනය කර ඇත්නම් පසුකාලීනව බාහිර ගණුදෙනුකරුවන්ගෙන් අයභාරය තවදුරටත් ජනනය නොවේ නම් වුවත් (උදාහරණ ලෙස එය අත්පත්කරගන්නා විසින් සංකලිත වන නිසා) අත්පත් කරගත් දිනට එයට නිමවුම් තිබෙන බව සලකා බලයි.

ආ12ආ අත්පත්කර ගත් දිනට ක්‍රියාකාරකම් සමූහයක හා වත්කම්වල නිමවුමක් නොමැති නම්, අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය (හෝ ක්‍රියාවලින් සමූහය) ප්‍රමාණවත්ද යන්න පහත සඳහන් කරුණු පවතී නම් පමණක් සලකා බැලිය යුතුය:

(අ) අත්පත්කරගත් යෙදවුමක් හෝ යෙදවුම් නිමවුම්වලට පරිවර්තනය කිරීමට හෝ සංවර්ධනය කිරීමට වන හැකියාව සඳහා වැදගත් වීම; සහ

(ආ) අත්පත් කරගත් යෙදවුම් එම ක්‍රියාවලිය ඉටු කිරීමට (හෝ ක්‍රියාවලි සමූහය) අවශ්‍ය නිපුණතා සහ පලපුරුද්ද තිබෙන සංවිධානමය ශ්‍රමබලකායක් විසින් සංවිධානමය ශ්‍රමබලකාය නිමවුම් වලට සංවර්ධනය කළහැකි සහ පරිවර්තන කලහැකි යෙදවුම් යන දෙකම ඇතුලත් වේ. එම වෙනත් යෙදවුම්වල පහත දෑ ඇතුලත් වේ:

(i) භාණ්ඩයක් හෝ සේවාවක් සංවර්ධනය කිරීමට භාවිතාකරන බුද්ධිමය දේපළ;

(ii) නිමවුම් ඇති කිරීමට සංවර්ධනය කිරීමට හැකි වෙනත් ආර්ථික සම්පත්; හෝ

(iii) අවශ්‍ය ද්‍රව්‍ය වලට ප්‍රවේශය ලබා ගැනීමට හෝ අනාගත නිමවුම් ඇති කිරීමට ඇති හිමිකම.

උපඡේද (ආ) I -III හි සඳහන් යෙදවුම්වලට උදාහරණ, තාක්‍ෂණය, පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති, නිශ්චල දේපළ සහ මිනිරන් අයිතිය ඇතුලත් වේ.

ආ12ඇ අත්පත් කරගත් දිනට ක්‍රියාකාරකම් සමූහයක සහ වත්කම්වල නිමවුම් තිබේනම්, අත්පත් කර ගත් ක්‍රියාවලිය (හෝ ක්‍රියාවලි සමූහය) අත්පත් කරගත් යෙදවුම් සහ නිමවුම්වලට ව්‍යවහාර කර තිබෙන විට එය ප්‍රමාණවත් ලෙස සලකනු ලබන්නේ:

(අ) නිමවුම නොකඩවා කර ගෙන යාමේ හැකියාව සඳහා එය වැදගත් වන අතරම අත්පත්කරගත් යෙදවුම් එම ක්‍රියාවලිය (හෝ ක්‍රියාවලින් සමූහය) ඉටු කිරීමට අවශ්‍ය නිපුණතා, දැනුම හෝ පළපුරුද්ද සංවිධානාත්මක ශ්‍රම බලකාය තුළින් සහන්විත වන්නේ නම්; හෝ

(ආ) නිමවුම නොකඩවා නිෂ්පාදන කිරීමේ හැකියාවට සැලකිය යුතු ලෙස දායක වීම සහ:

(i) එය අනන්‍ය හෝ හිඟ ලෙස සලකා බලනු ලැබේ නම්; හෝ

(ii) සැලකිය යුතු පිරිවැය දැරීමකින්, ප්‍රයත්න දැරීමකින් හෝ නිමවුම් අඛණ්ඩව බිහිකිරිමේ හැකියාව කල් දැමීමකින් තොරව එය ප්‍රතිෂ්ඨාපන කිරීමට නොහැකිවීම

ආ12ඈ ආ12ආ හෝ ආ12ඇ ඡේද දෙක සඳහා පහත සඳහන් අමතර සාකච්ජාවන්ද සහයෝගය ලබා දේ.

(අ) අත්පත් කරගත් ගිවිසුමක් යෙදවුමක් වන අතර ප්‍රමාණවත් ක්‍රියාවලියක් නොවේ. එසේනමුත් අත්පත් කරගත් ගිවිසුමක් (උදාහරණ ලෙස පිටතින් සිදුකරන දේපල කළමනාකරණය හෝ පිටතින් සිදුකරන වත්කම් කළමනාකරණය සඳහා වන ගිවිසුමක්), සංවිධානාමය ශ්‍රම බලකායකට ප්‍රවේශය ලබා දිය හැකිය. එවැනි ගිවිසුමක් තුලින් ප්‍රවේශය ලැබූ ශ්‍රම බලකායක් අස්තිත්ත්වය විසින් පාලනය කරනු ලබන හෝ නොඑසේනම් අත්පත් කර ගනු ලබන ප්‍රමාණවත් ක්‍රියාවලියක් සිදුකරන්නේද යන්න අස්තිත්ත්වය විසින් තක්සේරු කල යුතුය. එම තක්සේරුව කිරිමේදී සලකා බලන සාධකවලට ගිවිසුමේ කාලය සහ අළුත්කිරිමේ කොන්දේසිද ඇතුලත් වේ.

(ආ) අත්පත් කරගත් සංවිධානාමය ශ්‍රම බලකාය ප්‍රතිෂ්ඨාපනය කිරිමේදී අපහසුකම්, නිමවුම අත්පත් කරගැනීමේ හැකියාවට සංකීර්ණ ක්‍රියාවලියක් අත්පත් කරගත් සංවිධානාමය ශ්‍රම බලකාය ඉටුකරන බවත් ඇඟවිය හැකිය.

(ඇ) උදාහරණ ලෙස නිමවුම බිහිකිරිමට අවශ්‍ය සියළුම ක්‍රියාවලින් තුල යම් ක්‍රියාවලියක් උපාකාරක හෝ සුළු ක්‍රියාවලියක් වේ නම් එම ක්‍රියාවලිය (හෝ ක්‍රියාවලි කාණ්ඩය) වැදගත් නොවේ.

**SLFRS 4 - රක්ෂණ ගිවිසුම්**

වෙනස්කම් නැත.

**SLFRS 5 - විකිණීම් සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්**

44උෟ 2013 අප්‍රේල් නිකුත්කළ SLFRS 13 කිරීම සාධාරණ වටිනාකම මිණුම් කරණය, අ පරිශිෂ්ඨයෙහි සාධාරන වටිනාකම නිර්වචනය හා නැවත අය කරගත හැකි අගය පිළිබඳ නිර්වචනය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 13 ව්‍යවහාර කරන, කල්හි ඒ ~~සංශෝධනය~~ සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

**SLFRS 6 - ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම**

10. ඛණිජ සම්පත් සංවර්ධනය කිරීමට අදාළ වන වියදම් ගවේෂණ හා ඇගයීම් වත්කම් ලෙස හඳුනා නොගත යුතුය. සංවර්ධනය නිසා පැනනගින වත්කම් ගිණුම්වල සැලකිය යුතු අන්දම පිළිබඳ මගපෙන්වීම ~~ආකෘතිමය රාමුවේ~~ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකලපනාත්මක රාමුවේ සහ LKAS 38 අස්පෘශ්‍ය වත්කම් හි දක්වා ඇත.

26ඳ- ~~[නවමත් බලාත්මක නැති සංශෝධනවලට මෙම ඡේදය යොමු කරන අතර එම නිසා මෙම සංස්කරණයේදී ඇතුලත් කර නැත]~~

2018 දී නිකුත්කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමුකිරීම්වල සංශෝධන, 10 වන ඡේදය සංශෝධනය කර ඇති අතර එකී සංශෝධනය 2020 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා භාවිතාකල යුතුය. මෙකී සංශෝධන ද සමඟ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි සඳහන් යොමුකිරීම්වලට සිදුකරන ලද අනෙකුත් සංශෝධන සියල්ලක්ම ව්‍යවහාරකරනු ලබන්නේ නම් මෙකී සංශෝධනයද කලින් ව්‍යවහාරකරණයට ඉඩ දේ. SLFRS 6 සඳහා වූ සංශෝධන LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි ප්‍රමිතය අනුව අතීතයානුයෝගීව ව්‍යවහාර කල යුතුය. නමුත් අතීතයානුයෝගී ව්‍යවහාරය ප්‍රායෝගික නොවන විට හෝ එහි අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් පවතීනම් SLFRS 6 සඳහා වූ එකී සංශෝධනය LKAS 8 හි ඡේද 23 – 28, 50-53 හා 54ඊ අනුව සිදුකල යුතු වේ.

**SLFRS 7 - මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම**

වෙනස්කම් නැත.

**SLFRS 8 - මෙහෙයුම් ඛණ්ඩ**

වෙනස්කම් නැත.

**SLFRS 9 - මූල්‍ය සාධනපත්‍ර**

වෙනස්කම් නැත.

**SLFRS 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

වෙනස්කම් නැත.

**SLFRS 11 - බද්ධ සැකසුම්**

වෙනස්කම් නැත.

**SLFRS 12 - වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම**

වෙනස්කම් නැත.

**SLFRS 13 - සාධාරණ වටිනාකම් මිණුම් කිරීම**

වෙනස්කම් නැත.

**SLFRS 14 - නියාමන විලම්බන ගිණුම්**

වෙනස්කම් නැත.

**SLFRS 15 - ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින් වන අයභාරය**

වෙනස්කම් නැත.

**SLFRS 16 - කල්බදු**

වෙනස්කම් නැත.

**LKAS 1 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

7. **ප්‍රමාණාත්මක:**

~~**මූල්‍ය ප්‍රකාශයන් පදනම් කරගෙන පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි අයිතමයන්ගේ අත්හැරීම් හෝ අවප්‍රකාශ තනි තනිව හෝ සාමූහිකව ගත්කල හෝ බලපෑම් ඇති කල හැකි නම් එම අත්හැරීම් හෝ අවප්‍රකාශ ප්‍රමාණාත්මක වේ. අවට පවතින තත්වයන් තුල කරන විනිශ්චයන් අනුව අත්හැරීම් හෝ අවප්‍රකාශයේ තරම සහ ස්වභාවය මත ප්‍රමාණාත්මක බව රඳා පවතී. අයිතමයේ තරම හෝ ස්වභාවය හෝ ඒ දෙකෙහි සංයෝජනයක් නිර්ණය කිරීමේ සාධකය විය හැකිය.**~~

තොරතුරුවල ස්වභාවය හෝ වැදගත්කම (විශාලත්වය) හෝ ඒ දෙකම මත ප්‍රමාණාත්මක බව රඳා පවතී. අස්තිත්ත්වයක් මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස සම්බන්ධව ගත්කල එහි තොරතුරු ප්‍රමාණාත්මක දැයි අස්තිත්වයක් තක්සේරු කරන්නේ තනි තනිව හෝ අනෙකුත් තොරතුරු සමග සංයෝජනයෙන්ය.

එම තොරතුරු, මූල්‍ය ප්‍රකාශවලින් අත්හැරීම් හෝ අවප්‍රකාශවීම් හෝ හා සමාන බලපෑමක් ප්‍රාථමික පරිශීලකයින් සඳහා ඇති කල හැකි ආකාරයට ඒවා සන්නිවේදනය කර ඇත්නම් ඒවා අපැහැදිලි තොරතුරු වේ. ප්‍රමාණාත්මක තොරතුරු අපැහැදිලි බවට පත්වීමට ප්‍රතිඵලයක් විය හැකි තත්ත්වයන් පිළිබඳව උදාහරණ පහත පරිදි වේ:

(අ) ප්‍රමාණාත්මක අයිතමයක්, ගණුදෙනුවක් හෝ වෙනත් සිද්ධියක් සම්බන්ධයෙන් තොරතුරු, මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කරන නමුත් භාවිතාකල බස්වහර අවිනිශ්චිත හෝ අපැහැදිලිවීම;

(ආ) ප්‍රමාණාත්මක අයිතමයක, ගණුදෙණුවක හෝ වෙනත් සිද්ධියක් සම්බන්ධයෙන් තොරතුරු මූල්‍ය ප්‍රකාශ පුරාවටම විසිරී පැවතීම;

(ඇ) අසමාන අයිතම, ගණුදෙනු හෝ වෙනත් සිද්ධි නුසුදුසු පරිදි සමාහාරය කර තිබීම;

(ඈ) සමාන අයිතම, ගණුදෙනු හෝ වෙනත් සිද්ධි නුසුදුසු පරිදි එකට සමාහාරය කර නොතිබීම; සහ

(ඉ) කුමන තොරතුරු ප්‍රමාණාත්මකදැයි යන්න ප්‍රාථමික පරිශීලකයෙකුට නිර්ණය කිරීමට නොහැකි වන ප්‍රමාණයතෙක් ප්‍රමාණාත්මක නොවන තොරතුරුවල පැවැත්ම නොවැදගත් තොරතුරුවලින් සඟවා තැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශවල අවබෝධකර ගතහැකි බව අඩු වේ.

නිශ්චිත වාර්තාකරණ අස්තිත්වයක පොදු අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශවල ප්‍රාථමික පරිශීලකයින් විසින් එලඹී ආර්ථික තීරණවලට බලපෑමක් කිරීමට තොරතුරු අත්හැරීම් හෝ අවප්‍රකාශ සාධාරණව අපේක්ෂා කිරීමට හැකිදැයි තක්සේරු කිරීමට, අස්තිත්ත්වයේ ස්වකිය තත්ත්වයන් සලකා බලන අතරේ එම පරිශීලකයින්ගේ ගති ලක්ෂණ සැලකීම සලකාබැලීමද අස්තිත්ත්වයකට අවශ්‍ය වේ.

බොහෝ දැනට සිටින සහ අනාගත ආයෝජකයින්, ණයදෙන්නන් සහ ණයහිමියන්ට සෘජුවම තොරතුරු වාර්තාකරණ අස්තිත්ත්වයන් ලබාදීමට අවශ්‍ය නොවිය හැකි අතර ඔවුන්ට අවශ්‍ය බොහෝ මූල්‍ය තොරතුරු, පොදු අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශ මත විශ්වාස තැබිය යුතුයි. ඒ නිසාවෙන් ඔවුන් පොදු අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශවලට අවධානය යොමුකරන ප්‍රාථමික පරිශීලකයින් වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ ව්‍යාපාර සහ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ සාධාරණ දැනුමක් තිබෙන සහ උද්‍යෝගීමත්ව මනාලෙස තොරතුරු විමර්ශනය සහ විශ්ලේෂණය කිරීමට හැකි පරිශීලකයින් සඳහාය. ඇතැම්විට දැනුමැතිබව පෙන්වන සහ උද්‍යෝගිමත් පරිශීලකයින්ට පවා, සංකීර්ණ ආර්ථික සංසිද්ධියන් පිළිබඳ තොරතුරු අවබෝධකර ගැනීමට උපදෙස් දෙන්නෙකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය විය හැකිය.

~~ව්‍යාපාර සහ ආර්ථික ක්‍රියාකාරකම් සහ ගිණුම්කරණය පිළිබඳ සාධාරණ දැනුමක් සහ සාධාරණ උද්‍යෝගයකින් යුතුව තොරතුරු අධ්‍යයනයට කැමැත්තක් පරිශීලකයින්ට තිබෙන බව උපකල්පනය කෙරෙන~~

~~බව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවේ 25 ඡේදයේ සඳහන් වේ. එම නිසා එවැනි ලක්ෂණ සමඟ පරිශීලකයින් ආර්ථික තීරණ සිදු කිරීමේදී බලපෑම් කිරීම සාධාරණව කොපමණ අපේක්ෂා කරන්නේදැයි සැලකීමට තක්සේරුව අවශ්‍ය වේ.~~

………

**15. මූල්‍ය ප්‍රකාශ, අස්තිත්වයක මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ සාධාරණ ලෙස ඉදිරිපත් කළ යුතු ය.** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකලපනාත්මක රාමුවෙහි (සංකලපනාත්මක රාමුව) **දක්වා ඇති පරිදි වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් අර්ථ නිරූපනය කිරීම් හා හඳුනා ගැනීමේ නිර්නායකයන් අනුව ගනුදෙනුවල ප්‍රතිඵල, අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් විශ්වාසනීය ලෙස ඉදිරිපත් කිරීම සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වේ. අවශ්‍ය අවස්ථාවලදී අතිරේක හෙළි කිරීම් සහිතව** SLFRSs **භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙතැයි විශ්වාස කෙරේ.**

**19. අතිශයින්ම විරළ අවස්ථාවලදී ප්‍රමිතියක ඇති අවශ්‍යතාවයන් සමඟ අනුකූලවීම ආකෘතිමය රාමුවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශවල අරමුණු සමඟ ගැටෙන පරිදි නොමග යවන සුළුයයි කළමණාකරණය තීරණය කරන විට 20 වැනි ඡේදයේ දක්වා ඇති ආකාරයට, අස්තිත්වයට එම අවශ්‍යතාවයෙන් බැහැර විය හැකිය. එසේ කළ හැකිවන්නේ එවැනි බැහැර වීමක් අදාළ** සංකලපනාත්මක **ආකෘතිමය රාමුව විසින් අවශ්‍ය කරන විට හෝ එවැනි බැහැර වීමක් තහනම් කර නැති විටය.**

20 **………..**

**(ඇ) අස්තිත්වය බැහැර වී ඇති ප්‍රමිතියේ ශීර්ෂය ප්‍රමිතය අනුව ගත යුතු වූ ක්‍රියාමාර්ගය ඇතුලුව බැහැර වීමේ ස්වභාවය ආකෘතිමය රාමුවේ දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශවල අරමුණු හා ගැටිය හැකි එම තත්වයන්හිදී, එකී ක්‍රියාමාර්ගය නොමග යවන සුළු වීමට හේතුව භාවිතා කළ ක්‍රියාමාර්ගය, සහ**

**…………**

**23. ඉතාම විරල අවස්ථාවලදී ප්‍රමිති අවශ්‍යතාවයට අනුකූල වීම, ආකෘතිමය රාමුවේ දක්වා ඇති, මූල්‍ය ප්‍රකාශවල අරමුණු සමග ගැටෙන හෙයින් නොමඟ යවන සුළුයැයි කළමණාකරණය විසින් තීරණය කරන නමුත් අදාල නියාමන** සංකලපනාත්මක **ආකෘතිමය රාමුව අවශ්‍යතාවයේ බැහැරවීම තහනම් කරන විට අස්තිත්වය විසින් හැකි උපරිම ප්‍රමාණයට අනුකූල වීමෙන් සිදුවිය හැකියයි දකින නොමග යැවීම අඩු කිරීම සඳහා පහත කරුණු හෙළි කළ යුතුය.**

**(අ) ප්‍රශ්නයට තුඩු දී ඇති ප්‍රමිතියේ ශීර්ෂය, අවශ්‍යතාවයේ ස්වභාවය සහ** සංකලපනාත්මක **ආකෘතිමය රාමුවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශවල අරමුණු හා ගැටෙන හෙයින්, එම අවශ්‍යතාවය පිළිපැදීමෙන් නොමඟ යවන සුළුවේයැයි කළමනාකරණය විසින් තීරණය කිරීමට හේතුව, සහ**

………….

24. 19-23 ඡේද අවශ්‍යතාවයන් සඳහා, මූල්‍ය ප්‍රකාශවල අරමුණු සමග තොරතුරු අයිතමයක් ගැටිය හැකි වනුයේ, නියෝජනය වියයුතු හෝ නියෝජනය වේයයි සාධාරණව බලාපොරොත්තු විය හැකි ගනුදෙනු, අනෙකුත් සිදුවීම් හා තත්ත්වයන් විශ්වාසවන්තව නියෝජනය නොවන විට එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශ භාවිතා කරන්නන්ගේ ආර්ථික තීරණ ගැනීම කෙරෙහි බලපාන විට ය. ප්‍රමිතියක නිශ්චිත අවශ්‍යතාවයක් සමග අනුකූලවීම, සංකලපනාත්මක ආකෘතිමය රාමුවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ වල අරමුණු සමඟ ගැටිය හැකි හෙයින් නොමග යවන සුළු වේදැයි තක්සේරු කිරීමේ දී කළමනාකරණය පහත කරුණු සලකා බලයි.

(අ) විශේෂිත අවස්ථාවන්හිදී, මූල්‍ය ප්‍රකාශවල අරමුණු ඉටු නොවෙන්නේ ඇයි ද යන්න, සහ

(ආ) අවශ්‍යතාවය පිළිපදින වෙනත් අස්තිත්වයන්ට වඩා අස්තිත්වයේ තත්ත්වයන් වෙනස් වන්නේ කෙසේ ද? සමාන තත්ත්වයන්හිදී, අනෙකුත් අස්තිත්වයන් අවශ්‍යතාවය පිළිපදින්නේ නම්, සංකලපනාත්මක ආකෘතිමය රාමුවේ දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශවල අරමුණු සමග ගැටිය හැකි හෙයින් අස්තිත්වය මෙම අවශ්‍යතාවය පිළිපැදීම නොමග යවන සුළු නොවේ යයි උප මර්දනීය පූර්ව කල්පනයන් ඇති වේ.

28 උපචිත පදනම් ගිණුම්කරණය භාවිතා කරන විට, වත්කම්, වගකීම් ස්කන්ධය, ආදයම් වියදම් සඳහා සංකලපනාත්මක ආකෘතිමය රාමුවේ ඇති එම මූලිකාංගවල නිර්වචන සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලන විට අස්තිත්වයක් විසින් එම අයිතම වත්කම, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් (මූල්‍ය ප්‍රකාශ වල මූලිකාංග) ලෙස අස්තිත්වයක් හඳුනා ගනී.

89. ප්‍රවර්තන කාලපරිච්ඡේදයේදී අස්තිත්වයක් විසින් විශේෂ අයිතමයන් ලාභ හෝ අලාභවලට බාහිරව හඳුනා ගත යුත්තේ කුමන අවස්ථාවලදී ද යන්න සමහර SLFRSs නිශ්චය කරයි. LKAS 8 එවන් අවස්ථාවන් දෙකක් නිශ්චය කරයි. වැරදි නිවැරදි කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් නිසා වන බලපෑම, සංකලපනාත්මක ආකෘතිමය රාමුවේ ආදායම් සහ වියදම් සඳහා වන නිර්වචන සපුරාලන වෙනස් විස්තීර්ණ ආදායම් වල සංරචක ලාභ හෝ අලාභවලින් බැහැර කිරීමට වෙනත් SLFRSs මගින් අවශ්‍ය කෙරේ හෝ අවසර දේ. (7 වන ජේදය බලන්න)

139ට ~~[තවමත් බලාත්මක නැති සංශෝධනවලට මෙම ජේදය යොමු කරන අතර එම නිසා මෙම සංස්කරණයේදී ඇතුලත් කර නැත]~~

2018 දී නිකුත්කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමුකිරීම්වල සංශෝධන, 7, 15, 19-20, 23-24, 28 හා 89 ඡේද සංශෝධනය කර ඇති අතර එකී සංශෝධනය 2020 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා භාවිතාකල යුතුය. මෙකී සංශෝධන ද සමඟ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි සඳහන් යොමුකිරීම්වලට සිදුකරන ලද අනෙකුත් සංශෝධන සියල්ලක්ම ව්‍යවහාරකරනු ලබන්නේ නම් මෙකී සංශෝධනයද කලින් ව්‍යවහාරකරණයට ඉඩ දේ. LKAS 1 සඳහා වූ සංශෝධන LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි ප්‍රමිතය අනුව අතීතයානුයෝගීව ව්‍යවහාර කල යුතුය. නමුත් අතීතයානුයෝගී ව්‍යවහාරය ප්‍රායෝගික නොවන විට හෝ එහි අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් පවතීනම් LKAS 1 සඳහා වූ එකී සංශෝධන LKAS 8 හි ඡේද 23 – 28, 50-53 හා 54ඊ අනුව සිදුකල යුතු වේ.

139ඩ 2018 නොවැම්බර් මස නිකුත් කල ප්‍රමාණාත්මක යන නිර්වචනය, (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01ට සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි සංශෝධන), ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 7 ඡේදය සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 5 ඡේදය සංශෝධනය කරන අතර ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 6 ඡේදය ඉවත් කර ඇත. අස්තිත්ත්වයක් 2020 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අනාගතානුයෝගිව මෙම සංශෝධන ව්‍යවහාර කලයුතුයි. මෙම සංශෝධන කලින් ව්‍යවහාර කිරිමට අවසර දේ. කලින් කාලපරිච්ඡේදයක් සඳහා මෙම සංශෝධන අස්තිත්ත්වයක් ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කල යුතු වේ.

## LKAS 2- තොග

~~**සේවා සපයන්නකුගේ තොග පිරිවැය**~~

19 [ඉවත් කරන ලදී]

## LKAS 7- මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වෙනස්කම් නැත.

## LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

5 ~~ප්‍රමාණාත්මක, අයිතම් මගහැරීම හෝ නිසි ලෙස නොදැක්වීම, ඒවා තනි තනිව හෝ එකිනෙක එකතුව හෝ, මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒවා භාවිතා කරන්නන් කරනු ලබන ආර්ථිකමය තීරණ කෙරෙහි බලපාන්නේ නම් ඒවා ප්‍රමාණාත්මක වේ. ප්‍රමාණාත්මකතාවය අවම තත්වයන් හා නිගමනය කරන කල මගහැරීම හෝ නිසිලෙස නොදැක්වීමේ විශාලත්වය හා ස්වභාවය මත රඳා පවතියි. අයිතමයේ ප්‍රමාණය හෝ ස්වභාවය හෝ ඒ දෙකෙහිම සංකලනයක් නිගමනය කිරීමේ සාධකය විය හැක.;~~

**ප්‍රමාණාත්මක යන්න LKAS 7 හි 7 ඡේදය මගින් නිර්වචනය කර තිබෙන අතර එය එම තේරුමෙන්ම මෙම ප්‍රමිතයේදී ද භාවිතා වේ.**

6. ~~අත්හැරීමක් හෝ අවප්‍රකාශයක් පරිශීලකයන්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ ද එනම් ප්‍රමාණාත්මක ද යන්න තක්සේරු කිරීමේදී එකී පරිශීලකයන්ගේ අනුලක්ෂණ සලකා බැලිය යුතු ය. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ රාමුවේ 25 වැනි ඡේදයෙහි ව්‍යාපාරය සහ ආර්ථික ක්‍රියාකාරකම් සහ ගිණුම්කරණය පිළිබඳ සාධාරණ දැනුමක් සහ සාධාරණ උද්යෝගයකින් යුතුව තොරතුරු අධ්‍යයනයට කැමැත්තක් පරිශීලකයන්ට තිබෙන බවට උපකල්පනය කරයි, යනුවෙන් සඳහන් වේ. එම නිසා එවැනි ලක්ෂණවලින් යුත් පරිශීලකයන් ආර්ථික තීරණ ගැනීමේ දී කෙසේ බලපෑමක් ඇති කරයි ද යන්න තක්සේරුවේ දී සලකා බැලිය යුතු ය.~~

[ඉවත් කරන ලදී]

11 …….

**(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකලපනාත්මක රාමුවෙහි (සංකලපනාත්මක රාමුව)[2] වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් සඳහා වූ නිර්වචන, හඳුනා ගැනීමේ උපමාන, සහ මිණුම් සංකල්ප.**

2. 54උ–ඡේදය නියාමන ගිණුම් සඳහා මෙම අවශ්‍යතාවය සංශෝධනය කර ඇත්තේ කෙසේ ද යන්න විස්තර කරනු ලබයි.

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

54 …….

~~**54**උ- 54ඌ [තවමත් බලාත්මක නැති සංශෝධනවලට මෙම ඡේදය යොමු කරන අතර එම නිසා මෙම සංස්කරණයේදී ඇතුලත් කර නැත]~~

54උ 2018 වර්ෂයේදී නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි සඳහන් සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමු කිරීම් වලට වන සංශෝධන, 6 සහ 11 (ආ) ඡේද සංශෝධනය කර ඇත. යම් අස්තිත්ත්වයක් විසින් මෙකී සංශෝධන, 2020 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා ව්‍යවහාර කල යුතුය. මෙකී සංශෝධන කලින් ව්‍යවහාර කරනු ලබන්නේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි සඳහන් සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමු කිරීම්වල වන සංශෝධන හි සඳහන් අනෙකුත් සංශෝධන සියල්ලක්ම ඒ සමඟ ව්‍යවහාර කල යුතුය. කිසියම් අස්තිත්ත්වයක් 6 හා 11 (ආ) යන ඡේද සඳහා වන සංශෝධන මෙම ප්‍රමිතයට අනුව අතීතයානුයෝගීව ව්‍යවහාර කල යුතුය. ය. නමුත් *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි සඳහන් සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමු කිරීම්* වලට වන සංශෝධන අතීතයානුයෝගී ව්‍යවහාරය ප්‍රායෝගික නොවන විට හෝ එහි අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් පවතීනම් ඡේද 23 – 28 ව්‍යවහාර කිරීමේ 27 ඡේදයෙහි යොමු කිරීම් හැර අනෙක් යොමු කිරීම් වල ප්‍රායෝගික නොවන විට යන්න අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් පවතීනම් ලෙසත් ප්‍රායෝගික යන්න අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයකින් තොරව කල හැකි ලෙසත කියවිය යුතුය.

54ඌ කිසියම් අස්තිත්ත්වයක් විසින් SLFRS 14 නියාමන විලම්භ ගිණුම් ශේෂයන් යොදා නොගන්නේ නම් 11 (ආ) ඡේදය යොදා ගනිමින් තවදුරටත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන රාමුවෙහි සඳහන් නිර්වචන, හඳුනාගැනීමේ නිර්ණායක සහ මිනුම්කරණ සංකල්ප භාවිතා කළ යුතු අතර සංකල්පනාත්මක රාමුව ඒ සඳහා භාවිතා නොකළ යුතුය. නියාමන ගිණුම් ශේෂයක් යනු අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා නොගන්නා වියදකමක් (හෝ ආදායමක්) වන එහෙත් ගණුදෙනුකරුවකුගෙන් අයකරගත හැකි ගාස්තුව නිර්ණය කිරීමේදී ගාස්තු නියාමක විසින් විසින් ඇතුලත් කරනු ලබන්න ක් හෝ ඇතුලත් කිරීමට අපේක්ෂා කරනු ලබන්නකි. ගාස්තු නියාමක යනු, අස්තිත්ත්වයක් බැදෙන ගාස්තුව හෝ ගාස්තු පරාසයක් ස්ථාපනය කරන ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් බලගැන්වෙන අනුමත මණ්ඩලයකි. ගාස්තු නියාමක තුන්වන පාර්ශව මණ්ඩලයක්ල අස්තිත්ත්වයේ සම්බන්ධිත පාර්ශවයක් හෝ ගණුදෙණුකරුවන්ගේ යහපත සහ අස්තිත්ත්වයේ සමස්ථ මූල්‍ය ස්වශක්තතාවය තහවුරු කිරීම යන කරුණු දෙකම සඳහා ගාස්තු නියම කිරීමට ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් අනිවාර්යය කර ඇතිවිට අස්තිත්ත්වයේ ස්වකීය පාලන මණ්ඩලයද විය හැක.

54එ 2018 නොවැම්බර් මස නිකුත් කල ප්‍රමාණාත්මක යන නිර්වචනය (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි සංශෝධන) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 7 ඡේදය සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 5 ඡේදය සංශෝධනය කරන අතර ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 6 ඡේදය ඉවත් කර ඇත. අස්තිත්ත්වයක් 2020 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අනාගතානුයෝගිව මෙම සංශෝධන ව්‍යවහාර කල යුතුයි. මෙම සංශෝධන කලින් ව්‍යවහාර කිරිමට අවසර දේ. කලින් කාලපරිච්ඡේදයක් සඳහා මෙම සංශෝධන අස්තිත්ත්වයක් ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කල යුතු වේ.

## LKAS 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

**21. වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු නොගලපන සිදුවීම් ප්‍රමාණාත්මක වේ නම් යම් නිශ්චිත වාර්තාකරණ අස්තිත්වයක සම්බන්ධයෙන මූල්‍ය තොරතුරු ලබා ලබා දෙන පොදු අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන වල ඒවා හෙළිදරව් නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාථමික පරිශීලකයන් විසින් ඒ අනුසාරයෙන් ගනු ලබන ආර්ථික තීරණ කෙරහි බලපෑමක් ඇති ~~වේ~~ කරන ඇතැය සාධාරණව අපේක්ෂා කෙරේ. ඒ අනුව**

**අස්තිත්වයක් විසින් වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු නොගලපන එක් එක් වර්ගයේ ප්‍රමාණාත්මක සිදුවීම් පිළිබඳ පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතු යඃ**

**(අ) සිදුවීමේ ස්වභාවය; සහ**

**(ආ) එහි මූල්‍යමය බලපෑමේ ඇස්තමේන්තුවක් හෝ එසේ ඇස්තමේන්තුවක් කළ නොහැකි නම් ඒ බවට ප්‍රකාශයක්.**

23ඇ 2018 නොවැම්බර් මස නිකුත් කල ප්‍රමාණාත්මක යන නිර්වචනය (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි සංශෝධන) සංශෝධනය 21 වන ඡේදය කර ඇත. අස්තිත්ත්වයක් 2020 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන අනාගතානුයෝගිව ව්‍යවහාර කල යුතුයි. කලින් කාලපරිච්ඡේදයක් සඳහා මෙම සංශෝධන අස්තිත්ත්වයක් ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කල යුතුවේ. මෙම සංශෝධන කලින් ව්‍යවහාර කිරිමට අවසර දේ. අස්තිත්ත්වය ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 7 ඡේදය සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 5 සහ 6 ඡේද ප්‍රමාණාත්මක යන නිර්වචනය සංශෝධනය කර ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කල යුතුයි.

## LKAS 12 - ආදායම් බදු

වෙනස්කම් නැත.

## LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ

**නිර්වචන**

**6. නැවත අය කරගත හැකි අගය යනු වත්කමක ~~ශුද්ධ විකුණුම් මිල~~ <u>සාධාරණ අගයෙන් බැහැර කිරීමේ පිරිවැය අඩුකළ අගය</u> හා එහි භාවිත කිරීමේ අගය යන දෙකින් වැඩි අගයයි.**

81ඊ 2013 අප්‍රේල් නිකුත්තළ SLFRS 13 2013 අප්‍රේල් නිකුත් කළ, හය වන ඡේදයේ සාධාරණ අගය පිළිබඳ නිර්වචනය <u>හා නැවත අය කරගත හැකි අගය පිළිබඳ නිර්වචනය</u> වෙනස් කරන ලදි. 26, 35 සහ 77 ඡේදයන් සංශෝධනය කිරීම සහ ඉවත් කල ඡේද 32 සහ 33 යන ඡේද ඉවත් කරන ලදි. අස්තිත්වයක් SLFRS 13 ව්‍යවහාර කරන කල්හි, ඒ සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

## LKAS 19 - සේවක ප්‍රතිලාභ

වෙනස්කම් නැත.

## LKAS 20 - රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණ සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම

වෙනස්කම් නැත.

## LKAS 21 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම් වල බලපෑම්

වෙනස්කම් නැත.

## LKAS 23 - ණයගැනුම් පිරිවැය

වෙනස්කම් නැත.

## LKAS 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිකිරීම

11 මෙම ප්‍රමිතයේ පද සම්බන්ධය තුළ පහත දක්වෙන ඒවා සම්බන්ධිත පාර්ශව නොවන්නේය;

(අ) අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු අස්තිත්වයන් දෙකක පොදුවේ කටයුතු කිරීම නිසා හෝ එක් අස්තිත්වයක ප්‍රධාන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් අනෙක් අස්තිත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කිරීමේ හේතුව පමණකින්ම;

(ආ) හුදෙක් බද්ධ ව්‍යාපාරයක බද්ධ පාලනය බෙදාගන්නා ව්‍යාපාරිකයින් දෙදෙනෙක් වූ පමණින්ම;

~~(ඇ)~~ (i) මූල්‍ය සම්පාදකයන්,

(ii) වෘත්තිය සමිති,

(iii) මහජන උපයෝගිතා සම්පාදකයන්, සහ

(iv) වාර්තාකරන අස්තිත්වයේ පාලනය, බද්ධ පාලනය හෝ සැළකිය යුතු බලපෑමක් නොකරන රජයේ දෙපාර්තමේන්තුවක් හෝ නියෝජනායතනයක් ;

<u>(ඈ)</u> හුදෙක් අස්තිත්වයක් සමග කරන සාමාන්‍ය කටයුතු හා සම්බන්ධ වීම නිසා (ඔවුන් විසින් අස්තිත්වයක කටයුතු කිරීමේ නිදහසට බලපෑම් ඇතිවීම හෝ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වුව ද):

(ඇ) අස්තිත්වය සමග සැලකිය යුතු තරම් ව්‍යාපාර කටයුතු ප්‍රමාණයක් කරන ගනුදෙනුකරුවෙක්, සැපයුම්කරුවෙක්, බලයලත්තෙක්, බෙදාහරින්නෙක් හෝ සාමාන්‍ය නියෝජිතයෙක් හුදෙක් ආර්ථිකමය යැපීම හේතුකොට ගෙන.

**LKAS 26 - විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තා කරණය**

වෙනස්කම් නැත.

**LKAS 27 - වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන**

වෙනස්කම් නැත.

**LKAS 28 - ආශ්‍රිතයන්හි ආයෝජන සහ බද්ධ ව්‍යාපාර**

42 ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක ආයෝජනයේ කොටසකින් සෑදෙන ධාරණ අගයේ කිර්තිනාමයකොටසක්වීම හේතුවෙන්, වෙන්ව හදුනා නොගන්නා නිසා LKAS 36 වත්කම් හාණිකරනයෙහි කීර්තිනාමය සඳහාහාණිකරන පරික්ෂාව ව්‍යවහාර කිරීමේ අවශ්‍යතා මගින් හාණිකරන සඳහා එය වෙන්ව පරීක්‍ෂා නොකරයි. ඒ වෙනුවට ඕනෑම අවසථාවක වෙලාවක 41අ - 41ඇ ව්‍යවහාරකරණය කිරීමේදී ආයෝජනය හාණිකරනය වී ඇති බව හගවයි නම්, ආපසු අයකර ගතහැකි වටිනාකම (ප්‍රයෝජන අගයේ භාවිතයේ ඉහළ වටිනාකම සහ සාධාරණ අගයෙන් ~~විකිණීමට~~ <u>බැහැර කිරීමේ</u> පිරිවැය අඩුකර) එහි ධාරණ අගය සමඟ සැසඳීම මගින්, තනි වත්කමක් ලෙෂ LKAS 36 ප්‍රකාර ආයෝජනයේ සම්පූර්ණ ධාරණ අගය හානිකරණය සඳහා පරික්‍ෂා කරයි. එවැනි අවස්ථාවලදී හදුනාගන්නා හාණිකරණන අලාභයක් ආශ්‍රිතයේ හෝ බද්ධ ව්‍යාපාරයෙහි ආයෝජනයේ ධාරණ අගයේ කොටසක් වන කීර්තිනාමය ඇතුලත්ව කිසිම වත්කමකට වෙන් නොකරයි. ඒ අනුව ඒ හාණිකරන අලාභයේ යම් ප්‍රතිවර්ත්‍ය කිරීමක් ආයෝජනයේ පසුව ඇතිවන ආපසු අයකරගැනිමේ මුදලේ වැඩිවීමේ ප්‍රමාණයට, LKAS 36 ප්‍රකාර හදුනා ගනී. ආයෝජනයේ ප්‍රයෝජන වටිනාකම නිර්නය කිරීමේදී අස්තිත්වයක් පහත දැ ඇස්තමේන්තු කරයි.

**LKAS 29 - අති උද්ධමනකාරී ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරනය**

වෙනස්කම් නැත.

**LKAS 32 - මූල්‍ය සාධනපත්‍ර ඃ ඉදිරිපත් කිරීම**

වෙනස්කම් නැත.

**LKAS 33 - කොටසක ඉපැයුම්**

වෙනස්කම් නැත.

**LKAS 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය**

24. ~~කිසියම් අයිතමයක අත්හැරීම හෝ සාවද ලෙස ප්‍රකාශ කිරීම මුල්‍ය ප්‍රකාශන පරිශීලකයන් මුල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන ආර්ථික තීරණ වලට බලපෑමක් ඇති කරන්නේ නම් මෙම අයිතමය ප්‍රමාණාත්මක බව~~ LKAS 1 ~~සහ LKAS 8 ගිණුම්කරන ප්‍රතිපත්ති, ගිණුම්කරන ඇස්තමේන්තුවල වෙනස් වීම් සහ වැරදි ප්‍රමිත වලින්~~ ප්‍රමිතය ප්‍රමාණාත්මක තොරතුරු යන්න නිර්වචනය ~~කරයි.~~කරන අතර ~~LKAS 1~~ එකී ප්‍රමිතයෙන් ප්‍රමාණාත්මක අයිතමයන් පිළිබඳව (උදාහරණයක් වශයෙන්) අසන්තතික මෙහෙයුම් ද ඇතුළත්ව වෙනම හෙළිදරව් කිරීම අවශ්‍ය ~~වන අතර~~ <u>කෙරේ.</u> ගිණුම්කරන ඇස්තමේන්තුවල වෙනස්වීම් වැරදි සහ ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස් කිරීම් හෙළිදරව් කිරීම LKAS 8 <u>*ගිණුම්කරන ු තිපත්ති, ගිණුම්කරන ඇස්තමේන්තුවල වෙනස් වීම් සහ වැරදි*</u> ප්‍රමිතය අනුව අවශ්‍ය වේ. ප්‍රමාණාත්මක භාවය පිළිබඳව ප්‍රමාණකර දැක්වීමත් මේ මග පෙන්වීමත් පිළිබඳව මෙම ප්‍රමිත දෙකෙහි මගපෙන්වීමක් අඩංගු නොවේ.

31. මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ~~සහ ඉදිරිපත් කිරීම~~ සඳහා වූ සංකල් පනාත්මක අකෘතිමය රාමුව (සංකල් පනාත්මක ආකෘතිමය රාමුව) යටතේ හඳුනාගැනීම යනු මූල්‍ය ප්‍රකාශනයන්හි මූලිකාංගයක නිර්වචනය සපුරාලන ~~සහ "හඳුනා ගැනීම සඳහා වූ උපධාන තෘප්ත කරන~~ අයිතමයක් ~~ශේෂ පත්‍රයේ~~ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෝ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයනනහි (යේ) ~~ආදායම් ප්‍රකාශයේ~~ ඇතුළත් ~~කිරී~~මේ කිරීම සඳහා සොයා ගැනීමේ ක්‍රියාවලියයි." වාර්ෂික සහ අතුරු මුල්‍ය වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් දින දෙකේදීම වත්කම්, වගකීම් අදායම් හා වියදම් වල නිර්වචන හඳුනාගැනීම කෙරෙහි මූලික වේ.

33 ආදායම් (අයහාර) සහ වියදම් වල අත්‍යවශ්‍යම ලක්‍ෂණයක් වන්නේ සම්බන්ධිත වත්කම් සහ වගකීම් වල ගලා ඒම් සහ ගලා යාම් දැනටමත් සිදුවී තිබීමයි. එම ගලා ඒම් සහ ගලා යාම් සිදුවී තිබේ නම් සම්බන්ධිත අයහාර සහ වියදම් හඳුනා ගැනේ ; නැත්නම් ඒවා හඳුනා නොගැනේ. ~~විශ්වාසනීය ලෙස මැනිය හැකි, වගකීමක වැඩිවීමක් හෝ වත්කමක අඩුවීමක් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අඩුවීමක් පැන නැගී ඇති විටෙක ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනා ගන්නා බව ආකෘතිමය රාමුවේ සඳහන් වේ.~~ වත්කම් හෝ වගකීම් වල නිර්වචනය හා අනුකූල නොවන අයිතම් ~~ශේෂ පත්‍රයෙහි~~ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගැනීමට සංකල් පනාත්මක අකෘතිමය රාමුවෙන් අවකාශ නොලැබේ.

58 ~~*[තවමත් බලාත්මක නැති සංශෝධනවලට මෙම ඡේදය යොමු කරන අතර එම නිසා මෙම සංස්කරණයේදී ඇතුලත් කර නැත]*~~

2018 දී නිකුත්කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුව සඳහා වන යොමුකිරීම්වල සංශෝධන, 31 හා 33 ඡේද සංශෝධනය කර ඇති අතර එකී සංශෝධන 2020 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා භාවිතාකල යුතුය. මෙකී සංශෝධන ද සමඟ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි සඳහන් යොමුකිරීම්වලට සිදුකරන ලද අනෙකුත් සංශෝධන සියල්ලක්ම ව්‍යවහාරකරනු ලබන්නේ නම් මෙකී සංශෝධනයද කලින් ව්‍යවහාරකරණයට ඉඩ දේ. LKAS 34 සඳහා වූ සංශෝධන LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි ප්‍රමිතය අනුව අතීතයානුයෝගීව ව්‍යවහාර කල යුතුය. නමුත් අතීතයානුයෝගී ව්‍යවහාරය ප්‍රායෝගික නොවන විට හෝ එහි අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් පවතීනම් LKAS 34 සඳහා වූ එකී සංශෝධන මෙම ප්‍රමිතයේ 43-44 අනුව හා LKAS 8 හි ඡේද 23 – 28, 50-53 හා 54ඊ අනුව සිදුකල යුතු වේ.

59. 2018 නොවැම්බර් මස නිකුත් කල ප්‍රමාණාත්මක යන නිර්වචනය (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01ට සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8ට සංශෝධන) 24 වන ජේදය සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් 2020 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අනාගතානුයෝගිව මෙම සංශෝධන ව්‍යවහාර කල යුතුයි. කලින් කාලපරිච්ඡේදයක් සඳහා මෙම සංශෝධන අස්තිත්ත්වයක් ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කල යුතු වේ. මෙම සංශෝධන කලින් ව්‍යවහාර කිරීමට අවසර දේ.අස්තිත්ත්වයක් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 7 ඡේදය සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 5 සහ 6 ඡේදවල ප්‍රමාණාත්මක යන්න නිර්වචනයට සංශෝධන ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කල යුතුයි.

## LKAS 36 - වත්කම් හානිකරණය

වෙනස්කම් නැත.

## LKAS 37 - ප්‍රතිපාදන,අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්

**10. වගකීමක් යනු අතීත සිදුවීම් වලින් පැනනගින, පියවීමේ දී ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලායනු ඇතැයි අපේක්ෂා කරන අස්තිත්වයේ වර්තමාන බැඳීමකි.**

[1] මෙම ප්‍රමිතයේ **වගකීම්** යන නිර්වචනය 2018 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි **වගකීම්** යන නිර්වචනය සංශෝධනය කිරීම හේතු කොටගෙන සංශෝධනය කර නැත

44උ෴ 2013 අප්‍රේල් නිකුත්කළ SLFRS 13 කිරීම සාධාරණ වටිනාකම මිණුම් කරණය, අ පරිශිෂ්ඨයෙහි සාධාරන වටිනාකම නිර්වචනය හා නැවත අය කරගත හැකි අගය පිළිබඳ නිර්වචනය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 13 ව්‍යවහාර කරන, කල්හි ඒ ~~සංශෝධනය~~ සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

75. වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයට පෙර ප්‍රතිව්‍යුහගතකරණය පිණිස ගෙන ඇති කළමනාකරණ හෝ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක්, අස්තිත්වය වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයට පෙර;

(අ) ප්‍රතිව්‍යුහගත සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර; හෝ

(ආ) ප්‍රතිව්‍යුහගතකරණයෙන් බලපෑමක් ඇතිවන අය තුළ අස්තිත්වය විසින් ප්‍රතිව්‍යුහගත කිරීම සිදුකරන බවට වලංගු අපේක්ෂාවක් ඇති කෙරෙන තරම් ප්‍රමාණවත් පරිදි, එහි ප්‍රධාන ලක්ෂණ නිවේදනය කර, ඇත්නම් හැර වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ දී සම්මුතික බැඳීමකට තුඩු නොදෙන්නේ ය. අස්තිත්වයක් වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරන්නේ නම් හෝ බලපෑමක් ඇති අයට එහි ප්‍රධාන ලක්ෂණ නිවේදනය කරන්නේ නම්, සහ ප්‍රතිව්‍යුහගතකරණය හෙළිදරව් නොකළහොත් අස්තිත්වයක සම්බන්ධයෙන මූල්‍ය තොරතුරු ලබා ලබා දෙන පොදු අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන වල ඒවා හෙළිදරව් නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාථමික පරිශීලකයන් විසින් ඒ අනුසාරයෙන් ගනු ලබන ආර්ථික තීරණ කෙරහි බලපෑමක් ඇති ~~වේ~~ කරන ඇතැය සාධාරණව අපේක්ෂා කෙරේ~~මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ඒවා භාවිතා කරන්නන්ගේ ආර්ථික තීරණවලට බලපෑ හැකි තරම් ප්‍රමාණාත්මක වේ~~ නම් LKAS 10 වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු හට ගන්නා සිදුවීම් යටතේ හෙළිදරව් කිරීම අවශ්‍ය වේ.

104 2018 නොවැම්බර් මස නිකුත් කල ප්‍රමාණාත්මක යන නිර්වචනය (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 ට සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 සංශෝධන) 75 වන ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක 2020 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අනාගතානුයෝගිව මෙම සංශෝධන ව්‍යවහාර කල යුතුයි. කලින් කාලපරිච්ඡේදයක් සඳහා මෙම සංශෝධන අස්තිත්ත්වයක් ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කල යුතුවේ. මෙම සංශෝධන කලින් ව්‍යවහාර කිරීමට අවසර දේ. අස්තිත්ත්වයක් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 7 ඡේදය සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 හි 5 සහ 6 ඡේදවල ප්‍රමාණාත්මක යන්න නිර්වචනයට සංශෝධන ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කල යුතුයි.

## LKAS 38 - අස්පෘශ්‍ය වත්කම්

**8. (අ) වත්කමක් යනු සම්පතක්, වන අතර අතීත සිදුවීම් හේතු කොටගෙන අස්තිත්වයයක් විසින් පාලනය කරනු ලබන, සහ**

**(ආ) අස්තිත්වයට එමඟින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා එනු ඇතැයි අපේක්ෂිත සම්පතකි.**

[1] මෙම ප්‍රමිතයේ **වත්කම්** යන නිර්වචනය 2018 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි **වත්කම්** යන නිර්වචනය සංශෝධනය කිරීම හේතු කොටගෙන සංශෝධනය කර නැත.

## LKAS 39 - මූල්‍ය සාධනපත්‍ර හඳුනාගැනීම සහ මැණීම

වෙනස්කම් නැත.

## LKAS 40 - ආයෝජන දේපළ

වෙනස්කම් නැත.

## LKAS 41 - කෘෂිකර්මය

වෙනස්කම් නැත.

## මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව

පටුන

*ඡේදය*

*සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* පරමාර්ථය සහ තත්ත්වය **SP1.1**

1 වන පරිච්ඡේදය - පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ අරමුණු

හැඳින්වීම **1.1**

පොදු පරමාර්ථ වෙනුවෙන් වූ මූල්‍ය වාර්තාකරණයෙහි අරමුණ, ප්‍රයෝජනවත් බව සහ සීමාකාරී තත්ත්වයන් **1.2**

වාර්තා වන අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්, අස්තිත්ත්වයට එරෙහි හිමිකම් පෑම් සහ සම්පත් සහ හිමිකම්පෑම් වල වෙනස්වීම් පිළිබඳ තොරතුරු **1.12**

ආර්ථික සම්පත් සහ හිමිකම් පෑම් **1.13**

ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම් වල වෙනස්වීම් **1.15**

උපචිත ගිණුම්කරණය මඟින් පිළිබිඹු වන මූල්‍ය කාර්ය සාධනය **1.17**

අතීත මුදල් ප්‍රවාහ මගින් පිළිබිඹු වන මූල්‍ය කාර්ය සාධනය **1.20**

මූල්‍ය කාර්ය සාධනයෙන් ප්‍රතිඵලයක් නොවන ආර්ථික සම්පත්වල සහ හිමිකම්පෑම් වල වෙනස්කම් **1.21**

අස්තිත්ත්වයක ආර්ථික සම්පත් භාවිතය පිළිබඳ තොරතුරු **1.22**

2 වන පරිච්ඡේදය - ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගති ලක්ෂණ

හැඳින්වීම **2.1**

ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණ **2.4**

මූලික ගුණාත්මක ගතිලක්ෂණ **2.5**

ගුණාත්මක ගතිලක්ෂණ වර්ධනය කිරීම **2.23**

ඵලදායි මූල්‍ය වාර්තාකරණය මත පිරිවැය සීමා කිරීම **2.39**

3 වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රකාශ සහ වාර්තාකරණ අස්තිත්ත්වය

මූල්‍ය ප්‍රකාශ **3.1**

මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථය සහ විෂය පථය **3.2**

වාර්තාකරණ කාලපරිච්ඡේදය **3.4**

මූල්‍ය ප්‍රකාශ වල පිළිගත් සාපේක්ෂ වැදගත්කම පිළිබඳ අදහස **3.8**

අඛණ්ඩ පැවැත්මෙහි උපකල්පන **3.9**

වාර්තාකරණ අස්තිත්ත්වය **3.10**

ඒකාබද්ධ සහ ඒකාබද්ධ නොවන මූල්‍ය ප්‍රකාශ **3.15**

4 වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග


| | |
|---|---|
| හැඳින්වීම | **4.1** |
| වාර්තාකරණ ඒකකය | **4.3** |
| හිමිකම | **4.6** |
| ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදන හැකියාවන් | **4.14** |
| පාලනය | **4.19** |
| වගකීමක නිර්වචනය | **4.26** |
| බැඳීම | **4.28** |
| ආර්ථික සම්පතක් පැවරීම | **4.36** |
| අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙසට වන වර්තමාන බැඳීම | **4.42** |
| වත්කම් සහ වගකීම් | **4.48** |
| ගිණුම් ඒකකය | **4.48** |
| පසුව ඉටුකිරීමේ ගිවිසුම් | **4.56** |
| ගිවිසුම් හිමිකම්වල සහ ගිවිසුම් බැඳීම්වල හරය | **4.59** |
| ස්කන්ධයක නිර්වචනය | **4.63** |
| ආදායම් සහ වියදම්වල නිර්වචන | **4.68** |


5 වන පරිච්ඡේදය - හඳුනාගැනීම සහ ප්‍රති හඳුනාගැනීම


| | |
|---|---|
| හඳුනාගැනීමේ ක්‍රියාවලිය | **5.1** |
| හඳුනාගැනීමේ නිර්ණායකයන් ඃ | **5.6** |
| අදාළත්වය | **5.12** |
| විශ්වාසනීය නියෝජනය | **5.18** |
| ප්‍රති හඳුනාගැනීම | **5.26** |


6 වන පරිච්ඡේදය - මිනුම්කරණය


| | |
|---|---|
| හැඳින්වීම | **6.1** |
| ඇගයීමේ පදනම් ඃ | **6.4** |
| ඓතිහාසික පිරිවැය | **6.4** |
| ප්‍රවර්තන වටිනාකම | **6.10** |
| විශේෂ ඇගයීමේ පදනමින් ඉදිරිපත් කෙරෙන තොරතුරු ඃ | **6.23** |
| ඓතිහාසික පිරිවැය | **6.24** |
| ප්‍රවර්තන වටිනාකම | **6.32** |
| මැනුම් පදනමක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක ඃ | **6.43** |
| අදාළත්වය | **6.49** |
| විශ්වාසනීය නියෝජනය | **6.58** |

| | |
|---|---|
| ගුණාත්මක ගතිලක්ෂණ ඉහළ නැංවීම සහ පිරිවැය සීමා කිරීම් | **6.63** |
| ආරම්භක මිනුම්කරණයට නිශ්චිත සාධක | **6.77** |
| එකකට වඩා වැඩි මිනුම්කරණ පදනම | **6.83** |
| අස්තිත්ත්වයක් මිනුම්කරණය | **6.87** |
| මුදල් ප්‍රවාහ පදනම් කෙරෙන මිනුම්කරණ ශිල්ප ක්‍රම | **6.91** |

7 වන පරිච්ඡේදය - ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම

| | |
|---|---|
| සන්නිවේදන මෙවලම් ලෙසට ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම | **7.1** |
| ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ පරමාර්ථ සහ මූලධර්ම | **7.4** |
| වර්ගීකරණය | **7.7** |
| වත්කම් හා වගකීම් වල වර්ගීකරණය | **7.9** |
| ස්කන්ධය වර්ගීකරණය කිරීම | **7.12** |
| ආදායම් හා වියදම් වර්ගීකරණය කිරීම | **7.14** |
| සමාහරණය | **7.20** |

8 වන පරිච්ඡේදය - ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන නඩත්තුව පිළිබඳ සංකල්පයන්

| | |
|---|---|
| ප්‍රාග්ධනයෙහි සංකල්ප | **8.1** |
| ප්‍රාග්ධන නඩත්තුව සහ ලාභය නිර්ණය කිරීමෙ සංකල්ප | **8.3** |
| ප්‍රාග්ධන නඩත්තු ගැලපීම් | **8.10** |

පරිශිෂ්ඨ - නිර්වචිත පද (භාෂිත)

## *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි පරමාර්ථය සහ තත්ත්වය*

SP1.1 *මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක රාමුව (සංකල්පනාත්මක රාමුව)*, පොදු පරමාර්ථ සඳහා වන මූල්‍ය වාර්තාකරණයෙහි අරමුණ හා සංකල්ප විස්තර කරයි. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* පරමාර්ථය වන්නේ:

(අ) සංගත සංකල්ප මත පදනම් වන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිත (ප්‍රමිත) වර්ධනය කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ පාලක සභාවට සහාය වීම;

(ආ) කිසිදු ප්‍රමිතියක් අදාළ නොවන විශේෂ වූ ගනුදෙනුවකට හෝ වෙනත් සිද්ධියක්, හෝ ගිනුම්කරණ ප්‍රතිපත්තියක් තෝරා ගැනීම සඳහා ප්‍රමිතියෙන් අවකාශ ලබාදී තිබෙන විටෙක එම පිළියෙල කිරීම් කරන්නන් හට සංගත වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ධනය කිරීම සඳහා සහාය වීම; සහ

(ඇ) සියළුම පාර්ශවකරුවන්ට ප්‍රමිත අවබෝධ කරගැනීමට සහ අර්ථ නිරූපණයන් කිරීමට සහාය වීම.

SP1.2 *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* ප්‍රමිතියක් නොවේ. කිසිම ප්‍රමිතියක් හෝ ප්‍රමිතියක ඇතුළත් කිසිදු අවශ්‍යතාවයක් අක්‍රිය කිරීමට *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* ඇතුළත්ව නැත.

SP1.3 පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙන් ඉවත් කළයුතු* අංගයන් සමහර විට පාලක සභාව නියම වශයෙන් සඳහන් කළහැකිය. පාලක සභාව එසේ කළහොත් එම ඉවත්කිරීම සඳහා වූ පදනම එම ප්‍රමිතිය මතවූ නිගමන තුල පැහැදිලි කෙරේ.

SP1.4 සංකල්පනාත්මක ආකෘතිමය රාමුව සමග කටයුතු කිරීමෙන් ලද අත්දැකීම් පදනම් කර ගනිමින් ආයතනයේ පාලක සභාව විසින් වරින්වර එය සංශෝධනය කරනු ලැබිය හැක. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* සංශෝධන ප්‍රමිතියෙහි වෙනස්කම් සිදුකිරීම සඳහා ස්වයංක්‍රීය ලෙස මෙහෙය වන්නේ නැත. ප්‍රමිතියෙහි කිසියම් සංශෝධනයක් සිදු කළයුතු වන්නේ නම්, පාලක සභාව විසින් ඊට අදාළ නිසි ක්‍රියාවලිය පරීක්ෂාකර ව්‍යාපෘතිය න්‍යාය පත්‍රයට ඇතුළත් කර, සංශෝධනය මඟින් ප්‍රමිතය වැඩිදියුණු කරනු ලබයි.

SP1.5 පාලක සභාවෙහි සහ ගණකාධිකරණ ප්‍රමිත කමිටුවෙහි දක්වා ඇති මෙහෙවර සඳහා *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* දායක වනු ලැබේ. එම මෙහෙවර වනුයේ ලොව පුරා ඇති මූල්‍ය වෙළඳපොලවල විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාවය ගෙනදෙන ප්‍රමිත වර්ධනය කිරීමය. ආයතනයේ පාලක සභාවේ කාර්යභාරය තුළින් ගෝලීය ආර්ථිකයේ වර්ධනය හා දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි පොදු විශ්වාසය අභිවර්ධනය වීම වැනි පොදු යහපත ඇතිවේ. *සංකල්පනාත්මක ආර්ථිකමය රාමුව* ප්‍රමිතයන් සඳහා පදනම පහත පරිදි සලසා දෙයඃ:

(අ) ආයෝජකයින්ට සහ වෙනත් වෙළඳපල සහභාගිවන්නන් දැනුවත් කරන ආර්ථික තීරණ ගැනීමට හැකියාවක් ලබා දෙන අන්තර්ජාතිකව සැසඳිය හැකිබව සහ මූල්‍ය තොරතුරුවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම මඟින් විනිවිදභාවයට දායක වීම.

(ආ) ප්‍රාග්ධනය සපයන්නන් සහ ඔවුන්ගේ මුදල් වල වගකීම පවරා දී ඇති ජනයා අතර පවතින තොරතුරු පරතරය අඩු කරමින් වගවීම ශක්තිමත් කිරීම. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* මත පදනම්වූ ප්‍රමිත කළමනාකාරිත්වයට වග උත්තර බැඳීමට අවශ්‍ය තොරතුරු ලබාදෙa. අන්තර්ජාතිකව සැසඳිය හැකි තොරතුරු මූලාශ්‍ර ලෙස ගනිමින් එම ප්‍රමිත ලොව පුරා සිටින නියාමකවරුන්ට අත්‍යවශ්‍ය වැදගත්කමකින් යුක්තවූවකි.

(ඇ) ආයෝජකයින්හට වාසිදායක තත්ත්වයන් සහ ලොව පුරා ඇති අවදානම පිළිබඳව හඳුනා ගැනීමට උදව් කර ප්‍රාග්ධන වෙන්කිරීම් වර්ධනය කිරීම් තුළින් ආර්ථික කාර්ෂමතාවය සඳහා දායක වීම. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* මත පදනම්ව ලබාගත් ප්‍රමිත විශ්වසනීය තනි ගිනුම්කරණ ව්‍යවහාර භාවිතා කිරීම මඟින් ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනයේ පිරිවැය පහත හෙළීම මෙන්ම අන්තර්ජාතික වාර්තාකරණ පිරිවැයද අඩුකෙරේ.

*ඡේදය*

**1 වන පරිච්ඡේදය - පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ අරමුණ**

**හැඳින්වීම** **1.1**

**පොදු පරමාර්ථ වෙනුවෙන් වූ මූල්‍ය වාර්තාකරණයෙහි අරමුණ, ප්‍රයෝජනවත්බව සහ සීමාකාරී තත්ත්වයන්** **1.2**

**වාර්තා වන අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්, අස්තිත්ත්වයට එරෙහි හිමිකම්පෑම් සහ සම්පත් සහ හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ තොරතුරු** **1.12**

**ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම්** **1.13**

**ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම්වල වෙනස්වීම්** **1.15**

**උපචිත ගිණුම්කරණය මඟින් පිළිබිඹු වන මූල්‍ය කාර්ය සාධනය** **1.17**

**අතීත මුදල් ප්‍රවාහ මඟින් පිළිබිඹු වන මූල්‍ය කාර්ය සාධනය** **1.20**

**මූල්‍ය කාර්ය සාධනයෙහි ප්‍රතිඵලයක් නොවන ආර්ථික සම්පත්වල සහ හිමිකම්පෑම් වල වෙනස්වීම්** **1.21**

**අස්තිත්ත්වයක ආර්ථික සම්පත් භාවිතය පිළිබඳ තොරතුරු** **1.22**

## හැඳින්වීම

1.1 පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ අරමුණ වනුයේ *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* සඳහා පදනමක් සැදීමයි. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* අනෙකුත් අංගයන් ගුණාත්මක ගතිලක්ෂණය සහ පිරිවැය සීමා කිරීම්, ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වාර්තා වන අස්තිත්ත්ව සංකල්පය, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග හඳුනාගැනීම සහ ප්‍රති හඳුනාගැනීම, මැනුම්කරණය ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම පරමාර්ථයෙන් තාර්කිකව ගලායාමයs.

## පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ අරමුණු, ප්‍රයෝජනත්වය සහ සීමාකිරීම්

1.2 පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තා කිරීමේ පරමාර්ථය[1] වන්නේ අස්තිත්ත්වයකට සම්පත් ලබාදීමේ තීරණ ගැනීමේදී අස්තිත්ත්වයෙහි[2] දැනට සිටින සහ අනාගත ආයෝජකයින්ට, ණය දෙන්නන්ට සහ අනෙකුත් ණය හිමියන්ට වාර්තාකරණ අස්තිත්ත්වය[3] පිළිබඳ මූල්‍ය තොරතුරු ලබාදීමය. එම තීරණයන්හි සම්බන්ධිත තීරණ වනුයේ:

(අ) ස්කන්ධ සහ ණය සාධන පත්‍ර මිළදී ගැනීම්, විකිණීම් හෝ රඳවාගැනීම්;

(ආ) වෙන් කිරීම් හෝ ණය පියවා දැමීම සහ වෙනත් වර්ගයේ ණය හෝ වෙනස් වර්ගයෙන් ණය ලබාදීම හෝ නිරවුල් කිරීම;

(ඇ) අස්තිත්ත්වයේ ආර්ථික සම්පත් වලට බලපෑම් කරන ඡන්ද හිමිකම භාවිතා කිරීම හෝ වෙන් වශයෙන් බලපෑම් කිරීමේ කළමනාකාරිත්වයෙහි ක්‍රියාවන්.

1.3 1.2 ඡේදයේ විස්තර කර ඇති තීරණ රඳා පවතින්නේ දැනට සිටින සහ අනාගත ආයෝජකයින්, ණය දෙන්නන් සහ වෙනත් ණයහිමියන්ගෙන් අපේක්ෂා කරන ප්‍රතිලාභ මතවේ. උදාහරණ ලෙස: ලාභාංශ, මුල් මුදල හා පොලී වෙන්ව හෝ වෙළඳපල මිල ගණන් ඉහළයාම මතය. ආයෝජකයින්, ණය දෙන්නන්

---

[1] පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ සහ පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාකරණයේ විශේෂයෙන් නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවන්හිදී මූල්‍ය වාර්තා සහ මූල්‍ය වාර්තාකරණය යන පද සංකල්පනාත්මක ආකෘතිමය රාමුව පුරාවටම දැක්වෙන පරිදි තිබිය යුතුය.

[2] වෙනත් අයුරකින් සඳහන් කර නොමැති අවස්ථාවන්හිදී මෙම සංකල්පනාත්මක ආකෘතිමය රාමුව පුරාම අස්තිත්ත්වය යන පදය වාර්තාකරන අස්තිත්ත්වය ලෙසට සැලකිය යුතුය.

සහ වෙනත් ණයහිමියන් හෝ වෙනත් ප්‍රතිලාභ පිළිබඳ අපේක්ෂාවන් රඳා පවතින්නේ අස්තිත්ත්වයට ගලාඑන අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ වල ප්‍රමාණය කාල නියමය අනියතා (අපේක්ෂා) පිළිබඳව ඔවුන්ගේ තක්සේරුව සහ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්වල කළමනාකාරිත්වයෙහි භාරකාරත්වය පිළිබඳ ඔවුන්ගේ තක්සේරුව මතය.

1.4 1.3 ඡේදයෙහි විස්තර කළ තක්සේරුවක් කිරීම සඳහා දැනට සිටින සහ අනාගත ආයෝජකයින් හට, ණය දෙන්නන්හට සහ අනෙකුත් ණයහිමියන් හට පහත දෑ පිළිබඳ තොරතුරු අවශ්‍යවේ:

(අ) අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්, අස්තිත්ත්වයට එරෙහිව ඇති හිමිකම්පෑම් සහ එම සම්පත් වල හා හිමිකම්පෑම් වල වෙනස්වීම්. (1.12–1.21 ඡේද බලන්න); සහ

(ආ) අස්තිත්ත්වයෙහි කළමනාකාරීත්වය සහ පාලක මණ්ඩලය[3] කොතරම් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඔවුන්ගේ වගකීම් අස්තිත්ත්වයේ ආර්ථික සම්පතඨවල භාවිතය වෙනුවෙන් ඉටු කරන්නේද යන්න (1.22–1.23 ඡේද බලන්න).

1.5 දැනට සිටින සහ විභව බොහෝ ආයෝජකයින්ට, ණය දෙන්නන්ට සහ අනෙකුත් ණයහිමියන්ට ඔවුන් වෙත සෘජුව තොරතුරු සපයන ලෙසට වාර්තාකරණ අස්තිත්ත්වයෙන් ඉල්ලුම් කළ නොහැකි අතර, ඔවුන්ට අවශ්‍ය බොහෝ මූල්‍ය තොරතුරු අවශ්‍යතාවයන් සඳහා පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තා කෙරෙහි විශ්වාසය තැබීමට සිදුවේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තා යොමු කරන්නන් අතරින් මූලික පරිශීලකයින් බවට මොවුන් පත්වේ.[4]

1.6 කෙසේ නමුත්, පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාවන් තුලින් දැනට සිටින සහ අනාගත ආයෝජකයින්ට, ණය දෙන්නන්ට සහ අනිකුත් ණයහිමියන්ට අවශ්‍ය කෙරෙන සියලුම තොරතුරු ලබාදීම නොකරන සහ කළ නොහැකි කරුණක්ද වේ. එම පරිශීලකයින්ට අනිකුත් මාර්ග වලින් උචිත තොරතුරු, උදාහරණ වශයෙන්, සමස්ත ආර්ථික තත්ත්වය සහ අපේක්ෂාවන් පිළිබඳ දේශපාලනික සිදුවීම් සහ දේශපාලන වාතාවරණය සහ කර්මාන්තය සහ සමාගමෙහි අනාගත අපේක්ෂාවන් වැනි තොරතුරු කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

1.7 පොදු පරමාර්ථ සඳහා වන මූල්‍ය වාර්තාකරණය වාර්තාකරණ අස්තිත්ත්වයෙහි අගය දැක්වීම සඳහා සැලසුම්කළ වූවක් නොවන නමුත්, වාර්තාකරණ අස්තිත්ත්වයෙහි දැනට සිටින සහ අනාගත ආයෝජකයින්ට, ණය දෙන්නන්ට සහ අනිකුත් ණයහිමියන්ට අස්තිත්ත්වයෙහි අගය ඇස්තමේන්තු කිරීමට උපකාරීවන තොරතුරු ඔවුන් ලබාදේ.

1.8 මූලික තනි පරිශීලකයින් වෙත විවිධ වූ සහ පරස්පර වූ තොරතුරු අවශ්‍යතා සහ අභිලාෂයන් තිබිය හැකිය. පාලක මණ්ඩලය ප්‍රමිත වර්ධනය කිරීම තුළින් ප්‍රාථමික පරිශීලකයින් උපරිම සංඛ්‍යාවකගේ අවශ්‍යතාවයන් ඉටු කරලීම සඳහා වූ තොරතුරු ලබාදීම සොයා බලනු ලැබේ. කෙසේ වුවද, පොදු තොරතුරු අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් විශේෂයෙන් මූලික පරිශීලක උප කොටසට වඩාත් ප්‍රයෝජනවත් වන අමතර තොරතුරු ලබාදීම වාර්තාගත කරන අස්තිත්ත්වය විසින් නොවළක්වයි.

1.9 වාර්තාකරන අස්තිත්ත්වයෙහි කළමනාකාරිත්වයද, අදාල අස්තිත්ත්වයෙහි මූල්‍ය තොරතුරු පිළිබඳවද උනන්දුවක් දක්වයි. කෙසේ නමුත්, පොදු පරමාර්ථ සඳහා වන මූල්‍ය වාර්තා කෙරෙහි කළමනාකාරීත්වය විසින් විශ්වාසය තබා කටයුතු කිරීම අවශ්‍ය නොවන්නේ, එයට අවශ්‍ය මූල්‍ය තොරතුරු අභ්‍යන්තරයෙන් ලබාගත හැකි හෙයිනි.

1.10 ආයෝජකයින්, ණය ලබා දෙන්නන් සහ අනෙකුත් ණයහිමියන් හැරුණු විට සිටින නියාමකයින් සහ පොදු ජනතාව වැනි අනෙකුත් පාර්ශ්වකරුවන්ට පොදු පරමාර්ථ සඳහා වන මූල්‍ය වාර්තා ප්‍රයෝජනයට ගත හැකිය. කෙසේ නමුත්, මෙම අනෙකුත් කණ්ඩායම් වෙත එම වාර්තා මූලිකවම යොමු කිරීමක් සිදු නොවේ.

---

3 විශේෂයෙන් නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවන්හිදී කළමනාකරණය යන පදය අස්තිත්ත්වය කළමනාකාරීත්වය සහ පාලන මණ්ඩලය ලෙසට සංකල්පනාත්මක ආකෘතිමය රාමුව පුරාවටම දැක්වේ.

4 මෙම සංකල්පනාත්මක ආකෘතිමය රාමුව පුරාම 'ප්‍රාථමික පරිශිලකයන් ' සහ 'පරිශිලකයන් ' යන පදවලින් යොමුවන්නේ ඔවුන්ට අවශ්‍යකරන බොහෝ මූල්‍ය තොරතුරු සඳහා පොදු අරමුණු මූල්‍ය වාර්තා මත විශ්වාසය රැඳවිය යුතු දැනට සිටින සහ අනාගත ආයෝජනයන්, ණයදෙන්නන් සහ වෙනත් ණයහිමියන් වැනිඅයවේ.

1.11 බොහෝදුරට ගත්කල මූල්‍ය වාර්තාවන්හි නිවැරදි නිරූපණයකට වඩා ඇස්තමේන්තු, විනිශ්චයන් සහ ආකෘතීන් මත පදනම් වී ඇති බව පෙනේ. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* ස්ථාපිත කර ඇත්තේ එම ඇස්තමේන්තු, විනිශ්චයන් සහ ආකෘතීන් එම සංකල්ප පාදක කරගනිමිනි. පාලක මණ්ඩලය සහ මූල්‍ය වාර්තා පිළියල කරන්නන් උත්සාහ ගන්නා දිශාව දෙස වෙත ඉලක්ක සංකල්පවේ. බොහෝ ඉලක්ක සමඟ පරිපූර්ණ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සම්පූර්ණයෙන් නියම දැක්මක් ළඟා කරගැනීමට *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* අනුව අවම වශයෙන් කෙටි කාලීනව අපහසු වන්නේ, එය අවබෝධ කර ගැනීමට, පිළිගැනීමට, ගනුදෙනු විශ්ලේෂණය කිරීමට, නව ක්‍රම ක්‍රියාත්මක කිරීමට කාලය අවශ්‍ය වීම සහ අනෙකුත් සිද්ධීන් නිසාය. කෙසේ වෙතත්, මූල්‍ය වාර්තාකරණය ක්‍රමයෙන් විකාශයට පැමිණීමෙන් එහි ප්‍රයෝජනවත් භාවය වැඩි දියුණු වන්නේ නම් ඉලක්ක පිහිටුවා ගැනීම අත්‍යවශ්‍ය උපකාරයක් වේ.

## වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්, අස්තිත්ත්වයට එරෙහි හිමිකම්පෑම් සහ සම්පත් හා හිමිකම්පෑම්වල වෙනස්වීම පිළිබඳ තොරතුරු

1.12 පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා මඟින් වාර්තා කරන අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය වැනි අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් සහ වාර්තාකරණ අස්තිත්ත්වයට එරෙහිව ඇති හිමිකම්පෑම් පිළිබඳව තොරතුරු ලබා දීම සිදුවේ. මූල්‍ය වාර්තා මඟින්ද වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම් වෙනස්වීම් වැනි වෙනත් සිදුවීම් වලින් ඇතිවන බලපෑම් පිළිබඳව ද තොරතුරු ලබාදීම සිදුකෙරේ. මෙම දෙවර්ගයේම තොරතුරු මඟින් අස්තිත්ත්වයට සම්පත් ලබාදීමේ තීරණ ගැනීම සඳහා අදාල වන ප්‍රයෝජනවත් යෙදවුම් වන තොරතුරු ලබා දෙයි.

### ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම්

1.13 පරිශීලකයින් හට වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය ශක්තිය සහ දුර්වලතාවයන් හඳුනා ගැනීමට වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම් වල තොරතුරු වල ස්වභාවය හා වටිනාකම උපකාරී වේ. වාර්තාකරණ අස්තිත්ත්වයේ ද්‍රවශීලතාවය සහ නුබුන්වත්භාවය එහි අමතර මූල්‍ය අවශ්‍යතාවයන් සහ එම මූල්‍ය අවශ්‍යතාවයන් කෙතෙක් දුරට සාර්ථකව ලබාගත හැකිද යන්න පිළිබඳව තක්සේරු කිරීමට පරිශීලකයින් හට එම තොරතුරු උපකාරී වේ. අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්වල කළමනාකාරිත්වයෙහි භාරකාරත්වය පිළිබඳව තක්සේරු කිරීමට පරිශීලකයින් හට එම තොරතුරු උපකාරී වේ. දැනට පවතින හිමිකම්පෑම් සඳහා ගෙවීම් අවශ්‍යතාවයන්හි ප්‍රමුඛතාවයන් පිළිබඳ තොරතුරු මඟින් පරිශීලකයින් හට වාර්තාකරණ අස්තිත්ත්වයට එරෙහිව ඇති හිමිකම්පෑම් අතර අනාගත මුදල් ප්‍රවාහයන් බෙදී යන ආකාරය පිළිබඳව පුරෝකථන කිරීමට උපකාරී වේ.

1.14 විවිධ වර්ගයන්හි ආර්ථික සම්පත් වාර්තාකරණ අස්තිත්ත්වයෙහි අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපේක්ෂාවන් විවිධ ලෙසට පරිශීලකගේ ගණනය කිරීම් වලට බලපානු ලැබේ. සමහර අනාගත මුදල් ප්‍රවාහ ලැබිය යුතු ගිණුම් වැනි දැනට පවතින ආර්ථික සම්පත්වල ඍජු ප්‍රතිඵලයක් ලෙස ලැබේ. ගනුදෙනුකරුවන්ට භාණ්ඩ නිෂ්පාදනය කිරීමට සහ අලෙවි කිරීමට සම්පත් විවිධ සංයෝජන වලින් භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනස් මුදල් ප්‍රවාහ ලැබේ. එම මුදල් ප්‍රවාහයන් තනි ආර්ථික සම්පත් (හෝ හිමිකම්පෑම්) ලෙසට හඳුනාගැනීමට නුපුළුවන් නමුත්, මූල්‍ය වාර්තා පරිශීලකයින් හට වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මෙහෙයුම් සඳහා පවතින සම්පත් ප්‍රමාණය සහ ස්වභාවය දැනගැනීමට අවශ්‍ය වේ.

### ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම්හි වෙනස්වීම්

1.15 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම් වෙනස් වන්නේ එම අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනයෙහි (1.17-1.20 ඡේද බලන්න) සහ වෙනත් සිද්ධීන්ගෙන් හෝ ස්කන්ධ සාධන පත්‍ර නිකුත් කිරීම් (1.21 ඡේදය බලන්න) වැනි ගනුදෙනු වලින් වන ප්‍රතිඵලයක් ලෙසට දැක්විය හැකිය. වාර්තාකරන අස්තිත්වයට වන අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ අපේක්ෂාවන් සහ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් පිළිබඳ කළමනාකාරිත්වයෙහි භාරකාරිත්වය යන දෙඅංශයම විධිමත්ව තක්සේරු කිරීමට එම අංශ දෙකෙහිම ඇති වන වෙනස්කම් හඳුනා ගැනීමට පරිශීලකයින්ට හැකියාව තිබිය යුතුය.

1.16 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු උපයෝගී කරගනිමින් පරිශීලකයින් හට අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් මත අස්තිත්ත්වය විසින් උපයා ඇති ප්‍රතිලාභ පිළිබඳව අවබෝධ කර ගත හැකිය. අස්තිත්ත්වය විසින් උපයා ඇති ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු මඟින් පරිශීලකයින් හට අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් කෙරෙහි ඇති කළමනාකාරීත්වයේ භාරකාරත්වය පිළිබඳව තක්සේරු කිරීමට හැකිවේ. එම ප්‍රතිලාභ වල විචල්‍යතාවයන් සහ සංරචක පිළිබඳව වන තොරතුරු ද වැදගත් වන

අතර, විශේෂයෙන් අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳව ඇති අවිනිශ්චිතතාවය ගණනය කිරීමට හැකිවේ. වාර්තාකරණ අස්තිත්ත්වයෙහි අතීත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සහ කළමනාකාරිත්වය විසින් භාරකාර වගකීම් ඉටු කර ඇති ආකාරය, අස්තිත්ත්වයෙහි ඇති ආර්ථික සම්පත් මත විය හැකි අනාගත ප්‍රතිලාභ පිළිබඳව සාමාන්‍යයෙන් පුරෝකථන කිරීමට උපකාරී වේ.

**උපචිත ගිණුම්කරණය මගින් පිළිබිඹු වන මූල්‍ය කාර්ය සාධනය**

1.17 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම්වල බලපෑම් සිදුවූ කාලපරිච්ඡේද තුල ප්‍රතිඵලයක් වන මුදල් ලැබීම් සහ ගෙවීම් වෙනත් කාලපරිච්ඡේදයකදී සිදුවිය හැකි වුවද, ගනුදෙනු සහ වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන්ගේ බලපෑම් උපචිත ගිණුම්කරණයෙන් නිරූපණය කෙරේ. මෙය වැදගත් වන්නේ වාර්තාකරණ අස්තිත්ත්වයට හුදෙක් එම කාලපරිච්ඡේදය තුල තනිකරම වන මුදල් ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ තොරතුරු වලට වඩා එහි ආර්ථික සම්පත් සහ කාලපරිච්ඡේදය තුළ හිමිකම්පෑම් සහ එහි ආර්ථික සම්පත්වල සහ හිමිකම්පෑම් වල වෙනස්වීම් පිළිබඳ තොරතුරු මගින් අස්තිත්ත්වයෙහි අතීත සහ අනාගත කාර්ය සාධනය පිළිබඳ තක්සේරු කිරීමේදී වඩා හොඳ පදනමක් ලැබෙන නිසාවෙනි.

1.18 අස්තිත්ත්වයක් ආයෝජකයින් සහ ණයහිමියන්ගෙන් සෘජුව ලබා ගන්නා අතිරේක සම්පත් මගින් හැර, (1.21 ඡේදය බලන්න) එහි ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම් වල වෙනස්වීම් මගින් පිළිබිඹු වන කාල පරිච්ඡේදයන් තුළදී වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු අස්තිත්ත්වයෙහි අතීත සහ අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ ජනනය කිරීමේ හැකියාව තක්සේරු කිරීමේදී ප්‍රයෝජනවත්වේ. එම තොරතුරු වලින්, අස්තිත්ත්වය, ආයෝජකයින් සහ ණයහිමියන් ගෙන් සෘජුව ලබා ගන්නා අතිරේක සම්පත් මගින් හැර වාර්තාකරණ අස්තිත්ත්වය එයට ලබාගත හැකි ආර්ථික සම්පත් වැඩිවීම සහ ඒ නිසාවෙන් එහි මෙහෙයුම් මගින් ශුද්ධ මුදල් ප්‍රවාහ ජනනය කිරීමේ හැකියාවේ ප්‍රමාණය ඇඟවේ. කාලපරිච්ඡේදයක් තුළ අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරුවල අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්වල කළමනාකාරිත්වයේ භාරකාරත්වය තක්සේරු කිරීම පරිශීලකයින්ට උපකාරී විය හැකිය.

1.19 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි අදාළ කාලපරිච්ඡේදය තුළ වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු මගින් වෙළෙඳ මිල ගණන් වෙනස් වීම් හෝ පොළී අනුපාත වැඩි වීම් හෝ අඩුවීම් වැනි සිද්ධීන් ගෙන් අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් හා හිමිකම්පෑම් වල ප්‍රමාණය සහ එයින් අස්තිත්ත්වයෙහි ශුද්ධ මුදල් ප්‍රවාහ ගලාඒම උත්පාදනය කිරීමේ හැකියාවට වන බලපෑම් ද හැඟවිය හැකිය.

**අතීත මුදල් ප්‍රවාහ මගින් පිළිබිඹු වන මූල්‍ය කාර්ය සාධනය**

1.20 වාර්තාකරණ අස්තිත්ත්වයක කාලපරිච්ඡේදය තුළදී මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මගින් අස්තිත්ත්වයෙහි අනාගත ශුද්ධ "මුදල් ප්‍රවාහ" ගලා ඒම් උත්පාදනය කිරීමේ හැකියාව සහ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් කෙරෙහි ඇති කළමනාකාරිත්වයෙහි භාරකාරත්වය ද තක්සේරු කිරීම පරිශීලකයින්ට උපකාරී විය හැකිය. එම තොරතුරු මගින් වාර්තා කරන අස්තිත්ත්වය කෙසේ මුදල් ලබා ගන්නේද යන හා වියදම් කරන ආකාරය පිළිබඳව සහ එහි ණය ගැනීම් හා ණය ආපසු ගෙවීම්, ආයෝජකයින් හට මුදලින් ලාභාංශ හෝ වෙනත් මුදල් බෙදාහැරීම් ඇතුළුව සහ අස්තිත්ත්වයෙහි ද්‍රවශීලත්වයට හෝ නුබුන්වත්භාවයට බලපෑ හැකි වෙනත් සාධකයන් දැක්වේ. මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මගින් පරිශීලකයින් හට වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මෙහෙයුම් පිළිබඳව අවබෝධ කරගැනීමට, එහි මූල්‍ය සහ ආයෝජන ක්‍රියාකාරකම් අගයකිරීමට, එහි ද්‍රවශීලතාවය සහ නුබුන්වත්භාවය ගණනය කිරීමට සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වෙනස් තොරතුරු පිළිබඳව තේරුම් ගැනීමට හැකියාව ලැබේ.

**මූල්‍ය කාර්ය සාධනයෙහි ප්‍රතිඵලයක් නොවන ආර්ථික සම්පත් වල සහ හිමිකම්පෑම්වල වෙනස්වීම්**

1.21 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම්වල වෙනස්වීම් මූල්‍ය කාර්ය සාධනය හැරුණු විට ඇති ණය නිකුත් කිරීම හෝ ස්කන්ධ සාධනපත්‍ර වැනි හේතු නිසාද සිදුවිය හැකිය. මෙවැනි වෙනස්වීම් පිළිබඳ තොරතුරු පරිශීලකයින්ට ලබාදිය යුතු වන්නේ ඒ මගින් වාර්තා කරන අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් හා හිමිකම්පෑම් වෙනස්වීම් සිදුවීමට හේතු සහ එහි අනාගත මූල්‍ය කාර්ය සාධනය සඳහා එම වෙනස්කම් වල සම්බන්ධතාවය ආදිය පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබාගත හැකි නිසාය.

**අස්තිත්ත්වයක ආර්ථික සම්පත් භාවිතය පිළිබඳ තොරතුරු**

1.22 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි කළමනාකාරිත්වය විසින් අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් භාවිතය පිළිබඳව ඔවුන්ගේ වගකීම කෙතෙක් දුරට කාර්යක්ෂම හා සඵලදායී ලෙස ඉෂ්ඨ කර ඇද්ද පිළිබඳ

තොරතුරු ආදිය එම සම්පත් පිළිබඳ කළමනාකාරිත්වයෙහි භාරකාරත්වය තක්සේරු කිරීම සඳහා පරිශීලකයින්හට උපකාරී වේ. එවැනි තොරතුරු අනාගත කාලපරිච්ඡේද වලදී අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් කෙතෙක් දුරට කාර්යක්ෂමව හා සඵලදායි ලෙස භාවිතා කරන්නේද යන්න පිළිබඳව පුරෝකථනය කරමින් තක්සේරු කිරීමට ප්‍රයෝජනවත් වේ. එම නිසා ඒවා අස්තිත්ත්වයෙහි අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ ගලා ඒම සඳහා අස්තිත්ත්වයෙහි අපේක්ෂා පිළිබඳ ගණනය කිරිමට ප්‍රයෝජනවත් වනු ඇත.

1.23 අස්තිත්ත්වයෙහි සම්පත් භාවිතය පිළිබඳව කළමනාකාරිත්වයට ඇති වගකීම් වලට වන නිදසුන් අතර, මිල හා තාක්ෂණික වෙනස්වීම් වැනි අහිතකර ආර්ථිකමය සාධකවලින් එම සම්පත් ආරක්ෂා කරගැනීම සහ අස්තිත්ත්වයට බලපැවැත්වෙන නීති, රෙගුලාසි හා ගිවිසුම් පිළිබඳ ප්‍රතිපාදන වලට අනුගතව ඇත්ද යන්න ඇතුළත් වේ.

*ඡේදය*

**2 වන පරිච්ඡේදය - ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණ**

| | |
|---|---|
| **හැඳින්වීම** | **2.1** |
| **ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණ** | **2.4** |
| **මූලික ගුණාත්මක ගතිලක්ෂණ** | **2.5** |
| අදාළත්වය | 2.6 |
| ප්‍රමාණාත්මක භාවය | 2.11 |
| විශ්වාසනීය නියෝජනය | 2.12 |
| මූලික ගුණාත්මක ගතිලක්ෂණ භාවිතය | 2.20 |
| **ගුණාත්මක ගතිලක්ෂණ ඉහළ නැංවීම** | **2.23** |
| සැසඳිය හැකි බව | 2.24 |
| සත්‍යාපන හැකියාව | 2.30 |
| කාලානුරූපී බව | 2.33 |
| අවබෝධ කරගත හැකි බව | 2.34 |
| ගුණාත්මක ගතිලක්ෂණ ඉහළ නැංවීම භාවිතය | 2.37 |
| **ඵලදායි මූල්‍ය වාර්තාකරණය මත වන පිරිවැය සීමාකිරීම්** | **2.39** |

## හැඳින්වීම

2.1 මෙම පරිච්ඡේදය මඟින් ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණ සාකච්ඡා කරන අතර, එමඟින් දැනට සිටින හා අනාගත ආයෝජකයින්ට, ණය ලබා දෙන්නන්ට සහ වෙනත් ණය හිමියන්ට අස්තිත්ත්වයෙහි මූල්‍ය වාර්තා (මූල්‍ය තොරතුරු) පදනම් කරගනිමින් වාර්තාකරණ අස්තිත්ත්වය පිළිබඳව තීරණ ගැනීමට බොහෝ ප්‍රයෝජනවත් වේ.

2.2 මූල්‍ය වාර්තා මඟින් ලබාදෙනු ලබන තොරතුරු අතර වාර්තා කරන අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්, වාර්තාකරණ අස්තිත්ත්වයට එරෙහි හිමිකම්පෑම් සහ ගනුදෙනු හා අනෙකුත් සිද්ධීන් වල බලපෑම සහ එම සම්පත් හා හිමිකම්පෑම් වෙනස් කරවන පවත්නා තත්ත්වයන් වෙයි. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* ආර්ථික සංසිද්ධීන් ලෙසට මෙම තොරතුරු දැක්වේ. සමහර මූල්‍ය වාර්තාවන්හි කළමනාකාරිත්ව අපේක්ෂාවන් සහ වාර්තාකරණය සඳහා වන උපාය මාර්ග හා අනිකුත් වර්ගවල ඉදිරි දැක්මෙන් යුතු තොරතුරු වැනි සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.

2.3 මූල්‍ය තොරතුරු වලට ව්‍යවහාර වන, මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණ[5] මූල්‍ය ප්‍රකාශ වල ලබාදී ඇතිවා මෙන්ම වෙනත් ක්‍රම වලින් ද මූල්‍ය තොරතුරු ලබාදීමක් සිදු කෙරේ. ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු ලබාදීමට වාර්තාකරණ අස්තිත්ත්වයට ඇති හැකියාවට පෘථුල බාධකයක් වන පිරිවැය සමානව අදාලවේ. කෙසේ නමුත්, විවිධ වර්ගවල තොරතුරු සඳහා යොදා ගන්නා ගුණාත්මක ගතිලක්ෂණ සහ පිරිවැය බාධකයන් අනුව සැළකිල්ලට ගැනීම් වෙනස්විය හැකිය. උදාහරණ ලෙස, මේවා ඉදිරි දැක්මක් ඇති තොරතුරු වලට ව්‍යවහාර කිරීම, පවතින ආර්ථික සම්පත් සහ හිමිකම්පෑම් පිළිබඳ තොරතුරු වලට ව්‍යවහාර කිරීමට වඩා වෙනස් විය හැකිය.

## ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණ

2.4 මූල්‍ය තොරතුරු ප්‍රයෝජනවත් වීමට නම්, එයින් අදහස් කරනු ලබන දෑ අදාළ විය යුතු සහ විශ්වාසනීය ඉදිරිපත් කිරීමක් විය යුතුය. මූල්‍ය තොරතුරු සැසඳිය හැකි නම්, සත්‍යාපනය කළ හැකි නම්, කාලීන වන්නේ නම් සහ අවබෝධ කරගත හැකි නම් ඒවායෙහි ප්‍රයෝජනවත්භාවය ඉහළ නැංවේ.

### මූලික ගුණාත්මක ගතිලක්ෂණ

2.5 මූලික ගුණාත්මක ගතිලක්ෂණ වන්නේ අදාලත්වය සහ විශ්වාසනීය නියෝජනය වේ.

### අදාළත්වය

2.6 අදාල මූල්‍ය තොරතුරු පරිශීලකයින් ගත් තීරණ වෙනසක් කිරීමට හැකියාව ලැබේ. සමහර පරිශීලකයින් තොරතුරු මඟින් වාසිදායක තීරණ තෝරා ගන්නේ නැති වුවද, හෝ ඒ පිළිබඳ වෙනත් මූලාශ්‍ර මඟින් දැනටමත් දැනුවත්ව සිටිනවා වුවත් තීරණයක් වෙනසක් කිරීමට තොරතුරු වලට හැකියාව තිබිය හැකිය.

2.7 මූල්‍ය තොරතුරු මඟින් තීරණවල වෙනසක් කිරීමට හැකියාව ලැබෙනුයේ එහි පුරෝකථන අගයන්, තහවුරු කිරීමේ අගය හෝ මේ දෙකම ඇත්නම් පමණි.

2.8 මූල්‍ය තොරතුරු වල පුරෝකථන අගයක් තිබිය හැක්කේ, එය අනාගත ප්‍රතිඵල පුරෝකථනය කිරීම සඳහා වූ ක්‍රියාවලියක යෙදවුමක් ලෙසට භාවිතා කළ හැකිනම්ය. පුරෝකථන අගයක් තිබීම සඳහා මූල්‍ය තොරතුරුවල පුරෝකථනයක් හෝ අනාවැකියක් තිබීම අවශ්‍ය වන්නේ නැත. පුරෝකථ්‍ය අගයන් සහිත මූල්‍ය තොරතුරු පරිශීලකයින් විසින් යොදා ගනිමින් ඔවුන් ස්වකීය පුරෝකථනයන් ලබාගනී.

2.9 පෙර වූ ඇගයීම් පිළිබඳ පසුවිපරම් තොරතුරු ලබා දෙන්නේ නම් (තහවුරු කරමින් හෝ වෙනස් කරමින්) එම මූල්‍ය තොරතුරු වල තහවුරු කළ අගය තිබේ.

2.10 මූල්‍ය තොරතුරු වල පුරෝකථන අගය සහ තහවුරු කරන ලද අගය අන්තර් සම්බන්ධතාවයෙන් යුක්තවේ. තොරතුරුවල ඇතුළත් පුරෝකථන අගයෙහි නිරතුරුවම තහවුරු කරන ලද අගය ද තිබේ. උදාහරණ වශයෙන්, ප්‍රවර්තන වර්ෂය සඳහා අයභාර තොරතුරු, අනාගත වර්ෂ තුල අයභාර පුරෝකථන කිරීම උදෙසා පදනම ලෙසට භාවිතා කළ හැකි අතරම, අතීත වර්ෂයන්හිදී ප්‍රවර්තන වර්ෂය උදෙසා සිදුකර ඇති අයභාර පුරෝකථන සමඟ සැසඳීමට ද පුළුවන. මෙම සැසඳීම් වල ප්‍රතිඵල සහ එම පෙර වූ පුරෝකථන කිරීම සඳහා භාවිතා කළ ක්‍රියාවලි නිවැරදි සහ වැඩිදියුණු කිරීමට පරිශීලකයින්ට උපකාරී වනු ඇත.

*ප්‍රමාණවත් භාවය*

2.11 නිශ්චිත වාර්තාකරන අස්තිත්ත්වයක් විසින් ලබා දෙන පොදු පරමාර්ථ සඳහා වූ මූල්‍ය වාර්තාවන්හි අත් හැරීමක් හෝ අවප්‍රකාශයක් ලෙස ඉදිරිපත් කරන ලද තොරතුරු වේ නම් සහ ඒවා පදනම් කරගනිමින් ප්‍රාථමික පරිශීලකයින් ගනු ලබන තීරණ වලට එයින් බලපෑමක් වන්නේ නම් එලෙසට වූ තොරතුරු ප්‍රමාණාත්මක භාවයෙන් යුතු තොරතුරු වෙයි. වෙනත් වචනයෙන් කියතහොත්, ප්‍රමාණාත්මකභාවය යනු, යම් අස්තිත්ත්වයකට විශේෂිතවූ අදාළ වන අංගයක් වන අතර, එය ස්වභාවය, විශාලත්වය හෝ ඒ දෙකම මත පදනම් වන අස්තිත්ත්වයෙහි මූල්‍ය වාර්තා ඇතුළත් වන කොටස්වලට සම්බන්ධිත තොරතුරු වෙයි.

---

[5] “ගුණාත්මක ගතිලක්ෂණ” යන පදය සහ “පිරිවැය සීමා කිරීම” යන්න ගුණාත්මක ගතිලක්ෂණය සහ පිරිවැය සීමා කිරීම ලෙසට ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* පුරාවටම යෙදී ඇත.

අනුෂාංගික වශයෙන් පාලක මණ්ඩලයට ප්‍රමාණාත්මකභාවය පිළිබඳව ඒකාකාර ප්‍රමාණාත්මක සීමාවන් නියම කිරීමට හෝ විශේෂිත තත්ත්වයන් තුළ කුමකින් ප්‍රමාණාත්මකදැයි පූර්ව නිගමනවලට එළඹීමට නුපුළුවන.

**විශ්වාසනීය නියෝජනය**

2.12 මූල්‍ය වාර්තා වලින් ආර්ථික සංසිද්ධීන් පද වලින් සහ සංඛ්‍යා වලින් නියෝජනය කරනු ලැබේ. මූල්‍ය තොරතුරු ප්‍රයෝජනවත් වීම සඳහා අදාළ සංසිද්ධීන් නියෝජනයවීම පමණක් නොව, එය නියෝජනය කරන සංසිද්ධීන්ගේ විෂය අර්ථය විශ්වාසනීය නියෝජනයක් විය යුතුය. බොහෝ තත්වයන් යටතේ ආර්ථික සංසිද්ධි එහි විෂය අර්ථය සහ එහි නෛතික ස්වරූපය සමාන වේ. එලෙස එවා සමාන නොවන විටදී නෛතික ස්වරූපය සම්බන්ධ තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම, ආර්ථික සංසිද්ධිය පිළිබඳව විශ්වාසනීය නියෝජනයක්වීම සිදු නොවේ. (4.59-4.62 ඡේද බලන්න).

2.13 පරිපූර්ණ වූ විශ්වාසනීය නියෝජනයකදී තුන් ආකාරයක ගතිලක්ෂණ නිරූපණය වී තිබිය යුතුය. ඒවා නම්, සම්පූර්ණවීම. මධ්‍යස්ථවීම සහ වැරදි වලින් තොරවීම වේ. ඇත්ත වශයෙන්ම, පරිපූර්ණත්වය කලාතුරකින් කවදා හෝ ළඟා කරගත හැකි වන්නකි. පාලක මණ්ඩලයේ අරමුණ වනුයේ මෙම ගුණාංග හැකිතාක් දුරට උපරිම කිරීම වේ.

2.14 නිරූපණය කරන සංසිද්ධිය පරිශීලකයින්ට අවබෝධ කර ගැනීමට අවශ්‍ය සියළු තොරතුරු, සියළු අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම්ද ඇතුළුව සම්පූර්ණ නිරූපණයක ඇතුළත්වේ. උදාහරණයක් වශයෙන්, සමූහය තුළ වන සියළු වත්කම්වල සංඛ්‍යාත්මක නිරූපණයන් සහ සංඛ්‍යාත්මක නිරූපණයෙන් නියෝජනය වන්නේ කුමක්ද යන්න පිළිබඳ විස්තරයක් (උදාහරණ ලෙස, ඓතිහාසික පිරිවැය හෝ සාධාරණ අගය). සමහර අයිතම් සඳහා සම්පූර්ණ නිරූපණයකට නොපැහැර හැරිය හැකි ලෙස අවශ්‍ය විය හැක්කේ, තත්ත්වය සහ ස්වභාවයට බලපෑ හැකි සාධක හා තත්ත්වයන් සහ සංඛ්‍යාත්මක නිරූපණය නිර්ණය කිරීමට භාවිතා කළ ක්‍රියාවලියද වේ.

2.15 මධ්‍යස්ථ නිරූපණයක් යනු, පක්ෂග්‍රාහිත්වයක් රහිතව මූල්‍ය තොරතුරු තෝරා ගැනීම හෝ ඉදිරිපත් කිරීමත්ය. මධ්‍යස්ථ නිරූපණයක් යනු, පසකට බරවූල බර තැබූ අවධාරණය කළ, අවධාරණය නොකළ දෙයක් හෝ සත්‍ය වශයෙන් පරිශීලකයාට එම මූල්‍ය තොරතුරු වාසිදායක හෝ අවාසිදායක ලෙස ලැබීමට හැකිවන ලෙස සම්භාවිතාවය වැඩිකළ හෝ වාසියට හසුරුවන ලද්දක් ද නොවිය යුතුය. හැසිරීම මත අරමුණක් නොමැති හෝ බලපෑමක් නොමැති තොරතුරු ලෙස මධ්‍යස්ථ තොරතුරු යන්නෙන් අදහස් නොකෙරේ. එයට පටහැනිව නිර්වචනයෙන් අදාල මූල්‍ය තොරතුරු පරිශීලකයින්ගේ තීරණ වල වෙනසක් කිරීමට හැකිවිය යුතුය. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස අදාල මූල්‍ය තොරතුරු යනු පරිශීලකයින්හට විවිධ වූ තීරණ වලට එළඹීමේ හැකියාව ඇති යනුවෙන් අර්ථ දැක්විය හැකිය.

2.16 විචක්ෂණභාවය භාවිතා කිරීමෙන් මධ්‍යස්ථභාවයට උපකාරයක්වේ. විචක්ෂණභාවය යනු, අනියත තත්ත්වයන් යටතේ තීරණයන් ගැනීමේදී ඉටු කළයුතු පරෙස්සමය. විචක්ෂණභාවය භාවිතා කිරීම යනු, වත්කම් හා ආදායම් අධි තක්සේරු කිරීමක් හෝ වගකීම් හා වියදම් අඩු තක්සේරුවක් නොකිරීමයි.[6] ඒ හා සමානව විචක්ෂණභාවය භාවිතා කිරීම මඟින් වත්කම් හෝ ආදායම් අඩු තක්සේරු කිරීමකට හෝ වගකීම් හෝ වියදම් අධි තක්සේරු කිරීමකට ඉඩ නොදේ. එවැනි අවප්‍රකාශයන් අනාගත කාලපරිච්ඡේද තුල වන ආදායම් හෝ වියදම් අධි තක්සේරු කිරීමකට හෝ අඩු තක්සේරු කිරීමකට හෝ තුඩු දීමට පුළුවන.

2.17 විචක්ෂණභාවය භාවිතා කිරීමෙන් අභ්‍යාසය සඳහා අවශ්‍යතාවයක් අදහස් නොකෙරේ. උදාහරණ වශයෙන්, "වත්කම් හෝ ආදායම් හඳුනාගැනීම" සඳහා ඒත්තු ගැන්විය හැකි සාක්ෂි වල ක්‍රමානුකූල අවශ්‍යතාවයක් වගකීම් හෝ වියදම් හඳුනා ගැනීමට වඩා තිබේ. එසේ වුවත්, එමගින් නියෝජනය වීමට අදහස් කරෙන වඩාත් අදාල තොරතුරු තෝරා ගැනීමට අදහස් වල තීරණ ප්‍රතිඵලයක් ලෙස මෙය වන්නේ නම් විශේෂිත ප්‍රමිතවල අසමමිතික අවශ්‍යතාවය ඇතුළත් විය හැකිය. එබඳු අසමමිතියන් ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගතිලක්ෂණයක් නොවේ.

2.18 විශ්වාසනීය නියෝජනයකින් සියළු ආකාරයෙන් නිවැරදිතාවයක් ඇති බවට අදහස් නොකෙරේ. වැරදි වලින් තොර යන්නෙන් අදහස් කරන්නේ සංසිද්ධීන් විස්තර කිරීමේදී එය වැරදි හෝ මගහැරීම් වලින්

---

6 වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් 4.1 වගුවේ නිර්වචනය කර ඇත. ඒවා මූල්‍ය ප්‍රකාශවල මූලිකාංගවේ.

තොර බව සහ වාර්තා කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට භාවිතා කළ ක්‍රියාවලිය තෝරාගෙන ඇති සහ ව්‍යවහාර කළ ක්‍රියාවලිය දෝෂ රහිත එකක් බවය. මේ සම්බන්ධයෙන් වැරදි වලින් තොර යන්න සියළුම කරුණු පරිපූර්ණයෙන්ම නිවැරදි බව අදහස් නොකෙරෙයි. උදාහරණ වශයෙන්, නිරීක්ෂණය කළ නොහැකි මිල හෝ වටිනාකම ඇස්තමේන්තුවක් නිවැරදිද හෝ නිවැරදි නොවේද යන්න පිළිබඳව තීරණය කළ නොහැකිය. කෙසේ වෙතත්, ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව, වටිනාකම පැහැදිලිව හා නිවැරදිව ඇස්තමේන්තුවක් ලෙසට විස්තර කර ඇතිවිට ස්වභාවය සහ ඇස්තමේන්තුගත කිරීමේ ක්‍රියාවලි සීමාවන් පැහැදිලි කර ඇතිවිට සහ ඇස්තමේන්තුව සකස් කිරීමේදී සුදුසු ක්‍රියාවලිය තෝරා ගැනීම හා යොදා ගැනීම සිදුකර ඇති විට එය විශ්වාසනීය ඉදිරිපත් කිරීමකි.

2.19 මූල්‍ය වාර්තාවන්හි අන්තර්ගත මූල්‍යමය අගය සෘජුව නිරීක්ෂණය කළ නොහැකි විට සහ ඒ වෙනුවට ඇස්තමේන්තුගත කිරීම අවශ්‍යයෙන්ම කළයුතු විට, මැනීමෙහි අවිනිශ්චිතතාවයන් ඇතිවේ. මූල්‍ය තොරතුරු සකස් කිරීමේ දී සාධාරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අත්‍යවශ්‍ය අංගයක් වන අතර, ඇස්තමේන්තු පැහැදිලිව සහ නිවැරදිව විස්තර කර ඇත්නම් හා පැහැදිලි කර ඇත්නම් එම තොරතුරු වල ප්‍රයෝජනවත්භාවයෙහි පිළිගැනීමට හානියක් සිදුනොවේ. ඉහළ මට්ටමේ මැනීමක් තුලදී වුව ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමේදී වුවද, එවැනි ඇස්තමේන්තුවකින් අවිනිශ්චිතභාවයන් ඇතිවීම වැළැක්වීම සිදු නොවේ (2.22 ඡේදය බලන්න).

**මූලික ගුණාත්මක ගතිලක්ෂණ භාවිතය**

2.20 තොරතුරු ප්‍රයෝජනවත් වීමට නම් තොරතුරු අදාල සහ විශ්වාසනීය සහ එය නියෝජනය කිරීමට අදහස් කරන දෑ පිළිබඳ විශ්වාසනීය නියෝජනයක් ලබාදීම යන අරමුණු දෙකම ඉටු විය යුතුය. අදාල නොවන සංසිද්ධියක විශ්වාසනීය නියෝජනයක් හෝ අදාළ නොවන සංසිද්ධියක් විශ්වාසනීය නොවන නියෝජනයක් මඟින් පරිශීලකයින්හට හොඳ තීරණයකට එළඹීමට උපකාරයක් නොලැබේ.

2.21 මූලික ගුණාත්මක ගතිලක්ෂණ ව්‍යවහාරකරණය සඳහා වඩාත්ම කාර්යක්ෂම හා ඵලදායි ක්‍රියාවලිය සාමාන්‍යයෙන් වන්නේ මෙසේය. (මෙම උදාහරණයේ සළකා නොලැබූ ගතිලක්ෂණ ඉහළ නැංවීම සහ පිරිවැය සීමා කිරීමෙහි බලපෑම් වලට යටත්ව) පළමුව, වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය තොරතුරු පිළිබඳව පරිශීලකයාහට ප්‍රයෝජනයක් ලබාදිය හැකි ආර්ථික සංසිද්ධියක තොරතුරු හඳුනාගත යුතුය. දෙවනුව, එම සංසිද්ධිය පිළිබඳව ඇති වඩාත් අදාළ වන තොරතුරු වර්ගය හඳුනාගත යුතුය. තෙවනුව, එම තොරතුරු තිබෙන්නේ ද යන්න සහ එමඟින් ආර්ථික සංසිද්ධිය පිළිබඳව සාධාරණ නියෝජනයක් කළ හැකිද යන්න නිර්ණය කළ යුතුය. එසේනම්, එම අවස්ථාවේදී මූලික ගුණාත්මක ගතිලක්ෂණ ක්‍රියාවලිය තෘප්ත කිරීම අවසන් වේ. එසේ නොමැතිනම්, ඊළඟට ඇති වඩාත් අදාළ තොරතුරු වර්ගය සමඟින් මෙම ක්‍රියාවලිය නැවත වරක් සිදු කළ යුතුය.

2.22 සමහර අවස්ථාවල මූල්‍ය වාර්තාකරණයේ පරමාර්ථ ලඟාකර ගැනීම සඳහා ආර්ථික සංසිද්ධීන් පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිපත් කිරීමට මූලික ගුණාත්මක ගතිලක්ෂණ අතර හුවමාරුවක් කර ගැනීම අවශ්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස සංසිද්ධියකට වඩාත්ම අදාළ තොරතුරු ඉහළ අවිනිශ්චිත ඇස්තමේන්තුවක් විය හැකිය. සමහර අවස්ථාවල එම ඇස්තමේන්තුව ගණනය කිරීමේ මට්ටම සම්බන්ධිත අවිනිශ්චිත තත්ත්වය ඉතා ඉහළ වන අතර, ඒ අනුව එම ඇස්තමේන්තුවෙන් සංසිද්ධියට අදාළව ප්‍රමාණවත් විශ්වාසනීය නියෝජනයක් ලබා දෙන්නේ ද යන්න පිළිබඳව ප්‍රශ්න සහගත විය හැකිය. එබඳු සමහර අවස්ථාවලදී වඩාත්ම ප්‍රයෝජනවත් වන තොරතුරු වන්නේ ඇස්තමේන්තුව පිළිබඳව විස්තර සහ එයට බලපා ඇති අවිනිශ්චිතතාවයන් පිළිබඳ පැහැදිලි කිරීම්ද ඇතුළත් වන ඉහළ අවිනිශ්චිතතාවයෙන් යුතු ඇස්තමේන්තු විය හැකිය. එබඳු වෙනත් අවස්ථාවලදී සංසිද්ධිය පිළිබඳව ප්‍රමාණවත් විශ්වාසනීය නියෝජනයක් කිරීම මඟින් තොරතුරු සැපයෙන්නේ නැතිනම්, වඩාත්ම ප්‍රයෝජනවත් තොරතුරුවලට අදාළත්වයෙන් අඩු වුවත්, අවම අවිනිශ්චිත තත්ත්වයක් ඇති වෙනත් වර්ගයක ඇස්තමේන්තුවක් ඇතුළත් කළ හැකිවේ. සීමාකාරී තත්වයන් තුළ ප්‍රයෝජනවත් තොරතුරු ලබාදෙන ඇස්තමේන්තු නොතිබිය හැකිය. මෙවැනි සීමිත තත්ත්වයන්හිදී ඇස්තමේන්තු මත රඳා නොපවතින තොරතුරු සැපයීම අවශ්‍යයෙන්ම කළ යුතුය.

**ගුණාත්මක ගතිලක්ෂණ ඉහළ නැංවීම**

2.23 සැසඳිය හැකි බව, සත්‍යාපන හැකියාව, කාලානුරූපී බව සහ අවබෝධ කරගත හැකි බව යනු තොරතුරු වලින් නියෝජනය වීමට අදහස් කරන අදාළ සහ විශ්වාසනීය නියෝජනය යන කරුණු දෙකම ලබා දෙන තොරතුරුවල ප්‍රයෝජනවත් භාවය ඉහළ නංවන ගුණාත්මක ගතිලක්ෂණයන්ය. යම් සංසිද්ධියක් සමානව අදාළ තොරතුරු ලබාදෙන බව සහ ඒ හා සමානව විශ්වාසනීයව නියෝජනය වන බව යන

කරුණු දෙකම සළකා බලන්නේ නම් මෙම ක්‍රම දෙකෙන්ම එම සංසිද්ධිය විස්තර කිරීමට භාවිතා කළයුත්තේ කුමන ක්‍රමය ද යන්න තීරණය කිරීමට ඉහළ නංවන ගුණාත්මක ගතිලක්ෂණ උපකාරී විය හැකිය.

### සැසඳිය හැකි බව

2.24 පරිශීලකයින්ගේ තීරණවලට විකල්ප අතරින් තෝරා ගැනීමක් අවශ්‍ය කෙරේ. උදාහරණ වශයෙන්, ආයෝජිතයම හෝ රඳවා ගැනීමක් හෝ එක් වාර්තාකරණ අස්තිත්ත්වයක හෝ වෙනත් එකක ආයෝජනය කිරීම ගත හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වාර්තාකරණ අස්තිත්ත්වය පිළිබඳ තොරතුරු වඩාත් ප්‍රයෝජනවත් වන්නේ, එමඟින් වෙනත් අස්තිත්ත්වයක ඒ හා සමාන තොරතුරු සමඟ සැසඳිය හැකි නම් සහ එම අස්තිත්ත්වයේම වෙනත් කාලයක් සඳහා හෝ වෙනත් දිනයක් සඳහා වන සමාන තොරතුරු සමඟ සැසඳිය හැකි නම්ය.

2.25 සැසඳිය හැකිබව යනු, පරිශීලකයින් හට අයිතම අතර පවතින සමානතාවයන් සහ වෙනස්කම් හඳුනා ගැනීමට සහ අවබෝධ කරගැනීමට හැකියාව ලබාදෙන ගුණාත්මක ගතිලක්ෂණයකි. වෙනත් ගුණාත්මක ගතිලක්ෂණ මෙන් නොව, සැසඳිය හැකි බව තනි අයිතමයකට අදාල නොවේ. සැසඳීම සඳහා අවම වශයෙන් අයිතම දෙකක් අවශ්‍ය වේ.

2.26 සංගතතාවය, සැසඳිය හැකි බව හා සම්බන්ධතාවයක් තිබුණද එය ඒ හා සමාන නොවේ. සැසඳිය හැකි බව යන්නෙන් අදහස් වන්නේ වාර්තාකරණ අස්තිත්ත්වයෙහි එක් කාලපරිච්ඡේදයක සිට තවත් කාලපරිච්ඡේදයක් දක්වා හෝ එක් තනි කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්ව අතර සමාන අයිතම සඳහා සමාන ක්‍රම භාවිතා කිරීමයි. සැසඳිය හැකි බව යනු අපේක්‍ෂාවක් වන අතර, සංගතභාවය එම අපේක්‍ෂාව සපුරාලීමට උදව්වන්නක් වේ.

2.27 සැසඳියහැකිභාවය ඒකාකාරබව නොවේ. තොරතුරු සැසඳිය හැකිවීම සඳහා සමාන දේවල් එක සමාන ලෙසට සහ වෙනස් වූ දේවල් වෙනස් වූ විධියට දැකිය යුතුය. මූල්‍ය තොරතුරු සැසඳිය හැකි බව අසමාන දේවල් සමාන බවට පත් කිරීමෙන් සැසඳිය හැකි බව ඉහළ නොනංවන අතර, තවදුරට එය සමාන දේවල් වෙනස් දේවල් බවට පත් කිරීමෙන් සැසඳිය හැකි බව ඉහළ නොනංවේ.

2.28 මූලික ගුණාත්මක ගතිලක්ෂණ තෘප්ත කිරීම මඟින් සැහෙන ප්‍රමාණයකට සැසඳිය හැකිබව සමහරවිට අත්කර ගත හැකිය. වාර්තාකරණ අදාල ආර්ථික සංසිද්ධියක විශ්වාසනීය නියෝජනය වෙනස් අස්තිත්ත්වයක සමාන අදාල ආර්ථික සංසිද්ධියක් විශ්වාසනීය නියෝජනය සමඟ ස්වභාවයෙන්ම යම් ප්‍රමාණයක සැසඳිය හැකි බවක් සතුවිය යුතුය.

2.29 තනි ආර්ථික සංසිද්ධියක් විවිධ ක්‍රම මඟින් විශ්වාසනීය නියෝජනයක් කළ හැකි වුවත්, එම ආර්ථික සංසිද්ධිය සඳහා විකල්ප ගිණුම් ක්‍රම සඳහා ඉඩදීමෙන් සැසඳිය හැකි බව හීනවේ.

### සත්‍යාපන හැකියාව

2.30 ආර්ථික සංසිද්ධියකින් නියෝජනය කිරීමට අදහස් කරන තොරතුරු විශ්වාසනීයව නියෝජනය වන බව පරිශීලකයින්ට සහතිකවීමට සත්‍යාපනය උපකාරී වේ. සත්‍යාපනයෙන් අදහස් කෙරෙන්නේ විවිධ දැනුමැති සහ ස්වාධීන නිරීක්ෂකයින් එකඟතාවයකට එළඹීම අති ස්වාධීන කිරීමට අවශ්‍ය නොවූවද, පොදු සම්මුතියකට එළඹීමට හැකිවන්නේ නම් එම ප්‍රයෝජන නිරූපනය විශ්වාසනීයව නියෝජනය වන බවය. සත්‍යාපනයි කිරීම සඳහා ප්‍රමාණාත්මක තොරතුරු තනි ලක්ෂ්‍ය ඇස්තමේන්තුවීම අවශ්‍ය නොවේ. අදාල සම්භාවීතාවයන් සහ සිදුවිය හැකි වටිනාකම් පරාසයන් සහ අදාල සම්භාවීතාවයන් සත්‍යාපනය කළහැකිය.

2.31 සත්‍යාපනය ඍජු හෝ වක්‍ර විය හැකිය. ඍජු සත්‍යාපනය යන්නෙන් අදහස් වන්නේ, වටිනාකමක් හෝ වෙනත් නියෝජනයක් ඍජු නිරීක්ෂණ මඟින් සත්‍යාපනය කිරීමය. උදාහරණ වශයෙන්, මුදල් ගණන් කිරීම ගත හැකිය. වක්‍ර සත්‍යාපනය යන්නෙන් අදහස් කරන්නේ, ආකෘතියක සූත්‍රයකට හෝ වෙනත් ශිල්පයක යෙදවුම් පරීක්ෂා කිරීමට සහ එම ක්‍රමවේදය භාවිතා කොට නිමවුම් ප්‍රතිගණනය කිරීමය. උදාහරණයක් ලෙසට, ඉන්වෙන්ට්‍රියක ධාරණ අගය සත්‍යාපනය කිරීම යෙදවුම් පරීක්ෂා කිරීම (ප්‍රමාණය හා පිරිවැය) සහ අවසාන ඉන්වෙන්ට්‍රිය එම මුදල් ප්‍රවාහ උපකල්පන භාවිතා කිරීම මඟින් ප්‍රතිගණනය කිරීමයි (උදාහරණඃ මුලින් පිවිසි - මුලින් පිටවූ ක්‍රමය).

2.32 සමහර පැහැදිලි කිරීම් සහ ඉදිරි දැක්මකින් යුතු මූල්‍ය තොරතුරු එම අනාගත කාලපරිච්ඡේදය තෙක් හෝ කිසි ලෙසකින්වත් සත්‍යාපනය කිරීමට නොහැකි විය හැකිය. පරිශීලකයින්හට එම තොරතුරු භාවිතා

කිරීම සඳහා අවශ්‍ය ද යන්න තීරණය කිරීමට උපකාරී වීම සඳහා සාමාන්‍යයෙන් පාදක වූ උපකල්පන තොරතුරු එක් රැස් කිරීමේ ක්‍රම වේදය සහ තොරතුරු වලට සහාය වූ අනෙකුත් සාධකයන් සහ තත්ත්වයන් හෙළිදරව් කිරීම අවශ්‍යවේ.

**කාලානුරූපී බව**

2.33 කාලානුරූපී බව යනු තීරණගන්නන් හට ඔවුන්ගේ තීරණවලට බලපෑම් කළහැකි තොරතුරු නියමිත වේලාවට ලබා ගැනීමට ඇති හැකියාවයි. සාමාන්‍යයෙන් තොරතුරු පරණ වන්නට එහි ප්‍රයෝජනවත් භාවය අඩුවේ. කෙසේ වෙතත්, සමහර තොරතුරු වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයට වඩා දිගු කාලයකට වුවද අඛන්ඩව කාලානුරූප පවත්වාගෙන යායුතු වන්නේ උදාහරණ වශයෙන්, සමහර පරිශීලකයින්හට උපනති හඳුනාගැනීමට සහ තක්සේරු කිරීමට ඒවා අවශ්‍ය වන නිසාය.

**අවබෝධ කරගත හැකි බව**

2.34 තොරතුරු වර්ග කිරීමෙන්, විස්තර කිරීමෙන් සහ පැහැදිලිව සහ සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමෙන් ඒවා තේරුම් ගත හැකි වේ.

2.35 සමහර සංසිද්ධීන් ආවේනිකව සංකීර්ණ වන අතර පහසුවෙන් අවබෝධ කර ගැනීමට නොහැකි වේ. එම සංසිද්ධීන් වලට අදාල තොරතුරු මූල්‍ය වාර්තා තුළින් ඉවත් කිරීම මඟින් එම මූල්‍ය වාර්තා තුළ ඇති තොරතුරු අවබෝධ කරගැනීම පහසු වේ. කෙසේ නමුත්, එම වාර්තා අසම්පූර්ණ සහ ඒ අනුව වැරදි අදහස් දැක්වීමක් ඇතිවිය හැකි වේ.

2.36 මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන්නේ ව්‍යාපාර සහ ආර්ථික කටයුතු පිළිබඳ සාධාරණ දැනුමක් ඇති සහ තොරතුරු වඩාත් උනන්දුවෙන් සමාලෝචනය සහ විශ්ලේෂණය කරන පරිශීලකයින් උදෙසාය. සමහර අවස්ථාවලදී මනාව දැනුවත් සහ උද්යෝගිමත් පරිශීලකයින්ට වුවද සංකීර්ණ ආර්ථික සංසිද්ධීන් පිළිබඳ තොරතුරු අවබෝධ කරගැනීමේදී උපදේශකවරයෙකුගේ ආධාර ලබාගැනීමට අවශ්‍ය විය හැකිය.

**වැඩිදියුණු කරන ලද ගුණාත්මක ගතිලක්ෂණ ව්‍යවහාර කරගැනීම**

2.37 ගුණාත්මක ගතිලක්ෂණ වැඩිදියුණු කිරීම් සිදු කළ හැකි ප්‍රමාණය දක්වා උපරිම කළයුතුය. කෙසේ වුවත්, වැඩි දියුණු කරන ලද ගුණාත්මක ගතිලක්ෂණ එක්කෝ තනි වශයෙන් හෝ සමූහයක් වශයෙන්, එයින් අදහස් කරනු ලබන ඉදිරිපත් කිරීම සඳහා එම තොරතුරු අදාළ නොවන්නේ නම් හෝ සාධාරණ නියෝජනය සිදු නොකරන්නේ නම් එම තොරතුරු ප්‍රයෝජනවත් ඒවා නොවේ.

2.38 වැඩිදියුණු කරන ලද ගුණාත්මක ගතිලක්ෂණ ව්‍යවහාර කරගැනීම නැවත නැවත කළයුතු ක්‍රියාවලියක් වන අතර, එය නියම කරන ලද අනුපිළිවෙළින් අනුගමනය කළයුතු නොවේ. සමහර විට වෙනත් ගුණාත්මක ගතිලක්ෂණයක් උපරිම කර ගැනීම සඳහා වැඩිදියුණු කළ එක් ගුණාත්මක ගතිලක්ෂණයන් හීන කළයුතුවේ. උදාහරණ වශයෙන්, නව ප්‍රමිතියක් අනාගතානුයෝගීව ව්‍යවහාර කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සැසඳිය හැකි භාවයේ තාවකාලික අඩු කිරීම, අදාළත්වය දියුණු කර ගැනීම සඳහා හෝ දිගු කාලීනව සාධාරණ ඉදිරිපත් කිරීම් සිදුකිරීම සඳහා වැදගත් විය හැකිය. උචිත හෙළිදරව් කිරීම් සැසඳිය නොහැකි බව අර්ධ වශයෙන් හිලව් විය හැකිය.

## ප්‍රයෝජනවත් මූල්‍ය වාර්තාකරණය මත වන පිරිවැය සීමාකිරීම්

2.39 පිරිවැය යනු මූල්‍ය වාර්තාකරණය මඟින් ඉදිරිපත් කළහැකි තොරතුරු මත පැතිර පවතින සීමා කිරීමයි. මූල්‍ය තොරතුරු වාර්තාකරණය පිරිවැය නියමකරණය සහ එම තොරතුරු වාර්තාකරණය මඟින් සිදුවන ප්‍රතිලාභ අනුව පිරිවැය සාධාරණීකරණය කිරීම වැදගත් වෙයි. මෙහිදී සලකා බැලිය යුතු විවිධ වර්ගවල පිරිවැය සහ ප්‍රතිලාභ තිබේ.

2.40 මූල්‍ය තොරතුරු ලබා දෙන්නන් බොහෝ වශයෙන් වැය කර ප්‍රයත්න දරනුයේ මූල්‍ය තොරතුරු රැස් කිරීම, සැකසීම, සත්‍යාක්ෂණය කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා වන නමුත් අවසාන වශයෙන් එම පිරිවැය පරිශීලකයින් විසින් දරනු ලබන්නේ අඩුවූ ප්‍රතිලාභ යන ස්වරූපයෙනි. ලබාදී ඇති තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා සහ අර්ථ නිරූපණය කිරීමට මූල්‍ය තොරතුරු පරිශීලකයින් වියදමක් දරයි. අවශ්‍යකරන තොරතුරු ලබාදී නොමැති නම්, පරිශීලකයින් හට එම තොරතුරු වෙනත් තැනකින් ලබා ගැනීමට හෝ ඒවා ඇස්තමේන්තු කිරීමට අමතර පිරිවැයක් දැරීමට සිදුවේ.

2.41 මූල්‍ය තොරතුරු වලින් නියෝජනය කිරීමට අදහස් කරන අදාළ සහ විශ්වාසනීය නියෝජනය වන මූල්‍ය තොරතුරු වාර්තාකරණයෙන් පරිශීලකයින් වඩාත් විශ්වාසය ඇතිව තීරණ ගැනීමට ඒවාද උපකාරීවෙයි.

මෙහි ප්‍රතිඵලයක් වන්නේ වඩාත් කාර්යක්ෂම ප්‍රාථමික වෙළඳපළවල් ක්‍රියාත්මකවීම සහ සමස්තයක් වශයෙන් ආර්ථිකය සඳහා ප්‍රාග්ධනයේ පිරිවැය අඩුවීමය. තනි ආයෝජකයෙකුට, ණය ලබා දෙන්නෙකුට හෝ වෙනත් ණයහිමියකුට වුවත් වඩාත් දැනුවත් බව පෙන්වන තීරණ වලට එළඹීමෙන් වන වාසි අත්වේ. කෙසේ වෙතත්, සෑම පරිශීලකයින්ට අදාල වන සියළු තොරතුරු පොදු පරමාර්ථ සඳහා වන මූල්‍ය වාර්තා මඟින් ලබා දීමට නුපුළුවන.

2.42 පිරිවැය සීමාවන් ව්‍යවහාර කර ගැනීමේදී විශේෂිත වූ තොරතුරු වාර්තාකරණය මඟින් වන ප්‍රතිලාභ එම තොරතුරු ලබාදීම සඳහා වැය වූ පිරිවැය එම තොරතුරුවල ප්‍රයෝජනත්වය සමඟ සාධාරණය කළ හැකිද යන්න පාලක මණ්ඩලය තක්සේරු කරනු ලබයි. යෝජිත ප්‍රමිතයක් සකස් කිරීමේදී පිරිවැය සීමාකිරීම් ව්‍යවහාර කරන විට, එම ප්‍රමිතියෙන් අපේක්ෂිත ස්වභාවය සහ ප්‍රතිලාභ ප්‍රමාණය සහ පිරිවැය පිළිබඳ තොරතුරු පාලක මණ්ඩලය විසින් මුල්‍ය තොරතුරු සපයන්නන්ගෙන්, පරිශීලකයින්ගෙන්, විගණකවරුන්ගෙන්, විද්වතුන්ගෙන් සහ වෙනත් අයගෙන් ඉල්ලයි. බොහෝ අවස්ථාවලදී තක්සේරු කිරීමේ පදනමෙන්ම තොරතුරු වල ප්‍රමාණාත්මක භාවයෙහි හා ගුණාත්මක භාවයෙහි සංයෝජනයකි.

2.43 ආවේණික මනෝමූල භාවයන් හේතුකොටගෙන මූල්‍ය තොරතුරු වල විශේෂ අයිතම වාර්තාකරණය සඳහා වූ විවිධවූ තනි පුද්ගලයින්ගේ පිරිවැය සහ ප්‍රතිලාභ තක්සේරුකරණය වෙනස් වෙයි. එබැවින් පාලක මණ්ඩලය පිරිවැය හා ප්‍රතිලාභ හුදු තනි වාර්තාකරණ අස්තිත්ත්ව සම්බන්ධයෙන් නොව පොදුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් පිරිවැය සහ ප්‍රතිලාභ සළකා බැලීමට උත්සාහ ගනී. මෙමඟින් එම පිරිවැය සහ ප්‍රතිලාභ තක්සේරු සෑමවිටම සියලුම අස්තිත්ත්වයන්හි සමාන වාර්තාකරණ අවශ්‍යතාවයන් සඳහා සාධාරණීයකරණය වන බව අදහස් නොකෙරේ. විවිධ වූ ප්‍රමාණයෙන් යුතු අස්ත්ත්වයන්, ප්‍රාග්ධනය රැස් කර ගැනීමේ විවිධ මාර්ගයන්, (පොදුවේ හෝ පෞද්ගලිකව) විවිධ පරිශීලකයින්ගේ අවශ්‍යතාවයන් හෝ වෙනත් කරුණු හේතුවෙන් වන වෙනස්කම් අදාළ විය හැකිය.

*ඡේදය*


**3 වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රකාශ සහ වාර්තාකරණ අස්තිත්ත්වය**

| | |
|---|---|
| **මූල්‍ය ප්‍රකාශ** | **3.1** |
| **මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථය සහ විෂය පථය** | **3.2** |
| **වාර්තාකරණ කාලපරිච්ඡේදය** | **3.4** |
| **මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් පිළිගත් සාපේක්ෂ වැදගත්කම** | **3.8** |
| **අඛණ්ඩ පැවැත්ම පිළිබඳව වූ උපකල්පන** | **3.9** |
| **වාර්තාකරණ අස්තිත්වය** | **3.10** |
| **ඒකාබද්ධ සහ ඒකාබද්ධ නොවන මූල්‍ය ප්‍රකාශ** | **3.15** |


## මූල්‍ය ප්‍රකාශ

3.1 පොදු පරමාර්ථ සඳහා වූ විශේෂ මූල්‍ය වාර්තාවන්හි ලබා දී ඇති තොරතුරු 1 සහ 2 පරිච්ඡේද යටතේද, පොදු පරමාර්ථ සඳහා වූ විශේෂ මූල්‍ය වාර්තාවල කොටසක් වූ පොදු පරමාර්ත සඳහා විශේෂිත මූල්‍ය ප්‍රකාශ[7] වල දී ඇති තොරතුරු 3-8 පරිච්ඡේද යටතේ ද සාකච්ඡා කෙරේ.

### මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථය සහ විෂය පථය

3.2 වාර්තා කරනු ලබන අස්තිත්ත්වයට වන අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ සඳහා වන අපේක්ෂාවන් ඇස්තමේන්තු කිරීමේදී සහ අස්තිත්ත්වයේ ආර්ථික සම්පත්වල (1.3 ඡේදය බලන්න) කළමනාකාරිත්වය භාරකාරත්වය තක්සේරු කිරීමේ මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්ට ප්‍රයෝජනවත් වන වාර්තාකරණ අස්තිත්ත්වයෙහි වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම්[8] පිළිබඳ මූල්‍ය තොරතුරු ලබා දීම මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථයවේ.

---

[7] සංකල්පීය රාමුව පුරාවටම, 'මූල්‍ය ප්‍රකාශන' යන යෙදුම සාමාන්‍ය අරමුණු මූල්‍ය ප්‍රකාශන වලට යොමු කරයි.

[8] 4.1 වගුවෙහි වත්කම්, වගකීම්, ස්කන්ධය,ආදායම් හා වියදම් නිර්වචනය කර ඇත. ඒවා මූල්‍ය ප්‍රකාශ වල මුලිකාංග වේ.

3.3 ලබාදෙන තොරතුරු වන්නේ:

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම්, වගකීම් සහ ස්කන්ධය හඳුනාගැනීම;

(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි (යන්හි),[9] ආදායම් සහ වියදම් හඳුනාගැනීම; සහ

(ඇ) අනෙකුත් ප්‍රකාශයන්හි සහ සටහන් වල පහත දෑ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් ඇතුලත්ව:

(i) වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් හා වියදම් හඳුනාගන්නා අතර (5.1 ඡේදය බලන්න) එම තොරතුරු වලට ඒවායෙහි ස්වභාවය, හඳුනාගත් එම වත්කම් හා වගකීම් වලින් පැන නැඟෙන අවදානම් ආදිය ඇතුළුව;

(ii) හඳුනානොගත් වත්කම් හා වගකීම් (5.6 ඡේදය බලන්න) පිළිබඳව ඒවායෙහි ස්වභාවය සහ ඒවායින් පැන නගින අවදානම ආදී තොරතුරු ඇතුලත්ව;

(iii) මුදල් ප්‍රවාහ;

(iv) ස්කන්ධ ධාරකයින්ගේ හිමිකම් දායකත්වයන් සහ ඔවුන් වෙත කෙරෙන බෙදාහැරීම්; සහ

(v) ඉදිරිපත් කර ඇති හෝ හෙළිදරව් කළ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේදී භාවිතා කළ ක්‍රමයන්, උපකල්පන සහ විනිශ්චයන් හා එම ක්‍රමයන්හි, උපකල්පනයන්හි සහ විනිශ්චයන්හි වෙනස්වීම්.

**වාර්තාකරණු ලබන කාලපරිච්ඡේදය**

3.4 මූල්‍ය ප්‍රකාශ නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා පිළියෙල කරන අතර, (වාර්තා කරන කාලපරිච්ඡේදය) සහ පහත දැක්වෙන කරුණු පිළිබඳව තොරතුරු ලබාදේ:

(අ) වත්කම් සහ වගකීම් – හඳුනා නොගත් වත්කම් සහ වගකීම් ඇතුලත්ව – සහ ඒ වාර්තාකරන කාලය අවසානයේ හෝ වාර්තාකරන කාලපරිච්ඡේදය තුළ පැවතෙ ස්කන්ධය; සහ

(ආ) වාර්තා කරන ලද කාලපරිච්ඡේදය සඳහා වූ ආදායම් සහ වියදම්.

3.5 මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්හට වෙනස්වීම් හා උපනතින් තක්සේරු කිරීමට උපකාරී වීම සඳහා අවම වශයෙන් එක් පූර්වගාමී වාර්තාකරන කාලපරිච්ඡේදයට අදාල තුලනාත්මක තොරතුරු මූල්‍ය වාර්තා මඟින් ලබාදේ.

3.6 අනාගතයේදී සිදුවිය හැකි ගනුදෙනු වලට සහ අනාගතයෙහි සිදුවිය හැකි අනෙකුත් සිද්ධීන්වලට අදාළ තොරතුරු (ඉදිරි දැක්මෙන් යුතු තොරතුරු) මූල්‍ය වාර්තාවන්හි ඇතුළත් වන්නේ ඒවා:

(අ) හඳුනා නොගත් වත්කම් හෝ වගකීම් ඇතුළුව හෝ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී හෝ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය තුල පැවති ස්කන්ධය හෝ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය සඳහා ආදායම් සහ වියදම් වලට සම්බන්ධිත අස්තිත්ත්වයේ වත්කම් හා වගකීම් වලට; සහ

(ආ) මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට ප්‍රයෝජනවත් වන්නේනම්ය.

උදාහරණ වශයෙන්, වත්කමක් හෝ වගකීමක් මනින්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මඟින් නම්, එම ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට වාර්තා කරන මිනුම පිළිබඳව අවබෝධ කර ගැනීමට උපකාරී වේ. මූල්‍ය ප්‍රකාශ වෙනත් වර්ගයන්හි ඉදිරි දැක්මෙන් යුතු තොරතුරු සංයෝජනමය වශයෙන් ඉදිරිපත් නොකෙරේ. උදාහරණ වශයෙන්, වාර්තාකරන අස්තිත්ත්වය සඳහා වන කළමනාකාරිත්වයෙහි අපේක්ෂාවන් සහ උපාය මාර්ග පිළිබඳ සවිස්තරාත්මක වැදගත් දෑ ගත හැකිය.

3.7 මූල්‍ය ප්‍රකාශයන්හි පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයට පසුව සිදුවුනු ගනුදෙනු සහ අනිකුත් සිද්ධීන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශයේ ලබාදීම අවශ්‍ය වන්නේ නම්, මූල්‍ය ප්‍රකාශයන්ට එම තොරතුරු ද ඇතුළත් කෙරේ. (3.2 ඡේදය බලන්න).

---

9 *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි(යන්හි) අඩංගු වන්නේ තනි ප්‍රකාශයක්ද හෝ ප්‍රකාශ දෙකක් ද යන්න පිළිබඳව විශේෂයෙන් සඳහන් කර නොමැත.

### මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් පිළිගතහැකි සාපේක්ෂ වැදගත්කමේ අදහස

3.8 මූල්‍ය ප්‍රකාශ, ගනුදෙනු සහ වෙනත් සිද්ධීන්හි තොරතුරු ලබා දෙන්නේ ඒවා සමස්ථයක් ලෙස වාර්තා කරන අස්තිත්ත්වයේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් සැළකිල්ලට ගෙන මිස අස්තිත්ත්වයේ දැනට සිටින හෝ අනාගත ආයෝජකයින්, ණය දෙන්නන් හෝ වෙනත් ණය හිමියන්ගෙන් ඇති කවර හෝ විශේෂිත කාණ්ඩයක් සළකා බලා නොවේ.

### අඛණ්ඩ පැවැත්ම පිළිබඳව වූ උපකල්පනය

3.9 මූල්‍ය ප්‍රකාශ සාමාන්‍යයෙන් පිළියෙළ කරුණු ලබන්නේ වාර්තාකරණ අස්තිත්ත්වය අඛණ්ඩ පැවැත්මකින් යුතු සහ එහි මෙහෙයුම් පූර්වාදෘශ්‍ය අනාගතය දක්වා අඛණ්ඩව පවතී යන උපකල්පනය මතය. එහෙයින් අස්තිත්ත්වයෙහි ඈවර කිරීමක් පිළිබඳව හෝ වෙළෙඳ කටයුතු නවතා දැමීම පිළිබඳව හෝ අවශ්‍යතාවයක් හෝ අභිප්‍රායක් නොමැති ලෙසට උපකල්පනය කෙරේ. එවැනි අභිප්‍රායක් හෝ අවශ්‍යතාවක් පැවතුණහොත්, මූල්‍ය ප්‍රකාශ වෙනස් පදනමකින් යුතුව පිළියෙල කළ යුතුය. එසේනම්, භාවිතා කරන ලද පදනම මූල්‍ය ප්‍රකාශනයන්හි විස්තර කළ යුතුය.

## වාර්තාකරණ අස්තිත්ත්වය

3.10 වාර්තාකරණ අස්තිත්ත්වය යනු, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අවශ්‍යකරන හෝ තෝරා ගනු ලබන අස්තිත්ත්වයකි. වාර්තාකරණ අස්තිත්ත්වයක්, තනි අස්තිත්ත්වයක් හෝ අස්තිත්ත්වයක කොටසක් හෝ එක් අස්තිත්ත්වයකට වඩා වැඩියෙන් සමන්විත අස්තිත්ත්වයක් විය හැකිය. වාර්තාකරණ අස්තිත්ත්වයක් අවශ්‍යයෙන්ම නෛතික අස්තිත්ත්වයක් නොවේ.

3.11 සමහර වේලාවට එක් අස්තිත්ත්වයකට (පරිපාලකයා) වෙනත් අස්තිත්ත්වයක් හරහා (පරිපාලිත) පාලනය කිරීමේ හැකියාව ඇත. වාර්තාකරණ අස්තිත්ත්වය පරිපාලක සහ එහි පරිපාලිත යන දෙකොටසින් ම සමන්විත වන්නේ නම්, වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ හඳුන්වන්නේ "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ" ලෙසය. (3.15 - 3.16 ඡේද බලන්න) වාර්තාකරණ අස්තිත්ත්වය පරිපාලිත අස්තිත්ත්වයක් පමණක් නම්, වාර්තා කරන අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ හඳුන්වන්නේ "ඒකාබද්ධ නොකළ මූල්‍ය ප්‍රකාශ" ලෙසය. (3.17 - 3.18 ඡේද බලන්න).

3.12 වාර්තාකරණ අස්තිත්ත්වය, අස්තිත්ත්ව දෙකකින් හෝ වැඩි ගණනකින් සමන්විත වුවද, ඒවා සියල්ල පරිපාලක - පරිපාලිත සම්බන්ධතාවයෙන් බැඳී නොමැති නම්, වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ හඳුන්වන්නේ "සංයෝජිත මූල්‍ය ප්‍රකාශ" යනුවෙනි.

3.13 වාර්තාකරණ අස්තිත්ත්වයෙහි උචිත සීමාවන් නිර්ණය කිරීම අසීරුවිය හැක්කේ වාර්තාකරණ අස්තිත්ත්වය:

(අ) නෛතික අස්තිත්ත්වයක් නොවන විට; සහ

(ආ) පරිපාලක – පරිපාලිත සම්බන්ධතාවය මඟින් බැඳී ඇති නෛතික අස්තිත්ත්වයකින් පමණක් සමන්විත නොවන විට.

3.14 එවැනි අවස්ථාවන්හිදී වාර්තාකරණු ලබන අස්තිත්ත්වයේ සීමාවන් නිර්ණය කිරීම මෙහෙය වන්නේ වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරනු ලබන ප්‍රාථමික පරිශීලකයින්ගේ, වාර්තාකරණ අස්තිත්ත්වයෙහි සීමාවන් නිර්ණය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන තොරතුරු අවශ්‍යතාවය මඟිනි. විශ්වාසනීය නියෝජනය අවශ්‍ය වන්නේ ඒවා:

(අ) වාර්තාකරණ අස්තිත්ත්වයෙහි සීමාවන් පදනම් රහිත හෝ අසම්පූර්ණ ආර්ථික ක්‍රියාකාරකම් කට්ටලයකින් සමන්විත නොවන බව;

(ආ) වාර්තාකරණ අස්තිත්ත්වයෙහි සීමාව තුළ මධ්‍යස්ථ තොරතුරු ප්‍රතිඵලයන් වන ක්‍රියාකාරකම්වල ඇතුලත්ව; සහ

(ඇ) වාර්තාකරණ අස්තිත්ත්වයෙහි සීමාවන් කෙසේ නිර්ණය කළේද යන්න සහ කුමකින් වාර්තාකරණ අස්තිත්ත්වය ස්ථාපිතවී ඇත්ද පිළිබඳ විස්තරයක් ලබාදීම.

### ඒකාබද්ධ සහ ඒකාබද්ධ නොවන මූල්‍ය ප්‍රකාශ

3.15 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මඟින් පරිපාලකයේ සහ එහි පරිපාලිතයන් යන දෙකොටසම තනි වාර්තාකරණ අස්තිත්ත්වයක් ලෙසට ගෙන වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු ලබාදේ. එම තොරතුරු පරිපාලකයේ දැනට සිටින සහ අනාගත ආයෝජකයින්ට, ණය ලබා දෙන්නන්ට සහ අනෙකුත් ණය හිමියන්ට, පරිපාලිකයට අපේක්ෂිත අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ ලැබීම් පිළිබඳ අපේක්ෂාවන්

ඔවුන් තක්සේරු කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ. ඒ මක්නිසාද යත්, පරිපාලකයේ ශුද්ධ මුදල් ප්‍රවාහයෙන් එහි පරිපාලිතයන් ගෙන් පරිපාලකයට ලැබෙන බෙදාහැරීම් ඇතුළත් වන අතර, එම බෙදාහැරීම පදනම් වන්නේ පරිපාලිතයන්හි ශුද්ධ මුදල් ප්‍රවාහ ලැබීම් මත වන බැවිනි.

3.16 ඕනෑම විශේෂිත පරිපාලිතයක වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් පිළිබඳව වෙනම තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සැලසුම් කරන්නේ නැත. පරිපාලිතයක ස්වකීය මූල්‍ය ප්‍රකාශ තුළ එම තොරතුරු ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබේ.

3.17 ඒකාබද්ධ නොවන මූල්‍ය ප්‍රකාශ සැලසුම් කර ඇත්තේ පරිපාලකයේ වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු සැපයීමට මිස එහි පරිපාලිතයන්ට අදාළ එම තොරතුරු සැපයීම සඳහා නොවේ. එම තොරතුරු පරිපාලකයේ දැනට සිටින සහ අනාගත ආයෝජකයින්ට, ණය ලබා දෙන්නන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ප්‍රයෝජනයක් විය හැකි වන්නේ:

(අ) පරිපාලකයකට එරෙහි හිමිකම් පැවැත්ම, එම හිමිකම්පෑම දරන්නාට පරිපාලිතයකට එරෙහි හිමිකම් පෑමකට සංකේතමය වශයෙන් හිමිකමක් නොලැබේ; සහ

(ආ) සමහර අධිකරණ බල සීමාවන්හි පරිපාලකයට එරෙහි ස්කන්ධ හිමිකම්පෑම් දරන්නන් හට නෛතිකව බෙදාහැරීය හැකි ප්‍රමාණය රඳා පවතිනුයේ පරිපාලකයේ බෙදා හැරිය හැකි සංචිත මතය.

තනිව පරිපාලක අස්තිත්ත්වයෙහි සමහර හෝ සියලුම වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ හැකි තවත් ක්‍රමයක් වන්නේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල සටහන් තුළිනි.

3.18 ඒකාබද්ධ නොවූ මූල්‍ය ප්‍රකාශ වල ලබාදී ඇති තොරතුරු, පරිපාලකයේ දැනට සිටින සහ අනාගත ආයෝජකයින්ගේ, ණය ලබා දෙන්නන්ගේ සහ අනෙකුත් ණය හිමියන්ගේ තොරතුරු අවශ්‍යතාවයට අපේක්ෂිත පරිදි ප්‍රමාණයක් නොවේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වනවිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වලට ආදේශකයන් ලෙසට, ඒකාබද්ධ නොවන මූල්‍ය ප්‍රකාශ වලට එම කාර්යයන් ඉටුකළ නොහැක. එසේ වුවත්, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වලට අමතරව ඒකාබද්ධ නොවන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට පරිපාලකයට අවශ්‍ය වියහැකි හෝ තෝරාගත හැකිය.

*ඡේදය*

**4 වන පරිච්ඡේදයඃ මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග**

| | |
|---|---|
| **හැඳින්වීම** | **4.1** |
| **වත්කමක නිර්වචනය** | **4.3** |
| **හිමිකම** | **4.6** |
| **ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදනය සඳහා ඇති හැකියාව** | **4.14** |
| **පාලනය** | **4.19** |
| **වගකීමක නිර්වචනය** | **4.26** |
| **බැඳීම** | **4.28** |
| **ආර්ථික සම්පතක් පැවරීම** | **4.36** |
| **අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙසට වන වර්තමාන බැඳීම** | **4.42** |
| **වත්කම් සහ වගකීම්** | **4.48** |
| **ගිණුම් ඒකකය** | **4.48** |
| **පසුව ඉටුකිරීමේ ගිවිසුම්** | **4.56** |
| **ගිවිසුම් හිමිකම්වල සහ ගිවිසුම් බැඳීම්වල හරය** | **4.59** |
| **ස්කන්ධයක නිර්වචනය** | **4.63** |
| **ආදායම් සහ වියදම් නිර්වචනය** | **4.68** |

## හැඳින්වීම

4.1 *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* මූල්‍ය ප්‍රකාශ වල මූලිකාංග විස්තර කර ඇත්තේ:

(අ) වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය හා සම්බන්ධවන වත්කම්, වගකීම් සහ ස්කන්ධය; සහ

(ආ) වාර්තාකරණ අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධවන ආදායම් සහ වියදම්.

4.2 මෙම මූලිකාංග 1 වන පරිච්ඡේදයෙහි සහ 4.1 වගුවෙහි නිර්වචනය කර ඇති පරිදි ආර්ථික සම්පත්, හිමිකම්පෑම් සහ ආර්ථික සම්පත්වල සහ හිමිකම්පෑම්වල වෙනස්වීම් සමඟ ඈඳී ඇත.

**4.1 වගුව - මූල්‍ය ප්‍රකාශ වල මූලිකාංග**

| **පළමු වන පරිච්ඡේදයේ සාකච්ඡා කල අයිතමය** | **මූලිකාංගය** | **නිර්වචනය හෝ විස්තරය** |
|---|---|---|
| ආර්ථික සම්පත | වත්කම | අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස අස්තිත්ත්වයක් විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පතකි. |
| | | ආර්ථික සම්පතක් යනු ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව ඇති හිමිකමකි. |
| හිමිකමපෑම් | වගකීම | අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙසට ආර්ථික සම්පතක් පැවරීම සඳහා වර්තමානයෙහි අස්තිත්ත්වයට ඇති බැඳීමකි. |
| | ස්කන්ධය | අස්තිත්ත්වයෙහි සියළුම වගකීම් අඩු කළ පසු එහි වත්කම් වල ඇති අවශේෂ හිමිකමයි. |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබිඹු වන ආර්ථික සම්පත් වල සහ හිමිකම්පෑම් වල වෙනස් වීම. | ආදායම | ස්කන්ධ හිමිකම්පෑම් දරන්නන්හට අදාල දායකත්වයට සම්බන්ධිත දෑ හැරුනු විට වත්කම් වැඩි වීමෙහි හෝ වගකීම් අඩු වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් වන ස්කන්ධයේ වැඩිවීම. |
| | වියදම | ස්කන්ධ හිමිකම්පෑම් දරන්නන්හට අදාල බෙදා හැරීම් වලට සම්බන්ධිත දෑ හැරුණු විට වත්කම් අඩුවීමෙහි හෝ වගකීම් වැඩිවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් වන ස්කන්ධයේ අඩුවීම. |
| ආර්ථික සම්පත් හා හිමිකම්පෑම් වල වෙනත් වෙනස්කම් | – | ස්කන්ධ හිමිකම් දරන්නන්ගෙන් වන දායකත්වය සහ ඔවුන් වෙත කෙරෙන බෙදා හැරීම්. |
| | – | ස්කන්ධයෙහි වැඩිවීමක හෝ අඩුවීමක ප්‍රතිඵලයක් ලෙසට නොවන වත්කම් හෝ වගකීම් හුවමාරු කිරීම්. |

## වත්කමක නිර්වචනය

4.3 වත්කමක් යනු අතීත සිද්ධීන්හි ප්‍රතිඵලයක් වශයෙන් අස්තිත්ත්වයක් විසින් පාලනය කරන වර්තමාන ආර්ථික සම්පතකි.

4.4 ආර්ථික සම්පතක් යනු ආර්ථික ප්‍රතිලාභ ඇති කිරීමට හැකියාවක් ඇති හිමිකමකි.

4.5 මෙම නිර්වචනය එහි පැති තුනකින් මෙම කොටසෙන් සාකච්ඡා කෙරේ:

(අ) හිමිකම (4.6 – 4.13 ඡේද බලන්න);
(ආ) ආර්ථික ප්‍රතිලාභ ඇති කිරීමේ හැකියාව (4.14 – 4.18 ඡේද බලන්න); සහ
(ඇ) පාලනය (4.19 – 4.25 ඡේද බලන්න).

**හිමිකම**

4.6 ආර්ථික ප්‍රතිලාභ ඇති කිරීමේ හැකියාවන් ඇති හිමිකම් වලට පහත දෑ ඇතුළුව බොහෝ ස්වරූප ගනS:

(අ) වෙනත් පාර්ශ්වයක බැඳීමකට අනුරූප වන හිමිකම් (4.39 ඡේදය බලන්න) උදාහරණ සඳහා:

(i) මුදල් ලැබීමට ඇති අයිතිය.

(ii) භාණ්ඩ හෝ සේවා ලැබීමට ඇති අයිතිය.

(iii) වාසිදායක කොන්දේසි මත වෙනත් පාර්ශවයක් සමඟ ආර්ථික සම්පත් හුවමාරු කර ගැනීමට ඇති අයිතිය. මෙවැනි හිමිකම් වලට ඇතුලත් වන, උදාහරණ වශයෙන්, වර්තමානයෙහි වාසිදායක කොන්දේසි මත ආර්ථික සම්පත් මිළට ගැනීම සඳහා වන ඉදිරි ගිවිසුම් හෝ ආර්ථික සම්පතක් මිලදී ගැනීමට වන විකල්පයක් ගත හැකිය.

(iv) පැහැදිලිව සඳහන් කළ අවිනිශ්චිත අනාගත සිදුවීමක් සිදුවන්නේ නම්, වෙනත් පාර්ශවයක් ආර්ථික සම්පත් හුවමාරුවකට ඇති බැඳීමකින් ප්‍රතිලාභයක් ගැනීමට ඇති හිමිකම (4.37 ඡේදය බලන්න).

(ආ) වෙනත් පාර්ශවයකට ඇති බැඳීමකට අනුරූපී නොවන හිමිකම්, උදාහරණ වශයෙන්:

(i) භෞතික වස්තූන් මත වන හිමිකම්, දේපල, පිරියත සහ උපකරණ හෝ ඉන්වෙන්ට්‍රි වැනි දේවල්ය. මෙවැනි හිමිකම් වලට උදාහරණ වශයෙන්, භෞතික වස්තූන් පරිහරණය කිරීමට ඇති හිමිකම හෝ කල්බදු වස්තුවක අවශේෂ අගය මත ප්‍රතිලාභ ලැබීමේ හිමිකම ගත හැකිය.

(ii) බුද්ධිමය දේපළ භාවිතා කිරීමට ඇති හිමිකම.

4.7 බොහෝ හිමිකම් ස්ථාපිත කෙරෙනුයේ ගිවිසුම්, නීති සම්පාදනයෙන් හෝ සමාන ආකාර මඟිනි. උදාහරණ වශයෙන්, අස්තිත්ත්වයකට භෞතික වස්තුවක් හෝ කල්බදු වත්කමක් අයිතිවීම මඟින්, ණය සාධන පත්‍රයක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක අයිතිය මඟින් හෝ ලියාපදිංචි ස්වාධිකාර බලපත්‍රයක අයිතිය මඟින් හිමිකම ලබා ගත හැකිය. කෙසේ වුවත්, අස්තිත්ත්වයකට වෙනත් මාර්ග වලින් ද හිමිකම් ලබා ගත හැකිය. උදාහරණ වශයෙන්:

(අ) පොදු වශයෙන් ආධිපත්‍යය නොපවතින නිර්මාණශිලීබව අත්පත්කර ගැනීමෙන් හෝ නිර්මාණය කර ගැනීමෙන්; (4.22 ඡේදය බලන්න) ; හෝ

(ආ) වෙනත් පාර්ශවයකට එහි සිරිත් විරිත්, ප්‍රකාශිත ප්‍රතිපත්ති හෝ නිශ්චිත ප්‍රකාශනයන්ට පටහැනිව ක්‍රියා කිරීමට ප්‍රායෝගික හැකියාවක් නොමැති නිසා පැන නගින වෙනත් පාර්ශවයක බැඳීමක් හරහා ඇති වීමෙන් (4.31 ඡේදය බලන්න).

4.8 සමහර භාණ්ඩ හා සේවා - උදාහරණ වශයෙන්, සේවකයින්ගේ සේවාවන් ලැබෙනවාත් සමඟින් වහාම ඒවා පාරිභෝජනය කෙරෙයි. එවැනි භාණ්ඩ හා සේවාවන් මඟින් නිෂ්පාදනය කරන ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට අස්තිත්ත්වයේ හිමිකම, අවශ්‍යතාවය එම භාණ්ඩ හෝ සේවා පාරිභෝජනය තෙක් පවතින්නේ මොහොතකටය.

4.9 අස්තිත්ත්වයක සියළුම හිමිකම් එම අස්තිත්ත්වයෙහි වත්කම් නොවේ. අස්තිත්ත්වයෙහි වත්කම් බවට පත්වීමට නම්, හිමිකම් වලට වෙනත් සියළු පාර්ශව වලට (4.14-4.18 ඡේද බලන්න) ලබාගත හැකි ආර්ථික ප්‍රතිලාභ වලට එහා අස්තිත්ත්වය සඳහා ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදනය කිරීමේ හැකියාව සහ වත්කම් අස්තිත්ත්වය විසින් පාලනය කිරීම යන (4.19-4.25 ඡේද බලන්න) කරුණු දෙකම තිබිය යුතුය.

උදාහරණ වශයෙන්, සැළකිය යුතු පිරිවැයකින් තොරව සියලුම පාර්ශවයන් හට හිමිකම් ලබාගත හැකිබව උදාහරණ ලෙස, පොදු භාණ්ඩ වෙතට ප්‍රවිශ්ඨවීමේ හිමිකම, මහජනයාට ඉඩම් හරහා යාමට ඇති අයිතිය, හෝ පොදු ආධිපත්‍යය ඇති නිර්මාණශීලීබව වැනි අස්තිත්ත්ව රඳවාගෙන නොමැති වත්කම් වැනි දේ වෙයි.

4.10 අස්තිත්වයකට තමාගෙන්ම ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට හිමිකමක් තිබිය නොහැක. එහෙයින්:

(අ) අස්තිත්ත්වය විසින් නිකුත් කරනු ලබන ණය සාධන පත්‍ර හෝ ස්කන්ධ සාධනපත්‍ර ප්‍රති මිලදී ගෙන ඒවා රඳවාගෙන තිබීම - උදාහරණ වශයෙන්, භාණ්ඩාගාර කොටස් - ඒවා එම අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් නොවේ; සහ

(ආ) වාර්තාකරණ අස්තිත්ත්වය එක් නෛතික අස්තිත්ත්වයකට වඩා වැඩි අස්තිත්ත්වයන් ගෙන් සමන්විත වන්නේ නම්, එම නෛතික අස්තිත්ත්ව වලින් එකක් නිකුත් කරනු ලබන ණය සාධන පත්‍ර හෝ ස්කන්ධ සාධනපත්‍ර, එම නෛතික අස්තිත්ත්ව වල ඇති වෙනත් අස්තිත්ත්යවක් විසින් රඳවාගෙන ඇති විට, ඒවා වාර්තා කරන අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත් නොවේ.

4.11 මූලධර්මයක් ලෙසට, සෑම තනි අස්තිත්ත්වයක හිමිකම් යනු, වෙන්වූ වත්කමක් වේ. කෙසේ වුවත්, ගිණුම්කරණ පරමාර්ථ සඳහා සම්බන්ධිත හිමිකම් යන්න බොහෝවිට සළකනු ලබන්නේ තනි ගිණුම් ඒකකයක් ලෙසින් එනම්, තනි වත්කමක් ලෙසටය. (4.48 –4.55 ඡේද බලන්න) උදාහරණ වශයෙන්, භෞතිකව ඇති වත්කමක නෛතික හිමිකාරත්වය පහත දෑ ඇතුළුව හිමිකම් කීපයක් ඇති කරයි:

(අ) වත්කම පරිහරණය කිරීමට ඇති හිමිකම;

(ආ) වත්කම හා සම්බන්ධ වන හිමිකම් විකිණීමට ඇති හිමිකම;

(ඇ) වත්කම හා සම්බන්ධ වන හිමිකම් ඔඩපණ ගත කිරීමට ඇති හිමිකම; සහ

(ඈ) ඉහත (අ) - (ඇ) දක්වා ලැයිස්තුගත කර නොමැති අනෙකුත් හිමිකම්.

4.12 බොහෝ අවස්ථාවලදී භෞතික වස්තුවක නෛතික හිමිකාරීත්වයෙන් පැනනගින හිමිකම් කට්ටලය තනි වත්කමක් ලෙස ගණන් ගැනේ. සංකල්පමය වශයෙන් ආර්ථික සම්පත යනු, භෞතික වස්තුව නොව හිමිකම් සමූහයකි. කෙසේ වෙතත්, අයිතිවාසිකම් කට්ටලය භෞතික වස්තුව ලෙස විස්තර කිරීම තුළින් බොහෝ විට එම අයිතිවාසිකම් පිළිබඳ විශ්වාසනීය නියෝජනය වඩාත් සංක්ෂිප්ත හා තේරුම් ගත නොහැකි ආකාරයෙන් සැපයෙනු ඇත.

4.13 සමහර අවස්ථාවලදී, අයිතිය පවතීද යන්න අවිනිශ්චිත වේ. උදාහරණ වශයෙන්, වෙනත් පාර්ශවයකින් ආර්ථික සම්පතක් ලබා ගැනීමට අස්තිත්ත්වයට අයිතියක් තිබේද යන්න පිළිබඳව තර්ක කිරීමක් අස්තිත්ත්වය හා අදාල වෙනත් පාර්ශවය අතර ඇති විය හැකිය. පවතින එම අවිනිශ්චිතතාවය විසඳෙන තුරු - උදාහරණ වශයෙන්, අධිකරණ තීන්දුවක් මගින් - අස්තිත්ත්වයට හිමිකමක් තිබේද යන්න සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් වත්කමක් පවතින්නේ ද යන්න අවිනිශ්චිතවේ. (5.14 ඡේදයෙහි පැවැත්ම අවිනිශ්චිත වත්කම් හඳුනාගැනීම පිළිබඳව සාකච්ඡා කෙරේ)

**ආර්ථික ප්‍රතිලාභ නිපදවීමේ හැකියාව**

4.14 ආර්ථික සම්පතක් යනු ආර්ථික ප්‍රතිලාභ නිපදවීමේ හැකියාවක් ඇති හිමිකමකි. එම හැකියාව පැවතීම සඳහා එම හිමිකම ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදනයට ඇති හිමිකම නිශ්චිතව පැවැතිය යුතු හෝ වියහැකි වීමට අවශ්‍යතාවයක් නොමැත. හිමිකම දැනටමත් පැවතීම එකම අවශ්‍යතාවය වන අතර, අවම වශයෙන් එක් අවස්ථාවකදී වත් අස්තිත්ත්වය අනිකුත් සියලුම පාර්ශවයන්ට ලබාගත හැකි වීමට වඩා වැඩි ආර්ථික ප්‍රතිලාභ එය නිෂ්පාදනය කළයුතුවේ.

4.15 හිමිකමකට ආර්ථික සම්පතක අර්ථ දැක්වීම සපුරාලිය හැකි අතර, එම නිසා එහි ආර්ථික ප්‍රතිලාභ ලබාදීමේ සම්භාවිතාව අඩු වුවද, වත්කමක් විය හැකිය. කෙසේ වෙතත්, එම අඩු සම්භාවිතාවය ඇති විට වත්කම සඳහා ඉදිරිපත් කළයුතු තොරතුරු මොනවාද, එම තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ කෙසේද ආදිය තීරණ ගැනීමේදී බලපානු ලබන අතර, තීරණ වලදී වත්කම හඳුනාගන්නේද (5.15 - 5.17 ඡේද බලන්න) යන්න සහ එය මනින ආකාරය පිළිබඳව තීරණද ඇතුළත් විය යුතුය.

4.16 ආර්ථික සම්පතකට හිමිකම්පෑම් මගින් හෝ එය එසේ සිදුකිරීමට මංසැලසීම මගින් අස්තිත්වයක් සඳහා ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදනය කළහැකිය. උදාහරණ වශයෙන්, පහත දැක්වෙන දෑ වලින් එකක් හෝ කිහිපයක් ගත හැකිය:

(අ) ගිවිසුම් ගත වීම් තුළින් මුදල් ප්‍රවාහ හෝ වෙනත් ආර්ථික සම්පත් ලැබීම;

(ආ) වාසිදායක කොන්දේසි මත වෙනත් පාර්ශ්වයක් සමග ආර්ථික සම්පත් හුවමාරු කරගැනීම;

(ඇ) මුදල් ප්‍රවාහ ගලාඒම් ඇති කිරීම හෝ මුදල් ප්‍රවාහ ගලායෑම් වැළක්වීම, උදාහරණ වශයෙන්:

(i) එක්කෝ තනි තනිව හෝ වෙනත් ආර්ථික සම්පත් සමග සංයෝජනය වීමෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ සේවාවන් සැපයීමට ආර්ථික සම්පත භාවිතා කිරීම;

(ii) වෙනත් ආර්ථික සම්පත්වල වටිනාකම ඉහළ නැංවීම සඳහා ආර්ථික සම්පත භාවිතා කිරීම; හෝ

(iii) ආර්ථික සම්පත වෙනත් පාර්ශවයකට කල්බදු දීම;

(ඈ) ආර්ථික සම්පත විකිණීමෙන් මුදල් හෝ වෙනත් ආර්ථික සම්පත් ලබාගැනීම; හෝ

(ඉ) ආර්ථික සම්පත පැවරීම තුළින් වගකීම් වලින් ගෙවා නිදහස් වීම.

4.17 ආර්ථික සම්පතක එහි වටිනාකම උත්පාදනය කර ගන්නේ අනාගත ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදනය කිරීමට එහි ප්‍රවර්තන හැකියාවලින් වුවද, ආර්ථික සම්පත වන්නේ එම හිමිකමට නිෂ්පාදනය කළහැකි අනාගත ප්‍රතිලාභ නොව එම හැකියාවේ අඩංගු ප්‍රවර්තන හිමිකමයි. උදාහරණ වශයෙන්, මිළදීගත් විකල්පයක් එහි වටිනාකම උත්පාදනය කරගන්නේ අනාගත දිනයකදී වීමෙන් ක්‍රියාත්මක කිරීම තුලින් ආර්ථික ප්‍රතිලාභ නිපදවීමේ හැකියාව මගිනි. කෙසේ වුවත්, ආර්ථික සම්පත යනු, එහි ප්‍රවර්තන හිමිකමක් වන අතර, විකල්පය ක්‍රියාත්මක කිරීම අනාගත දිනයකදී සිදුවන්නකි. ආර්ථික සම්පත යනු, විකල්පය ක්‍රියාත්මක කිරීමෙන් දරන්නාට අනාගතයේ දී ලැබෙන ආර්ථික ප්‍රතිලාභ නොවේ.

4.18 වියදම් දැරීම සහ වත්කම් අත්පත් කර ගැනීම අතර සමීප සම්බන්ධතාවයක් තිබුණද, මෙම දෙවර්ගය අවශ්‍යයෙන්ම සමපාත විය යුතු නැත. එබැවින් අස්තිත්ත්වයක් වියදම් දැරීමේදී අස්තිත්ත්වයට අනාගතයේදී ආර්ථික ප්‍රතිලාභ අත්වීම පිළිබඳව සොයා බලා ඇති බවට සාක්ෂි තැබිය හැකි විය යුතු වුවත්, අස්තිත්ත්වය වත්කමක් ලබාගත් බවට වන නිශ්චිත සාක්ෂි සපයන්නේ නැත. ඒ හා සමානව සම්බන්ධිත වියදම් නොමැතිකම නිසා අස්තිත්ත්වය වත්කමක් නිර්වචනය සපුරාලීම වළක්වන්නේද නැත. වත්කම් වලට ඇතුළත් විය හැකි, උදාහරණ වශයෙන්, රජයක් විසින් අස්තිත්ත්වයට නොමිලේ ප්‍රදානය කර ඇති හිමිකම් හෝ වෙනත් පාර්ශවයක් විසින් අස්තිත්ත්වයට පරිත්‍යාග කර ඇති දේ ගත හැකිය.

**පාලනය**

4.19 පාලනය මගින් ආර්ථික සම්පතක් අස්තිත්ත්වයට සම්බන්ධ කෙරේ. පාලනය පවතින්නේ ද යන්න තක්සේරු කිරීම තුළින් අස්තිත්ත්වය විසින් වග උත්තර කිවයුතු ආර්ථික සම්පත් හඳුනාගැනීමට උපකාරී වේ. උදාහරණ වශයෙන්, සමස්ත දේපලක අයිතියෙන් පැනනගින හිමිකම් පාලනය නොකර, අස්තිත්ත්වයට දේපළක සමානුපාතික කොටසක් පාලනය කළ හැකිය. මෙවැනි අවස්ථාවන්හිදී අස්තිත්ත්වයෙහි වත්කම යනු එයින් පාලනය කරනු ලබන කොටස වන අතර, එයින් පාලනය නොවන සමස්ථ දේපළ හිමිකම පැන නැගෙන හිමිකම් නොවේ.

4.20 අස්තිත්ත්වයකට ආර්ථික සම්පතක් පාලනය කරනු ලබන්නේ ආර්ථික සම්පත් භාවිතා කිරීමට සහ එයින් ගලා ආ හැකි ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට මෙහෙයවීමට එයට වර්තමාන හැකියාවක් තිබේ නම් පමණි. පාලනයට ඇතුළත් වන්නේ අනෙකුත් පාර්ශවයන් විසින් ආර්ථික සම්පත් භාවිතා කිරීම මෙහෙයවීමට ඇති හැකියාව වැළැක්වීම සහ එයින් ගලා ආ හැකි ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම වළක්වාලීමයි. එයින් අනුසරනය කෙරෙන්නේ, එක් පාර්ශවයක් ආර්ථික සම්පතක් පාලනය කරන්නේ නම්, වෙනත් කිසිදු පාර්ශවයක් විසින් එම සම්පත පාලනය නොකරන බවයි.

4.21 අස්තිත්වයකට ආර්ථික සම්පතක් භාවිතා කිරීම මෙහෙයවීම සඳහා වර්තමාන හැකියාවක් ඇත්තේ එහි ක්‍රියාකාරකම් සඳහා ආර්ථික සම්පත ඵලදායි ලෙස යෙදවීමට හෝ හිමිකම හෝ වෙනත් පාර්ශවයකට එම පාර්ශවයේ ක්‍රියාකාරකම් වලට ආර්ථික සම්පත සඵලදායක ලෙස යෙදවීමට ඉඩදීමට හිමිකම ඇති විට පමණි.

4.22 ආර්ථික සම්පතක් පාලනය කිරීම සාමාන්‍යයෙන් පැනනගින්නේ නීතිමය හිමිකම් බලාත්මක කිරීමේ හැකියාවන් තුලිනි. කෙසේවෙතත්, ආර්ථික සම්පත් භාවිතා කිරීම මෙහෙයවීමට සහ එමඟින් ගලා ආ හැකි ප්‍රතිලාභ ලබාගැනීමට ප්‍රවර්තන හැකියාවක් අස්තිත්ත්වය හෝ වෙනත් ඕනෑම පාර්ශවයකට නොමැති බව සහතික වීමට අස්තිත්ත්වයට වෙනත් උපක්‍රම ඇත්නම් පාලනය එමඟින් ද පැන නැගිය හැකිය. උදාහරණ වශයෙන්, නිර්මානශීලී භාවයකට ප්‍රවේශ වීමට සහ එම නිර්මානශීලී බව රහසක් ලෙස තබා ගැනීමට ප්‍රවර්තන හැකියාව අස්තිත්ත්වයකට ඇත්නම්, එම නිර්මානශීලී බව ලියාපදිංචි කළ ස්වාධිකාරයක් මඟින් ආරක්ෂා නොවූවද, පොදු පාලනයන් යටතේ නොමැති නිර්මාණශීලී බවක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය අස්තිත්ත්වයට තිබිය හැක.

4.23 අස්තිත්ත්යක් විසින් ආර්ථික සම්පතක් පාලනය කිරීමට නම් එම සම්පතෙන් ලැබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ වෙනත් පාර්ශවයන් වෙතට එක්කෝ ඍජුව හෝ වක්‍රව අස්තිත්ත්වය වෙත ගලා ආ යුතුය. පාලනය පිළිබඳ මෙම අංගය තුළින් සියළු තත්ත්වයන් තුලදීම එම සම්පත මගින් ආර්ථික ප්‍රතිලාභ ලබාදෙන බවට අස්තිත්ත්වය විසින් සහතික වන බවක් හැඟවෙන්නේ නැත. ඒ වෙනුවට එයින් අදහස් කෙරෙනුයේ එම සම්පත ආර්ථික ප්‍රතිලාභ නිෂ්පාදනය කරන්නේ නම්, ඒවා එක්කෝ ඍජුව හෝ වක්‍රව ලබා ගන්නා පාර්ශවය වන්නේ අස්තිත්ත්වයයි.

4.24 ආර්ථික සම්පතක් මඟින් නිපදවන ආර්ථික ප්‍රතිලාභ වල වටිනාකමේ සැලකිය යුතු විචලතාවයන් සිදුවීමට නිරාවරණය වීමෙන් හැඟවිය හැක්කේ, අස්තිත්ත්වය එම සම්පත පාලනය කරන බවයි. කෙසේ වෙතත්, පාලනය පවතින්නේ ද යන්න පිළිබඳව කෙරෙන සමස්ත තක්සේරුවේදී සලකා බැලිය යුතු එක සාධකයක් පමණි.

4.25 සමහර වේලාවට එක පාර්ශවයක් (ප්‍රධානියකු) තවත් පාර්ශවයක් (නියෝජිතයකු) වෙනුවෙන් කටයුතු කිරීමට හා ප්‍රධානියාගේ යහපත සඳහා කටයුතු කිරීමට නිරත කරයි. උදාහරණ වශයෙන්, ප්‍රධානියකු විසින් පාලනය කරනු ලබන භාණ්ඩ විකිණීම සැලසුම් කිරීම සඳහා ප්‍රධානියා විසින් නියෝජිතයකු නිරත කළ හැකිය. ප්‍රධානියකු විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පතක් නියෝජිතයා හෝ භාරකාරීත්වය යටතේ තිබෙන විට, එම ආර්ථික සම්පත නියෝජිතයාගේ වත්කමක් නොවේ. තවද, ප්‍රධානියා විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පතක් තෙවන පාර්ශ්වයකට පැවරීමට නියෝජිතයාට බැඳීමක් තිබේනම්, එම වගකීම නියෝජිතයාගේ වගකීමක් නොවන්නේ මාරු කළ හැකි එම ආර්ථික සම්පත ප්‍රධානියාගේ ආර්ථික සම්පතක් මිස නියෝජිතයාගේ ආර්ථික සම්පතක් නොවන බැවිනි.

## වගකීමක නිර්වචනය

4.26 වගකීමක් යනු, අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් අස්තිත්ත්වයට ආර්ථික සම්පත් පැවරීමට ඇති වර්තමාන බැඳීමයි.

4.27 වගකීමක් පැවතීමට නම්, නිර්ණායකයන් තුනම සම්පූර්ණ විය යුතුය:

(අ) අස්තිත්ත්වයට වගකීමක් ඇති බව; (4.28 – 4.35 ඡේද බලන්න);

(ආ) ආර්ථික සම්පතක් පැවරීමේ වගකීමක් තිබීම (4.36 – 4.41 ඡේද බලන්න); සහ

(ඇ) බැඳීම යනු, අතීත සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙසට පවතින වර්තමාන වගකීමකි. (4.42- 4.47 ඡේද බලන්න).

### බැඳීම

4.28 වගකීමක් සඳහා වන ප්‍රථම නිර්ණායකය වන්නේ අස්තිත්ත්වයට බැඳීමක් ඇති බවයි.

4.29 බැඳීමක් යනු යම් අස්තිත්ත්වයකට වළක්වා ගැනීමට ප්‍රායෝගික හැකියාවක් නොමැති යුතුකමක් හෝ වගකීමක් වේ. බැඳීම යනු, සැම විටම වෙනත් පාර්ශවයකට (හෝ පාර්යශවයන්ට) යමක් කිරීමට බැඳී සිටීමයි. අනික් පාර්ශවය (හෝ පාර්ශවයන්) පුද්ගලයකු හෝ වෙනත් අස්තිත්ත්වයක්, පුද්ගල කණ්ඩායමක් හෝ වෙනත් අස්තිත්ත්ව හෝ මුළු මහත් සමාජයම වියහැකිය. යමක් කිරීමට බැඳී සිටින පාර්ශ්වයේ (හෝ පාර්ශවයන්ගේ) අනන්‍යතාවය දැන ගැනීම අවශ්‍ය නොවේ.

4.30 එක් පාර්ශ්වයකට ආර්ථික සම්පතක් පැවරීමට බැඳීමක් ඇති විට, එයින් කියැවෙන්නේ එම ආර්ථික සම්පත ලැබීමට වෙනත් පාර්ශවයකට (හෝ පාර්ශ්වයන්ට) හිමිකමක් ඇති බවයි. කෙසේවෙතත්, එක් පාර්ශවයක් විසින් වගකීමක් හඳුනාගෙන එය නිශ්චිත වටිනාකමකින් මැනීම සඳහා වන අවශ්‍යතාවයෙන් අනෙක් පාර්ශවය (හෝ පාර්ශවයන්) විසින් වත්කමක් හඳුනාගතයුතු හෝ එම වටිනාකමින්ම මැනිය යුතු යයි හැඟවෙන්නේ නැත. උදාහරණ ලෙස, එම වෙනස් නිර්ණායක අවශ්‍යතාවන් වී ඇත්තේ එමගින් නියෝජනය වීමට අදහස් කරන දෙය විශ්වාසනීයව නියෝජනය කරන වඩාත් අදාළ තොරතුරු තෝරා ගැනීමට අදහස් කරන තීරණවල ප්‍රතිඵලයක් වශයෙන් නම්, එක පාර්ශවයක වගකීමක් අනෙක් පාර්ශවයේ (පාර්ශව වල) අනුරූපී වත්කම් සඳහා වෙනස් හඳුනාගැනීමේ නිර්ණායක හෝ මිණුම් කිරීමේ අවශ්‍යතාවයන් ප්‍රශ්න වල අඩංගු විය හැකිය.

4.31 බොහෝ බැඳීම් ස්ථාපිත වී ඇත්තේ ගිවිසුම්, නීති සම්පාදනය හෝ සමාන ක්‍රම මඟින් වන අතර, එමගින් බැඳී සිටින පාර්ශවය (හෝ පාර්ශවයන්ට) විසින් නිත්‍යානුකූලව බලාත්මක කරනු ලැබේ. කෙසේ වෙතත්, අස්තිත්ත්වයක ඇති චාරිත්‍රානුකූල පරිචයන්, ප්‍රකාශිත ප්‍රතිපත්ති හෝ නිශ්චිත ප්‍රකාශවලින් ද එකී පරිචයන්, ප්‍රතිපත්ති හෝ ප්‍රකාශ මත පිහිටා අසංගත ආකාරයට ක්‍රියා කිරීමට අස්තිත්ත්වයට ප්‍රායෝගික හැකියාවක් නොමැති විටද බැඳීම් ඇතිවිය හැකිය. එවැනි අවස්ථාවන්හිදී පැනනඟින බැඳීම සමහරවිට "නිර්මාණාත්මක බැඳීමක්" ලෙස හැඳින්වේ.

4.32 සමහර අවස්ථාවන්හිදී, ආර්ථික සම්පතක් පැවරීම සඳහා අස්තිත්ත්වයට ඇති යුතුකම හා වගකීම එම අස්තිත්ත්වය විසින්ම ගනු ලබන විශේෂිතවූ අනාගත ක්‍රියාමාර්ගයක් මත ඇතිවන කොන්දේසි සහිත තත්ත්වයක් වනු ඇත. එවැනි ක්‍රියාවන්ට නිශ්චිත ව්‍යාපාරයක් මෙහෙය වීමට හෝ නිශ්චිත අනාගත දිනයකදී, නිශ්චිත වෙළඳපලක මෙහෙයුම් සිදු කිරීමට හෝ ගිවිසුමෙහි ඇති විශේෂිත විකල්පයක් ක්‍රියාත්මක කිරීම ඇතුළත් විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී යම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් වැලකී සිටීමට අස්තිත්ත්වයට ප්‍රායෝගික හැකියාවක් නොමැති නම්, එහිදී අස්තිත්ත්වයට බැඳීමක් ඇති වේ.

4.33 අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පදනම මත පිළියෙල කිරීම උචිත වන නිගමනය මඟින්, අස්තිත්ත්වය ඈවර කිරීම මඟින් හෝ වෙළඳ කටයුතු නතර කිරීමෙන් පමණක් වලක්වාගතහැකි එම පැවරුම වැළැක්වීමට අස්තිත්ත්වයට ප්‍රායෝගික හැකියාවක් නොමැතිය යන නිගමනය එසේම තහවුරුවේ.

4.34 ආර්ථික සම්පතක් පැවරීමෙන් වැළකීමට අස්තිත්ත්වයකට ප්‍රායෝගික හැකියාවක් තිබේද යන්න තක්සේරු කිරීමට භාවිතා කරන සාධක රඳා පවතින්නේ, එම අස්තිත්ත්වයෙහි යුතුකම් හා වගකීමේ ස්වභාවය මතය. උදාහරණ වශයෙන්, සමහර අවස්ථාවලදී වළක්වා ගැනීම සඳහා අස්තිත්ත්වයක් විසින් ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් තුළින් ලැබෙන ආර්ථික ප්‍රතිවිපාක, එම පැවරුමක් සිදුවන ප්‍රතිවිපාක වලට වඩා සැළකිය යුතු ප්‍රමාණයෙන් අහිතකර ලෙස බලපාන්නේ නම්, එහිදී අස්තිත්ත්වයට පැවරීම නැවැත්වීමට ප්‍රායෝගික හැකියාවක් තිබිය නොහැක. කෙසේ වෙතත්, පැවරුමක් සිදු කිරීමේ අභිප්‍රාය නොමැතිව හෝ පැවරුම කිරීමට ඉහළ හැකියාවක් නොමැති බව තුළින් අස්තිත්ත්වයට පැවරුම වළක්වා ගැනීම සඳහා ප්‍රායෝගික හැකියාවක් නොමැති බවට නිගමනය කිරීමට ප්‍රමාණවත් හේතුවක් වේ.

4.35 සමහර අවස්ථාවලදී, බැඳීමක් තිබේ ද යන්න අවිනිශ්චිත වේ. උදාහරණ වශයෙන්, අස්තිත්ත්වයක් විසින් සිදුකරන ලද වැරදි ක්‍රියාවක් සඳහා වෙනත් පාර්ශවයක් විසින් වන්දි ඉල්ලා සිටියේ නම්, එම ක්‍රියාව සිදු වී ඇත්ද, අස්තිත්ත්වය ඒ වරද කළේද හෝ නීතිය අදාළ වන්නේ කෙසේද, යන්න අවිනිශ්චිත විය හැකිය. එම අවිනිශ්චිතතාවය පැවතීම විසඳෙන තුරු - උදාහරණ වශයෙන්, අධිකරණ තීන්දුවක් මගින් - වන්දි ඉල්ලා සිටින පාර්ශවයට අස්තිත්ත්වයේ බැඳීමක් තිබේද යන්න සහ එහි ප්‍රතිඵලයක් ලෙසින් වගකීමක් තිබේද යන වගයි. (5.14 ඡේදය මගින් පැවැත්ම අවිනිශ්චිත වගකීම් හඳුනාගැනීම යටතේ සාකච්ඡා කෙරේ)

**ආර්ථික සම්පතක් පැවරීම**

4.36 වගකීමක් සඳහා වන දෙවැනි නිර්ණායකය වන්නේ, ආර්ථික සම්පතක් පැවරීමට වන බැඳීමකි.

4.37 මෙම නිර්ණායකයන් සපුරාලීමට ආර්ථික සම්පතක් වෙනත් පාර්ශවයකට (හෝ පාර්ශවයන්ට) පැවරීම සඳහා අස්තිත්ත්වයට අවශ්‍යවීමට බැඳියාවට හැකියාව තිබිය යුතුය. එම හැකියාව පැවතීම සඳහා එය නිශ්චිතවීම අවශ්‍ය නොවීම හෝ බොහෝවිට ආර්ථික සම්පත පැවරීමට අස්තිත්ත්වයට අවශ්‍යතාවයක් ඇති වීම - එම පැවරීම අවශ්‍ය වන්නේ, උදාහරණ වශයෙන්, නිශ්චය කරන ලද අවිනිශ්චිත අනාගත සිදුවීමක් සිදු වුවහොත් පමණි. එහි අවශ්‍යතාවය වන්නේ, බැඳීම දැනටමත් පැවතීම පමණක් වන අතර, අවම වශයෙන් එක් තත්ත්වයක් තුළ වුවද, අස්තිත්ත්වයකට ආර්ථික සම්පතක් පැවරීම අවශ්‍ය වනු ඇත.

4.38 ආර්ථික සම්පතක් පැවරීමේ සම්භාවිතාවය අඩු වුවද, බැඳීමකම වගකීමක් සඳහා වන නිර්වචනය සපුරාලිය හැකිය. කෙසේ වෙතත්, වගකීම හඳුනාගන්නේ ද (5.15 – 5.17 ඡේද බලන්න) වගකීම පිළිබඳව කුමන තොරතුරු ලබාදිය යුතුද සහ එම තොරතුරු ලබා දෙන්නේ කෙසේද යන තීරණ වලට පහළ සම්භාවිතාවය බලපෑ හැකිය.

4.39 ආර්ථික සම්පතක් පැවරීමේ බැඳීම් වලට ඇතුලත් කරුණු වලට උදාහරණ වශයෙන්:

(අ) මුදල් ගෙවීමට බැඳී සිටීම.

(ආ) භාණ්ඩ භාරදීමට හෝ සේවා ලබා දීමට බැඳී සිටීම.

(ඇ) අහිතකර කොන්දේසි මත වෙනත් පාර්ශවයක් සමග ආර්ථික සම්පත් හුවමාරු කර ගැනීමට වන බැඳීම්. එවැනි බැඳීම් වලට ඇතුලත් වන්නේ නිදසුනක් ලෙස, දැනට අහිතකර කොන්දේසි මත ආර්ථික සම්පතක් විකිණීමේ ඉදිරි ගිවිසුමක් හෝ විකල්ප වශයෙන්, වෙනත් පාර්ශවයකට අස්තිත්ත්වයෙන් ආර්ථික සම්පතක් මිළදී ගැනීමට ඇති හිමිකමක් තිබීම ගත හැකිය.

(ඈ) නිශ්චිතව සඳහන් කර ඇති අවිනිශ්චිත අනාගත සිදු වීමක් සිදුවුවහොත්, ආර්ථික සම්පතක් පැවරීමට වන බැඳීමක්.

(ඉ) යම් මූල්‍ය සාධන පත්‍රයක් මගින් ආර්ථික සම්පතක් හුවමාරුකර ගැනීමට අස්තිත්ත්වයක් බැඳී සිටීනම්, එවැනි මූල්‍ය සාධන පත්‍රයක් නිකුත් කිරීමට බැඳී සිටීම.

4.40 ආර්ථික සම්පතක් ලැබීමට හිමිකමක් ඇති පාර්ශවයකට, එම සම්පත පැවරීමේ බැඳීම ඉටු කරනවා වෙනුවට, සමහරවිට අස්තිත්ත්ව උදාහරණ ලෙස පහත දෑ තීරණය කරනු ඇත:

(අ) බැඳීමෙන් නිදහස් වීම පිළිබඳව සාකච්ඡාකර බැඳීම නිරවුල් කර ගැනීම;

(ආ) බැඳීම තෙවැනි පාර්ශවයකට පැවරීම; හෝ

(ඇ) ආර්ථික සම්පතක් පැවරීමට තිබූ බැඳීම නව ගනුදෙනුවකට එළඹීමෙන් එය බැඳීමෙන් ප්‍රතිස්ථාපනය වීම.

4.41 4.40 ඡේදයෙහි විස්තර කර ඇති තත්ත්වයන් යටතේ, යම් අස්තිත්ත්වයකට ආර්ථික සම්පතක් පැවරීමට ඇති බැඳීම එය නිරවුල් කරනතුරු, පවරන තුරු හෝ ප්‍රතිස්ථාපනය කරන තුරු පවතී.

**අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙසට වන වර්තමාන බැඳීම**

4.42 බැඳීමක් සඳහා තුන්වන නිර්ණායකය වන්නේ එම බැඳීම, අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙසට පැවති වර්තමාන බැඳීමයි.

4.43 අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙසින් වර්තමාන බැඳීම පවතින්නේ:

(අ) අස්තිත්ත්වය දැනටමත් ආර්ථික ප්‍රතිලාභ ලබා ගෙන තිබීම හෝ ක්‍රියාමාර්ගයක් ගෙන තිබීම ; සහ

(ආ) එහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙනත් ආකාරයකින් පැවරීමක් සිදු නොවූ ආර්ථික සම්පතක් පැවරීමට අස්තිත්ත්වයට සිදුවනු ඇත්තේ නම් පමණි.

4.44 ලබාගත් ආර්ථික ප්‍රතිලාභ වලට උදාහරණ ලෙස ඇතුලත් විය හැක්කේ භාණ්ඩ හෝ සේවාය. ගනු ලැබූ ක්‍රියාමාර්ගයට උදාරණයක් ලෙස, යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හෝ යම් වෙළඳපළක ක්‍රියාත්මක වීම ඇතුලත්විය හැකිය. කාලය පුරාවට ආර්ථික ප්‍රතිලාභ ලබා ගන්නේ නම් හෝ ක්‍රියාමාර්ග ගනු ලැබුවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන්, වර්තමාන වගකීම එම කාලය පුරාවටම එකතු වේ.

4.45 නව නීතියක් පනවන්නේ නම්, එම නීතියට ව්‍යවහාර වන ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පමණක් වර්තමාන බැඳීමක් පැනනගින විටද වෙනත් ආකාරයකින් එය පැවරීම සිදු නොකල යුතුවේ. ආර්ථික සම්පතක් අස්තිත්ත්වයට පැවරීමට හෝ පැවරීම කළයුතු විය හැකිය. අස්තිත්ත්වයකට වර්තමාන වගකීමක් ලබාදීමට නීති සම්පාදනය කිරීම පමණක්ම ප්‍රමාණවත් නොවේ. ඒ හා සමානව 4.31 ඡේදයේ සඳහන් කළ චාරිත්‍රානුකූල පරිචයක්, ප්‍රකාශිත ප්‍රතිපත්ති හෝ නිශ්චිත ප්‍රකාශ වර්තමාන බැඳීමක් ඇතිවීමට හේතුවක් වන්නේ, එම පරිචය, ප්‍රතිපත්තිය හෝ ප්‍රකාශය ව්‍යවහාර වන ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රතිඵලයක් වනවිට නම් පමණක්, වෙනත් ආකාරයකින් එය පැවරීම සිදු නොකළයුතු වූ ආර්ථික සම්පතක් අස්තිත්ත්වය පැවරීමට හෝ පැවරීමක් කිරීම කළයුතු විය හැකිය.

4.46 අනාගතයේ යම් මොහොතක් වන තුරු ආර්ථික සම්පතක පැවරීමක් බලාත්මක කළ නොහැකි තෙක්, වර්තමාන බැඳීමක් පැවතිය හැකිය. උදාහරණ වශයෙන්, ගිවිසුමකින් අනාගත දිනයක් දක්වා ගෙවීමක් කිරීම අවශ්‍ය නොවූවද, මුදල් ගෙවීම සඳහා ගිවිසුම්ගත බැඳීමක් දැනට පැවතිය හැකිය. ඒ හා සමානව අස්තිත්ත්වයක් වෙනුවෙන් අනාගතයේ යම් දිනක කාර්යයන් ඉටුකිරීම සඳහා ඇති ගිවිසුම්ගත බැඳීමක්, එම අනාගත දිනය තෙක් ප්‍රති පාර්ශවයන්ට එම කාර්යය ඉටුකරන ලෙසට අස්තිත්ත්වයට ඉල්ලුම් කිරීමට පුළුවන්කමක් නැති වුවත් එම බැඳීම දැනට පැවතිය හැක.

4.47 4.43 ඡේදයේ දැක්වෙන නිර්ණායක මෙතෙක් සපුරා නොමැති නම්, එනම්, අස්තිත්ත්වය මෙතෙක් ආර්ථික ප්‍රතිලාභ ලබා නොමැති නම් හෝ යම් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, එම අස්තිත්ත්වයට අවශ්‍ය විය හැකි ආර්ථික සම්පතක් පැවරීමට, වෙනත් ආකාරයෙන් මාරුකිරීමට සිදු නොවූ ආර්ථික සම්පතක් පැවරීමට අස්තිත්ත්වයට වර්තමානයෙහි තවමත් බැඳීමක් නොමැත. උදාහරණ වශයෙන්, අස්තිත්ත්වයක් විසින් සේවකයෙකුගෙන් සේවයක් ලබා ගැනීමට හුවමාරු කරගැනීමක් කල එම සේවකයාට වැටුපක් ගෙවීම සඳහා ගිවිසුමකට ඇතුළත්ව ඇත්නම්, එම සේවකයාගේ සේවය ලැබෙන තෙක් එම වැටුප ගෙවීමට අස්තිත්ත්වයට වර්තමාන බැඳීමක් නොමැත. ඊට පෙර ගිවිසුම ක්‍රියාත්මක වේ නම්, සේවකයාගෙන් අනාගතයෙහි ලැබෙන සේවාවන් සඳහා අනාගත වැටුප හුවමාරු කරගැනීමට අස්තිත්ත්වයට සංයෝජිත අයිතියක් හා බැඳීමක් ඇත. (4.56-4.58 ඡේද බලන්න).

## වත්කම් සහ වගකීම්

**ගිණුම් ඒකකය**

4.48 ගිණුම් ඒකකය යනු, හඳුනාගැනීමේ නිර්ණායක සහ මිනුම් සංකල්ප අදාල වන හිමිකම හෝ හිමිකීම් සමූහය හෝ බැඳීම හෝ බැඳීම් සමූහය හෝ හිමිකම් සහ බැඳීම් සමූහයයි.

4.49 වත්කමක් හා වගකීමක් සඳහා ගිණුම් ඒකකයක් තෝරාගනු ලබන්නේ, එම වත්කමට හෝ වගකමට සහ අදාළ ආදායම සහ වියදම සඳහා වන හඳුනාගන්නා නිර්ණායක සහ මිනුම් සංකල්ප අදාළ වන්නේ කෙසේද යන්න සළකා බැලීමේදීය. සමහර තත්ත්වයන් තුල, හඳුනාගැනීම සඳහා එක් ගිණුම් ඒකකයක් සහ මිනුම් සඳහා වෙනත් ගිණුම් ඒකකයක් තෝරා ගැනීම උචිත විය හැකිය. උදාහරණ වශයෙන්, සමහරවිට ගිවිසුම් තනි තනි ව හඳුනාගත හැකි නමුත්, මැනීමේදී ගිවිසුම් කළඹක කොටසක් ලෙස මනිනු

ලැබේ. ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වත්කම්, වගකීම්, අදායම් සහ වියදම් එකතු කිරීම හෝ සංරචක වලට වෙන් කිරීම අවශ්‍ය විය හැකිය.

4.50 යම් අස්තිත්ත්වයක් වත්කමක කොටසක් හෝ වගකීමක කොටසක් පවරන්නේ එවිට ගිණුම් ඒකකය වෙනස් විය හැකි අතර, එමගින් පවරන ලද සංරචකය සහ රඳවාගත් සංරචකය වෙනම ගිණුම් ඒකක බවට පත්වේ. (5.26 – 5.33 ඡේද බලන්න).

4.51 ප්‍රයෝජනවත් තොරතුරු ලබාදීම සඳහා ගිණුම් ඒකකයක් තෝරාගෙන ඇති අතර, එයින් අදහස් කරන්නේ:

(අ) වත්කම් හෝ වගකීම් පිළිබඳව ලබාදුන් තොරතුරු සහ ඒ හා සම්බන්ධිත ඕනෑම ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ද අදාළ විය යුතුය. හිමිකම් හා බැඳීම් වෙනම ගිණුම් ඒකක ලෙස සලකා තොරතුරු සැපයීමට වඩා හිමිකම් නිසා බැඳීම් සමූහයක් තනි ගිණුම් ඒකකයක් ලෙස සළකන්නේ නම්, උදාහරණයක් වශයෙන්, එම අයිතිවාසිකම් හා බැඳීම් පහත කරුණු සපුරාලන විට අදාළ තොරතුරු වඩාත් පහසුවෙන් සැපයිය හැකිවේ.

(i) වෙනම ගනුදෙනු වල විෂයයන් නොවන හෝ විය නොහැකිවීම;

(ii) වෙනස් රටා වලින් කල් ඉකුත් විය නොහැකි බව;

(iii) සමාන ආර්ථික ගතිලක්ෂණ සහ අවදානම් තිබීම සහ එම නිසා අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ අස්තිත්ත්වයට ගලාඒම හෝ අස්තිත්ත්වයෙන් ශුද්ධ මුදල් ගලා යෑම පිළිබඳ අපේක්ෂාවන්ට සමාන ඇඟවීම් තිබිය හැකිය; හෝ

(iv) මුදල් ප්‍රවාහ හට ගැන්වීමට අස්තත්ත්වයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාරික කටයුතුවල එසේම භාවිතා කිරීම සහ එකසේ අනෙකක් හා බැඳුනු අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු වලට යොමු කරමින් මැනීම.

(ආ) වත්කම් හෝ වගකීම් පිළිබඳව සහ අදාල ඕනෑම ආදායමක් හා වියදම් පිළිබඳ තොරතුරු වලින් ඒවා පැනනැඟුන ගනුදෙනුවේ හෝ වෙනත් සිද්ධියක හරය සමඟින් විශ්වාසනීයව නියෝජනයක් කළ යුතුය. එබැවින්, වෙනස් ප්‍රභවයන්ගෙන් පැන නගින හිමිකම් හෝ බැඳීම් තනි ගිණුම් ඒකකයක් ලෙස සැළකීම හෝ තනි ප්‍රභවයකින් පැන නගින හිමිකම් හෝ බැඳීම් තනි ගිණුම් ඒකකයක් ලෙස සැළකීම හෝ තනි ප්‍රභවයකින් පැන නගින හිමිකම් හෝ බැඳීම් වෙන් කිරීම අවශ්‍ය විය හැකිය. (4.62 ඡේදය බලන්න) සමානව අසම්බන්ධන හිමිකම් සහ බැඳීම් පිළිබඳ විශ්වාසනීය නියෝජනයක් ලබාදීමට සමානව, ඒවා වෙන වෙනම හඳුනාගෙන මැන බැලීම අවශ්‍ය විය හැකිය.

4.52 පිරිවැය වෙනත් මූල්‍ය වාර්තාකරණ තීරණවලට සීමාකිරීම් වනවා සේම, ගිණුම් ඒකකයක් තෝරාගැනීමේදී ද එය සීමාකිරීමක් බවට පත් වේ. එබැවින්, ගිණුම් ඒකකයක් තෝරාගැනීමේදී, එම ගිණුම් ඒකකය තෝරාගැනීමෙන් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්ට ලබාදී ඇති තොරතුරු වල ප්‍රතිලාභ, එම තොරතුරු ලබාදීමේදී හා භාවිතා කිරීමේ පිරිවැය සමඟ සාධාරණීකරණය කළ හැකි ද යන්න සළකා බැලීම වැදගත්ය. පොදුවේ ගත් කළ, ගිණුම් ඒකකයේ ප්‍රමාණය අඩුවන විට වත්කම්, වගකීම්, අදායම් සහ වියදම් හඳුනාගැනීම, මැනීම හා සම්බන්ධ පිරිවැය වැඩි වේ. එබැවින්, පොදුවේ ගත් කළ, එකම ප්‍රභවයකින් පැනනගින හිමිකම් හෝ බැඳීම් වෙන්කරනු ලබන්නේ එහි ප්‍රතිඵලයක් වන තොරතුරු වඩාත් ප්‍රයෝජනවත් නම් සහ පිරිවැයට වඩා එයින් ලැබෙන ප්‍රතිලාභ අගයෙන් වැඩි වන්නේනම් පමණි.

4.53 සමහර අවස්ථාවලදී හිමිකම් හා බැඳීම් යන දෙකම එකම ප්‍රභවයකින් පැනනගී. උදාහරණ වශයෙන්, සමහර ගිවිසුම් මගින් එක් එක් පාර්ශවයන් සඳහා වගකීම් සහ බැඳීම් යන දෙකම ස්ථාපිත කෙරේ. එම අයිතිවාසිකම් හා බැඳීම්, එකක් අනෙකක් හා බැඳී ඇත්නම් හා වෙන් කළ නොහැකි නම්, ඒවා තනි වෙන් කළ නොහැකි වත්කමක් හෝ වගකීමක් ලෙස ස්ථාපනය වන අතර, එම නිසා තනි ගිණුමක් සෑදේ. උදාහරණ වශයෙන්, පසුව ඉටුකිරීමේ ගිවිසුමේ තත්ත්වය මෙලෙස වෙයි. (4.57 ඡේදය බලන්න) ප්‍රතිවිරුද්ධ වශයෙන් බැඳීම්වලින් හිමිකම් වෙන්කළ හැකිනම්, වෙනම වත්කම් හා වගකීම් එකක් හෝ කීපයක් හඳුනාගැනීමේ ප්‍රතිඵලය ලෙස සමහර විට බැඳීම්වලින් වෙන්ව හිමිකම් කාණ්ඩ කිරීම උචිත විය හැකිය. වෙනත් අවස්ථාවලදී, වෙන් කළ හැකි හිමිකම් සහ බැඳීම් ඒවා තනි වත්කමක් හෝ වගකීමක් ලෙස සළකා තනි ගිණුම් ඒකකයක කාණ්ඩ කිරීම වඩා උචිත විය හැකිය.

4.54 හිමිකම හා බැඳීම් කට්ටලයක් තනි ගිණුම් ඒකකයක් ලෙස සැලකීම, වත්කම හා වගකීම් හිලව් කිරීමට වඩා වෙනස්වෙයි. (7.10 ඡේදය බලන්න).

4.55 විය හැකි ගිණුම් ඒකක තුල ඇතුළත් වන්නේ;

(අ) තනි හිමිකමක් හෝ තනි බැඳීමක්;

(ආ) සියළු හිමිකම්, සියළු බැඳීම් හෝ තනි ප්‍රභවයකින් පැනනගින සියළු හිමිකම් සහ සියළු බැඳීම්, උදාහරණ වශයෙන්, ගිවිසුමක්;

(ඇ) තනි ප්‍රභවයකින් පැනනගින එම හිමිකම් සහ/හෝ බැඳීම් වල උප කාණ්ඩයක් - උදාහරණ වශයෙන්, එම අයිතමයට වැඩි වෙනත් හිමිකම් වලින් ප්‍රයෝජනවත් ජීව කාලය සහ පරිභෝජන රටාව, වෙනත් දේපල, පිරියත සහ උපකරණ අයිතමයකට වඩා වැඩි උප කණ්ඩායමක හිමිකම්;

(ඈ) සමාන අයිතමයන් කළඹකින් පැනනගින හිමිකම් සහ/ හෝ බැඳීම් කාණ්ඩයක් ;

(ඉ) අසමාන අයිතම කළඹකින් පැනනගින හිමිකම් සහ/ හෝ බැඳීම් කාණ්ඩයක් - උදාහරණ වශයෙන්, තනි ගනුදෙනුවකින් බැහැර කළ යුතු වත්කම් හා වගකීම් කලඹක්; සහ

(ඊ) අයිතම කළඹක් තුල ඇති අවදානම් නිරාවරණ අයිතම කළඹක් පොදු අවදානමකට යටත් වන්නේ නම්, එම කළඹ සඳහා වන ගිණුම්කරණයේ සමහර අංගයන් විසින් එම කළඹ තුල එම අවදානමේ සමග සමස්ථ නිරාවරණය කෙරෙහි අවධානය යොමු කරනු ලැබිය හැකිය.

**පසුව ඉටුකිරීමේ ගිවිසුම්**

4.56 පසුව ඉටුකිරීමේ ගිවිසුමක් යනු, සමානව ඉටු නොකල ගිවිසුමක් හෝ ගිවිසුමේ කොටසකි. කිසිදු පාර්ශවයක් සිය බැඳීම් කිසිවක් ඉටුකර නොමැති හෝ දෙපාර්ශ්වයම අර්ධ වශයෙන් ඔවුන්ගේ බැඳීම් සමානව ඉටු කර ඇති ගිවිසුමකි.

4.57 පසුව ඉටුකිරීමේ ගිවිසුමක් මගින් ආර්ථික සම්පත් හුවමාරු කරගැනීමේ සංයෝජිත හිමිකමක් හා බැඳීමක් ස්ථාපිත කෙරේ. හිමිකම හා බැඳීම එකක් අනෙක හා බැඳුනු අතර, ඒවා වෙන්කල නොහැක. එබැවින් සංයෝජිත හිමිකම හා බැඳීම තනි වත්කමක් හෝ වගකීමක් වේ. හුවමාරු කොන්දේසි දැනට වාසිදායක වන්නේ නම්, අසතිත්ත්වයට වත්කමක් ඇත. හුවමාරු කොන්දේසි දැනට අවාසිදායක වන්නේ නම් අස්තිත්ත්වයට වගකීමක් ඇතිවෙයි. මූල්‍ය ප්‍රකාශවල එවැනි වත්කමක් හෝ වගකීමක් ඇතුළත් වේ ද යන්න රඳා පවතින්නේ අදාල ගිවිසුම භාරදූර ද යන්නට අදාල වන්නේ නම් යම් පරීක්ෂණයන් කිරීම ඇතුළුව වත්කම හෝ වගකීම හඳුනාගැනීමේ (5 වන ඡේදය බලන්න) සහ මිණුම් කිරීමේ පදනම (6 වන ඡේදය බලන්න) යන කරුණු දෙකම මතය.

4.58 ගිවිසුම යටතේ එක් පාර්ශවයක් සිය බැඳීම් ඉටු කරන තාක් දුරට ගිවිසුම තවදුරටත් පසුව ඉටුකිරීමේ ගිවිසුමක් නොවේ. වාර්තාකරණ අස්තිත්ත්වය ප්‍රථමයෙන් ගිවිසුම යටතේ ඉටුකරයි නම්, එම ඉටුකිරීම වාර්තාකරණ අස්තිත්ත්වය ආර්ථික සම්පත් වලට හුවමාරු කිරීම, ආර්ථික සම්පතක් ලැබීමට ඇති අයිතියක් බවට වෙනස් කිරීමේ සිදධියක් වනු ඇත. එම හිමිකම වත්කමකි. අනෙක් පාර්ශවය පළමුව ඉටු කිරීම යනු, ආර්ථික සම්පත් හුවමාරු කරගැනීමට වාර්තාකරණ අස්තිත්ත්වයෙහි හිමිකම හා බැඳීම වෙනස් කර, ආර්ථික සම්පත් හුවමාරු කර ගැනීමේ වගකීමක් බවට පත්වන සිද්ධියෙන් පසුව එම බැඳීම වගකීමකි.

**ගිවිසුම්ගත හිමිකම් වල සහ ගිවිසුම් ගත බැඳීම්වල හරය**

4.59 ගිවිසුමක නියමයන් මගින් එම ගිවිසුමෙහි පාර්ශවකරුවෙකු වන අස්තිත්ත්වයක් සඳහා හිමිකම් සහ බැඳීම් ඇති කරයි. එම හිමිකම් හා බැඳීම් විශ්වාසනීයව නියෝජනය කිරීම සඳහා, මූල්‍ය ප්‍රකාශ ඒවායේ හරය වාර්ථා කරයි. (2-12 ඡේදය බලන්න) සමහර අවස්ථාවලදී, හිමිකම්වල සහ බැඳීම්වල හරය ගිවිසුමෙහි නෛතික ස්වරූපයෙන් පැහැදිලිවේ. වෙනත් අවස්ථාවලදී, හිමිකම්වල සහ බැඳීම්වල හරය හඳුනාගැනීම සඳහා ගිවිසුමෙහි නියමයන් හෝ සමූහයක් හෝ ගිවිසුම් මාලාවක් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය වේ.

4.60 ගිවිසුමෙහි ඇති සියලුම නියමයන් - ඉතා පැහැදිලි හෝ ව්‍යංග වුවද, හරයක් නොමැතිනම් මිස සළකා බලනු ලැබේ. ව්‍යංග කොන්දේසි වලට ඇතුලත් විය හැක්කේ උදාහරණයක් ලෙස, ගණුදෙනුකරුවනට භාණ්ඩ විකිණීම සඳහා ගිවිසුම්වලට එළඹෙන අස්තිත්ත්ව මත පනවා ඇති ව්‍යවස්ථාපිත ප්‍රතිඥා භාර බැඳීම් වැනි ප්‍රඥප්ති මගින් පනවනු ලබන බැඳීම් ඇතුළත් විය හැකිය.

4.61 කිසිදු හරයක් නොමැති නියමයන් නොසළකා හරිනු ලැබේ. ගිවිසුමෙහි ආර්ථික වශයෙන් පැහැදිලි බලපෑමක් නොමැති නම්, යම් නියමයකට හරයක් නොමැති වේ. කිසිදු හරයක් නොමැති නියමයකට උදාහරණ වශයෙන්:

(අ) කිසිදු පාර්ශ්වයක් බැඳ නොතබන නියමයන් ; හෝ

(ආ) දරන්නාට ඕනෑම තත්ත්වයක් යටතේ ක්‍රියාත්මක කිරීමට ප්‍රායෝගික හැකියාවක් නොමැති විකල්පයන් ඇතුලත් හිමිකම්.

4.62 සමස්ත වාණිජමය බලපෑමක් ලබා ගැනීම සඳහා හෝ ලබා ගැනීමට සැලසුම් කිරීම සඳහා හෝ ගිවිසුම් මාලා සමූහයක් නිර්මාණය කිරීමට ඉඩ ඇත. එවැනි ගිවිසුම් වල හරය වාර්තා කිරීම සඳහා එම කණ්ඩායමේ හෝ ගිවිසුම් මාලාවෙන් පැන නගින හිමිකම් සහ බැඳීම් තනි ගිණුම් ඒකකයක් ලෙස සැලකීම අවශ්‍ය වේ. උදාහරණක් ලෙස, එක් ගිවිසුමක හිමිකම් හෝ බැඳීම්, එම වේලාවේදීම එම ප්‍රතිපාර්ශවය සමඟ එළඹෙන තවත් ගිවිසුමකින් සියළුම හිමිකම් සහ බැඳීම් නිකම්ම අවලංගු වන්නේ නම්, ගිවිසුම් දෙකේ සංයෝජිත බලපෑම වන්නේ හිමිකම් හෝ බැඳීම් ඇති නොවීමයි. මෙයට ප්‍රති විරුද්ධ වශයෙන් වෙන්වූ ගිවිසුම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් මඟින් ඇති කළයුතු හිමිකම් හෝ බැඳීම් කට්ටල එකක් හෝ වැඩි ගණනක් තනි ගිවිසුමකින් ඇති කරයි නම්, හිමිකම් හා බැඳීම් විශ්වසනීයව නියෝජනය කිරීමට හැකිවනු පිණිස එම හිමිකම් හා බැඳීම් ඇතිවූයේ වෙන්වූ ගිවිසුම් වලින් ලෙස සළකා සෑම කට්ටලයක් සඳහාම අස්තිත්ත්වය ගණන් පෙන්වීම අවශ්‍ය විය හැකිය. (4.48 – 4.55 ඡේද බලන්න).

## ස්කන්ධය නිර්වචනය කිරීම

4.63 ස්කන්ධය යනු, අස්තිත්ත්වයේ එහි සියළු වගකීම් අඩුකළ පසු වත්කම්වල ඇති අවශේෂ හිමිකමය.

4.64 ස්කන්ධ හිමිකම්පෑම් යනු, අස්තිත්ත්වයේ සියළු වගකීම් අඩු කිරීමෙන් පසු එහි අවශේෂ වත්කම් මත ඇති හිමිකම්පෑමයි. වෙනත් වචන වලින් කිවහොත්, ඒවා අස්තිත්ත්වයට එරෙහිව ඇති හිමිකම්පෑම් වන අතර, ඒවායින් වගකීමක අර්ථ නිරූපනය සපුරානොලයි. එවැනි හිමිකම්පෑම්, ගිවිසුම්, නීති සම්පාදනයෙන් හෝ ඒ හා සමාන ක්‍රම මඟින් ස්ථාපිත කළ හැකි අතර, වගකීමේ අර්ථ නිරූපන සපුරාලිය නොහැකි තරමට ඒවා ඇතුළත් කළ හැකිය:

(අ) අස්තිත්ත්වය විසින් නිකුත් කරන ලද විවිධ වර්ගවල කොටස්; සහ

(ආ) වෙනත් ස්කන්ධ හිමිකම්පෑම් නිකුත් කිරීමට අස්තිත්ත්වයේ සමහර බැඳීම්.

4.65 සාමාන්‍ය කොටස් සහ වරණීය කොටස් වැනි විවිධ පංතිවල ස්කන්ධ හිමිකම්පෑම් මඟින් ඒවා දරන්නන් වෙත විවිධ හිමිකම් පිරිනැමීම කළ හැකිය. උදාහරණ වශයෙන්, අස්තිත්ත්වයෙන් පහත දැක්වෙන සියළු දේ හෝ ඉන් සමහරක් ලැබීමේ අයිතිය ගත හැකිය:

(අ) ලාභාංශ, සුදුසුකම්ලත් දරන්නන් වෙත ලබාදීමට අස්තිත්ත්වයක් තීරණය කරන්නේ නම්;

(ආ) ස්කන්ධ හිමිකම්පෑම් තෘප්තිමත් කර ගැනීමෙන් ලැබෙන උත්පාදන එක්කෝ සම්පූර්ණයෙන් ඈවර කිරීමෙන් හෝ වෙනත් කාලවලදී අර්ධ වශයෙන්; හෝ

(ඇ) වෙනත් ස්කන්ධ හිමිකම්පෑම්.

4.66 සමහර අවස්ථා වලදී, නෛතික නියාමන හෝ වෙනත් අවශ්‍යතාවයන්, ප්‍රාග්ධනය හෝ රඳවා ගත් ඉපයුම් වැනි දේ ස්කන්ධයක විශේෂිත සංචිත වලට බලපායි. උදාහරණ වශයෙන්, එවැනි සමහර අවශ්‍යතා මඟින් ස්කන්ධ හිමිකම්පෑම් දරන්නන්හට බෙදාහැරීම් කිරීමට අස්තිත්ත්වයට අවසර දී ඇත්තේ, එම අවශ්‍යතා බෙදාහැරිය හැකි යැයි නියම කර ඇති ප්‍රමාණවත් සංචිතයක් එම අස්ථිත්වයට තිබේ නම් පමණි.

4.67 ව්‍යාපාරික ක්‍රියාකාරකම් බොහෝ විට සිදු කරනු ලබන්නේ තනි හිමිකාරත්ව, හවුල් ව්‍යාපාර, භාර හෝ විවිධ වර්ගයේ රජයේ ව්‍යාපාර වැනි අස්තිත්ත්ව විසිනි. එවැනි අස්තිත්ත්ව සඳහා නෛතික හා නියාමන ආකෘතිමය රාමුව බොහෝවිට සංස්ථාවක අස්තිත්ත්ව වලට අදාල වන ආකෘතිමය රාමු වලට වඩා වෙනස් වේ. උදාහරණ වශයෙන් - ස්කන්ධ දරන්නන්ට හිමිකම්පෑම් බෙදා හැරීම සඳහා එවැනි අස්තිත්ත්ව වලට සීමා කිරීම් තිබිය හැකිය. කෙසේ වෙතත්, *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* ඡේද 4-63 හි දැක්වෙන අස්තිත්ත්ව පිළිබඳ නිර්වචනය සියළුම වාර්තාකරණ අස්තිත්ත්ව වලට අදාල වේ.

## ආදායම් සහ වියදම්හි නිර්වචනය

4.68 ස්කන්ධ හිමිකම්පෑම් කරන ධාරකයින්ගෙන් වන දායකත්වය හර වත්කම් වැඩිවීම හෝ වගකීම් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස ස්කන්ධයේ වැඩිවීම ආදායමවේ.

4.69 ස්කන්ධ හිමිකම්පෑම් දරන්නනට සම්බන්ධ බෙදා හැරීම් හැර, වත්කම් අඩුවීම වියදම් වැඩිවීමේ ප්‍රතිඵලයක් වන ස්කන්ධයේ අඩුවීම වියදමවේ.

4.70 ආදායම් හා වියදම් පිළිබඳ මෙම නිර්වචන මඟින් පැහැදිලි කෙරෙනුයේ, ස්කන්ධ හිමිකම් දරන්නන්ගේ දායකත්වය ආදායමක් නොවන සහ ස්කන්ධ හිමිකම්පෑම් දරන්නන් හට කරනු ලබන බෙදාහැරීම් වියදමක් නොවන බවය.

4.71 ආදායම් සහ වියදම් යනු, අස්තිත්ත්වයක මූල්‍ය කාර්ය සාධනයට අදාළ මූල්‍ය ප්‍රකාශ වල මූලිකාංගවේ. මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට අස්තිත්ත්වයක මූල්‍ය තත්ත්වය සහ එහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු අවශ්‍ය වේ. එබැවින්, වත්කම් හා වගකීම් වෙනස්වීම් භාෂිතය අනුව ආදායම් සහ වියදම් නිර්වචනය කර ඇතත්, වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු මෙන්ම ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු ද වැදගත් වේ.

4.72 වෙනස් ගනුදෙනු සහ වෙනත් සිදුවීම් වෙනස් ගතිලක්ෂණ සහිත ආදායම් හා වියදම් ජනනය කරයි. වෙනස් ගතිලක්ෂණ සහිත ආදායම් හා වියදම් පිළිබඳව වෙන වෙනම තොරතුරු සැපයීමෙන්, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්හට අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව අවබෝධ කර ගැනීමට උපකාරී වේ. (7.14 – 7.19 ඡේද බලන්න).

*ඡේදය*

**5 වන පරිච්ඡේදය - හඳුනාගැනීම සහ ප්‍රතිහඳුනාගැනීම**


| | |
|---|---|
| **හඳුනාගැනීමේ ක්‍රියාවලිය** | **5.1** |
| **හඳුනාගැනීමේ නිර්ණායකයන්** | **5.6** |
| **අදාළත්වය** | **5.12** |
| පැවැත්මෙහි අවිනිශ්චිතතාවය | 5.14 |
| ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලා යාමේ අඩු සම්භාවිතාවය | 5.15 |
| **විශ්වසනීය නියෝජනය** | **5.18** |
| මිනුම් අවිනිශ්චිතතාවය | 5.19 |
| වෙනත් සාධක | 5.24 |
| **ප්‍රතිහඳුනාගැනීම** | **5.26** |


## හඳුනාගැනීමේ ක්‍රියාවලිය

5.1 හඳුනාගැනීම යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හෝ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ (යන්හි) ඇතුලත් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි එක මූලිකාංගයක නිර්වචනය සපුරාලන වත්කමක්, වගකීමක්, ස්කන්ධය, ආදායම් හෝ වියදම් වැනි අයිතමයක් ග්‍රහණය කර ගැනීමේ ක්‍රියාවලියයි. හඳුනාගැනීම යන්නෙන් අදහස් කරන්නේ එම ප්‍රකාශයන්ගෙන් එකක අයිතමය නිරූපණය කිරීම එක්කෝ තනිව හෝ වෙනත් අයිතම සමඟ එකතු කිරීම - වචන වලින් සහ මුල්‍යමය වටිනාකමකින් සහ එම වටිනාකම ප්‍රකාශයෙහි එක හෝ මෙවැනි එකතු සමූහයක් ලෙස ඇතුලත් කිරීමයි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කමක්, වගකීමක් හෝ ස්කන්ධය ලෙස හඳුනාගෙන ඇති වටිනාකම එහි “ධාරණ අගය” ලෙස හැඳින්වේ.

5.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශ(ය) සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ මගින් මූල්‍ය තොරතුරු සැසඳිය හැකි සහ අවබෝධ කරගත හැකි වන පරිදි සැලසුම් කර ඇති ව්‍යුහගත සාරාංශවල අස්තිත්ත්වයක හඳුනාගත් වත්කම්, වගකීම්, ස්කන්ධ, ආදායම් සහ වියදම් නිරූපණය කෙරේ. සාරාංශවල ව්‍යුහයන්හි වැදගත් ලක්ෂණයක් වන්නේ ප්‍රකාශයක හඳුනාගෙන ඇති වටිනාකම්වල එකතුවට ඇතුලත්ව ඇති අතර, අදාල වන්නේනම්, ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති අයිතම උප එකතුන් මගින් සම්බන්ධ කර ගැනීමයි.

5.3 පහත දැක්වෙන පරිදි හඳුනාගැනීම මූලිකාංග සමඟ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ(ය) සමඟ සම්බන්ධකරණය වේ. (5.1 රූප සටහන බලන්න):

(අ) වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ආරම්භක හා අවසාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල, මුළු වත්කම් වලින් මුළු වගකීම් අඩුකළ විට මුළු ස්කන්ධයට සමාන වේ; සහ

(ආ) වාර්තා කරන කාල පරිච්ඡේදය තුළ ස්කන්ධයේ හඳුනාගත් වෙනස්කම් සමන්විත වන්නේ:

(i) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ආදායමෙන් වියදම් අඩු කිරීම මඟින් ලැබෙන ප්‍රතිඵලයට;

(ii) ස්කන්ධ හිමිකම් ධාරකයින්ගේ දායකත්වයෙන්, ස්කන්ධ හිමිකම් ධාරකයින්ට කළ බෙදාහැරීම අඩු කිරීමෙන් වන ප්‍රතිඵලය එකතු කිරීමෙනි.

5.4 ඉහත සඳහන් කළ ප්‍රකාශ සම්බන්ධ කර ඇත්තේ එක් අයිතමයක් හඳුනාගැනීම සඳහා වෙනත් අයිතම එකක් (හෝ එහි ධාරණ අගය වෙනස් වීම) හෝ වැඩි ගණනක් හඳුනාගැනීම (හෝ අනෙකුත් අයිතම එකක හෝ වැඩි ගණනක ධාරණ අගය වෙනස් වීම) හෝ ප්‍රති හඳුනාගැනීම අවශ්‍ය වන බැවිනි. උදාහරණ වශයෙන්:

(අ) ආදායම් හඳුනාගැනීම එකවර සිදුවීම වැනි:

(i) වත්කමක් මූලික හඳුනාගැනීම හෝ වත්කමෙහි ධාරණ අගය වැඩි කිරීම; හෝ


(ii) වගකීමක් ප්‍රති හඳුනාගැනීම, හෝ වගකීමක ධාරණ අගය අඩු කිරීම.

(ආ) වියදම් හඳුනාගැනීම එකවර සිදුවීම වැනි:

(i) වගකීමක මූලික හඳුනාගැනීම හෝ, වගකීමෙහි පහතට ගෙන යන ප්‍රමාණය වැඩි කිරීම; හෝ

(ii) වත්කමක් ප්‍රති හඳුනාගැනීම හෝ, වත්කමක ධාරණ අගය අඩු කිරීම.

**5.1 රූප සටහන: හඳුනාගැනීම තුළින් මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග සම්බන්ධ වන්නේ කෙසේද?**



5.5 ගණුදෙනු හෝ වෙනත් සිද්ධීන් වලින් පැන නගින වත්කම් හෝ වගකීම් මූලික හඳුනාගැනීම, ආදායම හා සම්බන්ධිත වියදම් යන දෙකම සමගාමීව හඳුනාගැනීමට හේතුවිය හැකිය. උදාහරණ වශයෙන්, භාණ්ඩ අත්පිට විකිණීමෙන් ආදායම (එක් වත්කමක් හඳුනාගැනීමෙන් - මුදල්) සහ වියදම යන දෙකම හඳුනාගැනීම ප්‍රතිඵලයක්වේ. (වෙනත් වත්කමක් ප්‍රතිහඳුනාගැනීමෙන් - එනම් විකුණන ලද භාණ්ඩ) ආදායම හා ඒ හා සම්බන්ධ වියදම් සමගාමීව හඳුනාගැනීම, සමහරවිට ආදායම සමග පිරිවැය ගැලපීම ලෙස හැඳින්වේ. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* තුල ඇති සංකල්ප ව්‍යවහාර කිරීම වත්කම් හා වගකීම්වල වෙනස්වීම් හඳුනාගැනීමෙන් පැන නගින විට එවැනි ගැලපීමකට තුඩුදෙයි. කෙසේ වෙතත්, පිරිවැය ආදායම සමග ගැලපීම *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවේ* පරමාර්ථයක් නොවේ. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* මඟින් වත්කමක, වගකීමක හෝ ස්කන්ධය සඳහා වන අර්ථ දැක්වීම සපුරන්නේ නැති අයිතමයන් මූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුල හඳුනාගැනීමට ඉඩ නොදේ.

## හඳුනාගැනීමේ නිර්නායක

5.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගනු ලබන්නේ වත්කමක, වගකීමක හෝ ස්කන්ධයේ අර්ථ දැක්වීම සපුරාලන අයිතම පමණි. ඒ හා සමානව, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ (ආදායම්) හඳුනාගන්නේ ආදායම හෝ වියදම අර්ථ දැක්වීම සපුරාලන අයිතම පමණි. කෙසේ වෙතත්, එම මූලිකාංගයන්ගේ එකක අර්ථ දැක්වීම සපුරාලන සියළුම අයිතම හඳුනාගන්නේ නැත.

5.7 එක මූලිකාංගයක නිර්වචනය සපුරාලන අයිතමයක් හඳුනා නොගැනීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශ(ය) සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ සම්පූර්ණ බවෙන් වඩා අඩු කෙරෙන අතර, මූල්‍ය ප්‍රකාශ වලින් ප්‍රයෝජනවත් තොරතුරු බැහැරවීමක් සිදු විය හැකිය. අනෙක් අතට, සමහර තත්ත්වයන් තුළ, එක මූලිකාංගයක නිර්වචනය සපුරාලන සමහර අයිතම හඳුනා ගත්ත ද, ඒ සමග ප්‍රයෝජනවත් තොරතුරු ලබාදීමක් සිදුවිය නොහැක. වත්කමක් හෝ වගකීමක් හඳුනාගන්නේ එම වත්කම හෝ වගකීම හඳුනාගැනීමෙන් සහ එමඟින් යම් ප්‍රතිඵලයක් වන ආදායමේ, වියදමේ හෝ ස්කන්ධයේ වෙනස්වීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශ සමග පරිශීලකයිනට ප්‍රයෝජනවත් තොරතුරු ලබාදෙන්නේ නම් පමණි.

උදාහරණ:

(අ) වත්කම් හෝ වගකීම් පිළිබඳ අදාළ තොරතුරු සහ එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන යම් ආදායම්, වියදම් හෝ ස්කන්ධයේ වෙනස්වීම් පිළිබඳ තොරතුරු; (5.12 - 5.17 ඡේද බලන්න); සහ

(ආ) වත්කම් හෝ වගකීම් පිළිබඳ විශ්වාසනීය නියෝජනය කිරීමක් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන යම් ආදායමෙහි, වියදමෙහි හෝ ස්කන්ධයෙහි වෙනස්වීම් (5.18 - 5.25 ඡේද බලන්න).

5.8 වෙනත් මූල්‍ය වාර්තාකරණ තීරණවලට පිරිවැය සීමාකිරීම් පනවනවා සේම, එය හඳුනා ගැනීමේ තීරණ වලටද සීමාකිරීම් කරයි. වත්කමක් හෝ වගකීමක් හඳුනාගැනීමට පිරිවැයක් දැරිය යුතුය. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන්නන් විසින් වත්කමක් හෝ වගකීමක් පිළිබඳ අදාල මිනුමක් ලබා ගැනීම සඳහා පිරිවැය දරයි. මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් විසින්, ලබාදී ඇති තොරතුරු විශ්ලේෂණය කිරීම සහ නිර්වචනය කිරීම සඳහා පිරිවැයක් දරයි. මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට හඳුනාගැනීමෙන් ලබාදුන් තොරතුරුවලින් ලැබෙන ප්‍රතිලාභ එම තොරතුරු සැපයීමේ සහ භාවිතා කිරීමේ පිරිවැය හා සාධාරණීකරණය කළ හැකි නම් වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගැනේ. සමහර අවස්ථාවන්හිදී, හඳුනා ගැනීමේ පිරිවැය, ප්‍රතිලාභ වලට වඩා වැඩි විය හැකිය.

5.9 වත්කමක් හෝ වගකීමක් හඳුනාගන්නා විට එමඟින් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයිනට ලබාදිය හැකි ප්‍රයෝජනවත් තොරතුරුවල පිරිවැය සමඟින් වන ප්‍රතිලාභ ඉක්මවා නොයන්නේය යන්න හරියටම නිර්වචනය කළ නොහැක. පරිශීලකයිනට ප්‍රයෝජනවත් වන්නේ කුමක්ද යන්න රඳාපවතින්නේ අයිතමය, කරුණු සහ යම් තත්ත්වයන් මතය. ඒ නිසාවෙන් අයිතමයන් හඳුනාගන්නේද යන්න තීරණය කිරීමේදී විනිශ්චයක් අවශ්‍ය වන අතර, ඒ අනුව හඳුනාගැනීමේ අවශ්‍යතාවයන් ප්‍රමිත අතර සහ ඒවා තුල වෙනස්වීම අවශ්‍ය විය හැකිය.

5.10 හඳුනාගැනීම පිළිබඳ තීරණයක් ගැනීමේදී වත්කම හෝ වගකීම හඳුනාගෙන නොමැත යන ලෙස අදහස දියහැකි තොරතුරක් සළකා බැලීම වැදගත් වේ. උදාහරණ වශයෙන්, වියදමක් දරා ඇති විටෙක හා වියදම හඳුනාගෙන ඇති විටෙක, වත්කමක් හඳුනාගෙන නොමැති වීම ගත හැකිය. කාලයත් සමග සමහර අවස්ථාවල, වියදම හඳුනා ගැනීම තුළින් ප්‍රයෝජනවත් තොරතුරු සැපයෙනු ඇත. මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්හට ප්‍රවණතා හඳුනා ගැනීමට හැකි තොරතුරු උදාහරණ වශයෙන් ගත හැකිය.

5.11 වත්කමක හෝ වගකීමක නිර්වචනය සපුරාලන අයිතමයක් හඳුනා නොගත්තේ වුවද, සටහනක් මඟින් එම අයිතමය පිළිබඳ තොරතුරු සැපයීමට අස්තිත්ත්වයට අවශ්‍ය වියහැකිය. ව්‍යුහගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මඟින් ලබාදෙන සාරාංශයේ සහ අදාල වන්නේ නම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ(ය)න්ගෙන් හඳුනා

නොගත් අයිතමය නොමැති වීමට හිලව්වීම පිණිස සටහන් වල ඇති එම තොරතුරු ප්‍රමාණවත් ලෙස දෘෂ්‍යමානවීම සිදුකරන්නේ කෙසේද යන්න සළකා බැලීම වැදගත් වේ.

### අදාළත්වය

5.12 වත්කම්, වගකීම්, ස්කන්ධ, ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට අදාල වේ. කෙසේ වෙතත්, කිසියම් වත්කමක් හෝ වගකීමක් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන ආදායම්, වියදම් හෝ ස්කන්ධයේ වෙනස්වීම් වලට අදාල තොරතුරු සෑම විටම ලබා දෙන්නේ නැත. එය එසේ වීමට, උදාහරණ වශයෙන්:

(අ) වත්කමක් හෝ වගකීමක් පවතීද යන්න පිළිබඳ අවිනිශ්චිත බව (5.14 ඡේදය බලන්න); හෝ

(ආ) වත්කමක් හෝ වගකීමක් පවතින නමුත්, ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලා යාමේ සම්භාවිතාව අඩු බව (5.15 - 5.17 ඡේද බලන්න).

5.13 5.12 ඡේදයෙහි විස්තර කර ඇති සාධක එකක් හෝ දෙකම තිබීමෙන් හඳුනාගැනීම මඟින් ලබාදුන් තොරතුරු වල අදාළත්වයක් නොමැති බවට ස්වයංක්‍රීයව නිගමනයකට එළඹෙන්නේ නැත. එපමණක් නොව, 5.12 ඡේදයේ විස්තර කර ඇති සාධක හැර වෙනත් සාධකද නිගමනයට බලපානු හැකිය. එය සාධක වල සංයෝජනයන් විය හැකි අතර, හඳුනාගැනීමට අදාළ තොරතුරු සපයා ඇත්ද යන්න ඕනෑම එක් තනි සාධකයක් මත තීරණය නොවේ.

### පැවැත්මෙහි අවිනිශ්චිතතාවය

5.14 4.13 සහ 4.35 ඡේද මඟින් වත්කමක් හෝ වගකීමක් පවතිනවාද යන්න පිළිබඳ අවිනිශ්චිත අවස්ථා සාකච්ඡා කරනු ලැබේ. සමහර අවස්ථාවලදී, එම අවිනිශ්චිතතාවය ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලායාමේ පහළ සම්භාවිතාවය සමග සංයෝජනය විය හැකි වීම සහ කැපී පෙනෙන ලෙස පුළුල් පරාසයක විය හැකි ප්‍රතිඵල වලින් අදහස් කරන්නේ වත්කමක් හෝ වගකීමක් හඳුනාගැනීමට අවශ්‍යයෙන්ම තනි වටිනාකමකින් මනිනු ලැබුවහොත්, අදාළ තොරතුරු ලබා නොදිය හැකි බවකි. වත්කම හෝ වගකීම හඳුනාගෙන තිබේද, නැද්ද යන්න, ඒ හා ආශ්‍රිත අවිනිශ්චිතතාවයන් පිළිබඳ පැහැදිලි තොරතුරු මූල්‍ය ප්‍රකාශවල ලබාදීම අවශ්‍ය විය හැකිය.

### ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලායාමේ අඩු සම්භාවිතාව

5.15 ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලා යාමේ සම්භාවිතාව අඩු වුවද, වත්කමක් හෝ වගකීමක් පැවතිය හැකිය. (4.15 සහ 4.38 ඡේද බලන්න).

5.16 ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලායාමේ සම්භාවිතාවය අඩු නම්, වත්කම් හෝ වගකීම් පිළිබඳ වඩාත්ම අදාල තොරතුරු විය හැක්කේ, ගලා ඒමේ හෝ ගලා යෑමේ විශාලත්වය, ඒවා සිදුවිය හැකි කාලය සහ ඒවා සිදුවීමේ සම්භාවිතාවයට බලපාන සාධක පිළිබඳ තොරතුරු විය හැකිය. එවැනි තොරතුරු සඳහා සුදුසුම ස්ථානය වන්නේ සටහන්තුල ඇතුලත් කිරීමයි.

5.17 ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලා යාමේ සම්භාවිතාව අඩු වුවද, 5.16 ඡේදයෙහි විස්තර කර ඇති තොරතුරු ඉක්මවා වත්කම් හෝ වගකීම් හඳුනාගැනීමට අදාළ තොරතුරු ලබාදිය හැකිය. එය එසේද යන්න විවිධ සාධක මත රඳා පවතී. උදාහරණ වශයෙන්:

(අ) වෙළෙඳපොළ කොන්දේසි මත හුවමාරු වූ ගනුදෙනුවකදී වත්කමක් අත්පත්කර ගැනීමක් හෝ වගකීමක් දරන්නේ නම්, සාමාන්‍යයෙන් එහි පිරිවැයෙන් පිළිබිඹු වන්නේ ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හෝ ගලා යාමේ සම්භාවිතාවයයි. මේ අනුව, එම පිරිවැය අදාළ තොරතුරු විය හැකි අතර, සාමාන්‍යයෙන් එය පහසුවෙන් ලබාගත හැකිය. තවදුරටත්, වත්කම හෝ වගකීම හඳුනා නොගැනීම හුවමාරු වන අවස්ථාවේදී වියදම් හෝ ආදායම් හඳුනා ගැනීමට හේතු වියහැකි අතර, එය ගනුදෙනුවේ විශ්වාසනීය නියෝජනයක් නොවිය හැකිය. (5.25 (අ) ඡේදය බලන්න).

(ආ) හුවමාරු ගනුදෙනුවක් නොවන සිදුවීමකින් වත්කමක් හෝ වගකීමක් පැන නගින්නේ නම්, වත්කම හෝ වගකීම හඳුනාගැනීම සාමාන්‍යයෙන් ආදායම් හෝ වියදම් හඳුනාගැනීමෙන් සිදුවේ. වත්කම් හෝ වගකීම් හේතුවෙන් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම හෝ ගලා යා හැකි බවට අඩු සම්භාවිතාවයක් පමණක් තිබේ නම්, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් වත්කම සහ ආදායම හෝ වගකීම සහ වියදම හඳුනාගැනීම අදාළ තොරතුරු ලබාදීම ලෙස සළකන්නේ නැත.

**විශ්වාසනීය නියෝජනය**

5.18 කිසියම් වත්කමක් හෝ වගකීමක් හඳුනා ගැනීමට උචිත වන්නේ, එයින් අදාල තොරතුරු පමණක් නොව, එමෙන්ම එම වත්කම හෝ වගකීම පිළිබඳ විශ්වාසනීය නියෝජනයක් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන ආදායම්, වියදම් හෝ ස්කන්ධයෙහි වූ වෙනස්වීම් මතය. විශ්වාසනීය නියෝජනයක් ලබාදිය හැකිද යන්නට වත්කම හෝ වගකීම හා ආශ්‍රිත මිනුම් අවිනිශ්චිතතාවය මට්ටම සහ අනිකුත් සාධක බලපානු ලැබේ.

**මිනුම් අවිනිශ්චිතතාවය**

5.19 වත්කමක් හෝ වගකීමක් හඳුනා ගැනීමට නම්, එය මැනිය යුතුය. බොහෝ අවස්ථාවලදී, එවැනි මිනුම් ඇස්තමේන්තු කළ යුතු අතර, එම නිසා මිනුම් අවිනිශ්චිතතාවයට ද යටත් වේ. 2.19 ඡේදයෙහි සඳහන් කළ පරිදි, මූල්‍ය තොරතුරු සැකසීමේදී සාධාරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අත්‍යවශ්‍ය කොටසක් වන අතර, ඇස්තමේන්තු පැහැදිලිව හා නිවැරදිව විස්තර කර පැහැදිලි කර ඇත්නම්, තොරතුරුවල ප්‍රයෝජනත්වය දුර්වල නොකෙරේ. ඉහළ මට්ටමේ මිනුම් අවිනිශ්චිතතාවයක් පවා එවැනි ඇස්තමේන්තුවකින් ප්‍රයෝජනවත් තොරතුරු ලබාදීම වළක්වනු නොලැබේ.

5.20 සමහර අවස්ථාවන්හිදී, වත්කමක් හෝ වගකීමක් පිළිබඳ මිනුමක් තක්සේරු කිරීමේ දී සම්බන්ධ වන අවිනිශ්චිතතාවයෙහි මට්ටම ඉතා ඉහළ විය හැකි අතර, ඇස්තමේන්තුව මඟින් එම වත්කම් හා වගකීම් සහ යම් ප්‍රතිඵලයක් වන ආදායම, වියදම හෝ ස්කන්ධයේ වෙනස්වීම පිළිබඳව ප්‍රමාණවත් තරම් විශ්වාසදායක නියෝජනයක් ලබා දෙන්නේද යන්න සැක කළහැකිය. අවිනිශ්චිතතාව මැනීමේ මට්ටම ඉතා ඉහළ නම් උදාහරණ ලෙස වත්කම හෝ වගකීම එම මැනීම ඇස්තමේන්තු කිරීමේ එකම ක්‍රමය වන්නේ මුදල් ප්‍රවාහ පදනම් කරගත් මිනුම් ශිල්පතාවයන් භාවිතා කිරීම සහ ඊට අමතරව, පහත සඳහන් තත්ත්වයන් එකක් හෝ කිහිපයක් පවතින්නේ නම් පමණි:

(අ) සිදුවිය හැකි ප්‍රතිඵලයන්හි පරාසය අසාමාන්‍ය ලෙස පුළුල් වන අතර, එක් එක් ප්‍රතිඵල වල සම්භාවිතාවය ඇස්තමේන්තු කිරීම අසාමාන්‍ය ලෙස දුෂ්කරය.

(ආ) විවිධ ප්‍රතිඵලවල සම්භාවිතාවය පිළිබඳ ඇස්තමේන්තුවල කුඩා වෙනස්වීම් වලට මෙම මිණුම අසාමාන්‍ය ලෙස සංවේදී වේ, උදාහරණ වශයෙන්, අනාගත මුදල් ගලා ඒමේ හෝ ගලා යාමේ සම්භාවිතාව අසාමාන්‍ය ලෙස අඩු නම්, එහෙත් එම මුදල් ගලා ඒම් හෝ ගලා යෑම් සිදුවුවහොත් ඒවායේ විශාලත්වය මත අසාමාන්‍ය ලෙස ඉහළ අගයක් ගනී.

(ඇ) මනිනු ලබන වත්කම හෝ වගකීමට තනිකරම සම්බන්ධිත නොවන අසාමාන්‍ය ලෙස අසීරු හෝ අසාමාන්‍ය ලෙස විෂයානුබද්ධ මුදල් ප්‍රවාහ වෙන් කිරීමක් වත්කම හෝ වගකීම මැනීමේදී අවශ්‍ය කෙරේ.

5.21 5.20 ඡේදයෙහි විස්තර කර ඇති සමහර අවස්ථාවන්හි, වඩාත්ම ප්‍රයෝජනවත් තොරතුරු විය හැක්කේ, අතිශය අවිනිශ්චිත ඇස්තමේන්තුව මත රඳා පවතින ඇස්තමේන්තුව පිළිබඳ විස්තරයක් සහ එයට බලපාන අවිනිශ්චිතතාවයන් පිළිබඳ පැහැදිලි කිරීමක් ද ඇතුළත් මිනුමකි. මෙය විශේෂයෙන් විය හැක්කේ, එම මිනුම වත්කමෙහි හෝ වගකීමෙහි වඩාත්ම අදාල මිනුම් වන්නේ නම් විය හැකිය. වෙනත් අවස්ථාවන්හිදී එම තොරතුරු මඟින් වත්කම හෝ වගකීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් වූ ආදායම්, වියදම් හෝ ස්කන්ධයෙහි ඇති වන වෙනස්වීම් පිළිබඳ ප්‍රමාණවත් ලෙස විශ්වාසනීය නියෝජනයක් ලබා නොදෙන්නේ නම්, වඩාත්ම ප්‍රයෝජනවත් තොරතුරු විය හැක්කේ එය අදාළත්වයෙන් තරමක් අඩු නමුත්, මිනුම් අවිනිශ්චිතතාවයෙන් අඩු අගයකට යටත් වන වෙනස් මිනුමකි (ඕනෑම අවශ්‍ය විස්තර කිරීම් සහ පැහැදිලි කිරීම් කැටුව ඇති).

5.22 සීමිත තත්ත්වයන්හිදී වත්කමක හෝ වගකීමක දැනට ඇති (හෝ ලබාගත හැකි) අදාළ සියලු මිනුම් ඉතා ඉහළ මිනුම්කරණ අවිනිශ්චිතතාවයකට යටත් විය හැකිය. එනම් මිනුම එය ඇස්තමේන්තු කිරීමේ කාර්යය පිළිබඳ විස්තරයක් සහ එම ඇස්තමේන්තු වලට බලපාන අවිනිශ්චිතතාවයන් පිළිබඳව පැහැදිලි කිරීමක් මිනුම කැටුව පැවතියදී පවා වත්කම හෝ වගකීම පිළිබඳව (සහ යම් ප්‍රතිඵලයක් වන ආදායම, වියදම් සහ ස්කන්ධයේ වෙනස්වීම) ප්‍රයෝජනවත් තොරතුරු මෙයින් කිසිවකින් ලබා දෙන්නේ නැත.

5.23 වත්කමක් හෝ වගකීමක් හඳුනාගෙන තිබුණහොත්, වත්කම හෝ වගකීම පිළිබඳ විශ්වාසනීය නියෝජනයකට වත්කමෙහි හෝ වගකීමෙහි පැවැත්ම හෝ මිනුම් හෝ එහි ප්‍රතිඵල සමඟ සම්බන්ධිත අවිනිශ්චිතතාවයන් පිළිබඳ පැහැදිලි තොරතුරු අවසාන ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන කිසියම් ආර්ථික ප්‍රතිලාභවල ගලා ඒමක ගලා යාමක වටිනාකම සහ කාල නිර්ණය ඇතුලත් කිරීමට අවශ්‍ය විය හැක. (6.60 - 6.62 ඡේද බලන්න)

**වෙනත් සාධක**

5.24 හඳුනාගත් වත්කමක, වගකීමක, ස්කන්ධයේ, ආදායමේ හෝ වියදමක විශ්වාසනීය නියෝජනයකට එම අයිතමය හඳුනාගැනීම පමණක් නොව, එය මැනීම මෙන්ම ඉදිරිපත් කිරීම සහ ඒ පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමද ඇතුළත් වේ. (6-7 පරිච්ඡේද බලන්න).

5.25 එබැවින්, වත්කමක හෝ වගකීමක හඳුනාගැනීම මඟින් වත්කම් හෝ වගකීම් පිළිබඳ විශ්වාසනීය නියෝජනයක් ලබාදිය හැකි ද යන්න තක්සේරු කිරීමේ දී, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එහි විස්තරය සහ මිනුම් පමණක් හුදු සළකා බැලීම අවශ්‍යවීම පමණක් නොව පහත දෑ ද සළකා බැලිය යුතුය,

(අ) එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ආදායම්, වියදම් සහ ස්කන්ධයෙහි වෙනස්කම් නිරූපණය කිරීම - උදාහරණ වශයෙන්, අස්තිත්ත්වයක් විසින් ප්‍රතිශ්ඨාවක් සඳහා හුවමාරු කර ගැනීමට වත්කමක් අත්පත් කරගන්නේ නම්, එම වත්කම හඳුනා නොගැනීම වියදම් හඳුනාගැනීමට හේතුවන අතර, එමඟින් අස්තිත්ත්වයෙහි ලාභය හා ස්කන්ධය අඩුවීම සිදුවේ. සමහර අවස්ථාවල, උදාහරණ වශයෙන්, අස්තිත්ත්වය විසින් වහාම වත්කම ක්ෂය නොකරන්නේ නම්, එම ප්‍රතිඵලය මඟින් අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය පිරිහී බව ඇති බවට වූ නොමඟ යවන සුළු නියෝජනයන් ලබාදිය හැකිය.

(ආ) අදාල වත්කම් සහ වගකීම් හඳුනාගෙන තිබෙන්නේ ද, ඒවා හඳුනාගෙන නොමැතිනම්, එම හඳුනාගැනීම තුළ හඳුනා ගැනීමේ අසංගතතාවයක් ඇති කරයි. (ගිණුම්කරණ නොගැලපීම) සටහන් වලින් පැහැදිලි කිරීමේ තොරතුරු ලබාදී තිබුණ ද, ගනුදෙනුවෙහි සමස්ත බලපෑම හෝ වත්කම් හෝ වගකීම් වලට තුඩු දෙන වෙනත් සිදුවීමක් පිළිබඳ අවබෝධ කරගත හැකි හෝ විශ්වාසනීය නියෝජනයක් එයින් ලබාදිය නොහැක.

(ඇ) වත්කම හෝ වගකීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම හා අනාවරණය කිරීම, සහ එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආදායම්, වියදම් හෝ ස්කන්ධයෙහි වෙනස්වීම්, සම්පූර්ණ නිරූපණයකට, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයකු සඳහා අවශ්‍ය සියලු විස්තර ඇතුළුව නිරූපිත ආර්ථික සංසිද්ධිය අවබෝධ කරගැනීමට අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් සියල්ල ඇතුළත් වේ. එබැවින් සම්බන්ධිත තොරතුරු ඉදිරිපත් කිරීම හා අනාවරණය කිරීම මඟින් වත්කමක්, වගකීමක්, ස්කන්ධය, ආදායම් හෝ වියදම් පිළිබඳ විශ්වාසනීය නියෝජනයක කොටසක් බවට පත්වීමට හඳුනාගත් වටිනාකමට හැකිවේ.

## ප්‍රති හඳුනාගැනීම

5.26 ප්‍රති හඳුනාගැනීම යනු, හඳුනාගත් වත්කමක් හෝ වගකීමක් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් අස්තිත්ත්වයක මූල්‍ය තත්ව ප්‍රකාශයෙන් ඉවත් කිරීමයි. සාමාන්‍යයෙන් ප්‍රති හඳුනාගැනීම සිදුවන්නේ එම අයිතමය තවදුරටත් වත්කමක හෝ වගකීමක නිර්වචනය සපුරාලන්නේ නැති විටය:

(අ) වත්කමක් ප්‍රති හඳුනාගැනීම සාමාන්‍යයෙන් සිදුවන්නේ, අස්තිත්ත්වය හඳුනාගෙන තිබූ එම වත්කම සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක පාලනය නැති වූ විටය; සහ

(ආ) වගකීමක් ප්‍රති හඳුනාගැනීම සාමාන්‍යයෙන් සිදුවන්නේ, අස්තිත්ත්වය හඳුනාගෙන තිබූ එම වගකීම සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් සඳහා වර්තමාන බැඳීමක් නොමැති විටය.

5.27 ප්‍රති හඳුනාගැනීම සඳහා වූ ගිණුම්කරණ අවශ්‍යතාවයන් පහත සඳහන් දෙකම විශ්වාසනීය නියෝජනය අරමුණුගතව:

(අ) ගනුදෙනුවෙන් පසු රඳවා ගෙන ඇති යම් වත්කම් සහ වගකීම් හෝ ප්‍රති හඳුනාගැනීමට තුඩුදුන් වෙනත් හේතු (ගනුදෙනුවේ හෝ වෙනත් සිදුවීමක කොටසක් ලෙස අත්පත් කරගත්, දරණ ලද හෝ උපද්දන ලද කිසියම් වත්කමක් හෝ වගකීමක් ඇතුළුව); සහ

(ආ) එම ගනුදෙනුවේ හෝ වෙනත් සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අස්තිත්ත්වයෙහි වත්කම් හා වගකීම්වල වෙනස් වීම.

5.28 5.27 ඡේදයේ විස්තර කර ඇති අරමුණු සාමාන්‍යයෙන් සාක්ෂාත් කරගනු ලබන්නේ:

(අ) කල් ඉකුත් වූ හෝ ක්ෂය කරන ලද, එකතු කරන ලද, සපුරා ඇති හෝ පවරන ලද යම් වත්කමක් හෝ වගකීමක් ප්‍රති හඳුනාගැනීමක් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන ආදායම් හා වියදම් "හඳුනාගැනීම" මෙම පරිච්ඡේදයෙහි ඉතුරු කොටසෙහි" මාරු කරන ලද සංරචකය" යන යෙදුමෙන් අදහස් කරන්නේ එම සියලු වත්කම් හා වගකීම්ය;

(ආ) යම් රඳවා ගෙන ඇති වත්කම් හෝ වගකීම් අඛණ්ඩව හඳුනාගෙන ඇත්නම් ඒවා "රඳවා ගත් සංරචකයක්" ලෙස හැඳින්වේ. එම රඳවා ගත් සංරචකය පැවරූ සංරචකයෙන් වෙන්වූ ගිණුම් ඒකකයක් බවට පත්වේ. ඒ අනුව, ප්‍රති හඳුනාගැනීම රඳවාගත් සංරචකයට අදාල මැනීමේ අවශ්‍යතාවයන්හි වෙනස්වීමක් ප්‍රතිඵලයක් වන්නේ නැතොත් මිස, පැවරූ සංරචකය ප්‍රති හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, රඳවාගත් සංරචකය මත ආදායමක් හෝ වියදමක් හඳුනා ගන්නේ නැත;. සහ

(ඇ) 5.27 ඡේදයේ විස්තර කර ඇති ඉලක්ක එකක් හෝ දෙකම සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය නම්, පහත සඳහන් ක්‍රියා පටිපාටි එකක් හෝ කීපයක් ව්‍යවහාර කළයුතුය:

(i) රඳවාගෙන ඇති ඕනෑම සංරචකයක් පිළිබඳව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙන වෙනම ඉදිරිපත් කිරිම;

(ii) පවරන ලද සංරචකය ප්‍රති හඳුනාගැනීම හේතුවෙන් හඳුනාගත් ඕනෑම ආදායමක් සහ වියදමක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි වෙන වෙනම ඉදිරිපත් කිරීම; හෝ

(iii) පැහැදිලි කිරීමේ තොරතුරු ලබාදීම මගිනි.

5.29 සමහර අවස්ථාවලදී අස්තිත්ත්වයක වත්කමක් හෝ වගකීමක් පවරා ඇති බව පෙනෙන නමුත් එම වත්කම හෝ වගකීම අස්තිත්ත්වයේ එසේම පැවතිය හැකිය.

උදාහරණ ලෙස:

(අ) අස්තිත්ත්වයක් වත්කමක් පෙනෙන පරිදි පවරා ගෙන එහෙත් වත්කම විසින් නිෂ්පාදනය කළහැකි ආර්ථික ප්‍රතිලාභ වල වටිනාකමේ සැළකිය යුතු අන්දමේ ධනාත්මක හෝ සෘණාත්මක විචලනයන්ට විවෘත කර රඳවා තබා ගන්නේ නම්, මෙය එම වත්කම අස්තිත්ත්වය අඛණ්ඩව පාලනය කරන බව සමහර විට හැඟවිය හැකිය. (4.24 ඡේදය බලන්න) ; හෝ

(ආ) අස්තිත්ත්වය සඳහා නියෝජිතයකු ලෙස දරා ඇති වත්කමක් එම වත්කම වෙනත් පාර්ශවයකට අස්තිත්ත්වය පවරා ඇත්නම්, තවමත් වත්කම පාලනය කරනු ලබන්නේ පැවරුම්කරු විසින්ය. (4.25 ඡේදය බලන්න).

5.30 5.29 ඡේදයෙහි විස්තර කර ඇති අවස්ථාවලදී, එම වත්කම හෝ වගකීම ප්‍රති හඳුනා ගැනීම උචිත වන්නේ, එය 5.27 ඡේදයෙහි විස්තර කර ඇති අරමුණු දෙකෙන් එකක්වත් සාක්ෂාත් කර නොගන්නා බැවිනි.

5.31 අස්තිත්ත්වයක් සතුව තවදුරටත් පවරන ලද සංරචකයක් නොමැති විට, පවරන ලද සංරචකය ප්‍රති හඳුනා ගැනීමෙන් එම කරුණ විශ්වාසනීයව නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, මෙවැනි සමහර අවස්ථාවන්හිදී, 5.28 (ඇ) ඡේදයේ විස්තර ඇති ක්‍රියාපටිපාටි එකක් හෝ වැඩි ගණනක සහාය ලබාදී තිබියදී පවා, ගනුදෙනුවක් හෝ වෙනත් සිදුවීමක් මගින්, අස්තිත්ත්වයෙහි වත්කම් හෝ වගකීම් කෙතෙක් දුරට වෙනස් වී ඇද්ද යන්න ප්‍රති හඳුනාගැනීම තුළින් විශ්වාසනීය ලෙස නියෝජනය සිදු නොවිය හැක. එවැනි අවස්ථාවන්හිදී පවරන ලද සංරචකය ප්‍රතිහඳුනා ගැනීමෙන් හැඟවෙන්නේ අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය තිබුණාට වඩා සැළකිය යුතු ලෙස වෙනස් වී ඇති බවයි. උදාහරණ වශයෙන් මෙය සිදුවිය හැක්කේ:

(අ) යම් අස්තිත්ත්වයක් විසින් වත්කමක් පැවරුම් කර ඇති අතර, ඒ සමගම වෙනත් ගනුදෙනුවකට ඇතුළත් වී ඇත්නම්, එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම වත්කම නැවත අත්කර ගැනීමේ වර්තමාන හිමිකමක් හෝ වර්තමාන බැඳීමක් ඇති වේ. එවැනි වර්තමාන හිමිකමක් හෝ වර්තමාන බැඳීමක් පැනනගින්නේ උදාහරණ ලෙස ඉදිරි ගිවිසුමක්, ලිඛිත ගැණුමක විකල්පයක් හෝ මිලදී ගත් ඇරයුම් විකල්පයක් මගිනි.

(ආ) යම් අස්තිත්වයක් විසින් තවදුරටත් පාලනය නොකරනු ලබන, පවරා ඇති සංරචකයක් මගින් නිපදවිය හැකි ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණයෙහි සැලකිය යුතු ධනාත්මක හෝ සෘණාත්මක විචලනයනට නිරාවරණය කිරීමක් රඳවා ගෙන තිබෙන්නේ නම්ය.

5.32 5.28 (ඇ) ඡේදයෙහි විස්තර කර ඇති ක්‍රියා පටිපාටි වලින් එකක් හෝ වැඩි ගණනකින් සහාය දැක්වුවා වුවද, 5.27 ඡේදයෙහි විස්තර කර ඇති ඉලක්ක දෙකම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රති හඳුනාගැනීම ප්‍රමාණවත් නොවන්නේ නම්, පවරන ලද සංරචකය අඛණ්ඩව හඳුනාගැනීමෙන් සමහරවිට එම අරමුණු දෙකම ඉටු කර ගත හැකිය. මෙහි පහත ප්‍රති විපාක ඇත.

(අ) ගනුදෙනුවේ හෝ වෙනත් සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස එක්කෝ රඳවා ගත් සංරචකය හෝ පැවරූ සංරචකය මත ආදායමක් හෝ වියදමක් හඳුනානොගනී;

(ආ) වත්කමක් (හෝ වගකීමක්) පැවරීමෙන් ලැබෙන (හෝ ගෙවන) මුදල ලැබුණු (ගෙවූ) ණයක් ලෙස සලකනු ලැබේ; සහ

(ඇ) පැවරූ සංරචකය සම්බන්ධයෙන් පැනනගින යම් හිමිකමක් හෝ බැඳීයාවක් අස්තිත්වයට තවදුරටත් නොමැති බව දැක්වෙන කරුණ නිරූපනය කිරීමට, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පැවරූ සංරචකය පිළිබඳ වෙන්ව වූ ඉදිරිපත් කිරීමක් හෝ පැහැදිලි කිරීමේ තොරතුරු ලබාදීමක් අවශ්‍ය කෙරේ. ඒ හා සමානව මාරු කරන ලද සංරචකයෙන් පැනනගින ආදායම් හෝ වියදම් පිළිබඳ තොරතුරු සැපයීම අවශ්‍ය විය හැකිය.

5.33 ප්‍රති හඳුනාගැනීම පිළිබඳ ප්‍රශ්න පැන නගින එක් අවස්ථාවක් වන්නේ, පවත්නා හිමිකම් හෝ බැඳීයාවන් අඩු කරන හෝ ඉවත් කරන ආකාරයකින් ගිවිසුමක් වෙනස් කරන විටය. ගිවිසුම් වෙනස් කිරීම සඳහා ගිණුම් ගත කරන්නේ කෙසේද යන්න තීරණය කිරීමේ දී, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට වෙනස් කිරීමෙන් පසුව රඳවාගෙන ඇති වත්කම් හා වගකීම් පිළිබඳ වඩාත් ප්‍රයෝජනවත් තොරතුරු ලබා දෙන්නේ කුමන ගිණුම් ඒකකය ද යන්නත්, වෙනස් කිරීම් මගින් අස්තිත්ත්වයෙහි වත්කම් හා වගකීම් වෙනස්වූ ආකාරයත් සලකා බැලිය යුතුය:

(අ) ගිවිසුමක් වෙනස් කිරීමකින් පවත්නා හිමිකම් හෝ බැඳීයාවන් ඉවත් කිරීම පමණක් සිදුවන්නේ නම්, 5.26 - 5.32 ඡේදයන්හි සාකච්ඡා කොට සලකා බලා ඇත්තේ එම හිමිකම් හෝ බැඳීම් ප්‍රති හඳුනාගත යුතු ද යන්න තීරණය කළ යුතු බවයි;

(ආ) ගිවිසුමක් වෙනස් කිරීමකින්, නව හිමිකම් හෝ බැඳීම් පමණක් එකතු වන්නේ නම්, එකතු වූ හිමිකම් හෝ බැඳීයාවන් වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස සැලකිය යුතු ද, නැතහොත් එවැනි ගිණුම් ඒකකයක පවතින හිමිකම් හෝ බැඳීම් වල කොටසක් ලෙසට ගන්නේ ද යන්න තීරණය කිරීම අවශ්‍ය වේ. (4.48 - 4.55 ඡේද බලන්න); සහ

(ඇ) ගිවිසුම් වෙනස් කිරීමක් මගින් පවත්නා හිමිකම් හෝ බැඳීම් යන දෙකම ඉවත් වන්නේ නම්, සහ නව හිමිකම් හෝ බැඳීම් එකතු වන්නේ නම්, එම වෙනස් කිරීම් වල වෙන වෙනම හා සංයෝජිත බලපෑම සලකා බැලීම අවශ්‍ය වේ. එවැනි සමහර අවස්ථාවලදී, ගිවිසුමේ වෙනස් කිරීමේ ප්‍රමාණයට එහි හරය අනුව වෙනස් කිරීමෙන් පැරණි වත්කම් හෝ වගකීම්, නව වත්කමක් හෝ වගකීමක් සමඟ ආදේශ කෙරෙයි. එවැනි පුළුල් වෙනස් කිරීම් වලදී ප්‍රවේශයට මුල් වත්කම හෝ වගකීම ප්‍රති හඳුනා ගැනීමට අවශ්‍ය විය හැකි අතර, නව වත්කම හෝ වගකීම හඳුනාගැනීම කළ යුතුය.

*ඡේදය*

## 6 වන පරිච්ඡේදය - මිනුම

| | |
|---|---|
| **හැඳින්වීම** | **6.1** |
| **මිනුම් පදනම්** | **6.4** |
| **ඓතිහාසික පිරිවැය** | **6.4** |
| **වර්තමාන අගය** | **6.10** |
| සාධාරණ අගය | 6.12 |
| ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය | 6.17 |
| වර්තමාන පිරිවැය | 6.21 |
| **විශේෂ මිනුම් පදනමින් ඉදිරිපත් කෙරෙන තොරතුරු** | **6.23** |
| **ඓතිහාසික පිරිවැය** | **6.24** |
| **වර්තමාන අගය** | **6.32** |
| සාධාරණ අගය | 6.32 |
| ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය | 6.37 |
| වර්තමාන පිරිවැය | 6.40 |

| | |
|---|---|
| **මිනුම් පදනමක් තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක** | **6.43** |
| **අදාළත්වය** | **6.49** |
| වත්කමක හෝ වගකීමක ගති ලක්ෂණ | 6.50 |
| අනාගත මුදල් ප්‍රවාහ සඳහා දායකත්වය | 6.54 |
| **විශ්වසනීය නියෝජනය** | **6.58** |
| **ගුණාත්මක ගතිලක්ෂණ වැඩි දියුණු කිරීම් සහ පිරිවැය සීමා කිරීම්** | **6.63** |
| ඓතිහාසික පිරිවැය | 6.69 |
| වර්තමාන අගය | 6.72 |
| **ආරම්භක මිනුමට නිශ්චිත සාධක** | **6.77** |
| **එකකට වඩා වැඩි මිනුම් පදනම්** | **6.83** |
| **ස්කන්ධය මැනීම** | **6.87** |
| **මුදල් ප්‍රවාහ පදනම් කෙරෙන මිනුම් ශිල්ප ක්‍රම** | **6.91** |

## හැඳින්වීම

6.1 මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති මූලිකාංග මූල්‍ය භාෂිතයෙන් වශයෙන් ප්‍රමාණ කෙරේ. මේ සඳහා මිනුම් පදනමක් තෝරා ගැනීමට අවශ්‍යවේ. මිනුම් පදනමක් යනු, හඳුනාගනු ලැබූ ලක්ෂණයක්වේ. උදාහරණ වශයෙන්, මනිනු ලබන අයිතමයේ ඓතිහාසික පිරිවැය, සාධාරණ අගය හෝ ඉටුකිරීමේ අගය ගත හැකිය. වත්කමක් හෝ වගකීමක් සඳහා මිනුම් පදනමක් ව්‍යවහාර කිරීමෙන් එම වත්කම් හෝ වගකීම සහ සම්බන්ධිත ආදායම් සහ වියදම් සඳහා මිණුමක් නිර්මාණයවේ.

6.2 ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ගති ලක්ෂණ සහ පිරිවැය සීමාකිරීම් සලකා බැලීමෙන් විවිධ වත්කම්, වගකීම්, අදායම් සහ වියදම් සඳහා විවිධ මිනුම් පදනම් තෝරාගැනීම ප්‍රතිඵලයක් වියහැකිය.

6.3 ප්‍රමිතියකට, එම ප්‍රමිතියෙන් තෝරාගත් මිනුම් පදනම ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න විස්තර කිරීමට අවශ්‍ය විය හැකිය. එම විස්තරයට ඇතුළත් විය හැකි කරුණු:

(අ) නිශ්චිත මිනුම් පදනමක් මත මිනුමක් තක්සේරු කිරීම සඳහා භාවිතා කළ හැකි හෝ භාවිතා කලයුතු ශිල්පීය ක්‍රම නියම කිරීම;

(ආ) කැමති මිනුම් පදනමක් මඟින් ලබාදෙන තොරතුරු වලට සමාන තොරතුරු සැපයිය හැකි සරල මිනුම් ප්‍රවේශයක් නියම කිරීම; හෝ

(ඇ) මිනුම් පදනමක් වෙනස් කරන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම - උදාහරණ වශයෙන්, වගකීමක් ඉටු කිරීම සඳහා වන අගයන් බැහැර කිරීමෙන් එම වගකීම ඉටු කිරීමට අපොහොසත් වීමේ බලපෑම (ස්වකීය ණය අවදානම).

## මිණුම් පදනම්

### ඓතිහාසික පිරිවැය

6.4 ඓතිහාසික පිරිවැය මිනුම් වත්කම්, වගකීම් සහ සම්බන්ධිත ආදායම් හා වියදම් සම්බන්ධිත මූල්‍ය තොරතුරු ලබා දෙන්නේ, ගනුදෙනුවේ මිල හෝ ඒවා හට ගැනීමට තුඩුදුන් වෙනත් සිද්ධීන්ට අඩුතරමින් කොටසක් ලෙස උත්පාදනයවූ තොරතුරු භාවිතා කරමිනි. වර්තමාන අගය මෙන් නොව, ඓතිහාසික පිරිවැය මඟින් වත්කමකට හෝ වගකීමකට හානිකරණය මඟින් සිදුවන බරපතළ වෙනස්කම් වලට අදාල ප්‍රමාණය හැර වටිනාකමේ වෙනස්වීම් පිළිබිඹු නොවේ. (6.7 (ඇ) සහ 6.8 (ආ) ඡේද බලන්න).

6.5 වත්කමක් අත්කර ගැනීමේදී හෝ ඇති කිරීමේදී එහි ඓතිහාසික පිරිවැය වන්නේ, වත්කම අත්කර ගැනීමට හෝ ඇති කිරීමට ගෙවන ලද ප්‍රතිශ්ඨාව සහ එයට එකතු කරන ලද ගනුදෙනු කිරීමේ පිරිවැයෙන් සමන්විත වත්කම අත්කර ගැනීම හෝ ඇති කිරීම සඳහා දරණ ලද පිරිවැයේ වටිනාකමයි. වගකීමක්

දැරීමට සිදු වූ විට හෝ භාර ගත් විට එහි ඓතිහාසික පිරිවැය වන්නේ, වගකීම ඇති කිරීමට හෝ භාර ගැනීමට ලැබූ ප්‍රතිශ්ඨාවෙන් ගනුදෙනු පිරිවැය අඩු කළවිට ලැබෙන වටිනාකමයි.

6.6 වෙළෙඳපොළ කොන්දේසි මත සිදු නොවූ ගනුදෙනුවක ප්‍රතිඵලයක් වශයෙන් වත්කමක් අත්පත් කරගත් විට හෝ ඇති කළ විට හෝ වගකීමක් දැරූ විට හෝ භාරගත් විට, (6.80 ඡේදය බලන්න) ඒ සඳහා වූ පිරිවැය හඳුනාගැනීමට නොහැකි විය හැකිය, නැතහොත් වත්කමට හෝ වගකීමට අදාල පිරිවැය පිළිබඳ තොරතුරු ලබා නොදෙනු ඇත. එවැනි සමහර අවස්ථාවල දී, වත්කමේ හෝ වගකීමේ වර්තමාන අගය මූලික හඳුනාගැනීම මත සලකනු ලබන පිරිවැයක් ලෙසට භාවිතා කරන අතර, එම සලකනු ලබන පිරිවැය ඓතිහාසික පිරිවැයෙන් පසුව මැනීම සඳහා ආරම්භක ලක්ෂයක් ලෙස භාවිත කරයි.

6.7 අදාළ වන්නේ නම්, වත්කමක ඓතිහාසික පිරිවැය කාලය හරහා යාවත්කාලීන කෙරෙයි:

(අ) වත්කම සමන්විත වන සියළුම ආර්ථික සම්පත්-හෝ කොටසක් පරිභෝජනය (ක්‍ෂය කිරිම හෝ ක්‍රම ක්‍ෂය කිරීම) ;

(ආ) වත්කම් වලින් කොටසක් හෝ සියල්ලම නිරුද්ධකරණය සඳහා ගෙවීම් ලැබීම;

(ඇ) වත්කම්වල ඓතිහාසික පිරිවැයෙන් කොටසක් හෝ සියල්ලම තවදුරටත් අයකරගැනීමට නොහැකි වන පරිදි වන සිදුවීම් වල බලපෑම (හානිකරණය); සහ

(ඈ) වත්කම්වල ඕනෑම මූල්‍ය සංරචකයක් පිළිබිඹු කිරීම සඳහා පොළිය උපචිත කිරීම.

6.8 අදාළ වන්නේ නම්, පහත දෑ නිරූපණය කිරීමට වගකීමක ඓතිහාසික පිරිවැය කාලය හරහා යාවත්කාලීන කෙරෙයි:

(අ) සියලූ වගකීම් හෝ ඉන් කොටසක් ඉටුකිරීම, උදාහරණ වශයෙන්, වගකීම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් පියවෙන පරිදි ගෙවීම් කිරීමෙන් හෝ භාණ්ඩ ලබා දීමට වූ බැඳීම සපුරාලීම;

(ආ) එම වගකීම භාරදූරවන ප්‍රමාණය තෙක් වගකීම ඉටුකිරීමට අවශ්‍ය සම්පත් පැවරීමට වන බැඳීමේ වටිනාකම වැඩි කරන සිද්ධි වල බලපෑම. වගකීමක් භාරදූරවන්නේ, ඓතිහාසික පිරිවැය වගකීම ඉටුකිරීම නිරූපණය සඳහා තවදුරටත් ප්‍රමාණවත් නොවන්නේ නම් පමණි; සහ

(ඇ) වගකීමේ කිසියම් මූල්‍ය සංරචකයක් පිළිබිඹු කිරීම සඳහා පොළිය උපචිත කිරීම.

6.9 ඓතිහාසික පිරිවැය මිනුම් පදනමින් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මැනිය හැකි එක් ක්‍රමයක් වන්නේ ඒවා ක්‍රම ක්ෂය පිරිවැය යටතේ මැනීමයි. මූලික හඳුනාගැනීමේදී නිර්ණය කරන ලද අනුපාතිකයට වට්ටම් කරන ලද මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ක්‍රම ක්ෂය පිරිවැය මඟින් අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ ඇස්තමේන්තු පිළිබිඹු වේ. විචල්‍ය අනුපාතික සාධන පත්‍ර සඳහා විචල්‍ය අනුපාතිකයේ වෙනස්වීම් පිළිබිඹු වීමට වට්ටම් අනුපාතිකය යාවත්කාලීන කෙරේ. පොලිය උපචිතවීම, මූල්‍ය වත්කමක් හානිකරණය සහ ලැබීම් සහ ගෙවීම් වැනි පසුව සිදුවන වෙනස්වීම් නිරූපණයවීම සඳහා මූල්‍ය වත්කමක හෝ වගකීමක ක්‍රම ක්ෂය කාලයන් තුල යාවත්කාලීන කෙරේ.

**වර්තමාන අගය**

6.10 මිනුම් කිරීම සිදු කරන දිනට පවතින තත්ත්වය පිළිබිඹු කිරීම සඳහා යාවත්කාලීන කරන ලද තොරතුරු භාවිතා කරමින් වර්තමාන අගය මිනුම් මඟින් වත්කම්, වගකීම් සහ සම්බන්ධිත ආදායම් සහ වියදම් පිළිබඳ මූල්‍ය තොරතුරු ලබාදේ. යාවත්කාලීන කිරීම නිසා පෙර මිනුම් දිනයෙහි සිට වූ වත්කම් හා වගකීම් වල වර්තමාන අගයන් තුළින් වෙනස්වීම් පිළිබිඹු වේ. මුදල් ප්‍රවාහය සහ සාධක ඇස්තමේන්තු එම වර්තමාන අගයන්හි පිළිබිඹුවේ. (6.14 – 6.15 සහ 6.20 ඡේද බලන්න) ඓතිහාසික පිරිවැය මෙන් නොව, වත්කම හෝ වගකීම හටගැන්වීමට හේතුවූ ගනුදෙනුවේ මිල හෝ වෙනත් සිද්ධියකින් කොටසක් ලෙස වුවද, වත්කමක හෝ වගකීමක වර්තමාන අගය නිගමනය නොවේ.

6.11 වර්තමාන අගය මැනීමේ පදනම් වලට ඇතුළත් වන්නේ:

(අ) සාධාරණ අගය (6.12–6.16 ඡේද බලන්න);

(ආ) වත්කම් සඳහා ප්‍රයෝජ්‍ය අගය සහ වගකීම් සඳහා ඉටුකිරීමේ අගය (6.17–6.20 ඡේද බලන්න); සහ

(ඇ) වර්තමාන පිරිවැය (6.21–6.22 ඡේද බලන්න).

**සාධාරණ අගය**

6.12 සාධාරණ අගය යනු, මිනුම් දිනයේදී වෙළෙඳපොළ සහභාගි වන්නන් අතර විධිමත් ගනුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය යුතු හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි.

6.13 වෙළෙඳපොළ සහභාගි වන්නන්ගේ අස්තිත්ත්වයට ප්‍රවිශ්‍ය වීමට හැකි වෙළඳපොල සහභාගි වන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම පිළිබඳ අදහස සාධාරණ අගය මඟින් පිළිබිඹුවේ. වෙළෙඳපොළ සහභාගි වන්නන් ඔවුන්ගේ ආර්ථික වාසිය වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, එම වෙළඳපොල සහභාගි වන්නන් වත්කම හෝ වගකීම සඳහා මිල නියම කිරීමේ දී භාවිතා කරනු ලබන එම උපකල්පනයන්ම භාවිතා කරමින් වත්කම හෝ වගකීම මනිනු ලැබේ.

6.14 සමහර අවස්ථාවල සක්‍රීය වෙළඳපලක මිල ගණන් නිරීක්ෂණය කිරීමෙන් සාධාරණ අගය ඍජුව නිර්ණය කළ හැකිය. වෙනත් අවස්ථා වලදී, මිනුම් ශිල්ප ක්‍රම භාවිත කරමින් එය වක්‍රව නිර්ණය කෙරේ. උදාහරණ වශයෙන්, මුදල් ප්‍රවාහ මත පදනම් වූ මිණුම් ශිල්ප ක්‍රම (6.91 – 6.95 ඡේද බලන්න) පහත සඳහන් සියලු සාධක පිළිබිඹු කිරීම මඟින්:

(අ) අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ ඇස්තමේන්තු.

(ආ) මනිනු ලබන වත්කම හෝ වගකීම සඳහා අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු කල වටිනාකම හෝ කාල නිර්ණයට, මුදල් ප්‍රවාහ වලට ආවේණික අවිනිශ්චිතතාවය මඟින් සිදුවිය හැකි විචලනයන්.

(ඇ) මුදල් වල කාල වටිනාකම.

(ඈ) මුදල් ප්‍රවාහයන්හි ආවේණික අවිනිශ්චිතතාව දරාගැනීමේ මිල (අවදානම් අධිකවූ වාරිකයක් හෝ අවදානම් වට්ටම) එම අවිනිශ්චිතතාවය දරාගැනීමේ මිල රඳා පවතින්නේ එම අවිනිශ්චිතතාවයෙහි ප්‍රමාණය මතය. මුදල් ප්‍රවාහ නිශ්චිත වත්කමකට (හෝ වගකීමකට) වඩා අඩු මුදලක් ආයෝජකයන් මුදල් ප්‍රවාහ අවිනිශ්චිත වත්කමකට (සහ සාමාන්‍යයෙන් වගකීමක් භාර ගැනීම වෙනුවෙන් වැඩි ප්‍රමාණයක් අවශ්‍ය වන) සාමාන්‍යයෙන් ගෙවන කරුණ ද එලෙසම එයින් පිළිබිඹු වේ.

(ඉ) වෙනත් සාධක, උදාහරණ වශයෙන්, ද්‍රවශීලතාවය පවතින තත්වයන් තුළ වෙළෙඳපොළ සහභාගි වන්නන් එම සාධක සැළකිල්ලට ගනී නම්.

6.15 6.14 (ආ) සහ 6.14 (ඈ) යන ඡේදවල සඳහන් සාධකවල, ප්‍රතිපාර්ශවයන්, අස්තිත්ත්වයට ඇති ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට අපොහොසත් විය හැකි බව (ණය අවදානම), හෝ නැතහොත්, අස්තිත්ත්වය විසින් සිය වගකීම් ඉටුකිරීම සඳහා (තමන්ගේම ණය අවදානම) අසමත් විය හැකි බව ඇතුළත්ය.

6.16 වත්කම හෝ වගකීම ඇතිවීමට හේතුවූ ගනුදෙනුවේ මිල හෝ වෙනත් සිද්ධියකින්, කොටසක් ලෙස වුවද, සාධාරණ අගය නිගමනය නොකරන නිසා, වත්කම අත්කර ගැනීමේ දී දරන ගනුදෙනු පිරිවැය මඟින් සාධාරණ අගය වැඩි නොවන අතර, වගකීම දැරීමේදී හෝ භාර ගැනීමේදී දරන ගනුදෙනු කිරීමේ අඩුවන්නේ නැත. ඊට අමතරව සාධාරණ අගයෙන්, වත්කම අවසාන වශයෙන් බැහැර කිරීමට හෝ වගකීම පැවරීමෙන් හෝ නිරවුල් කිරීමේ හෝ වන ගනුදෙනුව සඳහා දැරීමට සිදුවන පිරිවැය පිළිබිඹු නොකරයි.

**ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය**

6.17 ප්‍රයෝජ්‍ය අගය යනු, අස්තිත්ත්වයක් විසින් වත්කමක් භාවිතා කිරීමෙන් සහ එය අවසාන වශයෙන් බැහැර කිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්ගේ, හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභ වල වර්තමාන අගයයි. ඉටුකිරීමේ අගය යනු, මුදල්වල වර්තමාන අගය හෝ අස්තිත්ත්වය එහි වගකීම සපුරාලීමක් ලෙස පැවරීමට අනුග්‍රහය දැක්වීමට අපේක්ෂා කරන හෝ වෙනත් ආර්ථික සම්පත්ය. මුදල් හෝ වෙනත් ආර්ථික සම්පත් වගකීම් ප්‍රතිපාර්ශ්වයකට පැවරීමට අපේක්ෂා කරන වටිනාකම පමණක් නොව, එලෙස වගකීම සපුරාලීමට හැකිවිට ඇතුලත් වන වෙනත් පාර්ශව වලට අස්තිත්ත්වය පැවරීමට අනුග්‍රහය දැක්වීමට අපේක්ෂා කරන වටිනාකම ද ඇතුලත්වේ.

6.18 ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය අනාගත මුදල් ප්‍රවාහයන් මත පදනම් වී ඇති නිසා, ඒවාට වත්කමක් අත්පත් කරගැනීම, හෝ වගකීමක් භාර ගැනීම සඳහා දැරීමට වන ගනුදෙනු පිරිවැය ඇතුළත් නොවේ. කෙසේ වෙතත්, ප්‍රයෝජ්‍ය අගයෙහි සහ ඉටුකිරීමේ අගයෙහි වත්කමක් අවසාන වශයෙන් බැහැර කිරීමට හෝ වගකීමක් සපුරාලන අස්තිත්ත්වයක් දැරීමට අපේක්ෂා කරන ඕනෑම ගනුදෙනුව පිරිවැයේ වර්තමාන අගය ඇතුළත් වේ.

6.19 ප්‍රයෝජ්‍ය අගයේ සහ ඉටුකිරීමේ අගයේ, වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ උපකල්පන වලට වඩා අස්තිත්ත්ව විශේෂිත උපකල්පන පිළිබිඹු කරයි. වෙළඳපොල සහභාගි වන්නන් විසින් භාවිතා කරන

උපකල්පන සහ අස්තිත්ත්වයක් විසින්ම භාවිතා කරන උපකල්පන අතර සමහරවිට ප්‍රායෝගිකව සුළු වෙනසක් තිබිය හැක.

6.20 ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය ඍජුව නිරීක්ෂණය කළ නොහැකි අතර, එය නිරීක්ෂණය කරන්නන් මුදල් ප්‍රවාහ මත පදනම් වූ මිණුම් ශිල්ප ක්‍රම අනුවය (6.91 – 6.95 ඡේද බලන්න) ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය 6.14 ඡේදයෙහි සාධාරණ අගය සඳහා විස්තර කර ඇති සාධකම පිළිබිඹු කරන්නේ නමුත්, එය ව්‍යාජ වෙළඳපොල සහභාගිවන්නන් ගේ යථා දර්ශනයට වඩා අස්තිත්ත්ව යථා දර්ශනය මඟින පිළිබිඹු වේ.

### වර්තමාන පිරිවැය

6.21 වත්කමක වර්තමාන පිරිවැය යනු, මිනුම්කරන දින දී සම (තුල්‍ය) වත්කමක පිරිවැයට, මිනුම්කරන දින දී ගණුදෙනුවට ඇතුලත් ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව සහ එදිනට දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැයෙහි එකතුවයි. වගකීමක වර්තමාන පිරිවැය යනු, මිනුම්කරන දින දී සම වගකීමක් සඳහා ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවෙහි මුදලින් එදිනට දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය අඩු කළ පසු ලැබෙන වටිනාකමයි. වර්තමාන පිරිවැය, ඓතිහාසික පිරිවැය මෙන් ප්‍රවේශවීමේ වටිනාකමයි: එයින් අස්තිත්ත්වයක් වෙළඳපොලෙහි මිල ගණන් යටතේ වත්කම අත්පත් කර ගැනීමේ දී හෝ වගකීම දැරීම සඳහා වන මිල ගණන් පිළිබිඹු කෙරේ. එබැවින්, එය සාධාරණ අගයෙන්, ප්‍රයෝජ්‍ය අගයෙන් සහ ඉටුකිරීමේ අගයෙන් වෙනස් වන අතර, ඒවා ඉවත් වීමේ අගයන් වේ. කෙසේ වෙතත්, ඓතිහාසික පිරිවැය මෙන් නොව, වර්තමාන පිරිවැය මඟින් මිනුම් කරන දිනදී ඇති තත්ත්වයන් පිළිබිඹු කරයි.

6.22 සමහර අවස්ථාවල සක්‍රීය වෙළඳපොල මිල ගණන් නිරීක්ෂණය කර වර්තමාන පිරිවැය ඍජුව නිර්ණය කළ නොහැකි අතර, එය වෙනත් ක්‍රම මඟින් වක්‍රව නිර්ණය කළ යුතු වේ. උදාහරණ වශයෙන්, නව වත්කම් සඳහා පමණක් මිල ගණන් ලබාගත හැකිවන විට, අස්තිත්ත්වය විසින් භාවිත කරන ලද වත්කමක වර්තමාන පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා, නව වත්කමේ වර්තමාන මිලට එම වත්කමක වර්තමාන වයස සහ වත්කමෙහි තත්ත්වය ගලපමින් එම වත්කමෙහි වර්තමාන පිරිවැය ඇස්තමේන්තු කළ යුතුය.

## විශේෂිත මිනුම් පදනම් මඟින් ලබාදෙන තොරතුරු

6.23 මිනුම් පදනමක් තෝරාගැනීමේදී, මිනුම් පදනම මඟින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ යන දෙකෙන්ම ඉදිරිපත් කෙරෙන තොරතුරු වල ස්වභාවය සලකා බැලීම වැදගත්ය. එම තොරතුරු 6.1 වගුව මඟින් සාරාංශ ගත කෙරෙන අතර 6.24 - 6.42 ඡේද මඟින් අමතර විමසීමක් ලබාදේ.

### ඓතිහාසික පිරිවැය

6.24 ඓතිහාසික පිරිවැය මඟින් වත්කමක් හෝ වගකීමක් මැනීමෙන් සපයනු ලබන තොරතුරු මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට අදාල වන්නේ, ඓතිහාසික පිරිවැය, අවම ලෙස අර්ධ වශයෙන්, වත්කම් හා වගකීම් වලට හේතුවූ ගනුදෙනුවේ මිල හෝ වෙනත් සිදුවීමකින් හටගත් තොරතුරු ඔවුන් විසින් භාවිතා කරන නිසාය.

6.25 සාමාන්‍යයෙන්, වෙළඳපළ කොන්දේසි මත මෑතකදී සිදුවූ ගනුදෙනුවකින් අස්තිත්ත්වයක් වත්කමක් අත්පත් කර ගත්තේ නම්, අඩු තරමින් එම වත්කමේ පිරිවැය ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ එම වත්කම අස්තිත්ත්වයටලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ හා සමානව, වෙළඳපල කොන්දේසි මත මෑතකදී සිදුවූ ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස වගකීමක් දරා ඇත්නම් හෝ භාරගනු ලැබ ඇත්නම්, වගකීම ඉටුකිරීමට පැවරිය යුතු ආර්ථික සම්පත්වල බැඳියාවේ වටිනාකම ගනුදෙනු කිරීම් පිරිවැය අඩු කළපසු ලැබූ ප්‍රතිෂ්ඨාර අගයට වඩා වැඩි නොවනු ඇතැයි අස්තිත්ත්වය සාමාන්‍යයෙන් අපේක්ෂා කෙරේ. එබැවින්, එවැනි අවස්ථාවන්හිදී වත්කමක් හෝ වගකීමක් ඓතිහාසික පිරිවැය මත මැනීමෙන් වත්කම, වගකීම යන දෙකටම අදාළ තොරතුරු සහ එම වත්කම, වගකීම ඇතිවීමට හේතුවූ ගනුදෙනුවේ මිල තොරතුරු ද ලබාදේ.

6.26 ඓතිහාසික පිරිවැය තුළින් වත්කමක පරිභෝජනය සහ එහි හානිකරණය පිළිබඳව පිළිබිඹු කෙරෙන්නේ අඩු තත්ත්වයකට පත් කරමින් නිසා, එම ඓතිහාසික පිරිවැයෙන් මනින ලද වත්කමෙහි අයකර ගැනීමට අපේක්ෂා කරන වටිනාකම, එහි ධාරණ වටිනාකමට වඩා අඩු තරමින් විශාලය. ඒ හා සමානව, වගකීම භාරදූර වනවිට එහි ඓතිහාසික පිරිවැය වැඩිවන නිසා, වගකීම සපුරාලීමට අවශ්‍යකරන ආර්ථික සම්පත් පැවරීමට ඇති බැඳියාවේ වටිනාකම වගකීමේ ධාරණ අගයට වඩා නොවේ.

6.27 මූල්‍ය වත්කමක් හැර වෙනත් වත්කමක් ඓතිහාසික පිරිවැය මඟින් මනින විට, වත්කමේ හෝ වත්කමේ කොටසක් විකිණූ හෝ පරිභෝජනය කල හෝ වත්කමෙහි කොටසක් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන වියදමක් ඇති කරයි.

6.28 වත්කමක් විකිණීමේදී පැන නඟින වියදම එම විකිණීම සඳහා වන ප්‍රතිෂ්ඨාව ලෙස හඳුනාගැනේ. ආදායම හා වියදම අතර ඇති වෙනස, විකිණීමේ ප්‍රතිඵලයක් වන ආන්තිකයයි. ආන්තිකයන් පිළිබඳ තොරතුරු ලබා දීමට වත්කම් පාරිභෝජනයෙන් පැනනඟින වියදම් සම්බන්ධිත ආදායම සමග සැසඳිය හැක.

6.29 ඒ හා සමානව, මූල්‍ය වගකීමක් හැර වෙනත් වගකීමක් ප්‍රතිෂ්ඨාවක් සඳහා හුවමාරුවක් ලෙස දරනු ලැබුවේ සහ ලබා ගත්තේ සහ ඓතිහාසික පිරිවැයට මනිනු ලබන්නේ නම්, එම වගකීම සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ සපුරාලීම තුළින් සපුරාලන ලද කොටස සඳහා ලැබුණු ප්‍රතිෂ්ඨාවෙහි අගය අනුව මනිනු ලබන ආදායමක් ඇති කරයි. වගකීම් සපුරාලීම සඳහා දරන ලද ආදායම සහ වියදම් අතර වෙනස වන්නේ සපුරාලීමේ ප්‍රතිඵලයක් ලෙසට වන ආන්තිකයයි.

6.30 වහාම පාරිභෝජනය කරන ලද භාණ්ඩ හා සේවා ඇතුළුව විකුණන ලද හෝ පාරිභෝජනය කරන ලද වත්කම් වල පිරිවැය පිළිබඳ (4.8 ඡේදය බලන්න) සහ ලැබූ ප්‍රතිෂ්ඨාව පිළිබඳ තොරතුරුවල, පුරෝකථන අගයන් තිබිය හැකිය. එම තොරතුරු අනාගතයේදී විකුණනු ලබන භාණ්ඩ (දැනට අස්තිත්ත්වය සතුව නොමැති භාණ්ඩ ඇතුළුව) සහ සේවා තුළින් වන අනාගත ආන්තිකයන් පුරෝකථනය කිරීමේ යෙදවුමක් ලෙසට භාවිතා කළහැකි අතර අනාගත ශුද්ධ මුදල් ගලා ඒම සඳහා වූ අස්තිත්ත්වයෙහි අපේක්ෂාවන් තක්සේරු කළ හැකිය. අස්තිත්ත්වයෙහි අනාගත මුදල් ප්‍රවාහ සඳහා වන අපේක්ෂාවන් තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් බොහෝවිට අස්තිත්ත්වය විසින් දැනටමත් රඳවාගෙන ඇති භාණ්ඩවලින් ජනනය කළහැකි ආන්තික පිළිබඳ අපේක්ෂාවන් මත පමණක් නොව, බොහෝ කාල පරිච්ඡේදයන් තුළ අනාගත ආන්තිකයන් ජනනය කිරීමට අස්තිත්ත්වය තුළ ඇති අපේක්ෂාවන් කෙරෙහි ද අවධානය යොමු කරයි. මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට මුදල් ප්‍රවාහ හෝ ආන්තික පිළිබඳව ඔවුන්ගේ පෙරවූ භාවිකථන පිළිබඳව පසුවිපරමක් ප්‍රතිපෝෂණයක් ඒවා ලබා දිය හැකි නිසා ඓතිහාසික පිරිවැයට මනිනු ලබන ආදායම් සහ වියදම් වල තහවුරු කිරීමේ අගයක් ද තිබිය හැකිය.

6.31 ඒ හා සමාන හේතුන් මත, වත්කම් සඳහා උපයන පොළිය, සහ වගකීම් සඳහා දරන ලද පොළිය පිළිබඳ තොරතුරු ක්‍රම ක්ෂය පිරිවැයෙන් මනිනු ලැබීමෙන් පුරෝකථ්‍ය සහ තහවුරු කිරීමේ අගය තිබිය හැකිය.

## වර්තමාන අගය

### සාධාරණ අගය

6.32 වත්කම් සහ වගකීම් සාධාරණ අගයෙන් මැනීමෙන් සපයනු ලබන තොරතුරු මත පුරෝකථන අගයක් තිබිය හැක්කේ, වෙළඳපොල සහභාගිවන්නන්ගේ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ අගය, කාලය සහ අවිනිශ්චිතතාවය පිළිබඳ වර්තමාන අපේක්ෂාවන් පිළිබිඹු වන නිසාය. මෙම අපේක්ෂාවන් මිල කර ඇත්තේ, වෙළෙඳපොල සහභාගිවන්නන්ගේ වර්තමාන අවදානම් වරණයක් පිළිබිඹු වන ආකාරයටය. පෙරවූ අපේක්ෂාවන් පිළිබඳ ප්‍රතිපෝෂණය ලබාදීමෙන් එම තොරතුරුවල තහවුරුවූ අගය ද තිබිය හැක.

6.33 වෙළෙඳපොළ සහභාගි වන්නන් ගේ වර්තමාන අපේක්ෂාවක් පිළිබිඹු කරන ආදායම් සහ වියදම් තුල සමහර පුරෝකථන අගය තිබිය හැකිනිසා, එවැනි ආදායම් සහ වියදම් අනාගත ආදායම් හා වියදම් පුරෝකථනය කිරීමේ යෙදවුමක් ලෙස භාවිතා කළ හැකිය. එවැනි ආදායම් සහ වියදම් අස්තිත්ත්වයේ ආර්ථික සම්පත් භාවිතා කරමින් අස්තිත්ත්වයේ කළමනාකාරිත්වය එහි වගකීම් කෙතරම් කාර්යක්ෂමව සහ සඵලදායි ලෙස ඉටුකර ඇත්ද යන්න තක්සේරු කිරීමට ද උපකාරී වේ.

6.34 6.14 ඡේදයෙහි හඳුනාගෙන ඇති විවිධ සාධක හේතුවෙන් වත්කමක හෝ වගකීමක සාධාරණ අගයෙහි වෙනසක් සිදුවිය හැකිය. එම සාධක තුළ වෙනස් ගති ලක්ෂණ ඇතිවිට, එම සාධක වල ප්‍රතිඵලයක් ලෙස වන ආදායම් හා වියදම් වෙන වෙනම හඳුනා ගැනීමෙන් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට ප්‍රයෝජනවත් තොරතුරු සැපයිය හැකිය. (7.14 (ආ) ඡේදය බලන්න).

6.35 අස්තිත්ත්වයක් එක වෙළඳපොලකින් වත්කමක් අත්පත් කරගෙන, වෙනස් වෙළඳපලක මිල ගණන් භාවිතා කරමින් සාධාරණ අගය නිර්ණය කරයි නම්, (අස්තිත්ත්වය වත්කම විකුණනු ලබන වෙළඳපොලේ) එම සාධාරණ අගය මුලින්ම නිර්ණය කළ වේලාවේදී එම වෙළෙඳපොළ දෙකේ ඇති මිල ගණන් භාවිතා කරමින් සාධාරණ අගය තීරණය කරන්නේ නම්, එම වෙළෙඳපොළ දෙකෙහි මිල ගණන් අතර වන යම් වෙනසක් ආදායම ලෙස හඳුනාගැනේ.

6.36 එම සාධාරණ අගය මනිනු ලබන අවස්ථාවේදී භාවිතා කල මිළ ගණන් සඳහා මූලාශ්‍රවූ වෙළඳපොලේදී ගනුදෙනුව සිදුවන්නේ නම්, වත්කමක් විකිණීම හෝ වගකීමක් පැවරීම සාමාන්‍යයෙන්

විය හැක්කේ එහි සාධාරණ අගයට සමානවූ වටිනාකමට සඳහා වන ප්‍රතිශ්ඨාවකටය. එවැනි අවස්ථාවලදී වත්කම හෝ වගකීම සාධාරණ අගයට මනිනු ලබන්නේ නම්, ගනුදෙනු කිරීමේ පිරිවැයෙහි බලපෑම සැළකිය යුතු මට්ටමක නොපවතින්නේ නම්, විකුණන අවස්ථාවේ දී හෝ පැවරීමේදී පැන නගින ශුද්ධ ආදායම හෝ ශුද්ධ වියදම සාමාන්‍යයෙන් කුඩා වේ.

**ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය**

6.37 ප්‍රයෝජ්‍ය අගය මඟින් වත්කමක් භාවිතා කිරීම සහ එහි අවසාන බැහැර කිරීම පිළිබඳ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය පිළිබඳ තොරතුරු ලබාදෙයි. අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහ ගලා ඒම් පිළිබඳ අපේක්ෂාවන් තක්සේරු කිරීම සඳහා භාවිතා කළ හැකි බැවින් මෙම තොරතුරුවල පුරෝකථක අගයන් තිබිය හැකිය.

6.38 ඉටුකිරීමේ අගය මඟින් වගකීමක් ඉටු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය පිළිබඳ තොරතුරු ලබාදෙයි. එබැවින්, ඉටුකිරීමේ වටිනාකමට පුරෝකථක අගයක් තිබිය හැක්කේ, විශේෂයෙන් වගකීම පැවරීමට හෝ සාකච්ඡා මඟින් පියවා දැමීමට වඩා එය ඉටු කරනු ඇතිබව නිසාය.

6.39 අනාගත මුදල් ප්‍රවාහ වල වටිනාකමේ ඇස්තමේන්තු කල නිර්ණය සහ අවිනිශ්චිතතාවය පිළිබඳ තොරතුරු සමඟ සංයෝජනයවූ ප්‍රයෝජ්‍ය අගයේ හෝ ඉටුකිරීමේ අගයේ යාවත්කාලීන කල ඇස්තමේන්තු වල, ප්‍රයෝජ්‍ය අගයේ හෝ ඉටුකිරීමේ අගයේ පෙරවූ ඇස්තමේන්තු පිළිබඳව ප්‍රතිපෝෂණයක් ඒවා ලබාදෙන නිසා ඒවායේ තහවුරු අගයක් ද තිබිය හැකිය.

**වර්තමාන පිරිවැය**

6.40 වර්තමාන පිරිවැයට මනිනු ලබන වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු අදාළ විය හැක්කේ, මිනුම් කරන දිනට සම වත්කමක් අත් කරගැනීමට හෝ නිර්මාණය කළහැකි පිරිවැය හෝ සම වගකීමක් දැරීමට හෝ භාරගැනීම සඳහා ලැබිය යුතු පිරිවැයෙන් පිළිබිඹු වන නිසාය.

6.41 ඓතිහාසික පිරිවැය මෙන්, වර්තමාන පිරිවැය මඟින්ද වත්කමක් පරිභෝජනය කිරීමේ පිරිවැය හෝ වගකීමක් ඉටු කිරීමෙන් ලැබෙන ආදායම පිළිබඳ තොරතුරු ලබාදේ. එම තොරතුරු වර්තමාන ආන්තිකයන් ලබා ගැනීමට භාවිතා කිරීමට සහ අනාගත ආන්තිකයන් පුරෝකථන කිරීමේ යෙදවුමක් ලෙසට භාවිතා කළ හැකිය. ඓතිහාසික පිරිවැය මෙන් නොව, වර්තමාන පිරිවැය මඟින් පාරිභෝජනය කරන හෝ ඉටුකරන ලද අවස්ථාවේ පවත්නා මිළ ගණන් පිළිබිඹු වේ. මිළෙහි සැලකිය යුතු වෙනස්කම් ඇති විට, ඓතිහාසික පිරිවැය මත පදනම් වූ ආන්තිකයන්ට වඩා වර්තමාන පිරිවැය මත පදනම් වූ ආන්තිකයන්, අනාගත ආන්තිකයන් පුරෝකථන කිරීම සඳහා වඩාත් ප්‍රයෝජනවත් විය හැකිය.

6.42 පරිභෝජනයේ වර්තමාන පිරිවැය වාර්තා කිරීම සඳහා (හෝ ඉටු කිරීමෙන් වන වර්තමාන ආදායම), වාර්තා කරන කාල පරිච්ඡේදය තුළ ධාරණ අගයෙහි වෙනස සහ පරිභෝජනයේ වර්තමාන පිරිවැය (හෝ ඉටු කිරීමෙන් ලැබෙන වර්තමාන ආදායම) සහ මිල ගණන් වෙනස් වීමේ බලපෑම යන කොටස් දෙකට බෙදා වෙන්කිරීම් අවශ්‍යවේ. එම මිල වෙනස් වීමේ බලපෑම සමහරවිට 'රඳවාගැනීමේ ලාභයක්' හෝ 'රඳවාගැනීමේ අලාභයක්' ලෙස හැඳින්වේ.

## 6.1 වගුව — විශේෂිත මිනුම් පදනම් මඟින් සපයනු ලබන තොරතුරුවල සාරාංශය

***වත්කම්***

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | | | |
|---|---|---|---|---|
| | **ඓතිහාසික පිරිවැය** | **සාධාරණ අගය (වෙළඳපල සහභාගිවන්නන්ගේ උපකල්පන)** | **ප්‍රයෝජන අගය (අස්තිත්ත්ව - විශේෂිත උප කල්පන)** [අ] | **වර්තමාන පිරිවැය** |
| ධාරණ අගය | පාරිභෝජනය නොකළ හෝ එකතු නොකළ (ගණුදෙනු පිරිවැය ඇතුළුව) සහ අයකර ගතහැකි ප්‍රමාණය දක්වා වන ඓතිහාසික පිරිවැය<br><br>(ඕනෑම මූල්‍ය සංරචකයක් සඳහා උපචිත පොළිය ඇතුලත්වේ) | වත්කම විකිණීමෙන් ලැබිය යුතු මිළ (බැහැර කිරීමේ ගණුදෙනු පිරිවැය අඩු නොකර) | වත්කම භාවිතයෙන් සහ එහි අවසාන බැහැර කිරීමෙන් වන අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය (බැහැර කිරීමේ ගණුදෙනු පිරිවැයේ වර්තමාන අගය අඩු කිරීමෙන් පසුව) | පරිභෝජනය නොකළ හෝ රැස් නොකළ (ගණුදෙනු පිරිවැය ඇතුළුව) සහ අයකර ගතහැකි ප්‍රමාණය දක්වා වන වර්තමාන පිරිවැය |
| **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ(ය)** | | | | |
| **සිද්ධිය** | **ඓතිහාසික පිරිවැය** | **සාධාරණ අගය (වෙළඳපල සහභාගිවන්නන්ගේ උපකල්පන)** | **ප්‍රයෝජ්‍ය අගය (අස්තිත්ත්ව - විශේෂිත උප කල්පන)** | **වර්තමාන පිරිවැය** |
| ආරම්භක හඳුනාගැනීම[ආ] | — | අත් කරගත් වත්කමෙහි ගෙවූ ප්‍රතිශ්ඨාව සහ සාධාරණ අගය අතර වෙනස[ඇ]<br><br>වත්කම් අත් කර ගැනීම සඳහා වූ ගණුදෙනු පිරිවැය | අත් කර වත්කමෙහි ගෙවූ ප්‍රතිශ්ඨාව සහ ප්‍රයෝජ්‍ය අගය අතර වෙනස<br><br>වත්කම් අත් කර ගත් ගැනීම සඳහා වූ ගණුදෙනු පිරිවැය. | — |
| වත්කම පාරිභෝජනය කිරිම හෝ විකිණීම[ඇ, ඉ] | විකුණන ලද හෝ පාරිභෝජනය කරන ලද වත්කම්වල වියදමට සමාන ඓතිහාසික පිරිවැය<br><br>ලැබූ ආදායම. | වීකුණන ලද හෝ පාරිභෝජනය කරන ලද වත්කම්වල වියදමට සමාන සාධාරණ අගය<br><br>ලැබූ ආදායම | විකුණන ලද හෝ පාරිභෝජනය කරන ලද වත්කම්වල වියදමට සමාන ප්‍රයෝජ්‍ය අගය<br><br>ලැබූ ආදායම. | විකුණන ලද හෝ පාරිභෝජනය කරන ලද වත්කම්වල වියදමට සමාන වර්තමාන පිරිවැය<br><br>ලැබූ ආදායම |

| | | | | |
|---|---|---|---|---|
| | (දළ හෝ ශුද්ධ ලෙසට ඉදිරිපත් කළහැකිය.)<br><br>වත්කම විකිණීමේදී ගණුදෙනු පිරිවැය සඳහා වන වියදම් | (දළ හෝ ශුද්ධ ලෙසට ඉදිරිපත් කළහැකිය.)<br><br>වත්කම විකිණීමේදී ගණුදෙනු පිරිවැය සඳහා වන වියදම් | (දළ හෝ ශුද්ධ ලෙසට ඉදිරිපත් කළහැකිය.) | (දළ හෝ ශුද්ධ ලෙසට ඉදිරිපත් කළහැකිය.)<br><br>වත්කම විකිණීමේදී ගණුදෙනු පිරිවැය සඳහා වන වියදම් |
| පොළී ආදායම් | වත්කම විචල්‍ය පොළියක් දරන්නේ නම්, ඓතිහාසික අනුපාතිකයන්ට අනුව පොළී ආදායම යාවත්කාලීනවේ. | සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | ප්‍රයෝජ්‍ය අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | පොළී ආදායම, වර්තමාන අනුපාතිකයට අනුවය |
| හානිකරණය | ඓතිහාසික පිරිවැය තව දුරටත් අයකර ගත නොහැකි නිසා පැන නගින වියදම් | සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | ප්‍රයෝජ්‍ය අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | වර්තමාන පිරිවැය තව දුරටත් අයකර ගත නොහැකි නිසා පැන නගින වියදම්. |
| අගය වෙනස්වීම් | හානිකරණය පිළිබිඹුවීම හැර, හඳුනාගෙන නොමැත.<br><br>මූල්‍ය වත්කම් සඳහා – ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහවල වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් | සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ. | ප්‍රයෝජ්‍ය අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ. | මිළෙහි වෙනස්වීම් වල බලපෑම පිළිබිඹු කරන ආදායම සහ වියදම්<br>(රඳවා ගැනීමේ ලාභ සහ රඳවා ගැනීමේ අලාභ) |

(අ) **ප්‍රයෝජ්‍ය** අගය මිනුම් පදනම ලෙස භාවිතා කරන්නේ නම්, ලබාදී ඇති තොරතුරු මෙම තීරුවේ සාරාංශගත කරයි. කෙසේ වෙතත්, 6.75 ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි, නිතිපතා යළි මැනීම සඳහා **ප්‍රයෝජ්‍ය** අගය ප්‍රායෝගික මිනුම් පදනමක් නොවිය හැකිය·

(ආ) වෙළඳපොල කොන්දේසි මත අත්පත් කර නොගත් වත්කමක් මුලින් හඳුනාගැනීම මත ආදායම් හෝ වියදම් පැන නැගිය හැකිය·

(ඇ) වත්කමේ සාධාරණ අගය මනින ලද අවස්ථාවේදී භාවිතා කල මිල ගණන් සඳහා වූ මූලාශ්‍රය වූ වෙළඳපොලින්, වත්කම අත්පත් කරගත් වෙළඳපොල වෙනස් නම්, ආදායමක් හෝ වියදමක් පැන නැගිය හැකිය·

(ඈ) වත්කම් පරිභෝජනය සංකේතමය වශයෙන් වාර්තාවන්නේ විකුණුම් පිරිවැය, ක්ෂය කිරීම හෝ ක්‍රමක්‍ෂය කිරීමෙනි·

(ඉ) ලැබුන ආදායම බොහෝ විට ලැබුණු ප්‍රතිෂ්ඨාවට සමාන වන නමුත්, එය ඕනෑම සම්බන්ධිත වගකීමක් සඳහා භාවිතා කරන පදනම මත රඳා පවතී·

***වගකීම්***

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | | | |
|---|---|---|---|---|
| | **ඓතිහාසික පිරිවැය** | **සාධාරණ අගය (වෙළඳපල සහභාගිවන්නන්ගේ උපකල්පන** | **සපුරාලීමේ අගය (අස්තිත්ත්ව -- විශේෂිත උපකල්පන)** | **වර්තමාන පිරිවැය** |
| **ධාරණ අගය** | වගකීමේ ඉටු නොකළ කොටස භාරගැනීම සඳහා ලැබුණු ප්‍රතිෂ්ඨාව (ගණුදෙනු පිරිවැයෙන් ශුද්ධ), ලැබී ඇති ප්‍රතිශ්ඨාවට වඩා ඇස්තමේන්තුගත මුදල් ගලා යෑම් ඉක්මවා යෑම<br><br>(ඕනෑම මූල්‍ය සංරචකයක් සඳහා උපචිතවූ පොළිය ඇතුලත්වේ.) | වගකීමෙන් ඉටු නොකළ කොටස පැවරීම සඳහා ගෙවනු ලබන මිළ (පැවරීමේදී දැරීමට සිදුවන ගණුදෙනු පිරිවැය ද ඇතුළුව) | වගකීමෙන් ඉටු නොකළ කොටස ඉටුකර ගැනීම පැන නගින අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය (ඉටු කිරීමේදී හෝ පැවරීමේදී දැරීමට සිදුවන ගණුදෙනු පිරිවැයේ වර්තමාන අගය ද ඇතුළුව). | වගකීමෙන් ඉටු නොකළ කොටස භාරගැනීම සඳහා දැනට ලැබුණු ප්‍රතිශ්ඨාව (ගණුදෙනු පිරිවැයෙන් ශුද්ධ), එම ප්‍රතිශ්ඨාවට වඩා ඇස්තමේන්තුගත මුදල් ගලා යෑම් ඉක්මවා යෑම |

| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ(ය) | | | | |
|---|---|---|---|---|
| **සිද්ධිය** | **ඓතිහාසික පිරිවැය** | **සාධාරණ අගය (වෙළඳපල සහභාගිවන්නන්ගේ උපකල්පන)** | **ඉටු කිරීමේ අගය (අස්තිත්ත්ව - විශේෂිත උප කල්පන)** | **වර්තමාන පිරිවැය** |
| ආරම්භක හඳුනාගැනීම[අ] | — | ලැබී ඇති ප්‍රතිශ්ඨාව සහ වගකීමේ සාධාරණ අගය අතර වෙනස[ආ] | ලැබී ඇති ප්‍රතිශ්ඨාව සහ වගකීම ඉටු කිරීමේ අගය අතර වෙනස | — |

| | | | | |
|---|---|---|---|---|
| | | වගකීම් දැරීම හෝ භාරගැනීම සඳහා වන ගණුදෙනු පිරිවැය | වගකීම් දැරීම හෝ භාරගැනීම සඳහා වන ගණුදෙනු පිරිවැය | |

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ(ය)**

| **සිද්ධිය** | **ඓතිහාසික පිරිවැය** | **සාධාරණ අගය (වෙළඳපල සහභාගිවන්නන්ගේ උපකල්පන)** | **ඉටු කිරීමේ අගය (අස්තිත්ත්ව - විශේෂිත උප කල්පන)** | **වර්තමාන පිරිවැය** |
|---|---|---|---|---|
| වගකීම ඉටු කිරීම | ඉටුකරන ලද වගකීම්වල ඓතිහාසික පිරිවැයට සමාන ආදායම (ඓතිහාසික ප්‍රතිශ්ඨාව පිළිබිඹුවේ) | ඉටුකරන ලද වගකීම්වල සාධාරණ අගයට සමාන ආදායම. | ඉටුකරන ලද වගකීම්වල ඉටු කිරීමේ අගයට සමාන ආදායම. | ඉටුකරන ලද වගකීම්වල වර්තමාන පිරිවැයට සමාන ආදායම වර්තමාන ප්‍රතිශ්ඨාව පිළිබිඹු කරයි). |
| | වගකීම් ඉටුකිරීමේදී දරණ පිරිවැය සඳහා වියදම් | වගකීම් ඉටුකිරීමේදී දරණ පිරිවැය සඳහා වියදම් | වගකීම් ඉටුකිරීමේදී දරණ පිරිවැය සඳහා වියදම් | වගකීම් ඉටුකිරීමේදී දරණ පිරිවැය සඳහා වියදම් |
| | ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය.) | (ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය.දළ නම්, ඓතිහාසික ප්‍රතිශ්ඨාව වෙන වෙනම ඉදිරිපත් කළහැකිය.) | (ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය. දළ නම්, ඓතිහාසික ප්‍රතිශ්ඨාව වෙන වෙනම ඉදිරිපත් කළහැකිය.) | (ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය. දළ නම්, ඓතිහාසික ප්‍රතිශ්ඨාව වෙන වෙනම ඉදිරිපත් කළහැකිය.) |
| වගකීම පැවරීම | ආදායම, පවරන ලද වගකීමෙහි ඓතිහාසික පිරිවැයට සමානවේ. (ඓතිහාසික ප්‍රතිශ්ඨාව පිළිබිඹු කරයි) | ආදායම, පවරන ලද වගකීමෙහි සාධාරණ අගයට සමානවේ. | ආදායම, පවරන ලද වගකීමෙහි ඉටුකරන අගයට සමානවේ. | ආදායම, පවරන ලද වගකීමෙහි වර්තමාන පිරිවැයට සමානවේ. (වර්තමාන ප්‍රතිශ්ඨාව පිළිබිඹු කරයි) |
| | වගකීම පැවරීම කිරීම වෙනුවෙන් ගෙවන ලද පිරිවැය සඳහා වන වියදම් (ගණුදෙනු පිරිවැය ඇතුළුව) | වගකීම පැවරීම වෙනුවෙන් ගෙවන ලද පිරිවැය සඳහා වන වියදම් (ගණුදෙනු පිරිවැය ඇතුළුව) | වගකීම පැවරීම වෙනුවෙන් ගෙවන ලද පිරිවැය සඳහා වන වියදම් (ගණුදෙනු පිරිවැය ඇතුළුව) | වගකීම පැවරීම වෙනුවෙන් ගෙවන ලද පිරිවැය සඳහා වන වියදම් (ගණුදෙනු පිරිවැය ඇතුළුව) |

| | | | | |
|---|---|---|---|---|
| | ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය.) | ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය.) | ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය.) | ශුද්ධ හෝ දළ වශයෙන් ඉදිරිපත් කළහැකිය.) |
| පොළී වියදම් | වගකීම විචල්‍ය පොළියක් දරන්නේ නම්, ඓතිහාසික අනුපාතිකයන්ට අනුව පොළී වියදම් යාවත්කාලීනවේ. | සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | ඉටුකිරීමේ අගයෙහි වෙනස්වීම් වලින් ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | පොළී වියදම්, වර්තමාන අනුපාතිකයන්ට අනුවය |
| වගකීමක් භාරදූර වීමට හේතුවන සිදුවීම් වල බලපෑම | වගකීම්වල ඓතිහාසික පිරිවැයට වඩා ඇස්තමේන්තුගත මුදල් ගලා යාමේ අතිරික්තයට වියදම් සමානවේ හෝ එම අතිරික්තයේ පසුකාලීන වෙනස | සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | ඉටුකිරීමේ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ.<br><br>(වෙනම හඳුනාගත හැකිය.) | වගකීම්වල වර්තමාන පිරිවැයට වඩා ඇස්තමේන්තු ගත මුදල් ගලා යාමේ අතිරික්තයට වියදම් සමානවේ හෝ එම අතිරික්තයේ පසුකාලීන වෙනස |
| අගය වෙනස්වීම් | වගකීම භාරදූර වන තරම හැර හඳුනාගෙන නොමැත.<br><br>මූල්‍ය වගකීම් සඳහා -- ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහවල වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් | සාධාරණ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ. | ඉටුකිරීමේ අගයෙහි වෙනස්වීම් වලින් ලැබෙන ආදායම සහ වියදම් පිළිබිඹුවේ. | මිල ගණන් වල වෙනස්වීම් බලපෑම පිළිබිඹු කරන ආදායම සහ වියදම් (රඳවා ගැනීමේ ප්‍රතිලාභ සහ රඳවා ගැනීමේ අලාභ) |

(අ) වෙළඳපොල කොන්දේසි මත නොව, දරන ලද හෝ භාරගනු ලබන වගකීමක් මුලින් හඳුනාගැනීම මත ආදායම සහ වියදම් පැන නැගිය හැකිය.

(ආ) වගකීමේ සාධාරණ අගය මනින ලද අවස්ථාවේදී භාවිතා කල මිළ ගණන්වල මූලාශ්‍රය වූ දරනු ලබන වෙළඳපොලෙන් වගකීම දරනු ලැබූ හෝ භාරගත් වෙළඳපොල වෙත එනම්, ආදායමක් හෝ වියදමක් පැන නගී.

## මිනුම් පදනමක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක

6.43 වත්කමක් හෝ වගකීමක් සඳහා හා සම්බන්ධිත ආදායම් සහ වියදම් සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ (ය) යන දෙකෙහිම (6.23 – 6.42 ඡේද හා 6.1 වගුව බලන්න) මිනුම් පදනම ඉදිරිපත් කරනු ලබන තොරතුරු වල ස්වභාවය මෙන්ම වෙනත් සාධක සලකා බැලීම අවශ්‍ය කෙරේ. (6.44 – 6.86 ඡේද බලන්න).

6.44 බොහෝ අවස්ථාවන්හිදී, කුමන මිනුම් පදනමක් තෝරාගත යුතුද යන්න තනි සාධකයක් විසින් නිර්ණය කරනු නොලැබේ. එක් එක් සාධකයෙහි සාපේක්ෂ වැදගත්කම රඳා පවතින්නේ කරුණු සහ තත්ත්වයන් මතය.

6.45 මිනුම් පදනමක් මගින් සපයනු ලබන තොරතුරු මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට ප්‍රයෝජනවත් විය යුතුය. මෙය ඉෂ්ඨ කරගැනීමට, තොරතුරුවල අදාලත්වය සහ එයින් නියෝජනය කිරීමට අදහස් කරන දෙය විශ්වාසවන්තව නියෝජනය විය යුතුය. ඊට අමතරව, හැකිතාක්දුරට සපයන ලද තොරතුරු සැසඳිය හැකි, සත්‍යාපනය කළ හැකි, කාලෝචිත සහ තේරුම් ගත හැකි විය යුතුය.

6.46 2.2.1 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූලික ගුණාත්මක ගතිලක්ෂණ යොදාගැනීමේ වඩාත් කාර්යක්ෂම හා සඵලදායි ක්‍රියාවලිය වන්නේ සාමාන්‍යයෙන් ආර්ථික සංසිද්ධියක් පිළිබඳ වඩාත්ම අදාල තොරතුරු හඳුනාගැනීමයි. එම තොරතුරු ලබාගත නොහැකි නම් හෝ ආර්ථික සංසිද්ධිය විශ්වාසනීයව නිරූපණය කිරීමට හැකිවන පරිදි ලබා ගත නොහැකි නම්, ඊළඟට ඇති වඩාත්ම අදාල වර්ගයේ තොරතුරු සළකා බැලේ. මිනුම් පදනමක් තෝරා ගැනීමේදී ගුණාත්මක ගතිලක්ෂණ මගින් ඉටුකරන කාර්යභාරය පිළිබඳව 6.49 - 6.76 ඡේද මගින් වැඩිදුර සාකච්ඡා කෙරේ.

6.47 6.49 - 6.76 ඡේදවලින් සාකච්ඡා වන පරිදි, හඳුනාගත් වත්කම් සහ වගකීම් සඳහා මිනුම් පදනමක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු සාධක කෙරෙහි අවධානය යොමු කෙරේ. හඳුනාගත් සහ හඳුනා නොගත් අයිතම සඳහා සටහන් වල ලබාදී ඇති තොරතුරු සඳහා මිනුම් පදනමක් තෝරාගැනීමේදී එම සාකච්ඡාවේ සමහර දෑ ව්‍යවහාර විය හැකිය.

6.48 මූලික හඳුනාගැනීම මත මිනුම් පදනමක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු අමතර සාධක පිළිබඳව 6.77 - 6.82 ඡේදවල සාකච්ඡා කෙරේ. ආරම්භක මිනුම් පදනම පසුකාලීන මිනුම් පදනම සමඟ අසංගත නම්, තනිකරම මිනුම් පදනමේ වෙනස්වීම නිසා ආදායම් සහ වියදම් ප්‍රථම පසුකාලීන මිනුම් අවස්ථාවේදී හඳුනා ගැනීම කළ යුතුය. එවැනි ආදායම් හා වියදම් හඳුනාගැනීමේදී, ගනුදෙනුවක් හෝ වෙනත් සිදුවීමක් නිරූපණය කරන විට, සත්‍ය වශයෙන්ම එවැනි ගනුදෙනුවක් හෝ සිදුවීමක් සිදුවී නොමැති බව පෙනීයයි. එබැවින් වත්කමක් හෝ වගකීමක් සහ සම්බන්ධ ආදායම් හා වියදම් සඳහා මිනුම් පදනමක් තෝරාගැනීමේදී ආරම්භක මිනුම් සහ පසුව මැනීම යන දෙකම සළකා බැලීමෙන් පසුව නිර්ණය කළ යුතුය.

### අදාළත්වය

6.49 වත්කමක් හෝ වගකීමක් සඳහා මිනුම් පදනමක් මගින් ලබාදෙන තොරතුරුවල අදාලත්වය සහ සම්බන්ධ ආදායම හා වියදම සඳහා බලපාන්නේ:

(අ) වත්කම් හා වගකීම් වල ගතිලක්ෂණ (6.50–6.53 ඡේද බලන්න); සහ

(ආ) එම වත්කම හෝ වගකීම අනාගත මුදල් ප්‍රවාහයට දායක වන්නේ කෙසේද (6.54–6.57 ඡේද බලන්න) යන්න මගිනි.

### වත්කමක හෝ වගකීමක ගතිලක්ෂණ

6.50 මිනුම් පදනමක් මගින් ලබාදෙන තොරතුරු වල අදාළත්වය කොටසක් ලෙස රඳා පවත්නේ වත්කම් හෝ වගකීම් වල ගතිලක්ෂණ මතය, විශේෂයෙන් මුදල් ප්‍රවාහ වල විචල්‍යතාවය මත සහ වත්කම් වල හෝ වගකීමේ වටිනාකම, වෙළඳපොල සාධක හෝ වෙනත් අවදානම් වලට සංවේදී ද යන්න මතය.

6.51 වත්කමක හෝ වගකීමක වටිනාකම වෙළඳපොල සාධක හෝ වෙනත් අවදානම් වලට සංවේදී නම්, එහි ඓතිහාසික පිරිවැය, එහි වර්තමාන අගයට වඩා සැළකිය යුතු ලෙස වෙනස් විය හැකිය. ඒ නිසාවෙන්, වටිනාකම වෙනස්වීම පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්හට වැදගත් නම් ඓතිහාසික පිරිවැය මගින් අදාල තොරතුරු ලබාදිය නොහැකිය. උදාහරණ වශයෙන්, ව්‍යුත්පන්නයක් වන මූල්‍ය වත්කමක මූල්‍ය වගකීමක් පිළිබඳ අදාළ තොරතුරු ක්‍රම ක්ෂය පිරිවැයෙන් ලබාදිය නොහැක.

6.52 තවද, ඓතිහාසික පිරිවැය භාවිතා කරන්නේ නම්, වටිනාකමේ වෙනස්කම් වාර්තා කරන්නේ, එම වටිනාකම වෙනස් වන අවස්ථාවේ නොවන නමුත්, බැහැර කිරීම, හානිකරණය හෝ ඉටුකිරීම වැනි සිදුවීමක් සිදුවන අවස්ථාවේදීය. ඒ හැරත්, ඓතිහාසික පිරිවැයට මැනීම වටිනාකමේ වෙනස්වීම් පිළිබඳව කාලානුරූපී තොරතුරු ලබා නොදෙන නිසා වාර්තා කරන කාල පරිච්ඡේදය තුළදී වත්කම හෝ වගකීම රඳවා සිටීමෙන් පැන නගින අස්තිත්ත්වයේ අවදානමට වන නිරාවරණයේ සම්පූර්ණ බලපෑම නිරූපණය නොකිරීම මඟින්, ආදායම සහ වියදම එම පදනම මත වාර්තා කිරීම මඟින් පුරෝකථන අගයන් සහ තහවුරු කිරීමේ අගයන් තිබිය නොහැකිය.

6.53 වත්කමක හෝ වගකීමක සාධාරණ අගයෙහි වෙනස්වීම් මඟින් වෙළඳපල සහභාගී වන්නන් ගේ අපේක්ෂාවන්හි වෙනස්වීම් සහ ඔවුන්ගේ අවදානම් වරණයන්හි වෙනස්වීම් පිළිබිඹු කරයි. මනිනු ලබන වත්කමෙහි හෝ වගකීමෙහි ගතිලක්ෂණ මත සහ අස්තිත්ත්වයෙහි ව්‍යාපාර කටයුතු වල ස්වභාවය අනුව එම වෙනස්වීම් පිළිබිඹු කරන තොරතුරු මඟින් සෑම විටම පුරෝකථක අගයන් හෝ තහවුරු කිරීමේ අගයන් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට ලබා නොදේ. අස්තිත්ත්වයක ව්‍යාපාර කටයුතු වලට වත්කම් විකිණීම හෝ වගකීම පැවරීම ඇතුළත් නොවන විට මෙලෙස ඇති විය හැකිය, උදාහරණ ලෙස, අස්තිත්ත්වයක් සතු වත්කම් තනිකරම භාවිතය සඳහා හෝ තනිකරම ගිවිසුම් ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා හෝ අස්තිත්ත්වයෙහි වගකීම් එය විසින්ම ඉටු කළයුතු නම් ගත හැකිය.

### අනාගත මුදල් ප්‍රවාහයට දායක වීම

6.54 1.14 ඡේදයේ සඳහන් කර ඇති පරිදි, සමහර ආර්ථික සම්පත් සෘජුවම මුදල් ප්‍රවාහයන් ඇති කරයි; වෙනත් අවස්ථාවලදී, වක්‍රව මුදල් ප්‍රවාහයන් ඇති කිරීම සඳහා ආර්ථික සම්පත් සංයෝජිතව භාවිතා කරයි. ආර්ථික සම්පත් භාවිතා කරන්නේ කෙසේද, සහ වත්කම් සහ වගකීම් මුදල් ප්‍රවාහයන් ඇති කරන්නේ කෙසේද යන්න රඳා පවතින්නේ අස්තිත්ත්වය විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර කටයුතුවල ස්වභාවය මතය.

6.55 ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීමට හෝ අලෙවි කිරීමට ආර්ථික සම්පත් සංයෝජිතව භාවිතා කිරීම මඟින් වක්‍රව මුදල් ප්‍රවාහ හට ගන්වන එම විවිධ ආර්ථික සම්පත් භාවිතා කිරීම ව්‍යාපාරික කටයුතුවල අස්තිත්ත්වය නියැලී ඇති විට, එම ක්‍රියාකාරකම ගැන ඓතිහාසික පිරිවැය හෝ වර්තමාන පිරිවැය මඟින් අදාල තොරතුරු ලබාදීමට ඉඩ ඇත. උදාහරණ වශයෙන්, දේපල, පිරියත හා උපකරණ සාමාන්‍යයෙන් අස්තිත්ත්වයක ඇති වෙනත් ආර්ථික සම්පත් සමග සංයෝජනය වී භාවිතා වීම ගත හැකිය. ඒ හා සමානව, අස්තිත්ත්වයෙහි වෙනත් ආර්ථික සම්පත් පුළුල් ලෙස භාවිතා කිරීම හැර, ඉන්වෙන්ට්‍රි සාමාන්‍යයෙන් පාරිභෝගිකයෙකුට විකිණිය නොහැක. (උදාහරණයක් ලෙස, නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාකාරකම් වලදී) 6.24 – 6.31 සහ 6.40 – 6.42 ඡේද මඟින් එවැනි වත්කම් ඓතිහාසික පිරිවැය මඟින් මනිනු ලබන්නේ කෙසේද යන්න හෝ වර්තමාන පිරිවැය මඟින් කාල පරිච්ඡේදය තුළදී ආන්තිකයන් උත්පාදනය කිරීමේදී භාවිතා කළ හැකි අදාල තොරතුරු සැපයීම පැහැදිලි කරයි.

6.56 ස්වාධීනව හා සැලකිය යුතු අන්දමේ ආර්ථික දණ්ඩනයක් නොමැතිව විකිණිය හැකි (උදාහරණ වශයෙන්, සැලකිය යුතු අන්දමේ ව්‍යාපාරික කඩා වැටීමකින් තොරව) වත්කම් හා වැනි සෘජුවම මුදල් ප්‍රවාහ හටගන්වන වත්කම් සහ වගකීම් සඳහා අනාගත මුදල් ප්‍රවාහවල වටිනාකමේ වර්තමාන ඇස්තමේන්තු කාල නිර්ණය සහ අවිනිශ්චිතතාවය අන්තර්ගත කරන වඩාත්ම අදාල තොරතුරු ලබාදෙන මිනුම් පදනම විය හැක්කේ වර්තමාන අගයයි.

6.57 අස්තිත්ත්වයක ව්‍යාපාර කටයුත්තකට ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීමේ අරමුණ ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් කළමනාකරණය ඇතුළත් වන විට, වත්කම් මත උපයාගත් පොළිය සහ වගකීම් සඳහා දැරීමට සිදුවන පොළිය අතර වන ආන්තිකය නිගමනය කිරීමට භාවිතා කළ හැකි අදාළ තොරතුරු ක්‍රම ක්ෂය පිරිවැය මඟින් ලබාදිය හැකිය. කෙසේ වෙතත්, ක්‍රම ක්ෂය පිරිවැය මඟින් ප්‍රයෝජනවත් තොරතුරු සපයනු ඇද්දැයි තක්සේරු කිරීමේදී, මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල ගතිලක්ෂණ සළකා බැලීම ද අවශ්‍ය වේ. මුල් මුදල සහ පොළිය හැර වෙනත් සාධක මත රඳා පවතින මුදල් ප්‍රවාහ පිළිබඳ අදාළ තොරතුරු සැපයීමට ක්‍රම ක්ෂය පිරිවැය මඟින් අපේක්ෂා තබාගත නොහැකිය.

### විශ්වාසනීය නියෝජනය

6.58 වත්කම් සහ වගකීම් යම් ආකාරයකින් සම්බන්ධ වූ විට, එම වත්කම් සහ වගකීම් සඳහා විවිධ මිනුම් පදනම් භාවිතා කිරීම මඟින් මිනුම් අසංගතතාවයක් (ගිණුම්කරණ නොගැලපීම) ඇති විය හැකිය. මූල්‍ය ප්‍රකාශ වල මිනුම් නොගැලපීම් අඩංගු වේ නම්, එම මූල්‍ය ප්‍රකාශ මඟින් අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනයේ සමහර අංග විශ්වාසනීයව නියෝජනය නොවිය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමහර තත්ත්වයන් තුළ, සම්බන්ධිත වත්කම් සහ වගකීම් සඳහා එකම මිනුම් පදනමක් භාවිතා

කිරීම මඟින් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්හට වෙනස් මිනුම් පදනම් භාවිතා කිරීමෙන් ලැබෙන තොරතුරු වලට වඩා ප්‍රයෝජනවත් තොරතුරු ලබාදිය හැකිය. මෙය විශේෂයෙන් එක් වත්කමකින් හෝ වගකීමකින් ලැබෙන මුදල් ප්‍රවාහයන්, වෙනත් වත්කමකින් හෝ වගකීමකින් ගලා එන මුදල් ප්‍රවාහයන් සමග ඍජුව සම්බන්ධ වන විට ඇතිවිය හැකිය.

6.59 2.13 සහ 2.18 යන ඡේදවල සඳහන් කර ඇති පරිදි, පරිපූර්ණ විශ්වාසනීය නියෝජනයන් දෝෂ රහිත වන බව දක්වා තිබුණද, මෙම මිනුම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වශයෙන් නිවැරැදි විය යුතු ලෙසට අදහස් නොකෙරේ.

6.60 සක්‍රීය වෙළඳපළක මිළ ගණන් නිරීක්ෂණය කිරීමෙන් මිනුමක් ඍජුව නිර්ණය කළ නොහැකි විට, ඒ වෙනුවට තක්සේරු කිරීම් කළ යුතු අතර, එහිදී මිනුම් අවිනිශ්චිතතාවයක් පැනනගී. විශේෂිත මිනුම් පදනමක් හා ආශ්‍රිත මිනුම් මට්ටමෙහි අවිනිශ්චිතතාවය, එම මිනුම් පදනම මඟින් අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව සපයනු ලබන තොරතුරු මඟින් විශ්වාසනීය නියෝජනයක් ලබා දෙන්නේ ද යන්න පිළිබඳව බලපානු ලැබේ. ඉහළ මට්ටමේ මිනුම් අවිනිශ්චිතතාවයකින් අදාල තොරතුරු ලබාදෙන මිනුම් පදනමක් භාවිතා කිරීම අවශ්‍යයෙන්ම වළක්වා ගනු නොලැබේ. කෙසේ වෙතත්, සමහර අවස්ථාවල මිනුම් අවිනිශ්චිතතාවයෙහි මට්ටම ඉතා ඉහළ මට්ටමක නම්, එම මිනුම් පදනම මඟින් ලබාදෙන තොරතුරු වලින් ප්‍රමාණවත් තරම් විශ්වාසනීය නියෝජනයක් ලබා නොදේ. (2.22 ඡේදය බලන්න) එවැනි අවස්ථාවන්හි දී, අදාළ තොරතුරු ලැබෙන වෙනත් මිනුම් පදනමක් තෝරාගැනීමට සළකා බැලීම සුදුසු ය.

6.61 මිනුම් අවිනිශ්චිතතාවය, ප්‍රතිඵල අවිනිශ්චිතතාවය සහ පවතින අවිනිශ්චිතතාවය යන දෙකෙන්ම වෙනස්ය:

(අ) වත්කමක් හෝ වගකීමක් මඟින් ඇතිවෙන යම් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම හෝ ගලා යාමක් හෝ වන වටිනාකමේ කාල නිර්ණයේ අවිනිශ්චිතතාවයක් ඇති විට ප්‍රතිඵල අවිනිශ්චිතතාවයක් පැනනගී.

(ආ) වත්කමක් හෝ වගකීමක් තිබේද යන්න පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවිට පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවේ. එම වත්කම හෝ වගකීම පවතීද යන්න අවිනිශ්චිත වන විට වත්කම හෝ වගකීම අස්තිත්ත්වය හඳුනාගන්නේ ද යන්න පිළිබඳව පැවැත්මේ අවිනිශ්චිතතාවය කෙසේ බලපෑ හැකිද යන්න 5.12-5.14 ඡේදවල සාකච්ඡා කෙරේ.

6.62 ප්‍රතිඵලයෙහි අවිනිශ්චිතතාවය හෝ පැවැත්මෙහි අවිනිශ්චිතතාවයේ පෙනුම සමහරවිට මිනුම් අවිනිශ්චිතතාවයට දායක විය හැකිය. කෙසේ වෙතත්, ප්‍රතිඵල අවිනිශ්චිතතාවය හෝ පැවැත්මේ අවිනිශ්චිතතාවය මඟින් අවශ්‍යයෙන්ම මිනුම් අවශ්‍යතාවය ප්‍රතිඵලයක් නොවේ. උදාහරණ වශයෙන්, සක්‍රීය වෙළඳපලක මිල ගණන් නිරීක්ෂණය කිරීමෙන් වත්කමක සාධාරණ අගය ඍජුව නිර්ණය කළ හැකි නම්, වත්කම අවසානයේ කොපමණ මුදල් ප්‍රමාණයක් නිපදවනු ඇත්ද යන්න පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇතිවී, ඒ අනුව ප්‍රතිඵලයෙහි අවිනිශ්චිතතාවයක් තිබුණද, එම සාධාරණ අගයෙහි මිනුම පිළිබඳ ආශ්‍රිත මිනුම් අවිනිශ්චිතතාවයක් ඇතුලත් නොවේ.

**ගුණාත්මක ගතිලක්ෂණ වැඩි දියුණු කිරීම සහ පිරිවැය සීමාකිරීම**

6.63 මිනුම් පදනමක් තෝරා ගැනීම සඳහා ගුණාත්මක ගතිලක්ෂණ වන සංසන්දනය කිරීම, අවබෝධ කර ගැනීම සහ පිරිවැය සීමා කිරීම වැනිදෑ වල සම්බන්ධයන් ඇත. එම සම්බන්ධයන් පිළිබඳව පහත දැක්වෙන ඡේදවල සාකච්ඡා කෙරේ. 6.69 – 6.76 ඡේද වලින් විශේෂයෙන් නිශ්චිත මිනුම් පදනම ව්‍යවහාර කිරීම පිළිබඳව තවදුරටත් සාකච්ඡා කෙරේ. කාලානුරූපතාවයෙහි ගුණාත්මකභාවයේ ගතිලක්ෂණයන් ඉහළ නැංවීම මිනුම් සඳහා නිශ්චිත සම්බන්ධයන් නොමැත.

6.64 පිරිවැය සීමා කිරීම් සීමා කිරීම් මෙන්ම වෙනත් මූල්‍ය වාර්තාකරණ තීරණ ද ඒ හා සමානව, මිනුම් පදනම් තෝරාගැනීමේදී ද සීමා කිරීම් සිදු කරයි. එබැවින්, මිනුම් පදනමක් තෝරා ගැනීමේදී එම මිනුම් පදනම මඟින් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට ලබාදෙන තොරතුරුවල ප්‍රතිලාභ, එම තොරතුරු ලබාදීමේ සහ භාවිතා කිරීමේ පිරිවැය සමග සාධාරණීකරණය කිරීමට හැකි ද යන්න සළකා බැලිය යුතුය.

6.65 වාර්තාකරණ අස්තිත්ත්වයක් තුළ එක්කෝ කාල පරිච්ඡේදයක සිට කාලපරිච්ඡේදයක් දක්වා හෝ අස්තිත්ත්වයන් හරහා එක් කාලපරිච්ඡේදයක් තුළ එකම අයිතම සඳහා එකම මිනුම් පදනමක් සංගතව භාවිතා කිරීම මූල්‍ය ප්‍රකාශ වඩාත් සැසඳිය හැකි ලෙස පිළිබිඹු කිරීමට උපකාරී වේ.

6.66 මිනුම් පදනමේ වෙනසකින් මුල්‍ය ප්‍රකාශ පිළිබඳව ලබාගත හැකි අවබෝධය අඩු විය හැකිය. කෙසේවෙතත්, අවබෝධ කරගැනීමේ හැකියාව අඩු වීමට වඩා වෙනත් සාධක ඉක්මවා ගියහොත්, එම

වෙනස් කිරීම සාධාරණීකරණය කළ හැකිය. උදාහරණ වශයෙන්, වෙනස වඩාත් අදාළ තොරතුරු වලට හේතුවේ නම්, වෙනසක් සිදු කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට එම වෙනසෙහි බලපෑම අවබෝධ කරගැනීමට හැකි වන පරිදි පැහැදිලි කිරීමේ තොරතුරු අවශ්‍ය විය හැකිය.

6.67 අවබෝධ කර ගැනීම අර්ධ වශයෙන් රඳා පවත්නේ, වෙනස් මිනුම් පදනම් කොපමණ ප්‍රමාණයක් භාවිතා කරන්නේද යන්න සහ කාලයත් සමඟ ඒවා වෙනස් වන්නේ ද යන්න මතය. පොදුවේ ගත් කල, මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් සඳහා බොහෝ මිනුම් පදනම් භාවිතා කරන්නේ නම්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන තොරතුරු වඩාත් සංකීර්ණ වන අතර, සහ එබැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එකතුන් හෝ උප එකතුන් අවබෝධ කරගැනීමේ හැකියාව අඩුවීම සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ(ය) හි තොරතුරු අඩුවේ. කෙසේවෙතත්, ප්‍රයෝජනවත් තොරතුරු ලබාදීමට අවශ්‍ය නම්, මිනුම් පදනම් ගණනාවක් භාවිතා කිරීම සුදුසුය.

6.68 ස්වාධීනව තහවුරු කළ හැකි පියවර මඟින් ප්‍රතිඵලයක් වන මිනුම් පදනම් භාවිතා කිරීම මඟින් සත්‍යාපනය කිරීම ඉහළ නැංවිය හැකිය. උදාහරණයක් වශයෙන්, මිළ ගණන් නිරීක්ෂණය කිරීමෙන් හෝ එක්කෝ ඍජුව හෝ වක්‍රව, උදාහරණයක් ලෙස, ආකෘතියකට යෙදවුම් පරීක්ෂා කිරීමෙන්. මිනුමක් සත්‍යාපනය කළ නොහැකි නම්, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට මිනුම නිර්ණය කළ ආකාරය ඔවුන්ට අවබෝධ කරගැනීම පිණිස පැහැදිලි කිරීමේ තොරතුරු අවශ්‍ය විය හැකිය. එවැනි සමහර අවස්ථාවලදී වෙනස් මිනුම් පදනමක් භාවිතා කිරීම පිළිබඳව පැහැදිලිව සඳහන් කිරීම අවශ්‍ය විය හැකිය.

**ඓතිහාසික පිරිවැය**

6.69 බොහෝ අවස්ථාවන්හිදී, වර්තමාන අගය මැනීමට වඩා ඓතිහාසික පිරිවැය මැනීම සරල නිසා පිරිවැය අඩු වෙයි. ඊට අමතරව, ඓතිහාසික පිරිවැය පදනම ව්‍යවහාර වන මිනුම් පදනම නිර්ණය කරන පියවර සාමාන්‍යයෙන් අවබෝධ කරගත හැකි සහ බොහෝ අවස්ථාවල සත්‍යාපනය කළ හැකිය.

6.70 කෙසේ වෙතත්, පාරිභෝජනය ඇස්තමේන්තු කිරීම සහ හානිකරණ පාඩුව හඳුනාගැනීම හා මැනීම හෝ භාරදූර වගකීම් පුද්ගල නිශ්‍රිත විය හැකිය. එබැවින්, වත්කමක හෝ වගකීමක ඓතිහාසික පිරිවැය මැනීම හෝ සත්‍යාපනය කිරීම සමහරවිට වර්තමාන අගය මැනීමට හෝ සත්‍යාපනය කිරීමට වඩා අපහසු විය හැකිය.

6.71 ඓතිහාසික මිනුම් පදනමක් භාවිතා කරමින් වෙනස් කාලයන්හිදී අත්පත් කරගත් සර්ව සම වත්කම් හෝ දරන ලද වගකීම් මූල්‍ය ප්‍රකාශ වල, වෙනස් වටිනාකම් වලින් වාර්තා කළ හැකිය. වාර්තාකරණ අස්තිත්ත්වයෙහි කාලපරිච්ඡේදයක සිට තවත් කාලපරිච්ඡේදයක් දක්වා සහ අස්තිත්ත්ව අතර එක් කාල පරිච්ඡේදයක් තුළ යන දෙකෙහිම සැසඳිය හැකි බව අඩු කිරීමට මෙමගින් පුළුවනි.

**වර්තමාන අගය**

6.72 සාධාරණ අගය, නිර්ණය කරන්නේ අස්තිත්ත්වයේ – නිශ්චිත සාපේක්ෂ වැදගත්කමේ අපේක්ෂාවෙන් නොව වෙළඳපල සහභාගි වන්නන්ගේ සාපේක්ෂ වැදගත්කමේ අපේක්ෂාවෙන් සහ වත්කම අත්කර ගැනීම හෝ වගකීම දැරීම සිදුවන අවස්ථාවේදී එය ස්වාධීනව සිදුවන නිසා, සාධාරණ අගයට මනිනු ලබන සර්ව සම වත්කම් හෝ වගකීම් ප්‍රතිපත්තියක් ලෙස, වෙනස් නොවූ වෙළඳපළට ප්‍රවේශයක් ඇති අස්තිත්ත්ව විසින් මනිනුයේ වෙනස් නොවූ වටිනාකමකටය. මෙමගින් වාර්තාකරණ අස්තිත්ත්වයෙහි කාලපරිච්ඡේදයක සිට කාලපරිච්ඡේදයක් දක්වා සහ අස්තිත්ත්ව හරහා තනි කාල පරිච්ඡේදයක් තුළ යන දෙකෙහිදීම සැසඳිය හැකි බව වැඩිදියුණු කළහැකිය. මෙයට ප්‍රතිවිරුද්ධව ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය අස්තිත්ත්ව - නිශ්චිත සාපේක්ෂ වැදගත්කමේ අපේක්ෂා පිළිබිඹු වන නිසා, එම මිනුම් වෙනස් අස්තිත්ත්වයන්හි සර්ව සම වත්කම් හා වගකීම් සඳහා වෙනස් විය හැකිය. විශේෂයෙන් වත්කම් හෝ වගකීම් ඒ හා සමාන ආකාරයෙන්ම මුදල් ප්‍රවාහයට දායක වන්නේ නම්, එම වෙනස්කම් මඟින් සැසඳිය හැකි බව අඩු කළ හැකිය.

6.73 සක්‍රිය වෙළඳපළක මිළ ගණන් නිරීක්ෂණය කරමින් වත්කමක හෝ වගකීමක සාධාරණ අගය ඍජුව නිර්ණය කළ හැකිනම්, සාධාරණ අගය මැනීමේ ක්‍රියාවලිය අඩු පිරිවැයකින් යුක්තවීම, සරල සහ අවබෝධ කරගැනීමට පහසු; සහ ඍජු නිරීක්ෂණ මඟින් සාධාරණ අගය සත්‍යාපනය කළ හැකිය.

6.74 තක්සේරු කිරීමේ ශිල්පක්‍රම, සමහර අවස්ථා වලදී මුදල් ප්‍රවාහ පදනම් භාවිත කරගත් මැනුම් ශිල්පීය ක්‍රම ඇතුලත්ව, සක්‍රිය වෙළඳපලෙහි ඍජුව නිරීක්ෂණය කළ නොහැකිවිට, සාධාරණ අගය තක්සේරු කිරීමට අවශ්‍ය විය හැකිය. ප්‍රයෝජ්‍ය අගය සහ ඉටුකිරීමේ අගය නිර්ණය කරන විට සාමාන්‍යයෙන් අවශ්‍ය වේ. භාවිතා කරනු ලබන ශිල්පීය ක්‍රම මත පදනම්ව:

(අ) තක්සේරු කිරීම සඳහා යෙදවුම් ඇස්තමේන්තු කිරීම සහ තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම ව්‍යවහාර කිරීම මිල අධික සහ සංකීර්ණ විය හැකිය.

(ආ) ක්‍රියාවලිය සඳහා වන යෙදවුම් පුද්ගල නිශ්‍රිතවීම සහ යෙදවුම් සහ ක්‍රියාවලියෙහිම වලංගුභාවය යන දෙකම සත්‍යාපනය කිරීම දුෂ්කර විය හැකිය. ඒ නිසාවෙන්, සර්ව සම වත්කම් වල හෝ වගකීම් වල මිනුම වෙනස් විය හැකිය. එයින් සැසඳීමේ හැකියාව අඩු වනු ඇත.

6.75 බොහෝ අවස්ථාවලදී, වෙනත් වත්කම් සමඟ සංයෝජිතව භාවිතා කරන ලද තනි වත්කමක් සඳහා ප්‍රයෝජ්‍ය අගය අර්ථවත් ලෙස නිර්ණය කළ නොහැක. ඒ වෙනුවට, වත්කම් සමූහයක් සඳහා ප්‍රයෝජ්‍ය අගය නිර්ණය කරන අතර, එම ප්‍රතිඵලය තනි වත්කම් සඳහා වෙන් කිරීමට අවශ්‍ය විය හැකිය. මෙම ක්‍රියාවලිය පුද්ගල නිශ්‍රිත සහ පදනම් රහිත විය හැකිය. ඊට අමතරව, වත්කමක් සඳහා ප්‍රයෝජ්‍ය අගය පිළිබඳ ඇස්තමේන්තු, සමූහයේ වෙනත් වත්කම් සමඟ සහසම්බන්ධතාවයේ බලපෑම අතපසුවීමකින් පිළිබිඹු විය හැකිය. එබැවින්, වෙනත් වත්කම් සමග සංයෝජිතව භාවිතා කරන වත්කමක ප්‍රයෝජ්‍ය අගය නිර්ණය කිරීම පිරිවැය අධික ක්‍රියාවලියක් වීම සහ එහි සංකීර්ණත්වය සහ පුද්ගල නිශ්‍රිත බව සත්‍යාපනය අඩු කිරීමද සිදුවේ. මෙම හේතු නිසා ක්‍රමානුකූලව යළි නැවත මිනුම් කරනු ලබන එවැනි වත්කම් සඳහා ප්‍රයෝජ්‍ය අගය ප්‍රායෝගික මිනුම් පදනමක් නොවිය හැකිය. කෙසේ වෙතත්, ඉඳහිට සිදුවන වත්කම් යළි මිනුම්කරණය සඳහා එය ප්‍රයෝජනවත් විය හැකිය, උදාහරණයක් ලෙස, හානිකරණය පිළිබඳ පරීක්ෂණයකින් ඓතිහාසික පිරිවැය සම්පූර්ණයෙන්ම අයකරගත හැකිද යන්න නිර්ණය කිරීම සඳහා මෙය භාවිතා කිරීම ගත හැකිය.

6.76 වර්තමාන පිරිවැය මිනුම් පදනමක් භාවිතා කරමින් වෙනස් වේලාවන්හිදී අත්පත් කරගත් සර්ව සම වත්කම් හෝ දරන ලද වගකීම් මූල්‍ය ප්‍රකාශ වල වෙනස් නොවූ වටිනාකමකින් වාර්තාවේ. මෙයින් වාර්තා කරන අසතිත්ත්වයෙහි එක් කාලපරිච්ඡේදයක සිට කාලපරිච්ඡේදයක් දක්වා සහ අස්තිත්ත්ව අතර එක් කාල පරිච්ඡේදයක් සඳහා යන දෙකෙහිදීම සැසඳීමේ වැඩිදියුණු වීමක් සිදුවේ. කෙසේ වෙතත්, වර්තමාන පිරිවැය නිර්ණය කිරීම සංකීර්ණ, පුද්ගල නිශ්‍රිත නම් පිරිවැය අධික විය හැකිය. උදාහරණයක් ලෙස, 6.22 ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි, වත්කමක වර්තමාන පිරිවැය තක්සේරු කිරීමට නව වත්කමක වර්තමාන මිල ගැලපීම් කරමින් අස්තිත්ත්වය සතු වත්කමක වර්තමාන වයස සහ තත්ත්වය පිළිබිඹු වන පරිදි තක්සේරු කිරීම අවශ්‍ය විය හැකිය. ඊට අමතරව, තාක්ෂණයේ වෙනස්වීම් සහ ව්‍යාපාර පරිචයන්ගේ වෙනස්වීම් නිසා, බොහෝ වත්කම් සර්ව සම වත්කම් සමග ප්‍රතිසම්පාදනය නොවේ. ඒ අනුව, පවත්නා වත්කමට සමාන වත්කමක වර්තමාන පිරිවැය තක්සේරු කිරීමට හැකිවනු පිණිස නව වත්කමක වර්තමාන මිලට තවත් විෂය නිශ්‍රිත ගැලපීමක් කිරීම අවශ්‍ය කෙරේ. එසේම, පරිභෝජනයේ වර්තමාන පිරිවැය සහ මිල වෙනස් වීමේ බලපෑම අතර ඇති වත්මන් පිරිවැයෙහි ධාරණ අගයෙහි වෙනස්වීම් බෙදීම (6.42 ඡේදය බලන්න) සංකීර්ණ විය හැකි අතර, පදනම් රහිත උපකල්පන අවශ්‍ය විය හැකිය. මෙම දුෂ්කරතා නිසා වර්තමාන පිරිවැය මිනුම් වල සත්‍යාපන හැකියාව සහ තේරුම් ගැනීමේ හැකියාව නොමැති විය හැකිය.

**මූලික මිනුම් සඳහා නිශ්චිත සාධක**

6.77 මූලික හඳුනාගැනීම සඳහා හෝ පසුව මැනීම සඳහා හෝ වේවා වන මිනුම් පදනමක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු කරුණු 6.43 – 6.76 ඡේදවල සාකච්ඡා කෙරේ. මූලික හඳුනාගැනීමේදී සළකා බැලිය යුතු අමතර සාධක කීපයක් 6.78 – 6.82 ඡේදවල සාකච්ඡා කරයි.

6.78 මූලික හඳුනා ගැනීමේදී, අත් කරගත් වත්කමක පිරිවැය, හෝ දරනු ලැබූ වගකීමක් වෙළඳපල කොන්දේසි මත සිදුවන ගනුදෙනුවක් මත වන ප්‍රතිඵලයක් ලෙස ගණුදෙනු පිරිවැය සැලකිය යුතු නොවේ නම්, සාමාන්‍යයෙන් ගනුදෙනු පිරිවැය, එම දිනයේ එහි සාධාරණ අගයට සමාන වේ. එසේ වුවද, එම වටිනාකම් දෙක එක සමාන වුවත්, මූලික හඳුනා ගැනීමේදී කුමන මිනුම් පදනම භාවිතා කළේද යන්න විස්තර කිරීම අවශ්‍ය වේ. ඓතිහාසික පිරිවැය පසුව භාවිතා කරන්නේ නම් එම මිනුම් පදනමද සාමාන්‍යයෙන් මූලික හඳුනා ගැනීමේදී සුදුසු වේ. ඒ හා සමානව වර්තමාන අගයක් පසුව භාවිතා කරන්නේ නම්, සාමාන්‍යයෙන් එය ද මූලික දී ම හඳුනා ගැනීමේදී සුදුසු වේ. මූලික හඳුනා ගැනීමේදී සහ පසුව මැනීම සඳහා එකම මිනුම් පදනමක් භාවිතා කිරීමෙන් පසුව මැනීම සිදු කරන පළමු අවස්ථාවේදී ආදායම් හෝ වියදම් හඳුනාගැනීම තනිකරම වළක්වනුයේ මිනුම් පදනමෙහි වන වෙනසක් නිසාය. (6.48 ඡේදය බලන්න).

6.79 වෙළඳපල කොන්දේසි මත සිදුවන ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස වෙනත් වත්කමක් හෝ වගකීමක් පැවරීමට හුවමාරුවක් ලෙස යම් අස්තිත්වයක් වත්කමක් අත්පත් කර ගැනීමේදී හෝ වගකීමක් දැරීමේදී, අත් කරගත් වත්කමෙහි හෝ දරනු ලබන වගකීමෙහි මූලික මිනුම, එම ගනුදෙනුව මඟින් කිසියම් ආදායමක් හෝ වියදමක් පැන නගින්නේ ද යන්න නිර්ණය කරයි. වත්කමක් හෝ වගකීමක් පිරිවැයට මනිනු ලබන විට, පවරන ලද වත්කම් හෝ වගකීම් ප්‍රති හඳුනාගැනීම තුළින් ආදායම් හෝ වියදම්

පැනනගින්නේ නැත්නම්, හෝ වත්කම හානිකරණය වීම හෝ වගකීම භාර දූර නොවන්නේ නම්, මූලික හඳුනාගැනීමේදී ආදායමක් හෝ වියදම් කිසිවක් පැන නොනඟී.

6.80 වෙළඳපල කොන්දේසි මත සිදු නොවන ගනුදෙනුවක ප්‍රතිඵලයක් වන සිද්ධියකදී වත්කම් අත් කර ගැනීම, හෝ වගකීම් දැරීම සිදුවිය හැකිය. උදාහරණ වශයෙන්:

(අ) ගනුදෙනුවෙහි මිළට පාර්ශවයන් අතර ඇති සබඳතා, හෝ එක් පාර්ශවයක මූල්‍ය දුෂ්කරතා හෝ වෙනත් අයුතු බලපෑම් බලපානු ඇත;

(ආ) වත්කමක්, රජයක් විසින් අස්තිත්ත්වයට නොමිලේ ප්‍රදානය කිරීම හෝ වෙනත් පාර්ශවයක් විසින් අස්තිත්ත්වයට පරිත්‍යාග කිරීම විය හැකිය;

(ඇ) නීති සම්පාදනය හෝ නියාමනය මඟින් වගකීමක් පැනවිය හැකිය; හෝ

(ඈ) වැරදි ක්‍රියාවක් නිසා වන්දි ගෙවීමේ වගකීමක් හෝ දඩුවමක් පැනවිය හැකිය.

6.81 එවැනි අවස්ථාවන්හිදී, අත් කරගත් වත්කම හෝ දැරූ වගකීම එහි ඓතිහාසික පිරිවැය මඟින් මැනීමෙන්, අස්තිත්ත්වයෙහි වත්කම් හා වගකීම් සහ ගනුදෙනුවෙන් හෝ වෙනත් සිදුවීමකින් පැනනගින කිසිදු ආදායමක් පිළිබඳව විශ්වාසනීය නියෝජනයක් ලබා නොදිය හැක. එබැවින් 6.6 ඡේදයේ විස්තර කර ඇති පරිදි, අත් කරගත් වත්කම් හෝ දරන ලද වගකීම් සළකනු ලබන පිරිවැයට මැනීම සුදුසු විය හැකිය. එම සළකනු ලබන පිරිවැය සහ ලබාදුන් හෝ ලැබූ ප්‍රතිෂ්ඨාව අතර වෙනසක් තිබේනම්, මූලික හඳුනා ගැනීමේ දී එය ආදායමක් හෝ වියදමක් ලෙසට හඳුනා ගනු ඇත.

6.82 වෙළඳපල කොන්දේසි මත නොවන ගනුදෙනුවක සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වත්කම් අත්පත් කරගත් විට හෝ වගකීම් දැරූ විට, ගනුදෙනුවේ හෝ වෙනත් සිදුවීමෙහි අදාළ සියළු අංග හඳුනා ගෙන සළකා බැලීම අවශ්‍ය කෙරේ. උදාහරණයක් ලෙස, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය මත යම් සම්බන්ධිත බලපෑම සහ අස්තිත්තවයේ මූල්‍ය තත්ත්වය (4.59 – 4.62 ඡේද බලන්න) මත වෙනත් සිද්ධි හෝ ගනුදෙනුවේ බලපෑමේ හරය හෝ විශ්වාසනීයව නියෝජනය වීමට ස්කන්ධ හිමිකම් පාන දරන්නන්ට කල වගකීම් හඳුනා ගැනීම අවශ්‍ය විය හැකිය.

**එකකට වඩා වැඩි මිනුම් පදනම්**

6.83 සමහර විට 6.43 – 6.76 ඡේදවල විස්තර කර ඇති සාධක සළකා බැලීමේදී, අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය සහ එහි මූල්‍ය කාර්ය සාධනය යන දෙකම මඟින් විශ්වාසනීය නියෝජනය වන බව හැකිවීමට සම්බන්ධිත තොරතුරු ලබාදීමට වත්කමක් හෝ වගකීමක් සඳහා සම්බන්ධ ආදායම් සහ වියදම් සඳහා එක් මිනුම් පදනමකට වඩා අවශ්‍ය බව නිගමනය කිරීමට යොමුවිය හැකිය.

6.84 බොහෝ අවස්ථාවන්හිදී, එම තොරතුරු සැපයීමට වඩාත්ම තේරුම්ගත හැකි ක්‍රමය වන්නේ:

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වන වත්කම් සහ වගකීම් සඳහා සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ(ය)හි වන සම්බන්ධිත ආදායම් සහ වියදම් සඳහා යන දෙකෙහිම තනි මිනුම් පදනමක් භාවිතා කිරීම; සහ

(ආ) වෙනස් මිනුම් පදනමක් ව්‍යවහාර කිරීමේදී අමතර තොරතුරු සටහන් මඟින් ලබාදීම.

6.85 කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී පහත දේ භාවිතය මඟින් එම තොරතුරු වඩාත් අදාළ වීම, හෝ අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය සහ එහි මූල්‍ය කාර්ය සාධනය යන දෙකෙහිම වඩා විශ්වාසනීය නියෝජනයක් ප්‍රතිඵලයක් වශයෙන් හටගනී:

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඇති වත්කම් හෝ වගකීම් සඳහා වර්තමාන අගය මිනුම් පදනම; සහ

(ආ) ලාභාලාභ ප්‍රකාශයෙහි ඇති සම්බන්ධිත ආදායම් සහ වියදම් සඳහා වෙනස් මිනුම් පදනමක්[10] (7.17 – 7.18 ඡේද බලන්න).

එම මිනුම් පදනම් තෝරාගැනීමේදී, 6.43 – 6.76 ඡේදවල සාකච්ඡා කළ සාධක සළකා බැලීම අවශ්‍ය වේ.

---

[10] මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සමන්විත විය යුත්තේ තනි ප්‍රකාශයකින්ද හෝ ප්‍රකාශ දෙකකින්ද යන්න පිළිබඳව *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* "ලාභ හෝ අලාභ ප්‍රකාශය" යන යෙදුමෙන් සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ඇති වෙන්වූ කොටසක භාවිතාවේ.

6.86 එවැනි අවස්ථාවන්හිදී වත්කම් වල හෝ වගකීම් වල වර්තමාන අගය වෙනස් වීම මත කාල පරිච්ඡේදය තුළ පැන නැගුනු මුළු ආදායම හෝ මුළු වියදම වෙන්කොට වර්ගීකරණය කර ඇත. (7.14 - 7.19 ඡේද බලන්න) එබැවින්, ඒ සඳහා:

(අ) ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයට එම ප්‍රකාශය සඳහා තෝරාගත් මිනුම් පදනම ව්‍යවහාර කරමින් මනින ලද ආදායම් හෝ වියදම් ඇතුළත් වේ; සහ

(ආ) අනෙකුත් විස්තීර්ණ ආදායමට ඉතිරිව ඇති සියලුම ආදායම් හෝ වියදම් ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම වත්කම හෝ වගකීම සම්බන්ධිත සමුච්චිත වෙනත් විස්තීර්ණ ආදායම පහත (i) සහ (ii) අතර වෙනසට සමානවේ:

(i) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් හෝ වගකීම් වල ධාරණ අගය; සහ

(ii) ලාභාලාභ ප්‍රකාශය සඳහා තෝරාගත් මිනුම් පදනම ව්‍යවහාර කරගනිමින් නිර්ණය කළ යුතුව තිබූ ධාරණ අගය.

## ස්කන්ධය මැනීම

6.87 ස්කන්ධයේ ප්‍රමාණයෙහි (මුළු ස්කන්ධය) මුළු ධාරණ අගය සෘජුව මනිනු නොලැබේ. එය හඳුනාගත් සියලුම වත්කම් වල මුළු ධාරණ අගයෙන්, හඳුනාගත් සියලු වගකීම් වල මුළු ධාරණ අගය අඩු කළ විට ලැබෙන අගයට සමාන වේ.

6.88 අස්තිත්ත්වයෙහි අගය පෙන්වීමට පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශ සැලසුම් කර නොමැති හෙයින්, ස්කන්ධයෙහි මුළු ධාරණ වටිනාකම සාමාන්‍යයෙන් පහත දෑට සමාන නොවේ:

(අ) අස්තිත්ත්වයෙහි ස්කන්ධ හිමිකම්පෑම් වල සමහර වෙළඳපල අගය;

(ආ) සමස්තයක් ලෙස අඛන්ඩ පැවැත්මේ පදනමින් අස්තිත්ත්වය විකිණීමෙන් රැස්කර ගත හැකි වටිනාකම; හෝ

(ඇ) අස්තිත්ත්වයෙහි සියළුම වත්කම් විකුණා සහ එහි සියළුම වගකීම් පියවා දැමීම මඟින් රැස් කරගත හැකි වටිනාකම.

6.89 සම්පූර්ණ ස්කන්ධය සෘජුව මනින්නේ නැති වුවද, සමහර තනි පන්තිවල ස්කන්ධයේ (4.65 ඡේදය බලන්න) සහ ස්කන්ධයේ සමහර සංරචකවල (4.66 ඡේදය බලන්න) ධාරණ අගය සෘජුව මැනීම සුදුසු විය හැකිය. එසේ වුවද, අවශේෂ අගය ලෙස සම්පූර්ණ ස්කන්ධය මනිනු ලැබීම නිසා අවම වශයෙන් එක් පන්තියක ස්කන්ධය සෘජුව මැනිය නොහැක. ඒ හා සමානව, අවම වශයෙන් ස්කන්ධයෙහි එක් සංරචකයක් වත් සෘජුව මැනිය නොහැක.

6.90 තනි ස්කන්ධ පන්තියක හෝ ස්කන්ධ සංරචකයන්හි මුළු ධාරණ මුදල සාමාන්‍යයෙන් ධන වන නමුත්, සමහර තත්ත්වයන් තුළ සෘණ විය හැකිය. ඒ හා සමානව මුළු ස්කන්ධයම සාමාන්‍යයෙන් ධන වන නමුත්, කුමන වත්කම් හා වගකීම් හඳුනාගෙන තිබේද සහ ඒවා මනින ආකාරය මත එය සෘණ විය හැකිය.

## මුදල් ප්‍රවාහය පදනම්කරගත් මිනුම් ශිල්පක්‍රම

6.91 සමහර අවස්ථාවලදී මිනුමක් සෘජුව නිරීක්ෂණය කළ නොහැක. එවැනි සමහර අවස්ථාවල මිනුම ඇස්තමේන්තු කිරීමේ එක් ක්‍රමයක් වන්නේ මුදල් ප්‍රවාහ පදනම් කරගත් මිනුම් ශිල්ප ක්‍රම භාවිත කිරීමයි. එවැනි ශිල්ප ක්‍රම මිනුම් පදනම් නොවේ. ඒවා මිනුම් පදනමක් ව්‍යවහාර කිරීම සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රම වේ. එබැවින්, එවැනි ශිල්ප ක්‍රමයක් භාවිතා කිරීමේදී කුමන මිණුම් පදනමක් භාවිතා කරන්නේද යන්න සහ එම ශිල්පීය ක්‍රමය මඟින් මිනුම් පදනමට අදාළ සාධක පිළිබිඹු වන ප්‍රමාණය පිළිබඳව හඳුනාගැනීම අවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන්, මිනුම් පදනම වන්නේ සාධාරණ අගය නම් 6.14 ඡේදයෙහි විස්තර කර ඇති දෑ ව්‍යවහාර කළයුතු සාධකවේ.

6.92 විකරණය කරන ලද මිනුම් පදනමක් ව්‍යවහාර කිරීමේදී මුදල් ප්‍රවාහ පදනම් කරගත් මිනුම් ශිල්ප ක්‍රම භාවිතා කළ හැකිය. උදාහරණ වශයෙන්, දැක්විය හැක්කේ අස්තිත්ත්වයක් වගකීමක් (ස්වකීය ණය අවදානම) ඉටු කිරීමට අපොහොසත් විය හැකි බවේ බලපෑම ඉවත් කිරීමට ඉටු කිරීමේ වටිනාකම විකරණය කිරීම දැක්විය හැකිය. සමහරවිට මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්ට වඩාත් අදාළ තොරතුරු ලැබීම හෝ එය අඩු පිරිවැයකින් සකස් කරගත හැකිවීම හෝ තේරුම්ගත හැකිවීම ප්‍රතිඵලයක් විය හැකිය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්ට විකරණය කරන ලද මිනුම් පදනම් තේරුම් ගැනීම වඩාත් අපහසු විය හැකිය.

6.93 ප්‍රතිඵලයේ අවිනිශ්චිතතාවය (6.61 (අ) ඡේදය බලන්න) පැන නගින්නේ අනාගත මුදල් ප්‍රවාහයන්හි වටිනාකම පිළිබඳව හෝ කාල නිර්ණය පිළිබඳ අවිනිශ්චිතතාවයන් අනුවය. එම අවිනිශ්චිතතාවයන් වත්කම් හා වගකීම් වල වැදගත් ගතිලක්ෂණයන් වේ. වත්කමක් හෝ වගකීමක් අවිනිශ්චිත අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ යොමු වූ ඇස්තමේන්තු අනුව මැනීමේදී සළකා බැලිය යුතු එක් සාධකයක් වන්නේ එම මුදල් ප්‍රවාහයන්හි ඇස්තමේන්තුගත වටිනාකම හෝ කාල නිර්ණය ඇතිවිය හැකි විචලනවේ. (6.14 (ආ) ඡේදය බලන්න) එම විචලන සළකා බලනුයේ සිදුවිය හැකි මුදල් ප්‍රවාහ පරාසය තුළ ඇති තනි වටිනාකමක් තෝරා ගැනීමෙනි. සමහරවිට තෝරාගත් වටිනාකමම සිදුවිය හැකි ප්‍රතිඵලයෙහි වටිනාකම විය හැකි නමුත්, සෑම විටම එසේ නොවේ. වඩාත්ම අදාල තොරතුරු ලබා දෙන වටිනාකම සාමාන්‍යයෙන් පරාසයෙහි මධ්‍ය කොටස ඇතුලත ලබා දෙයි. (මධ්‍ය ඇස්තමේන්තුවක්) විවිධ මධ්‍ය ඇස්තමේන්තු මඟින් විවිධ තොරතුරු ලබා දේ, උදාහරණ වශයෙන්:

(අ) අපේක්ෂිත අගය (සම්භාවිතාවය --- බර තැබූ සාමාන්‍ය සංඛ්‍යාන මධ්‍යන්‍යය ලෙසද හඳුන්වන) මඟින් ප්‍රතිඵලවල සමස්ත පරාසය පිළිබිඹු වන අතර, එය බොහෝදුරට වියහැකි ප්‍රතිඵල සඳහා වැඩි බරක් ලබාදේ. අපේක්ෂිත අගය මඟින් එම වත්කමින් හෝ වගකීමෙන් අවසානයට පැනනගින මුදල් ගලා ඒම හෝ ගලා යාම හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව පුරෝකථන කිරීම අදහස් නොකෙරේ.

(ආ) සිදුනොවීමට වඩාත් වැඩි විය හැකි උපරිම වටිනාකම (සංඛ්‍යාන මධ්‍යස්ථය හා සමාන) පසුකාලීන අලාභයක සම්භාවිතාවය 50% ට වඩා වැඩි නොවන සහ පසුකාලීන ලාභයක සම්භාවිතාවය 50% ට වඩා වැඩි නොවන බව ඇඟවීම් කරයි.

(ඇ) වඩාත් වැඩි විය හැකි ප්‍රතිඵලය (සංඛ්‍යාන මාතය) වන්නේ වත්කමකින් හෝ වගකීමකින් පැනනගින තනි වඩාත් විය හැකි අවසාන ගලා ඒම හෝ ගලා යාමය.

6.94 මධ්‍ය ඇස්තමේන්තුවක් රඳා පවතින්නේ, අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ ඇස්තමේන්තු සහ ඒවායෙහි වටිනාකම් සහ කාල නිර්ණයන්හි ඇතිවිය හැකි විචලන මතය. එමඟින් මධ්‍ය ඇස්තමේන්තුවෙන් අවසාන ප්‍රතිඵලයේ අවිනිශ්චිතතාවය දරා ගැනීම සඳහා මිළ ග්‍රහණය කිරීමක් සිදු නොවේ. (එනම්, 6.14 (ඇ)ඡේදයේ විස්තර කර ඇති සාධකය).

6.95 කිසිදු මධ්‍ය තක්සේරුවකින් ඇතිවිය හැකි ප්‍රතිඵල වල පරාසය පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා නොදේ. එබැවින්, පරිශීලකයන්හට විය හැකි ප්‍රතිඵලවල පරාසය පිළිබඳ තොරතුරු අවශ්‍ය විය හැකිය.

## 7 වන පරිච්ඡේදය - ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම


| | *ඡේදය* |
|---|---|
| **සන්නිවේදන මෙවලම් ලෙස ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම** | **7.1** |
| **ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ පරමාර්ථ සහ මූලධර්ම** | **7.4** |
| **වර්ගීකරණය** | **7.7** |
| **වත්කම් හා වගකීම් වල වර්ගීකරණය** | **7.9** |
| හිලව් කිරීම | 7.10 |
| **ස්කන්ධය වර්ගීකරණය** | **7.12** |
| **ආදායම් හා වියදම් වර්ගීකරණය** | **7.14** |
| ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් | 7.15 |
| **සමාහරණය** | **7.20** |


### සන්නිවේදන මෙවලම් ලෙස ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම

7.1 වාර්තා කරන අස්තිත්ත්වය විසින් එහි වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් පිළිබඳව එහි මූල්‍ය ප්‍රකාශ වල තොරතුරු ඉදිරිපත් කිරීමෙන් සහ හෙළිදරව් කිරීමෙන් තොරතුරු සන්නිවේදනය කරයි.

7.2 මූල්‍ය ප්‍රකාශ වල තොරතුරු සඵලදායී ලෙස සන්නිවේදනය කිරීමෙන් එම තොරතුරු වඩාත් අදාළ බවට පත් කෙරෙන අතර අස්තිත්වයෙහි වත්කම්, වගකීම්, ස්කන්ධය ආදායම් හා වියදම් වල විශ්වාසනීය නියෝජනයක් සඳහා දායක වේ. එයින් මූල්‍ය ප්‍රකාශවල තොරතුරු අවබෝධ කර ගැනීමේ හැකියාව සහ

සංසන්දනාත්මක භාවය ඉහළ නංවයි. මූල්‍ය ප්‍රකාශ වල ඇති තොරතුරු සඵලදායි ලෙස සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන්නේ:

(අ) රීති කෙරෙහි අවධානය යොමු කිරීමට වඩා ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අරමුණු සහ මූලධර්ම කෙරෙහි අවධානය යොමු කිරීම;

(ආ) සමාන අයිතම, අසමාන අයිතම වලින් වෙන්කර කාණ්ඩ කරන ආකාරයට තොරතුරු වර්ගීකරණය කිරීම; සහ

(ඇ) අනවශ්‍ය විස්තර හෝ අධික ලෙස සමාහරණය කිරීම මඟින් අපැහැදිලි නොවන ආකාරයට තොරතුරු සමාහරණය කිරීම.

7.3 වෙනත් මූල්‍ය වාර්තාකරණ තීරණවලට පිරිවැය බාධා කරනවා සේම, ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ තීරණවලට ද එය බාධා කරයි. එබැවින්, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම පිළිබඳව තීරණ ගැනීමේදී මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් හට විශේෂිත තොරතුරු ඉදිරිපත් කිරීමෙන් හෝ හෙළිදරව් කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල එම තොරතුරු ලබාදීමේ සහ භාවිතා කිරීමේ පිරිවැය සාධාරණීකරණය කිරීමට ඉඩ ඇති හෙයින් සළකා බැලීම වැදගත්ය.

## ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ පරමාර්ථ සහ මූලධර්ම

7.4 මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් තොරතුරු සඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ පහසුකම් සැලසීම සඳහා ප්‍රමිති වල ඇති ඉදිරිපත් කිරීම් සහ හෙළිදරව් කිරීම් වැඩිදියුණු කිරීමේදී පහත දෑ අතර සමබරතාවයක් තිබීම අවශ්‍ය කෙරේ:

(අ) අස්තිත්ත්වයෙහි වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් විශ්වාසනීය ලෙස නියෝජනය වන පරිදි අදාළ තොරතුරු ලබාදීමට අස්තිත්ත්වයට නම්‍යශීලී බවක් ලබාදීම; සහ

(ආ) වාර්තාකරණ අස්තිත්ත්වයෙහි එක් කාල පරිච්ඡේදයක සිට තවත් කාල පරිච්ඡේදයක් සඳහා අස්තිත්ත්ව හරහා තනි කාල පරිච්ඡේදයක් සඳහා තොරතුරු අවශ්‍ය කිරීම.

7.5 ප්‍රමිති වල ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අරමුණු ඇතුලත් කිරීම මඟින් මූල්‍ය ප්‍රකාශ වල සන්නිවේදන කටයුතු සඵලදායි වීමට සහායක් වී තිබෙන්නේ එවැනි අරමුණු මඟින් අස්තිත්වයන්ට ප්‍රයෝජනවත් තොරතුරු හඳුනාගැනීමටත්, වඩාත් සඵලදායී ආකාරයට එම තොරතුරු සංනිවේදනය කරන්නේ කෙසේද යන්න තීරණය කිරීමට උපකාර වන හෙයිනි.

7.6 පහත සඳහන් මූලධර්ම සලකා බැලීම මඟින් ද මූල්‍ය ප්‍රකාශවල සඵලදායී සංනිවේදනය සහාය වේ:

(අ) ප්‍රමිතිකල විස්තරවලට වඩා සමහරවිට අස්තිත්ව-නිශ්චිත තොරතුරු වඩාත් ප්‍රයෝජනවත් වේ, සමහරවිට මේවා 'පුනරුක්ති පාඨය' (boilerplate) ලෙස හැඳින්වේ; සහ

(ආ) මූල්‍ය ප්‍රකාශ වල වෙනස් කොටස් වල ඇති තොරතුරු පිටපත් කර තැබීම සාමාන්‍යයෙන් අනවශ්‍ය වන අතර, එමඟින් මූල්‍ය ප්‍රකාශ පිළිබඳව ඇති අවබෝධය අඩුවීම සිදුවිය හැකිය.

## වර්ගීකරණය

7.7 වර්ගීකරණය යනු, හවුලේ පරිහරණය කරන ගතිලක්ෂණ පදනම් කරගෙන වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම හෝ වියදම් ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ පරමාර්ථයෙන් කාණ්ඩ කිරීමයි. අයිතමයෙහි ස්වභාවය, එහි භූමිකාව, (හෝ ක්‍රියාකාරීත්වය) තුළ අස්තිත්ත්වය විසින් මෙහෙයවනු ලබන ක්‍රියාකාරකම් සහ එය කෙසේ මනින්නේද යන ආකාරය එවැනි ගතිලක්ෂණ වලට ඇතුලත් වන නමුත් - ඒවාට පමණක් සීමා නොවේ.

7.8 අසමාන වත්කම්, වගකීම්, ස්කන්ධ, ආදායම හෝ වියදම් එකට වර්ගීකරණය කිරීමෙන් අදාළ තොරතුරු අපැහැදිලි වීම, තේරුම් ගැනීමේ සහ සැසඳීමේ හැකියාව අඩුවීම සහ එයින් නියෝජනය කිරීමට අදහස් කරන දේ පිළිබඳව විශ්වාසනීය නියෝජනයක් ලබා දීමට නොහැකි වනු ඇත.

### වත්කම් හා වගකීම් වර්ගීකරණය

7.9 වත්කමක් හෝ වගකීමක් සඳහා තෝරාගත් ගිණුම් ඒකකයකට වර්ගීකරණය අදාළ වේ. (4.48 – 4.55 ඡේද බලන්න) කෙසේ වෙතත්, සමහර විට වෙනස් ලක්ෂණ ඇති වත්කමක් හෝ වගකීමක් සංරචක වලට වෙන් කොට එම සංරචක වෙනම වර්ගීකරණය කිරීම සුදුසු විය හැකිය. එම සංරචක වෙනවෙනම

වර්ගීකරණය කිරීම උචිත වන්නේ, එහි ප්‍රතිඵලයක් ලෙසින් මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත් බව ඉහළ නැංවෙන හෙයිනි. උදාහරණ වශයෙන්, වත්කමක් හෝ වගකීමක් ජංගම සහ ජංගම නොවන සංරචක ලෙස එම සංරචක වෙන් කර වෙන වෙනම වර්ගීකරණය කිරීම උචිත විය හැකිය.

### හිලව් කිරීම

7.10 හිලව් කිරීම සිදුවන්නේ අස්තිත්වයක් විසින් වත්කමක් සහ වගකීමක් යන දෙකම වෙන්වූ ගිණුම් ඒකක ලෙස හඳුනාගෙන මැන බලන නමුත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඒවා කාණ්ඩ කර තනි ශුද්ධ වටිනාමක් ලෙස සඳහන් කිරීමේදීය. හිලව් කිරීමෙන් අසමාන අයිතම එකට වර්ගීකරණය කරන අතර, එබැවින් එය සාමාන්‍යයෙන් උචිත නොවේ.

7.11 වත්කම් සහ වගකීම් හිලව් කිරීම, තනි ගිණුම් ඒකකයක හිමිකම් සහ බැඳීම් කට්ටලයක් ලෙස සැළකීමට වඩා වෙනස් වේ. (4.48 – 4.55 ඡේද බලන්න).

### ස්කන්ධය වර්ගීකරණය

7.12 ප්‍රයෝජනවත් තොරතුරු ලබාදීම සඳහා ස්කන්ධ හිමිකම් ඉල්ලීම්වල වෙනස් ගතිලක්ෂණ ඇත්නම් ස්කන්ධ හිමිකම් වෙන වෙනම වර්ගීකරණය කිරීම අවශ්‍ය වේ. (4.65 ඡේදය බලන්න).

7.13 ඒ හා සමානව, සමහර සංරචකයන් විශේෂිත නෛතික, නියාමන හෝ වෙනත් අවශ්‍යතා වලට යටත් වන්නේ නම්, ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම සඳහා එම ස්කන්ධයේ සංරචක වෙන වෙනම වර්ගීකරණය කිරීම අවශ්‍ය විය හැකිය. උදාහරණ වශයෙන්, සමහර අධිකරණ බලය තුල ස්කන්ධ ධාරකයින්ගේ හිමිකම්පෑම් සඳහා බෙදාහැරීම් කිරීමට අස්තිත්ත්වයට අවසරදී ඇත්තේ, අස්තිත්ත්වය සතුව බෙදාහැරිය හැකි ලෙස නිශ්චය කළ ප්‍රමාණවත් සංචිත ඇත්නම් පමණි. (4.66 ඡේදය බලන්න) එම සංචිත වෙනම ඉදිරිපත් කිරීමෙන් හෝ හෙළිදරව් කිරීමෙන් ප්‍රයෝජනවත් තොරතුරු ලබාදිය හැකිය.

### ආදායම් සහ වියදම් වර්ගීකරණය

7.14 වර්ගීකරණය අදාළ වන්නේ:

(අ) ආදායම් සහ වියදම් වල ප්‍රතිඵලය වන්නේ වත්කම් හෝ වගකීම් සඳහා තෝරාගත් ගිණුම් ඒකකයකි;

(ආ) එවැනි ආදායම් සහ වියදම් සංරචක වල, එම සංරචකවල වෙනස් ගතිලක්ෂණ ඇත්නම් ඒවා වෙන වෙනම හඳුනා ගනු ඇත. උදාහරණ වශයෙන්; වත්කමක වර්තමාන අගය වෙනස් වීමට අගයන්ගේ වෙනස්වීමෙහි බලපෑම් සහ උපචිත පොළිය ඇතුළත් විය හැකිය. (6.1 වගුව බලන්න) එම සංරචක වෙනවෙනම වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය තොරතුරු වල ප්‍රයෝජනභාවය ඉහළ නැංවේ නම්, එසේ කිරීම සුදුසුය.

### ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම්

7.15 ආදායම් සහ වියදම් වර්ගීකරණය කර ඇතුළත් කර ඇත්තේ:

(අ) ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි[11] හෝ

(ආ) ලාභ හෝ අලාභ ප්‍රකාශයට බාහිරව ඇති වෙනත් විස්තීර්ණ ආදායම් තුළ.

7.16 ලාභ හෝ අලාභ ප්‍රකාශය යනු, අස්තිත්ත්වයෙහි වාර්තා කරන කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රාථමික තොරතුරු මූලාශ්‍රය වේ. එම ප්‍රකාශයෙහි ලාභය හෝ අලාභයෙහි එකතුවක අඩංගු වන අතර, කාල පරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ බොහෝ ලෙස සාරාංශගත නිරූපණයක් ලබාදෙයි. මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන බොහෝ දෙනෙක් ඔවුන්ගේ විශ්ලේෂණ වල එක්කෝ එම විශ්ලේෂණය සඳහා ආරම්භක අයිතමය ලෙස හෝ කාල පරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනයේ ප්‍රධාන දර්ශකය ලෙස එම එකතුව අන්තර්ගත කෙරේ.

[11] මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ(ය) තනි ප්‍රකාශයක් හෝ ප්‍රකාශ දෙකකින් සමන්විතද යන්න *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* නියම නොකරයි. *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* "ලාභ හෝ අලාභ ප්‍රකාශය" යන පදය වෙනම ප්‍රකාශයක් වෙතට සහ තනි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයක් තුල වෙනම කොටසක් වෙතට යොමු කිරීමට භාවිතා කරයි. ඒ හා සමානව "ලාභය හෝ අලාභය සඳහා එකතුව" යන පදය, වෙනම ප්‍රකාශයක එකතුව සඳහා සහ තනි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයක් තුල කොටසක් සඳහා උප එකතුවක් යන දෙකටම යොමු කිරීමට එය භාවිත කෙරේ.

එසේ වුවද, එම කාල පරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය අවබෝධ කර ගැනීම සඳහා හඳුනාගෙන ලැබූ සියලුම ආදායම් හා වියදම් වල විශ්ලේෂණය වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇතුළත් ආදායම් සහ වියදම් මෙන්ම මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් වෙනත් තොරතුරු වල විශ්ලේෂණයක් ද අවශ්‍ය වේ.

7.17 අස්තිත්ත්වයෙහි කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ ලාභාලාභ ප්‍රකාශය වන හෙයින්, මූලික වශයෙන් සියළු ආදායම් සහ වියදම් එම ප්‍රකාශයේ ඇතුළත් වේ. කෙසේ නමුත්, ප්‍රමිති වැඩිදියුණු කිරීමේදී සුවිශේෂී තත්ත්වයක් තුළ වත්කමක හෝ වගකීමක වර්තමාන අගය වෙනස් වීම තුළින් පැන නැගෙන ආදායම් හෝ වියදම් වෙනත් විස්තීර්ණ ආදායමට ඇතුලත් කළ යුතු ලෙසට පාලක මණ්ඩලයට තීරණය කළහැකි අතර, එසේ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශය මගින් වඩාත් අදාල තොරතුරු ලබාදීම හෝ අස්තිත්ත්වයෙහි එම කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව වඩාත් විශ්වාසනීය නියෝජනයක් සැපයීමට හැකි වේ.

7.18 ඓතිහාසික පිරිවැය මිනුම් පදනමක් මත පැන නගින ආදායම් සහ වියදම් (6.1 වගුව බලන්න) ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. වත්කමක හෝ වගකීමක වර්තමාන අගයෙහි වූ වෙනස්කම් සංරචකයක් ලෙස වෙන වෙනම හඳුනා ගෙන ඇතිවිට එම ආකාරයේ ආදායම් සහ වියදම් ද පිරික්සුමට භාජනය වේ. උදාහරණ වශයෙන්, මූල්‍ය වත්කමක් වර්තමාන අගයෙන් මනිනු ලැබේ නම් සහ පොළී ආදායම් අගයන්ගේ අනිකුත් වෙනස්වීම් වලින් වෙන වෙනම හඳුනා ගෙන තිබේ නම්, එම පොළී ආදායම් අගයන්ගේ අනෙකුත් වෙනස්වීම් වලින් වෙන වෙනම හඳුනා ගෙන තිබේ නම්, එම පොළී ආදායම ලාභාලාභ ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

7.19 මූලික වශයෙන්, එක් කාලපරිච්ඡේදයක් තුල වන වෙනත් විස්තීර්ණ ආදායමේ ඇතුලත් වන ආදායම් හා වියදම් අනාගත කාල පරිච්ඡේදයක වන ලාභාලාභ ප්‍රකාශයට විස්තීර්ණ ආදායමෙන් ප්‍රති වර්ගීකරණය කරනු ඇති අතර, එසේ කිරීමේ ප්‍රතිඵලය ලෙස ලාභාලාභ ප්‍රකාශය මඟින් වඩාත් අදාළ තොරතුරු ලබාදීම හෝ එම අනාගත කාල පරිච්ඡේදය සඳහා වන අස්තිත්ත්වයෙහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව වඩාත් විශ්වාසනීය නියෝජනයක් ලබාදිය හැකිය. කෙසේ වෙතත්, උදාහරණයක් ලෙස, එම ප්‍රතිඵලය ඇතිවූ ප්‍රති වර්ගීකරණය කරනු ලබන කාල සීමාව හෝ ප්‍රති වර්ගීකරණය කළයුතු වටිනාකම හඳුනා ගැනීම සඳහා පැහැදිලි පදනමක් නොමැති විට, වෙනත් විස්තීර්ණ ආදායමේ ඇතුලත් එම ආදායම සහ වියදම ප්‍රති වර්ගීකරණය නොකළයුතු බව ප්‍රමිතයන් සංවර්ධනය කිරීමේදී පාලක මණ්ඩලය තීරණය කළ හැක.

## සමාහරණය

7.20 සමාහරණය යනු, හවුල් ගතිලක්ෂණ ඇති හා එකම වර්ගීකරණය තුල ඇතුළත් වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් හා වියදම් එකට එකතු කිරීමය.

7.21 සමාහරණය කිරීම මඟින් විශාල පරිමාවක විස්තර සාරාංශ කිරීමෙන් තොරතුරු වඩාත් ප්‍රයෝජනවත් බවට පත් කෙරේ. කෙසේ වෙතත්, සමාහරණය මගින් එම සමහර විස්තර සඟවයි. එබැවින් එක්කෝ විශාල ප්‍රමාණයක නොවැදගත් විස්තර මඟින් හෝ අධික සමාහරණය මගින් අදාළ තොරතුරු සැඟවීම වැළැක්වීමට සමබරතාවයක් පිහිටුවීම අවශ්‍යවේ.

7.22 මූල්‍ය ප්‍රකාශයන්හි වෙනස් කොටස්වල වෙනස් සමාහරණ කිරීමට අවශ්‍ය විය හැකිය. උදාහරණ වශයෙන්, ආකෘතිකව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ(ය) මඟින් සාරාංශගත තොරතුරු ලබාදීම සහ සටහන් තුලින් වඩාත් සවිස්තරාත්මක තොරතුරු ලබාදේ.

## 8 වන පරිච්ඡේදය - ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන නඩත්තුව පිළිබඳ සංකල්ප

| | |
|---|---|
| **ප්‍රාග්ධන සංකල්ප** | **8.1** |
| **ප්‍රාග්ධන නඩත්තුව සහ ලාභය නිර්ණය කිරීමේ සංකල්ප** | **8.3** |
| **ප්‍රාග්ධන නඩත්තු ගැලපීම්** | **8.10** |

8 වන පරිච්ඡේදයේ ඇතුලත් කරුණු වෙනස් කිරීමකින් තොරව 2010දී නිකුත් කළ මුල්‍ය වාර්තාකරණය පිළිබඳ ආකෘතිමය රාමුවේ සිට ඉදිරියට ගෙන ඇත. එම කරුණු මුල් කෘතිය ප්‍රකාශයට පැවේ 1989දී නිකුත් කළ මුල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුව තුලය.

## ප්‍රාග්ධන සංකල්ප

8.1 ප්‍රාග්ධනය පිළිබඳ මුල්‍ය සංකල්පයක් බොහෝ අස්තිත්ත්ව විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරනු ලැබේ. ප්‍රාග්ධනය පිළිබඳ මූල්‍ය සංකල්පයක් යටතේ ආයෝජනය කළ මුදල් හෝ ආයෝජනය කළ ක්‍රය ශක්තිය වැනි අස්තිත්ත්වයෙහි ශුද්ධ වත්කම් හෝ ස්කන්ධය සමග පර්යාය තුල මාර්ථ (සමාර්ථ) වන්නකි. මෙහෙයුම් හැකියාව වැනි ප්‍රාග්ධනයේ භෞතික සංකල්පය යටතේ ප්‍රාග්ධනය යන්න අස්තිත්ත්ව පදනම මත වන නිෂ්පාදන ධාරිතාව ලෙසට සැළකේ. උදාහරණ ලෙස, දිනකට වන නිමැවුම් ඒකක ගණන.

8.2 අස්තිත්ත්වයක් විසින් ප්‍රාග්ධනය පිළිබඳ උචිත සංකල්පයක් තෝරා ගැනීමේදී ඒවා මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන්නන්ගේ අවශ්‍යතා මත පදනම් විය යුතුය. මේ අනුව, මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන්නන් මූලික වශයෙන් නාමික ආයෝජනය තුල ප්‍රාග්ධන පිළිබඳව හෝ ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයෙහි ක්‍රය ශක්තිය පිළිබඳව සැලකිලිමත් වන්නේ නම්, ප්‍රාග්ධනය පිළිබඳ මූල්‍ය සංකල්ප අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, පරිශීලකයින්ගේ ප්‍රධාන සැළකිල්ල අස්තිත්ත්වයෙහි මෙහෙයුම් හැකියාව හා සම්බන්ධ නම්, ප්‍රාග්ධනය පිළිබඳ භෞතික සංකල්පය භාවිතා කළ යුතුය. සංකල්ප ක්‍රියාත්මක කිරීමේදී යම් මිනුම් දුෂ්කරතාවයන් තිබියදී වුවද, තෝරාගත් සංකල්පය මගින් ලාභය නිර්ණය කිරීමේදී අත් කරගත යුතු ඉලක්ක හඟවයි.

## ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්ප සහ ලාභය නිර්ණය කිරීම

8.3 8.1 ඡේදයෙහි දැක්වෙන ප්‍රාග්ධන සංකල්ප මගින් ප්‍රාග්ධන නඩත්තු කිරීමේ පහත දැක්වෙන සංකල්ප වලට මග පාදයි:

(අ) *මූල්‍ය ප්‍රාග්ධන නඩත්තුව.* මෙම සංකල්පය යටතේ කාල පරිච්ඡේදය තුළ හිමිකරුවන්ට සිදුකල යම් බෙදාහැරීම් සහ ඔවුන්ගෙන් ලද දායක මුදල් බැහැර කිරීමෙන් පසුව කාල පරිච්ඡේදය අවසානයේ ඇති ශුද්ධ වත්කම් වල මූල්‍ය (හෝ මුදල්) වටිනාකම කාලපරිච්ඡේදය ආරම්භයේදී වූ ශුද්ධ වත්කම් වල මූල්‍ය (මුදල්) වටිනාකම ඉක්මවා යන්නේ නම් ලාභයක් උපයා ඇත. මූල්‍ය ප්‍රාග්ධන නඩත්තුව එක්කෝ නාමික මූල්‍ය ඒකකවලින් හෝ ස්ථාවර ක්‍රය ශක්ති ඒකක මගින් මැනිය හැකිය.

(ආ) *භෞතික ප්‍රාග්ධන නඩත්තුව.* මෙම සංකල්පය යටතේ කාල පරිච්ඡේදය තුළ හිමිකරුවන්ට සිදුකල යම් බෙදාහැරීම් සහ ඔවුන්ගෙන් ලද දායක මුදල් බැහැර කිරීමෙන් පසුව ලාභයක් උපයා ගත හැක්කේ කාල පරිච්ඡේදය අවසානයට ඇති අස්තිත්ත්වයෙහි භෞතික නිෂ්පාදක ධාරිතාවය (හෝ මෙහෙයුම් හැකියාව) (හෝ සම්පත් හෝ එම ධාරිතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල්), කාලපරිච්ඡේදය ආරම්භයේදී ඇති භෞතික නිෂ්පාදන ධාරිතාවය ඉක්මවා යන්නේ නම් පමණි.

8.4 ප්‍රාග්ධන නඩත්තුව පිළිබඳ සංකල්පය විසින් සැලකිලිමත් වන්නේ අස්තිත්වයට නඩත්තු කිරීමට අවශ්‍ය කරන ප්‍රාග්ධනය එය නිර්වචනය කරන්නේ කෙසේද යන්නය. එයින් ප්‍රාග්ධනයෙහි සංකල්ප සහ ලාභයෙහි සංකල්ප අතර සම්බන්ධතාවක් ඇති කරනු ලබන්නේ, එමගින් කුමන ලාභයක් මැනිය යුතුද යන්න පිළිබඳව යොමු ලක්ෂ්‍යය ලබාදෙන බැවින්, එය අස්තිත්ත්වයක ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ සහ එහි ප්‍රාග්ධන ප්‍රතිලාභ අතර වෙනස වෙන්කොට හඳුනා ගැනීම සඳහා පූර්වාවශ්‍යතාවයක් වේ; ප්‍රාග්ධන නඩත්තුව සඳහා අවශ්‍ය වටිනාකමට වඩා වැඩිපුර වත්කම් ගලා ඒම් පමණක් ලාභය ලෙස සැළකීම සහ එබැවින්

එය ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ ලෙස සැළකේ. ඒ අනුව, ලාභය යනු ආදායමින් වියදම් අඩු කිරීමෙන් පසු (උචිත අවස්ථාවන්හි දී ප්‍රාග්ධන නඩත්තු ගැලපුම් ද ඇතුළුව) ඉතුරුව ඇති අවශේෂ වටිනාකම වේ. වියදම්, ආදායම් ඉක්මවා ගියහොත් අවශේෂ වටිනාකම අලාභය වේ.

8.5 භෞතික ප්‍රාග්ධන නඩත්තු සංකල්පයට වර්තමාන පිරිවැය මිනුම් පදනම අනුගමනය කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රාග්ධන නඩත්තු සංකල්පය, විශේෂිත මිනුම් පදනමක වල භාවිතය අවශ්‍ය නොවේ. මෙම සංකල්පය යටතේ පදනම තෝරාගැනීම රඳා පවතින්නේ අස්තිත්ත්වය විසින් පවත්වාගෙන යාමට අපේක්ෂා කරන මූල්‍ය ප්‍රාග්ධනයේ වර්ගය මතය.

8.6 ප්‍රාග්ධනය නඩත්තු කිරීමේ සංකල්ප දෙක අතර ඇති ප්‍රධාන වෙනස වන්නේ වත්කම්වල සහ වගකීම්වල මිළ ගණන් වෙනස්කම්වල බලපෑම සළකනු ලබන ආකාරයයි. පොදුවේ ගත් කළ, කාලසීමාව ආරම්භයේ දී තිබූ ප්‍රාග්ධනය තරම් ප්‍රාග්ධනයක් කාලසීමාව අවසානයේදීත් තිබේනම් අස්තිත්ත්වය විසින් එහි ප්‍රාග්ධනය පවත්වාගෙන ගොස් ඇත. කාලපරිච්ඡේදය ආරම්භයේ දී පවත්වාගත යුතු ප්‍රාග්ධන අවශ්‍යතාවයට වඩා වැඩිපුර ඇති වටිනාකම ලාභය වේ.

8.7 මූල්‍ය ප්‍රාග්ධන නඩත්තු සංකල්පය යටතේ ප්‍රාග්ධනය යන්න නාමික මුදල් ඒකක භාෂිතයෙන් අර්ථ දක්වා ඇති විට ලාභය ලෙසට නියෝජනය වන්නේ කාල පරිච්ඡේදය පුරාවට නාමික මුදල් ප්‍රාග්ධනයෙහි වැඩි වීමයි. මේ අනුව, රඳවාගෙන ඇති කාලසීමාව පුරා වත්කම්වල මිල ඉහළ යාම, සම්ප්‍රදායික වශයෙන් හඳුන්වන්නේ රඳවාගැනීමේ ප්‍රතිලාභ ලැබීමක් වන නිසා එය සංකල්පනාත්මක ලාභයකි. කෙසේ වෙතත්, හුවමාරු ගනුදෙනුවකදී වත්කම් බැහැර කරන තුරු එම ලාභ හඳුනා නොගනී. මූල්‍ය ප්‍රාග්ධන නඩත්තු සංකල්පය, නියත ක්‍රය ශක්තියේ ඒකක අනුව අර්ථ දක්වන විට, කාල පරිච්ඡේදය පුරා ආයෝජන ක්‍රය ශක්තිය වැඩිවීම ලාභය නියෝජනය කරයි. මේ අනුව, වත්කම් වල එම කොටසේ පමණක් මිල ගණන්වල වැඩිවීම, සාමාන්‍ය මිල මට්ටමේ වැඩිවිම ඉක්මවා යන විට ඒවා ලාභය ලෙසට සැළකේ. වැඩිවීමේ ඉතිරිය ප්‍රාග්ධන නඩත්තු ගැලපුමක් ලෙස සළකන අතර, ඒ අනුව එය ස්කන්ධයෙහි කොටසක් වේ.

8.8 භෞතික ප්‍රාග්ධන නඩත්තු සංකල්පය යටතේ ප්‍රාග්ධනය භෞතික නිෂ්පාදිත ධාරිතාව යන භාෂිතයෙන් අර්ථ දැක්වීමෙදී ලාභය නියෝජනය වන්නේ එම කාලය තුළ එම ප්‍රාග්ධනයේ වැඩිවීමෙනි. අස්තිත්ත්වයෙහි වත්කම් සහ වගකීම් කෙරෙහි බලපාන සියළුම මිළ ගණන් වෙනස්වීම්, අස්තිත්ත්වයෙහි භෞතික ඵලදායිතා ධාරිතාවය මැනීමෙහි වූ වෙනස්කම් ලෙස දසුනක් ඇති කරන බැවින්, ඒවා ලාභය ලෙස නොව ස්කන්ධයෙහි කොටසක් වන ප්‍රාග්ධන නඩත්තු ගැලපුම් ලෙස සලකනු ලැබේ.

8.9 මිනුම් පදනම් සහ ප්‍රාග්ධන නඩත්තුව පිළිබඳ සංකල්ප නිර්ණය කරනු ලබන්නේ, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිතා කරන ආකෘති අනුව වේ. වෙනස් ගිණුම්කරණ ආකෘතීන් වෙනස් මට්ටමේ අදාළත්වයන් සහ විශ්වාසනීයත්වයන් පෙන්නුම් කරන අතර, අනෙකුත් ක්ෂේත්‍රවල මෙන් කළමනාකාරීත්වය විසින් අදාළත්වය සහ විශ්වසනීයත්වය අතර සමබරතාවයක් සෙවිය යුතුය. මෙම *සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* ගිණුම්කරණ ආකෘති පරාසයකට අදාළවන අතර, තෝරා ගත් ආකෘතියක් යටතේ නිර්මාණය කල මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට සහ ඉදිරිපත් කිරීමට මග පෙන්වීමක් ලබාදෙයි. වර්තමානයෙහිදී සුවිශේෂී තත්ත්වයන් යටතේ හැර, අති උද්ධමනකාරී ආර්ථිකයන්හි ව්‍යවහාර මුදල් මගින් වාර්තා කරන එවැනි අස්තිත්ත්ව සඳහා වැනි වෙනත් විශේෂිත ආකෘතීන් නියම කිරීමට පාලක මණ්ඩලයේ අභිප්‍රායක් නොමැත. කෙසේ වෙතත්, මෙම අභිප්‍රාය ලෝකයේ දියුණුවත් සමඟ සමාලෝචනයට භාජනය කළ යුතු වේ.

## ප්‍රාග්ධන නඩත්තු ගැලපීම්

8.10 වත්කම් සහ වගකීම් ප්‍රත්‍යාගණනය හෝ නැවත ප්‍රකාශ කිරීම ස්කන්ධයෙහි වැඩිවීමකට හෝ අඩුවීමකට හේතු වේ මෙම වැඩිවීම් හෝ අඩුවීම් ආදායම් සහ වියදම් හි පිළිබඳ අර්ථ දැක්වීම සපුරාලන අතර, ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සමහර සංකල්ප යටතේ මේවා ආදායම් ප්‍රකාශයට ඇතුළත් නොවේ. ඒ වෙනුවට, මෙම අයිතම ස්කන්ධයේ ප්‍රාග්ධන නඩත්තු ගැලපුම් ලෙස හෝ ප්‍රත්‍යාගණන සංචිත ලෙස ඇතුළත් වේ.

## පරිශිෂ්ඨය

### නිර්වචනය කළ පද

පහත දැක්වෙන නිර්වචනය කළ පද මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි අදාළ ඡේදවලින් උපුටා ගැනීම හෝ ලබා ගැනීම සිදුකර තිබේ.

| | | |
|---|---|---|
| සමාහරණය | හවුල් ගතිලක්ෂණ ඇති හා එකම වර්ගීකරණය තුළ ඇතුළත් වත්කම්, වගකීම් ස්කන්ධය, ආදායම් හෝ වියදම් එකට එකතු කිරීම | CF.7.20 |
| වත්කම | අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙසට අස්තිත්ත්වය විසින් පාලනය කරනු ලබන වර්තමාන ආර්ථික සම්පතකි | CF.4.3 |
| ධාරණ අගය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කමක්, වගකීමක් හෝ ස්කන්ධය ලෙස හඳුනාගනු ලබන අගය | CF.5.1 |
| වර්ගීකරණය | ඉදිරිපත් කිරීමේ හා හෙළිදරව් කිරීමේ අරමුණු සඳහා හවුල් ලක්ෂණ පදනම මත වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් හෝ වියදම් තේරීම (සුබෙදුම). | CF.7.7 |
| සංයෝජිත මූල්‍ය ප්‍රකාශ | මව් - පරිපාලිත සම්බන්ධතාවයෙන් සියල්ල සම්බන්ධකරණය නොවූ අස්තිත්ත්ව දෙකක් හෝ ඊට වැඩි අස්තිත්ත්ව වලින් අඩංගු වන ඇති වාර්තා කරන අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ. | CF.3.12 |
| ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ | මව් සහ එහි පරිපාලිතයන් යන දෙකම අඩංගු වන වාර්තා කරන අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ. | CF.3.11 |
| ආර්ථික සම්පතක් පාලනය කිරීම | ආර්ථික සම්පත භාවිතා කිරීම සඳහා මෙහෙයවීමට සහ එයින් ගලා ආ හැකි ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට ඇති වර්තමාන හැකියාව. | CF.4.20 |
| ප්‍රති හඳුනාගැනීම | හඳුනාගෙන ඇති වත්කමක් හෝ වගකීමක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් අස්තිත්ත්වයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් ඉවත් කිරීම. | CF.5.26 |
| ආර්ථික සම්පත | ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව ඇති හිමිකමකි. | CF.4.4 |
| ගුණාත්මක ගතිලක්ෂණ වැඩි දියුණු කිරීම | ගුණාත්මක ගතිලක්ෂණයකින් ප්‍රයෝජනවත් තොරතුරු වඩාත් ප්‍රයෝජනවත් බවට පත්කරයි. ගුණාත්මක ගතිලක්ෂණ වනුයේ සංසන්දනය, සත්‍යාපනය, කාලෝචිත භාවය සහ තේරුම්ගතහැකි භාවයයි. | CF.2.4, CF.2.23 |
| ස්කන්ධය | අස්තිත්ත්වයක් විසින් එහි සියලු වගකීම් අඩුකළ පසු ඇති වත්කම්වල අවශේෂ හිමිකම | CF.4.63 |
| ස්කන්ධ හිමිකම් පෑම | අස්තිත්වයක එහි සියලු වගකීම් අඩුකළ පසු ඇති වත්කම් වල අවශේෂ හිමිකමට හිමිකම් පෑම. | CF.4.64 |
| පසුව ඉටුකිරීමේ ගිවිසුම | ගිවිසුමක්, හෝ ගිවිසුමක කොටසක් සමානව ඉටු නොකිරීම- කිසිදු පාර්ශ්වයක් විසින් සිය කිසිදු බැඳීමක් ඉටුකර නොතිබීම - දෙපාර්ශවයම විසින් සමාන ප්‍රමාණයෙන් සිය බැඳීම් අර්ධ වශයෙන් ඉටු කර තිබීම. | CF.4.56 |

| | | |
|---|---|---|
| පැවැත්මෙහි අවිනිශ්චිතතාවය | වත්කමක් හෝ වගකීමක් පවතීද යන්න පිළිබඳ ව ඇති අවිනිශ්චිතතාවය. | CF.4.13, CF.4.35 |
| වියදම් | ස්කන්ධ ධාරකයින්ගේ හිමිකම් පෑම් වලට සම්බන්ධිත බෙදාහැරීම හැර ස්කන්ධයෙහි අඩුවීම් ප්‍රතිඵලයක් වන වත්කම් වල අඩුවීම් හෝ වගකීම් වල වැඩිවීම් . | CF.4.69 |
| මූලික ගුණාත්මක ගති ලක්ෂණ | පොදු අරමුණු මූල්‍ය වාර්තා භාවිතා කරන ප්‍රාථමික පරිශීලනය කරන්නන්ට ප්‍රයෝජනවත් විය හැකි මූල්‍ය තොරතුරු සතුවිය යුතු ගුණාත්මක ගතිලක්ෂණයකි. මූලික ගුණාත්මක ගතිලක්ෂණ වන්නේ, අදාලත්වය සහ විශ්වාසනිය නියෝජනයයි. | CF.2.4, CF.2.5 |
| පොදු අරමුණු සඳහා වන මූල්‍ය වාර්තා | ප්‍රාථමික පරිශීලකයින්හට අස්තිත්ත්වයට සම්පත් ලබාදීමට සම්බන්ධිත තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන වාර්තාකරණ අස්තිත්ත්වයෙහි ආර්ථික සම්පත්, අස්තිත්ත්වයට එරෙහි හිමිකම්පෑම් සහ එම ආර්ථික සම්පත්වල සහ හිමිකම්පෑම් වල වෙනස්වීම් පිළිබඳ මූල්‍ය තොරතුරු ලබාදෙන වාර්තාවකි. | CF.1.2, CF.1.12 |
| පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශ | වාර්තාකරණ අස්තිත්ත්වයෙහි වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම හා වියදම් පිළිබඳව තොරතුරු ලබාදෙන විශේෂිත වූ ආකාරයේ පොදු අරමුණු සඳහා වන මූල්‍ය වාර්තා. | CF.3.2 |
| ආදායම | ස්කන්ධ ධාරකයින්ගේ ස්කන්ධ හිමිකම්පෑම් වලට සම්බන්ධිත දායකත්වයන් හැර, ස්කන්ධයේ වැඩිවීම් ප්‍රතිඵලයක් වන වත්කම් වල වැඩිවීම් හෝ වගකීම් වල අඩුවීම්. | CF.4.68 |
| වගකීම | අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙසට ආර්ථික සම්පත් පැවරීම සඳහා අස්තිත්ත්වයට ඇති වර්තමාන බැඳීම. | CF.4.26 |
| ප්‍රමාණාත්මක තොරතුරු | නිශ්චිත වාර්තා කරන අස්තිත්ත්වයක් පිළිබඳ මූල්‍ය තොරතුරු ලබාදෙන පොදු අරමුණු මූල්‍ය වාර්තාවන් ප්‍රාථමිකව පරිශීලනය කරන්නන්, එම වාර්තා පදනම මත ගන්නා තීරණවලට බලපෑම් කළ හැකි අත්හැරීම් හෝ අවප්‍රකාශ සිදු කරන තොරතුරු | CF.2.11 |
| මිනුම | වත්කමකට හෝ වගකීමකට සහ සම්බන්ධිත ආදායම් සහ වියදම් වලට මිනුම් පදනමක් ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලය. | CF.6.1 |
| මිනුම් පදනම | හඳුනාගනු ලැබූ ලක්ෂණයන් - උදාහරණ වශයෙන්, මනිනු ලබන අයිතමයේ ඓතිහාසික පිරිවැය, සාධාරණ අගය හෝ ඉටුකිරීමේ අගය. | CF.6.1 |
| මිනුම් අවිනිශ්චිතතාවය | මූල්‍ය වාර්තාවල ඇති මුදල් ප්‍රමාණයන් සෘජුව නිරීක්ෂණය කළ නොහැකි වීම සහ ඒ වෙනුවට ඇස්තමේන්තු කළයුතු අවස්ථාවක අවිනිශ්චිතතාවය පැන නගී. | CF.2.19 |
| හිලව් කිරීම | වෙන්වූ ගිණුම් ඒකක ලෙස හඳුනාගත් සහ මනින ලද වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි තනි ශුද්ධ වටිනාකමක් ලෙස කාණ්ඩගත කිරීම. | CF.7.10 |
| ප්‍රතිඵලයෙහි අවිනිශ්චිතතාවය | වත්කමකින් හෝ වගකීමකින් ප්‍රතිඵලයක් වන ආර්ථික ප්‍රතිලාභයක කිසියම් ගලාඒමක හෝ ගලා යෑමක වටිනාකම හෝ කාල නියමය පිළිබඳ අවිනිශ්චිතතාවය. | CF.6.61 |

| | | |
|---|---|---|
| ආර්ථික ප්‍රතිලාභ නිපදවීමේ හැකියාව | ආර්ථික සම්පතක් ඇතුලත දැනටමත් පවතින අංගයක් සහ එය අවම වශයෙන් එක් අවස්ථාවකදී අනෙක් සියලුම පාර්ශවයන්ට ලබාගත හැකි ආර්ථික ප්‍රතිලාභ ඉක්මවා අස්තිත්ත්වය සඳහා නිපදවනු ලැබේ. | CF.4.14 |
| ප්‍රාථමික පරිශීලකයින් (පොදු අරමුණු සඳහා වන මූල්‍ය වාර්තාවන්හි) | දැනට සිටින සහ අනාගත ආයෝජකයින් ණය ලබා දෙන්නන් සහ වෙනත් ණය හිමියන්. | CF.1.2 |
| විචක්ෂණභාවය | අවිනිශ්චිත තත්ත්වයන් කොන්දේසි යටතේ තීරණ ගැනීමේදී ප්‍රවේශම් වීමයි. විචක්ෂණශීලී ලෙස ක්‍රියාකිරීම යන්නෙන් අදහස් කරන්නේ, වත්කම් සහ ආදායම් වැඩියෙන් සඳහන් කර නොමැති වීම සහ වගකීම් සහ වියදම් අඩුවෙන් සඳහන් කර නොමැති වීමයි. ඒ හා සමානව වත්කම් හෝ ආදායම් අඩුවෙන් සඳහන් කිරීමට හෝ වගකීම් හෝ වියදම් වැඩියෙන් සඳහන් කිරීමට විචක්ෂණශීලී භාවය ඉඩ නොදෙයි. | CF.2.16 |
| හඳුනාගැනීම | වත්කමක්, වගකීමක්, ස්කන්ධය, ආදායම හෝ වියදමක් - මූල්‍ය ප්‍රකාශවල මූලිකාංගයන් එකක නිර්වචනය සපුරන එම අයිතමය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෝ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය(වල) තුල ඇතුළත් කිරීම සඳහා ග්‍රහනය කිරීමේ ක්‍රියාවලියයි.<br><br>එක්කෝ තනිව හෝ වෙනත් අයිතම සමඟ සමාහරණය කිරීමෙන් - වචනවලින් සහ මූල්‍ය වටිනාකමක් මඟින් සහ එම ප්‍රකාශය තුල වටිනාකම එක හෝ ඊට වැඩි එකතු ලෙස ඇතුලත් කිරීම ඇතුළුව - එම ප්‍රකාශ වලින් එක ප්‍රකාශයක් තුල අයිතමය නිරූපණය කිරීම හඳුනාගැනීම සඳහා අවශ්‍ය කෙරේ. | CF.5.1 |
| වාර්තාකරණ අස්තිත්ත්වය | පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අවශ්‍ය කෙරෙන හෝ තෝරාගනු ලබන අස්තිත්ත්වයයි. | CF.3.10 |
| ඒකාබද්ධ නොවූ මූල්‍ය ප්‍රකාශ | වාර්තාකරණ අස්තිත්ත්වය මූල්‍ය ප්‍රකාශ තුළ මව් පාර්ශවය පමණක් දැක්වීම. | CF.3.11 |
| ගිණුම් ඒකකය | හඳුනාගැනීමේ නිර්ණායක සහ මිනුම් සංකල්ප අදාළ වන හිමිකම හෝ හිමිකම් සමූහය, බැඳීම හෝ බැඳීම් සමූහය හෝ හිමිකම් සහ බැඳීම් සමූහය. | CF.4.48 |
| ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු | වාර්තාකරණ අස්තිත්ත්වයට සම්පත් ලබාදීමට සම්බන්ධිත තීරණ ගැනීමේදී ප්‍රාථමික පරිශීලකයනට ප්‍රයෝජනවත් පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ වල මූල්‍ය තොරතුරු ප්‍රයෝජනවත්වීමට, මූල්‍ය තොරතුරු අදාල වියයුතු සහ එය නියෝජනය කිරීමට අදහස් කරන දෑ විශ්වාසනීයව නියෝජනය විය යුතුය. | CF.1.2, CF.2.4 |
| පරිශීලකයින් (පොදු අරමුණු සඳහා වන මූල්‍ය වාර්තාවන්හි) | ප්‍රාථමික පරිශීලකයින් (පොදු අරමුණු සඳහා වන මූල්‍ය වාර්තාවන්හි) බලන්න. | – |

## SLFRS 2 *කොටස් පදනම් කරගත් ගෙවීම් සඳහා සංශෝධන*

63ඉ ඡේදය එකතු කර ඇත.

### බලාත්මක වන දිනය

...

63ඉ 2018 දී නිකුත් කරන ලද, *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට (SLFRSs) අදාළ සංශෝධන*, පරිශිෂ්ඨ අ හි ඇතුළත් ස්කන්ධ සාධන පත්‍රයක නිර්වචනයේ පාදක සටහන සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් විසින් එම සංශෝධනය 2020 ජනවාරි 01 දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. *SLFRSs තුල සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට යොමුකළ සංශෝධන* මගින් වෙනත් සියළු සංශෝධන ද එම අවස්ථාවේදීම අස්තිත්ත්වය ව්‍යවහාර කරන්නේ නම් කලින් ව්‍යවහාර කිරීමට අවසරදේ. LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි* අනුව, මෙම ප්‍රමිතියේ 53 - 59 ඡේද වල දැක්වෙන සංක්‍රාන්ති විධිවිධාන වලට යටත්ව අස්තිත්ත්වයට SLFRS 2 ට සංශෝධන අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතුය. කෙසේවෙතත්, අතීතානුයෝගීව ව්‍යවහාර කිරීම ප්‍රායෝගික නොවන බව හෝ එයට අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් දැරිය යුතු බව අස්තිත්වයක් නිර්ණය කරන්නේ නම් LKAS 8 හි 23 - 28, 50 - 53 සහ 54 ඊ යන ඡේද වලට යොමුවීම මගින් එය SLFRS 2 ට සංශෝධනය ව්‍යවහාර කළයුතුය.

පරිශිෂ්ඨ අ හි ස්කන්ධ සාධන පත්‍රයක් අර්ථදැක්වීමේ පාද සටහන සංශෝධනය කෙරේ. නව පාඨය යටින් ඉරක් ඇඳ ඇති අතර, කපාහැර ඉවත් කළ පාඨය හරහා ඉරක් ඇඳ ඇත.

* 2018 දී නිකුත් කරන ලද *මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* වගකීමක් යන්න අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පතක් ~~පැනනගින~~ පැවරීමට අස්තිත්ත්වයට ඇති වර්තමාන බැඳීමක් ලෙස අර්ථ දැක්වේ. ~~නිරවුල් කිරීම මගින් අස්ථිත්ත්වයක ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් අස්ථිත්වයෙන් පිටතට ගලා යාමක් අපේක්ෂා කෙරේ. (එනම් අස්තිත්ත්වයෙහි මුදල් හෝ වෙනත් වත්කම් ගලා ඒම්).~~

## SLFRS 3 *ව්‍යාපාර සංයෝජන සඳහා වන සංශෝධනය*

11 වන ඡේදයෙහි පාද සටහනෙහි සඳහන් *"ආකෘතිමය රාමුව"* යන්න කපා ඉවත් කර ඇති අතර, *"මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා ආකෘතිමය රාමුව "* යන පාද සටහන ඇතුළත් කර ඇත. 11 වන ඡේදය වෙනත් ආකාරයකින් සංශෝධනය නොවන නමුත් යොමුකිරීමේ පහසුව සඳහා ඇතුළත් කර ඇත. නව පාඨය යටින් ඉරක් ඇඳ ඇති අතර, කපාහැර ඉවත් කළ පාඨය හරහා ඉරක් ඇඳ ඇත.

*හඳුනාගැනීමේ කොන්දේසි*

11 අත් කර ගැනීමේ ක්‍රමය ව්‍යවහාර කිරීමේ කොටසක් ලෙස හඳුනාගැනීම සඳහා සුදුසුකම් ලැබීමට, හඳුනාගත හැකි වත්කම් අත් කරගත් සහ භාරගත් වගකීම් අත් කරගත් දිනට *මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවෙහි* වත්කම් සහ වගකීම් සඳහා වන නිර්වචනය සපුරාලිය යුතුය. උදාහරණ වශයෙන්, අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ ක්‍රියාකාරකමකින් ඉවත් වීමට එහි සැලැස්ම බලාත්මක කිරීමට හෝ අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ සේවකයින්ගේ සේවය සමාප්ත කිරීමට හෝ වෙනත් ස්ථානයක පිහිටුවීමට, අත්පත් කරගන්නා දැරීමට අවශ්‍ය කරන එහෙත් අනාගතයේදී සදාචාරාත්මකව දැරීමට නොබැඳෙන පිරිවැය අත්පත් කර ගත් දින වගකීමක් නොවේ. එබැවින්, අත් කර ගන්නා තැනැත්තා අත් කර ගැනීමේ ක්‍රමය ව්‍යවහාර කිරීමේ කොටසක් ලෙස එම පිරිවැය හඳුනා නොගනී. ඒ වෙනුවට, අත් කරගත් තැනැත්තා එම අනිකුත් SLFRSs වලට අනුකූලව සහ පශ්චාත් සංයෝජන මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගනී.

† මෙම ප්‍රමිතිය සඳහා 2018 දී නිකුත් කල *මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* වෙනුවට අත්පත් කර ගන්නන් විසින් ව්‍යවහාර කිරීමට අවශ්‍ය කරන්නේ 2011දී පාලක මණ්ඩලය විසින් පිළිගත් *මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවේ* වන වත්කමක් සහ වගකීමක් සඳහා වන නිර්වචන සහ සහායවීම් මඟපෙන්වීම්ය.

## SLFRS 6 *ඛනිජ සම්පත් ගවේෂණය කිරීම සහ ඇගයීම සඳහා සංශෝධන*

10 වන ඡේදය සංශෝධනය කර ඇති අතර, 26 අ ඡේදය එකතු කර ඇත. නව පාඨය යටින් ඉරි ඇඳ ඇති අතර, කපාහැර ඉවත් කරන ලද පාඨය හරහා ඉරක් ඇඳ ඇත.

**ගවේෂණ සහ වත්කම් ඇගයීමේ පිරිවැයේ මූලිකාංග**

...

10 ඛනිජ සම්පත් සංවර්ධනයට සම්බන්ධිත වියදම්, වත්කම් ගවේෂණය කිරීම සහ ඇගයීමේ වත්කම් ලෙස හඳුනානොගනී. ~~*ආකෘතිමය රාමුව*~~ *මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව* සහ LKAS 38 - *අස්පෘශ්‍ය වත්කම්* මඟින් සංවර්ධනයෙන් පැන නගින වත්කම් හඳුනාගැනීම පිණිස මගපෙන්වීමක් ලබාදේ.

## බලාත්මක වන දිනය

...

26අ 2018 දී නිකුත් කරන ලද *SLFRSs ඇතුළත් සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට යොමුකළ සංශෝධන,* සංශෝධිත 10 වන ඡේදය. අස්තිත්ත්වයක් විසින් එම සංශෝධනය 2020 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා ව්‍යවහාර කරගත යුතුය. *SLFRSs තුල සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට යොමුකළ සංශෝධන මඟින් සිදුකළ සියළු වෙනත් සංශෝධනත්* එම අවස්ථාවේදීම, අස්තිත්ත්වයක් ව්‍යවහාර කරන්නේ නම් කලින් ව්‍යවහාර කිරීමට අවසරදේ. *LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* අනුව අස්තිත්ත්වයක් *LKASs 6* මෙම සංශෝධන අතීතානුයෝගීව ව්‍යවහාර කළයුතුය. කෙසේවෙතත්, අතීතානුයෝගීව ව්‍යවහාර කිරීම ප්‍රායෝගික නොවන බව හෝ එය අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් දැරිය යුතු බව අස්තිත්වය නිර්ණය කරන්නේ නම් *LKAS 8* හි 23 - 28, 50 - 53 සහ 54 ඊ යන ඡේද වලට යොමුවීම මඟින් එය SLFRS 6 ට සංශෝධනය ව්‍යවහාර කළයුතුය.

## SLFRS 14 *නියාමන විලම්බන ගිණුම් සඳහා වූ සංශෝධනය*

13 වන ඡේදයෙහි "විශ්වසනීය" යන ප්‍රථම සිදුවීම් අවස්ථාව සඳහා පාද සටහන එකතු කර ඇත.

* 2010 දී නිකුත් කරන ලද *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* සහ 2018 දී නිකුත් කර ඇති *සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි* සංශෝධිත අනුවාදයේ දී ද භාවිතා කර ඇති "විශ්වාසනීය නියෝජනය" යන පදය ආකෘතිමය රාමුවෙහි *"විශ්වාසනීයත්වය"* ලෙසට හඳුන්වන පදයෙහි ප්‍රධාන ගති ලක්ෂණවලට ආවරනයවේ. මෙම ප්‍රමිතියෙහි 13 වන ඡේදයේ ඇති අවශ්‍යතාවයන් පදනම්වී ඇත්තේ LKAS 8 හි අවශ්‍යතාවයන් මතය. එය "විශ්වාසනීය" යන පදය රඳවා තබාගෙන ඇත.

## LKAS 1 *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා වූ සංශෝධන*

7, 15, 19-20, 23-24, 28 සහ 89 යන ඡේද සංශෝධනය කර ඇති අතර,139 ග ඡේදය එකතු කර ඇත . නව පාඨය යටින් ඉරක් ඇඳ ඇති අතර, කපා හැර ඉවත්කල පෙළ හරහා ඉරක් ඇඳ ඇත.

## නිර්වචන

**7 නිශ්චිතව දක්වා ඇති අර්ථයන් සමග මෙම ප්‍රමිතියේ පහත සඳහන් පද භාවිතා වේ:**

...

**ප්‍රමාණාත්මක අත්හැරීම් හෝ අයිතම අවප්‍රකාශය ප්‍රමාණාත්මක වන්නේ එමඟින් මූල්‍ය ප්‍රකාශ පදනම් කරගෙන පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ වලට තනි තනිව හෝ සාමූහිකව බලපෑම් කළ හැකි නම් ය. ප්‍රමාණාත්මක භාවය රඳා පවතින්නේ ප්‍රමාණය සහ අත්හැරීමේ ස්වභාවය හෝ අවප්‍රකාශය අවට තත්ත්වයන් තුළ සිදුකර ඇති විනිශ්චයන් මතය. අයිතමයේ ප්‍රමාණය හෝ ස්වභාවය හෝ ඒ දෙකේම සංයෝජනයක් නිර්ණය කරන සාධකය විය හැකිය.**

අත් හැරීමක් හෝ අවප්‍රකාශයක් පරිශීලකයින්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් කළ හැකිද යන්න සහ ඒ තරම් ප්‍රමාණවත් ද යන්න තක්සේරු කිරීමට එම පරිශීලකයින්ගේ ගතිලක්ෂණ සලකා බැලීම අවශ්‍ය වෙයි. ~~මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන ආකෘතිමය රාමුවෙහි 25 වන ඡේදයෙහි දැක්වෙන පරිදි පරිශීලකයින්හට~~ පරිශීලකයින්හට ව්‍යාපාර සහ ආර්ථික ක්‍රියාකාරකම් සහ ගිණුම්කරණය පිළිබඳ සාධාරණ දැනුමක් ඇතැයි උපකල්පනය කෙරෙන අතර, තොරතුරු සාධාරණ උද්‍යෝගිමත් බවකින් අධ්‍යයනය කිරීමට කැමැත්තක් ඇති බවට උපකල්පනය කෙරෙයි.;- එමනිසා එවැනි ගුණාංග වලින් යුත් පරිශීලකයින් සිටින විට ආර්ථික තීරණ ගැනීමේදී කවර ලෙසට බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිද යන්න පිළිබඳව තක්සේරු කිරීමේදී සාධාරණ ලෙස සැලකිල්ලට ගත යුතුය.

...

**සාධාරණ ඉදිරිපත් කිරීම සහ SLFRSs සමඟ අනුකූල වීම**

**15 මූල්‍ය ප්‍රකාශ අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ සාධාරණව ඉදිරිපත් කිරීම් කළ යුතුය. ~~ආකෘතිමය රාමුව~~ මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පනාත්මක ආකෘතිමය රාමුව (සංකල්පනාත්මක ආකෘතිමය රාමුව) තුල නියම කරඇති වත්කම්, වගකීම්, අදායම් සහ වියදම් සඳහා නිර්වචන හා හඳුනාගැනීමේ නිර්ණායක අනුව ගනුදෙනුවල බලපෑම්, වෙනත් සිද්ධි සහ පවත්නා තත්ත්වයන්හි විශ්වාසනීය නියෝජනයක් සාධාරණ ඉදිරිපත් කිරීමකම අවශ්‍ය කෙරේ. අවශ්‍යවූ විට අතිරේක හෙළිදරව් කිරීම් සමඟ SLFRSs ව්‍යවහාර කරගන්නා විට, මූල්‍ය ප්‍රකාශ එම සාධාරණ ඉදිරිපත් කිරීම ඉෂ්ඨ කර ගැනීම ප්‍රතිඵලයක් වන බවට අනුමාන කෙරේ.**

...

**19 අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී, විසින් SLFRS යක අවශ්‍යතාවයක් සමඟ අනුකූලවීම මඟින් නොමඟ යවන සුළු සහ ~~ආකෘතිමය රාමුවෙහි~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි නියම කරඇති මූල්‍ය ප්‍රකාශයන්හි අරමුණු සමඟ ගැටුම් ඇති කරන බවට කළමනාකාරීත්වය නිගමනය කරන විට, අදාළ නියාමන ආකෘති රාමුවෙන් අවශ්‍ය කරන්නේ නම් හෝ වෙනත් ආකාරයෙන් එවැනි බැහැරවීමක් තහනම් නොකරණු ලබන්නේ නම්, 20 වන ඡේදයෙන් නියම කරඇති ආකාරයට එම අවශ්‍යතාවයෙන් බැහැර විය යුතුය.**

**20 යම් අස්තිත්ත්වයක් විසින් SLFRS අවශ්‍යතාවයකින් බැහැර වනවිට, 19 වන ඡේදය අනුව එය පහත දැ හෙළිදරව් කළ යුතුය:**

**(අ) මූල්‍ය ප්‍රකාශ මඟින් අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව කළමනාකාරීත්වය විසින් නිගමනය කර ඇති බව;**

**(ආ) සාධාරණ ඉදිරිපත් කිරීමත් ඉෂ්ඨ කර ගැනීම සඳහා විශේෂිත අවශ්‍යතාවයකින් බැහැර වීම හැර එය අදාළ SLFRSs සමග අනුකූල වී ඇති බව;**

**(ඇ) අස්තිත්ත්වයක් විසින් බැහැර වූ SLFRS හි සිරස්තලය, SLFRS මඟින් අවශ්‍යකරන එයට සළකන ආකාරය ඇතුළුව බැහැර වීමේ ස්වභාවය, ~~ආකෘතිමය රාමුවෙහි~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි නියම කර ඇති මූල්‍ය ප්‍රකාශවල අරමුණු සමඟ ගැටුම් ඇති වී නොමඟ යවන සුළු තත්ත්වයක් ඇතිවීමට එම සළකන ආකාරය හේතුවූයේ කුමක් නිසාද යන්න; සහ**

**(ඈ) ඉදිරිපත් කළ සෑම කාළ පරිච්ඡේදයක් සඳහා අවශ්‍යතාවයට අනුකූල වෙමින් මූල්‍ය ප්‍රකාශ තුල වාර්තා කළ යුතුවූ සෑම අයිතමයක් මත බැහැර වීමේ මූල්‍ය බලපෑම.**

...

**23 අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී, SLFRSයක අවශ්‍යතාවයන් සමඟ අනුකූල වන විට, එමගින් නොමඟ යැවීම් සිදු වන අතර, ~~ආකෘතිමය රාමුවෙහි~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි ඇතුලත් මූල්‍ය ප්‍රකාශයන්හි පරමාර්ථ සමඟ ගැටුම් ඇති කරන බවට කළමනාකාරීත්වය නිගමනය කරන නමුත්, අදාල නියාමන**

**ආකෘතිමය රාමුව විසින් අවශ්‍යතාවයෙන් ඉවත් වීම තහනම් කර තිබෙන විට, එම අස්තිත්ත්වය විසින් හැකිතාක් දුරට නොමග යවන සුළු කරුණු අඩු කරමින් පහත අනුකූලතාවයන් හෙළිදරව් කිරීම සිදු කළ යුතුය:**

**(අ) ප්‍රශ්නගත SLFRS හි සිරස්තලය, අවශ්‍යතාවයෙහි ස්වභාවය සහ කළමනාකාරීත්වය විසින් එම අවශ්‍යතාවයට අනුකූලවීමේ තත්ත්වයන් තුළ ~~ආකෘතිමය රාමුව~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව තුල වූ මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථ සමග ගැටෙන බව සමඟ නොමග යවන සුළු තත්ත්වයක් ඇති වෙන බවට නිගමනය කිරීමට හේතුව; සහ**

**(ආ) ඉදිරිපත් කරන ලද සෑම කාලපරිච්ඡේදයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශයන්හි ඇති එක් එක් අයිතමයට සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා අවශ්‍ය වන බවට කළමනාකාරීත්වය විසින් නිගමනය කරන ලද ගැලපීම්.**

24 19-23 ඡේද වල පරමාර්ථය සඳහා, තොරතුරු අයිතමයක් සමග මුල්‍ය ප්‍රකාශ වල පරමාර්ථ ගැටීමේදී එයින් ගනුදෙනු විශ්වාසනීයව නියෝජනය නොකරන විට, එයින් නියෝජනය කිරීමට අදහස් කරන හෝ සාධාරණ ලෙස නියෝජනය කළ හැකි බවට අපේක්ෂා කළ හැකි අනෙක් සිදුවීම් සහ කොන්දේසි, සහ එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුල්‍ය ප්‍රකාශ පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ වලට බලපෑම් කිරීමට ඉඩ ඇත. SLFRs හි නිශ්චිත අවශ්‍යතාවන්ට අනුකූලද යන්න තක්සේරු කිරීමේදී, එය නොමග යවන සුළු වන තරමේ තරමින් ~~ආකෘතිමය රාමුවෙහි~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව අනුව වූ මූල්‍ය ප්‍රකාශවල පරමාර්ථ සමග ගැටෙන විට, කළමනාකාරිත්වය විසින් සළකා බලනු ලබන කරුණු:

(අ) විශේෂ තත්ත්වයන් තුළ මුල්‍ය ප්‍රකාශවල පරමාර්ථය ඉෂ්ඨ කර නොගන්නේ මන්ද යන්න; සහ

(ආ) අවශ්‍යතාවයට අනුකූල වන වෙනත් අස්තිත්ත්වයන්ගෙන් අස්තිත්ත්වයෙහි තත්ත්වය වෙනස් වන්නේ කෙසේද යන්න. සමාන තත්ත්වයන් තුළ ඇති වෙනත් අස්තිත්ත්වයන්ගේ අවශ්‍යතාවයට අනුකූල වන්නේ නම්, අස්තිත්ත්වයෙහි අනුකූලත්වය ~~ආකෘතිමය රාමුව~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව අනුව වූ මූල්‍ය ප්‍රකාශ සහ එහි පරමාර්ථයට පටහැනි වීමට තරම් නොමඟ යවන සුළු නොවන බවට උප මර්ධනීය අනුමැතියක් ඇත.

...

### උපචිත පදනමට ගිණුම්කරණය

...

28 උපචිත පදනමට ගිණුම්කරණය භාවිතා කරන විට, අස්තිත්ත්වයක් විසින් වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම සහ වියදම (මූල්‍ය ප්‍රකාශ වල මුලිකාංග) හඳුනාගන්නා විට, ~~ආකෘතිමය රාමුවට~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව තුළ වූ මූලිකාංගයන්හි නිර්වචන සහ හඳුනාගැනීමේ මූලිකාංග සංතෘප්තියට පත් වේ.

### කාලපරිච්ඡේදයට අදාළ ලාභය හෝ අලාභය

...

89 සමහර SLFRS විසින් නිශ්චිත තත්ත්වයන් යටතේ අස්තිත්ත්වයක් විසින් වර්තමාන කාල පරිච්ඡේදයේ ලාභයට හෝ අලාභයට පිටින් විශේෂිත වූ අයිතමයන් හඳුනාගනු ලබන අවස්ථාවන් නියම කරයි. LKAS 8 යටතේ එවැනි තත්ත්වයන් දෙකක් නියම කරයි. එනම් දෝෂ නිවැරදි කිරීම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස් වීමේ බලපෑම්ය. ~~ආකෘතිමය රාමුවෙහි~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි ආදායම් හෝ වියදම් වල නිර්වචනය සපුරාලන වෙනත් පුළුල් ආදායම් සංරචක ලාභයෙන් හෝ අලාභයෙන් බැහැර කළ යුතු ලෙසට වෙනත් SLFRs හි අවශ්‍යතාවය හෝ අවසරය මඟින් ලබාදී ඇත. (ඡේද 7 බලන්න).

...

## සංක්‍රාන්තිය සහ බලාත්මක වන දිනය

...

139ග. 2018 දී නිකුත් කරන ලද, SLFRS සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට අදාල සංශෝධන වල යොමුව, සංශෝධනය කරන ලද ඡේද 7, 15, 19-20, 23-24, 28 සහ 89 වේ. අස්තිත්ත්වයක් විසින් එම සංශෝධන 2020 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා අදාල කරගත යුතුය. SLFRS තුළ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව පිළිබඳ සංශෝධන යොමුගත කරමින් සිදුකර ඇති අනිකුත් සියලුම සංශෝධන යම් අස්තිත්ත්වයක් විසින් අදාළ කරගන්නේ නම්, කලින් තිබූ

අදාළත්වයන් යොදා ගැනීමට අවසර දී ඇත. අස්තිත්වයක් විසින් අතීතානුයෝගීව LKAS 1 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ වෙනස් වීම් වෙත සිදු කර ඇති සංශෝධන, වලට අනුකූලව යොදාගත හැකිය. කෙසේවෙතත්, අතීතානුයෝගීව යොදාගැනීම ප්‍රායෝගික නොවන බවට හෝ අනවශ්‍ය පිරිවැයක් හෝ වැයමක් දැරීමට සිදුවන බවට අස්තිත්ත්වයක් විසින් තීරණය කරන්නේ නම්, LKAS 8 හි 23-28, 50-53සහ 54ඊ යන ඡේද වලට යොමුගත කරමින් LKAS 1 සඳහා වන සංශෝධන අදාළ කරගත හැකිය.

## LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ සඳහා සංශෝධන

ඡේද 6 සහ 11ආ ඡේද සංශෝධනය කර ඇත. ඡේද 11(ආ) සඳහා නව පාද සටහනක් එකතු කර ඇත. ඡේද 54ට පෙර ඇති ශීර්ෂය සංශෝධනය කර ඇති අතර, ඡේද 54 ඊ 54 උ ඡේද එකතු කර ඇත. නව පෙළ යටින් ඉරක් ඇඳ ඇති අතර, ඉවත්කල පෙළ හරහා ඉරක් ඇඳ ඇත.

## නිර්වචන

...

6 අත්හැරීමකින් හෝ වැරදි අර්ථකථනයකින් පරිශීලකයින්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් කළ හැකි ද යන්න තක්සේරු කිරීමේදී, සහ ප්‍රමාණාත්මක වීමට නම්, එම පරිශීලකයින්ගේ අනුලක්ෂණ සළකා බැලීම අවශ්‍ය වේ. ~~මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවෙහි 25 වැනි ඡේදයෙහි පරිශීලකයින්~~ පරිශීලකයින් හට ව්‍යාපාරික සහ ආර්ථික ක්‍රියාකාරකම් හා ගිණුම්කරණය පිළිබඳ සාධාරණ දැනුමක් ඇති බවට සහ සාධාරණ කඩිසරකමකින් තොරතුරු අධ්‍යයනය කිරීමට කැමැත්තක් ඇති බවට උපකල්පනය කෙරේ- එම නිසා එවැනි ගුණාංගවලින් සමන්විත පරිශීලකයින් හට ආර්ථික තීරණ ගැනීමේදී බලපෑම් කිරීමට හැකිවෙතැයි සාධාරණව අපේක්ෂා කළ හැකි ආකාරය පිළිබඳව තක්සේරු කිරීමේ දී සැලකිල්ලට ගැනීම අවශ්‍ය වේ.

...

### ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යෙදීම

...

**11 10 වැනි ඡේදයේ විස්තර කර ඇති පරිදි විනිශ්චය කිරීමේදී, කළමනාකාරීත්වය විසින් යොමුකළ යුතු, සහ පහත දැක්වෙන ප්‍රභවයන්හි අදාලත්වය අනුපිළිවෙළින් සලකා බැලිය යුතුය:**

**(අ) සමාන සහ අදාළ ගැටලු සම්බන්ධව කටයුතු කිරීමේදී SLFRSs හි ඇති අවශ්‍යතාවයන්; සහ**

**(ආ) ~~ආකෘතිමය රාමුවෙහි~~ <u>මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි</u> (සංකල්පනාත්මක ආකෘතිමය රාමුව) දැක්වෙන නිර්වචන, හඳුනාගැනීමේ නිර්ණායක සහ වත්කම් සඳහා මැනුම් සංකල්ප.†**

† 54 උ ඡේදයෙහි නියාමන ගිණුම් ශේෂ සඳහා මෙම අවශ්‍යතාවය සංශෝධනය වී ඇති ආකාරය විස්තර කර ඇත.

## බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය

...

54ඊ <u>2018 දී නිකුත් කරන ලද SLFRSs හි සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට අදාළ සංශෝධන, සංශෝධිත ඡේද 6 සහ 11(ආ). අස්තිත්ත්වයක් විසින් එම සංශෝධන 2020 ජනවාරි 01 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා අදාල කරගත යුතුය. අස්තිත්ත්වයක් විසින් SLFRSs හි සංකල්පනාත්මක ආකෘතිමය රාමුව ආශ්‍රිත සංශෝධන මඟින් සිදුකර ඇති අනෙකුත් සියලුම සංශෝධන ද ඒ සමඟ ම අදාළ කරගන්නේ නම් කලින් යෙදුම් සඳහා අවසර දෙනු ලැබේ. අස්තිත්ත්වයක් විසින් මෙම ප්‍රමිතියට අනුකූලව සංශෝධිත 6 සහ 11(ආ) ඡේදයන් කෙරෙහි අතීතානුයෝගීව සලකා බැලීම අදාළ වේ. කෙසේ වෙතත්, යම් අස්තිත්ත්වයක් විසින් අතීතානුයෝගීව සළකා බැලීමේ යෙදුම ප්‍රායෝගික</u>

නොවන බවට හෝ අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් දැරීමට අවශ්‍ය බවට තීරණය කරන්නේ නම් මෙම ප්‍රමිතියෙහි 23-28 ඡේද වෙත යොමු කරමින් 6 වන ඡේදයෙහි සංශෝධන අදාළ කරගත යුතුවේ. SLFRSs සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි යොමුගත වූ සංශෝධන වලට ඇතුළත් සංශෝධන අතීතානුයෝගීව අදාළ කර ගැනීමේ දී අනවශ්‍ය පිරිවැයක් හෝ වැයමක් දැරීමට සිදුවන්නේ නම්, අස්තිත්ත්වයක් විසින් මෙම ප්‍රමිතියෙහි 23-28 ඡේද අදාළ කර ගැනීමේ දී 27 වන ඡේදයෙහි ඇති අවසාන වාක්‍යය හැර වෙනත් සඳහනක් කියැවීමේදී "ප්‍රායෝගික නොවීම" යන්න "අනවශ්‍ය පිරිවැයක් හෝ වැයමක් දැරීමට ඇතුළත් වේ" යනුවෙන් සහ "ප්‍රායෝගික" යන්න ඇති ඕනෑම සඳහනක් "අනවශ්‍ය පිරිවැයක් හෝ වැයමක් දැරීමට නොමැතිව" ලෙසට කියවිය යුතුය.

54ඪ යම් අස්තිත්වයක් විසින් SLFRS 14 නියාමන විලම්බිත ගිණුම් අදාළ කර නොගන්නේ නම්, අස්තිත්ත්වයක් විසින් සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි ඇතුළත් ඒවා වෙනුවට, නියාමන ගිණුම් ශේෂයන් සඳහා 11(ආ) ඡේදය යෙදීමේදී දිගටම යොමුගත වීම සහ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවෙහි* දැක්වෙන නිර්වචන, හඳුනාගැනීමේ මිනුම් ක්‍රම සහ මිනුම් සංකල්ප අදාළ කරගත හැකි බව සළකා බැලිය යුතුය. නියාමන ගිණුම් ශේෂයක් යනු, අනිකුත් අදාළ SLFRSs සමග අනුකූලව වත්කමක් හෝ වගකීමක් ලෙසට ගාස්තු නියාමක විසින් පාරිභෝගිකයින් අයකල හැකි ගාස්තුවක් ලෙසට ස්ථාපිත කළ හැකි ලෙසට අපේක්ෂා කරන ඕනෑම වියදමක (හෝ ආදායමක) ශේෂයක් ඇතුළත්වන හෝ ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන ශේෂයකි. ගාස්තු නියාමක යනු ගාස්තු හෝ ගාස්තු පරාසයක් ස්ථාපිත කිරීම සඳහා බලයලත් අස්තිත්ත්වයට බද්ධව ස්ථාපිත කර ඇති බලයලත් ආයතනයකි. ව්‍යවස්ථාවෙන් හෝ ගාස්තු සකස් කිරීමේදී ගනුදෙනුකරුවන් සහ අස්තිත්ත්වයෙහි සමස්ත මූල්‍ය ශක්‍යතාවය තහවුරු කිරීම යන දෙකෙහිම යහපත වෙනුවෙන් කටයුතු කළයුතු ලෙසට දක්වා ඇත්නම් ගාස්තු නියාමක තෙවන පාර්ශවීය ආයතනයක් හෝ අස්තිත්ත්වයෙහිම පාලන මණ්ඩලය ඇතුළු අස්තිත්ත්වයට සම්බන්ධිත පාර්ශවයක් වෙයි.

* යොමුව වන්නේ කවුන්සිලය විසින් 2011 දී සම්මත කරන ලද මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන ආකෘතිමය රාමුවයි.

## LKAS 34 *අතුරු මූල්‍ය වාර්තාකරණය සඳහා සංශෝධන*

31 සහ 33 ඡේද සංශෝධනය කර ඇති අතර, 58 වන ඡේදය එකතු කර ඇත. නව පෙළ යටින් ඉරි ඇඳ ඇති අතර, ඉවත්කල පෙළ හරහා ඉරක් ඇඳ ඇත.

**වාර්ෂික ගිණුම්කරණ වැනි එම ප්‍රතිපත්ති**

...

31 ~~මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුව (ආකෘතිමය රාමුව)~~ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව (සංකල්පනාත්මක ආකෘතිමය රාමුව) යටතේ ~~ශේෂ පත්‍රයට හෝ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කිරීමේ~~ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට හෝ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කිරීම සඳහා යොදාගැනීමට ~~මූලිකාංගයක්~~ මූල්‍ය ප්‍රකාශ වල එක් මූලිකාංගයක් ~~සහ හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන අර්ථ දැක්වීම~~ සපුරාලන අයිතමයක් හඳුනා ගැනීමේ ක්‍රියාවලියයි. වත්කම්, වගකීම්, අදායම් සහ වියදම් වල අර්ථදැක්වීම වර්ෂය අවසානයේ දී සහ වන වාර්ෂික සහ අතුරු මූල්‍ය වාර්තාකරණ කාලසීමාවන් යන දෙකේදීම හඳුනාගැනීම මූලික වේ.

...

33 වත්කම් වලට සහ වගකීම් වලට සම්බන්ධිත ගලා ඒම් සහ ගලා යෑම් යන ආදායමෙහි (ආදායම) සහ වියදමෙහි අත්‍යවශ්‍ය ලක්ෂණයන් දැනටමත් සැළකිල්ලට ගෙන ඇත. එම ගලා ඒම් හෝ ගලා යෑම් සැළකිල්ලට ගෙන තිබේ නම්, අදාල ආදායම සහ වියදම හඳුනාගැනේ; එසේ නොමැතිනම්, ඒවා හඳුනාගෙන නොමැත. ~~ආකෘතිමය රාමුවෙහි දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් වියදම් හඳුනාගනු ලබන්නේ විශ්වාසනීයව මැනිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අඩු වීමක් හේතුවෙන් වත්කමක් අඩුවීම හෝ වගකීමක් වැඩිවීම තුළින්~~ එම ~~ආකෘතිමය රාමුව~~ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙන් ශේෂ පත්‍රයෙහි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඇතුළත් වත්කම් හෝ වගකීම් යන නිර්වචන සපුරනු නොලබන අයිතමයන් හඳුනා ගැනීමට ඉඩ නොදේ.~~.~~

...

## බලාත්මක දිනය

58 2018 දී නිකුත් කරන ලද සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි සංශෝධන වලට යොමුගතව සංශෝධිත ඡේද 31 සහ 33. අස්තිත්ත්වයක් විසින් එම සංශෝධන 2020 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා අදාල කරගත යුතුය. අස්තිත්ත්වය විසින් එම කාලය තුළදීත් සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි සංශෝධන වලට යොමුගත කරමින් සිදුකර ඇති සියළුම සංශෝධන අදාළ කරගන්නේ නම් පෙර තිබූ යෙදුම් සඳහා අවසර දෙනු ලැබේ. අස්තිත්ත්වයකට LKAS 34 සංශෝධන වලට අනුකූලව LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ නැවත සළකා බලමින් අදාළ කරගත හැකිය. කෙසේ වෙතත්, යම් අස්තිත්ත්වයක් විසින් නැවත සළකා බැලීමේ යෙදුම ප්‍රායෝගික නොවන බවට හෝ අනවශ්‍ය පිරිවැයක් හෝ වෑයමක් දැරීමට සිදුවන බවට තීරණය කරන්නේ නම්, මෙම ප්‍රමිතියෙහි 23- 28, 50- 53 සහ LKAS 8හි 54 ඊ යන ඡේද වලට යොමු ගතව LKAS 34හි සංශෝධන අදාළ කරගත යුතුය.

## LKAS 37 *වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සඳහා සංශෝධනය*

10 වන ඡේදයෙහි වගකීමක් යන්නෙහි නිර්වචනයට පාද සටහනක් එකතු කර ඇත.

* *මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි ඇතුළත් වගකීමක් යන්නෙහි නිර්වචනය සංශෝධනය වුවද, ඒ අනුව මෙම ප්‍රමිතියෙහි වගකීමක් යන්නෙහි නිර්වචනය සංශෝධනය වූයේ නැත.*

## LKAS 38 *අස්පෘශ්‍ය වත්කම් සඳහා සංශෝධනය*

8 වන ඡේදයෙහි ඇතුලත් වගකීමක් යන්නෙහි නිර්වචනයට පාද සටහනක් එකතු කර ඇත

* *මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවෙහි ඇතුළත් වත්කමක් යන්නෙහි නිර්වචනය සංශෝධනය වුවද, ඒ අනුව මෙම ප්‍රමිතියෙහි වත්කමක් යන්නෙහි නිර්වචනය සංශෝධනය වූයේ නැත.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.